17 වන කාණ්ඩය
3 වන කලාපය

අඟහරුවාද
1981 නොවැම්බර් 17

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

(නිල වාර්තාව)

(අශෝධිත පිටපත)

## අන්තර්ගත ප්‍රධාන කරුණු

1981 නොවැම්බර් 16 වන සඳුදා

[වැඩ කටයුතු ඉදිරියට ගෙන යෑම]

විසර්ජන පනත් කෙටුම්පත, 1982 [පළමුවන වෙන් කළ දිනය] :

දෙවන වර කියවීම—විවාදය කල් තබන ලදි

පරිපූරක මුදල්

වාර්ෂික වාර්තා

මුදල් පනත : යෝජනාව

---

1981 නොවැම්බර් 17 වන අඟහරුවාද

මහජන ආරක්ෂක ආඥාපනත : යෝජනාව

විසර්ජන පනත් කෙටුම්පත, 1982 [දෙවන වෙන් කළ දිනය] :

දෙවන වර කියවීම—විවාදය ඉදිරියට ගෙන යන ලදී

---

මිල/ விலை/ Price : 1.50　　තැපැල් ගාස්තුව/ தபாற் செலவு/ Postage :1.50

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 17
இல. 3

செவ்வாய்க்கிழமை
17 நொவம்பர் 1981

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

அதிகார அறிக்கை

(பிழை திருத்தப்படாதது)

பிரதான உள்ளடக்கம்

**திங்கட்கிழமை, 16 நொவம்பர் 1981**
[நிகழ்ச்சித் தொடர்]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 1982 [ஒதுக்கப்பட்ட முதலாம் நாள்]:
இரண்டாம் மதிப்பு—விவாதம் ஒத்திவைக்கப்பட்டது
குறைநிரப்புத் தொகை
ஆண்டறிக்கைகள்
நிதிச்சட்டம் : தீர்மானம்

---

**செவ்வாய்க்கிழமை, 17 நொவம்பர் 1981**

பொதுசனப் பாதுகாப்புக் கட்டளைச்சட்டம் : தீர்மானம்
ஒதுக்கீட்டுச் சட்டமூலம், 1982 [ஒதுக்கப்பட்ட இரண்டாம் நாள்]:
இரண்டாம் மதிப்பு—விவாதம் தொடர்கிறது

---

**Volume 17**
**No. 3**

**Tuesday**
**17th November, 1981**

# PARLIAMENTARY DEBATES

(HANSARD)

OFFICIAL REPORT

(Uncorrected)

PRINCIPAL CONTENTS

**Monday, 16th November 1981**
[*Continuation of Proceedings*]

APPROPRIATION BILL, 1982 [First Allotted Day]:
Second Reading—Debate adjourned
SUPPLEMENTARY SUPPLY
ANNUAL REPORTS
FINANCE ACT: RESOLUTION

---

**Tuesday, 17th November 1981**

PUBLIC SECURITY ORDINANCE: RESOLUTION
APPROPRIATION BILL, 1982 [Second Allotted Day]:
Second Reading—Debate continued

2—A 59790—3,875 (81/11)
Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## පාර්ලිමේන්තුව
### பாராளுமன்றம்
### PARLIAMENT

**1981 නොවැම්බර් 16 වන සඳුදා**
*திங்கட்கிழமை, 16 நொவம்பர் 1981*
*Monday, 16th November 1981*

---

**[1981 නොවැම්බර් 16 වන සඳුද නිල වාර්තාවේ 446 වන තීරුවේ සිට ඉතිරි වැඩ කටයුතු]**

*[1981 நொவம்பர் 16, திங்கட்கிழமைய அதிகார அறிக்கை பத்தி 446 இலிருந்து நிகழ்ச்சித் தொடர்.]*

*[Continuation of Proceedings from Col. 446 of* OFFICIAL REPORT *for Monday, 16th November 1981.]*

---

## විසර්ජන පනත් කෙටුම්පත, 1982
*ஒதுக்கீட்டுச் சட்டமூலம், 1982*
APPROPRIATION BILL, 1982

අ. භා. 5.35

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා (කොළඹ දිසා ඇමතිතුමා)**
(Mr. Weerasinghe Mallimaratchchi—District Minister, Colombo)
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி—கொழும்பு மாவட்ட அமைச்சர்)*

ගරු කථානායකතුමනි, අද අයවැය විවාදයේ මුල් දිනයයි. අද මම මේ සහභාගි වෙන්නෙ පස්වෙනි අයවැය විවාදයටයි. පසුගිය අයවැය විවාද මොන තරම් උණුසුම් තත්ත්වයක පැවතුණාදැයි මට සිහියට නැගෙනවා. ඒ වගේම අපේ මුදල් ඇමතිතුමා මෙවර ඉදිරිපත් කළ අයවැය කොපමණ හොඳින් විරුද්ධ පාර්ශ්වය පිළිගෙන තිබෙනවාද යන්න, අද විරුද්ධ පාර්ශ්වය දෙස බලන විට පෙනී යනවා. මට මේ අවස්ථාවේ පෙනෙන්ට ඉන්නේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාත්, බලාපොරොත්තු නැති විධියට මේ පාර්ලිමේන්තුවට [illegible] නිස්ව පක්ෂයේ මන්ත්‍රීතුමාත් පමණයි. වෙන කිසිම කෙනෙක් නැහැ. එයින් පෙනී යන්නේ අයවැය ලේඛනය හොඳ බව විරුද්ධ පාර්ශ්වයේ වැඩි දෙනෙක් පිළිගෙන තිබෙන බවයි. විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ඉන්නේ කථාවක් පවත්වන බලාපොරොත්තුවෙන්. එතුමා ඉන්නෙත් මෙතැන විරුද්ධ පාර්ශ්වයේ නායකයා හැටියට සිටිය යුතු නිසයි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එක මන්ත්‍රීතුමෙක් කථා කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දන්නෙ නැහැ, ඒ මන්ත්‍රීතුමා කථා කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මොන කොටස වෙනුවෙන්ද කියා. මට ඒක හිතා ගන්න අමාරුයි. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායම් දෙකක් සිටිනවා. ප්‍රවෘත්ති පත්‍ර කියවන විටවත් මට තේරුම් ගන්න පුළුවන්කමක් නැහැ, ගම්පහ ගරු මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මහතා) මොන කණ්ඩායමේද කියා. එතුමා කථාවක් කරල පසුව පක්ෂය වර්ණනා කරල යමක් කිව්වා. 1979 ඉඳලම එතුමා ඒක කළා. 'අපි බලමුකො, 1983 දී තමුන්නාන්සේලා එන හැටි' කියලයි අද එතුමා කථාව අවසාන කළේ. 1983 දී එන්න බලාපොරොත්තුවක් තියෙන මිනිස්සු මෙහෙමද වැඩ කරන්නේ කියා මා එතුමාගෙන් අහන්න කැමතියි.

අයවැය විවාදයේදී අපි කථා කරන්නේ ආණ්ඩු පක්ෂය වෙනුවෙන්. මේ අයවැය ඉදිරිපත් කිරීමේදී මුදල් ඇමතිතුමා සියයට සියයක් හරි යයි අපි කවුරුත් පිළිගන්නේ නැහැ. වැරදි තිබෙන්න පුළුවන්, අඩුපාඩු තිබෙන්න පුවළුන්. විරුද්ධ පාර්ශ්වයට යුතුකමක් තියෙනවා, අපි කථා කරන දේවල් අහල අපට පිළිතුරු සපයන්න. පිළිතුරු සපයන්නෙ කොහොමද, එක් කෙනෙක්වත් නැතිව? ඒ ගැන මම එපමණයි කියන්නෙ. පසුව මම ඒ පක්ෂවල තත්ත්වයත් ටිකක් විග්‍රහ කරන්නට බලාපොරොත්තු වෙනවා.

මම මුලින්ම අපේ මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්න කැමතියි, මෙවැනි අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. මාස දෙකක පමණ කාලයක [illegible] ලංකාවේ විරුද්ධ පක්ෂවලට අයත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසිංහ මල්ලිමාරච්චි මහතා]

පත්‍රත්, සාමාන්‍යයෙන් නිදහස්ය කියන ප්‍රවෘත්ති පත්‍රත් ප්‍රකාශ කළා මේ අයවැය ඉදිරිපත් කිරීමේදී මුදල් ඇමතිතුමා ඉතාම අසීරු තත්ත්වයකට පත් වෙනවාය කියා. එපමණක් නොවෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය රේස් කොළයක් වාගේ පත්‍රයක් මුද්‍රණය කරනවා. ඒ පත්‍රයත්, අපේ කල වාන මන්ත්‍රීතුමා ඉන්න "ඇත්ත" පත්‍රයත්, ඒ වාගේම "ජනදින" පත්‍රයත් යන පත්‍ර තුනෙන් බලාපොරොත්තු වුණා, මේ අයවැය ලේඛනයෙන් සාමාන්‍ය පුංචි ජනතාවට ලෙකුම බරක් පැටවේය, කවදාවත් රට කරගෙන යන්න බැරි තත්ත්වයකට පත්වේය, මුදල් ඇමතිතුමා ඉතාමත් අමාරු තත්ත්වයකට පත් වේය කියා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවදාවත් එක්සත් ජාතික පක්ෂ රජයක් යට තේ නම් මුදල් ඇමතිතුමා කරදරේ වැටෙන්නෙ නැති බව අපට කියන්න පුළුවනි. අපි එහෙම වැටෙන්න අවස්ථාවක් දෙන්නෙත් නැහැ. මුදල් ඇමතිතුමා කරදරේ වැටුණා, එක් අවස්ථාවක. ඒ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටියදී.

එතුමා මුදල් ඇමති වශයෙන් අද කරදරේ වැටේවි කියා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හුඟාක් දෙනෙක් සිතාගෙන සිටියා. මොකද, ඒ අය තුළ එතුමා ගැන ලොකු වෛරයක් තිබෙනවා; එතුමා ගැන ලොකු අමාරුවක් ඇති වී තිබෙනවා. ඒ මොකද, 1970 සිට 1976 දක්වා එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජයේ පිටුපස මන්ත්‍රීවරයෙක් වශයෙනුයි සිටියෙ. එතුමා නෑදෑකම්වලට, හිතවත්කම්වලට කත් ඇද්දෙ නැති නිසායි; අවංකව කථා කළ නිසයි එසේ පිටුපස්සෙ සිටියෙ. ඒ වෛරය පිරිමසා ගැනීමේ අරමුණින්, මේවර මහජනයා කල කිරෙන විධියට අයවැය ලේඛනයක් ඉදිරිපත් කර එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට එපා වන විධියට කලකිරීමක් ඇති වන විධියට කටයුතු කොට දේශපාලන වශයෙන් පරාජයක් අත්පත් කර ගනීවි කියා විශ්වාසයක් ඒ අය තුළ තිබුණා. නමුත් අද මොකක්ද සිදු වී තිබෙන්නෙ? අවංකව මම කල්පනා කරන හැටියට අපේ රජය මෙතෙක් ඉදිරිපත් කර ඇති අයවැය ලේඛන අතුරෙන් මෙම අයවැය ලේඛනය

දුප්පත් මහජනතාවට සහනයක් දුන් හොඳ අයවැය ලේඛනයක් හැටියට මට හඳුන්වන්න පුළුවනි.

මම එසේ කියන්නේ ඇයි? විශේෂයෙන් අද පාර්ලිමේන්තුවේ නැති ලංකා සම සමාජ පක්ෂයත්, කොමියුනිස්ට් පක්ෂයෙත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇතැම් කොටසුත් එක්සත් ජාතික පක්ෂයේ අපට විරුද්ධව අවුරුදු ගණනාවක්ම නැඟූ චෝදනාවක් තමයි, "අපේ පක්ෂය ධනවාදී පක්ෂයක්ය; අපි කවදත් බලන්නේ ධනපතියන්ට වැඩ කරන්නය; අපි ලෙන්ගතුකම් කරන්නෙ ධනපතීන්ට පමණය" කියා. ඒ ආකල්පය මේ රටේ සාමාන්‍ය මහජනයා තුළ ආරෝපණය කරන්න මේ පක්ෂ තුනම ක්‍රියා කර තිබේනවා. ඒ ක්‍රියාව ඔප්පු කරන්න වුවමනා නිසා, නුවුමනා අවස්ථාවලත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමග කොමියුනිස්ට් පක්ෂයත්, ලංකා සම සමාජ පක්ෂයත් සම්බන්ධ වෙලා අත පුච්චගත්තා පමණක් නොවෙයි, වෙනත් කිය යුතු තැනුත් නොකිය යුතු තැනුත් විශාල ප්‍රමාණයක් පුච්චාගෙන තිබෙනවා. ඒ වුණත් අද ඒවා සියල්ලම අමතක කර දරේ වැටුණා, එක් අවස්ථාවක. ඒ. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටියදී.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු කාලයේ දීත් මේ රජය කාලයේදීත් ගත් යම් යම් පියවරවල් මම තමුන්නාන්සේට ඉදිරිපත් කරන්න කැමතියි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය කාලයේදී—1970 සිට 1977 දක්වා—මේ රටේ පුද්ගලයෙකුට පිට රටට යන්න නිදහසක් තිබුණේ නැහැ. පිටරට යෑම සීමා කිරීම නිසා මොකද වුණේ? ඉතාමත් ධනවත්, පිටරටවලට ඉතාමත් සම්බන්ධකම් තිබෙන අල්ප දෙනෙකුට පමණයි, පිටරට යන්න පුළුවන් වුණේ. නමුත් අපේ රජය බලයට පත් වුණාට පස්සෙ ඒ සීමාවන් ඉවත් කළ නිසා අද නිදහසේ ඕනෑම රැකියාවක යෙදීම සඳහා පිටරටට යාමට පුළුවන්කම ලැබී තිබෙනවා පමණක් නොවෙයි, ඔවුන් උපයන මුදල් මේ රටට එවීමෙන් මේ රටේ ආර්ථික තත්ත්වය දියුණු කිරීමටත් අවස්ථාව සැලසී තිබෙනවා. අපි එදා තිබුණු ඒ සීමා නීති කඩා දැමූ නිසා කොයි තරම් ලොකු ප්‍රයෝජනයක් සිදු වී තිබෙනවාද කියා මම විරුද්ධ පක්ෂයෙන් ප්‍රශ්න කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එපමණක් නොවෙයි, පිටරටින් යම් යම් යන්ත්‍රෝපකරණ ගෙන්වීමේදී අද පවතින තත්ත්වය කුමක්ද කියා තමුන්නාන්සේට අවබෝධ වෙනවා ඇති. ඉතාමත් හොඳ උදාහරණයකින් මම මෙය පැහැදිලි කරන්නම්. 1973, 1974 සහ 1975 කාලයේ දී මම ඔය පංචිකාවත්තේ තිබෙන ලියවන පට්ටලවලට ගිහින් තිබෙනවා. කෙනෙක් යම් වඩක් කරවා ගන්නට—කිසියම් යන්ත්‍රයකට වුවමනා කරන මුරිච්චියක් ඇණයක් ලියවා ගන්නට—ලියවන පට්ටලයක් අයිතිකාරයකු ළඟට ගියොත් අඩු ගණනේ දවස් පහක්, හයක්වත් ඒ සඳහා ගත කරන්නට ඔහුට සිදු වුණා. ඒ දවස්වල තිබුණේ එක්දාස් නමසිය විසි ගණන්, තිස් ගණන්වල ගෙන්නූ ලේත් මැෂින්. ඒවායින් වැඩක් කර ගන්නට නියම ප්‍රමාණයට වඩා තුන්හතර ගුණයක් ගෙවන්න සිදු වෙලා තිබුණා. ලේත් මැෂින් ක්‍රියා කරවන්නන් පුහුණු කරන ස්ථාන එදා තිබුණේ නැහැ. ඒ මැෂින් ගෙන්වීම සීමා කර තිබුණා. පැටල් ගෙන්වීම සීමා කර තිබුණා; ලොරි ගෙන්වීම සීමා කර තිබුණා. මේ සීමා කිරීම් නිසා කරදර දෙකක් ජනතාවට සිදු වුණා.

එදා ට්‍රැක්ටරයක් ගෙන්නා ගන්න, ලේත් මැෂින් එකක් ගෙන්නා ගන්න කෙනකුට වුවමනා වුණා නම්, ඔහු යන්න ඕනෑ කා ළඟටද? ඔහුට යන්න වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයා ළඟට. මන්ත්‍රීතුමා ළඟට ගිහින්, ඊළඟට මන්ත්‍රීතුමා දන්න, ඔහුගේ කිට්ටුම ගෝලයා ළඟටත් ගිහින් ඔහුගේ මාර්ගයෙන් තමයි, ඒ යන්ත්‍රය ගෙන්නා ගන්න පුළුවන් වුණේ. එහෙම ගෙන්නා ගනීමේ දීත් ඒ මැෂින් එකට ගෙවන ගණනෙන් කාලක් නැත්නම් භාගයක් තවත් තුන්හතර දෙනකු අතර බෙදා දිය යුතු අවස්ථාවක් එදා ඇති වී තිබුණා. එවැනි තත්ත්වයක් තිබුණේ නැද්ද කියා මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් විරුද්ධ පක්ෂයේත් ගරු මන්ත්‍රීවරුන්ගෙන් අහන්නට කැමතියි.

අද මොකද වෙලා තිබෙන්නේ? අද අපි රජය මගින් හෝ වේවා, පෞද්ගලික සමාගම් මගින් හෝ වේවා, ඕනෑම යන්ත්‍ර සූත්‍රයක් ගෙන්වීමට බලය දී තිබෙනවා. ඒ නිසා අද මොකද වී තිබෙන්නේ? එදා කිසියම් වැඩක් කර ගන්න පැය 4 ක් 5 ක් පෝලිමේ සිටි මිනිසාට, අද මිනිත්තු කීපයකින් ඒ වැඩේ කර ගන්න පුළුවන් තත්ත්වයක් ඇති වී තිබෙනවා. කොම්පැනියක් විසින් හෝ පුද්ගලයෙකු විසින් හෝ එක ට්‍රැක්ටරයක් ගෙන්නූ විට කීදෙනකුට රැකියාව ලැබෙනවාද? එක ට්‍රැක්ටරයකට අඩු ගණනේ තුන්හතර දෙනකුවත් සේවකයන් ඕනෑ කරනවා. ඒ උදවිය බඳවා ගන්නේ කොහෙන්ද? මේ රටේම ජනතාවගෙන්. මේ රටේ ජනතාවට එයින් රැකියා ලැබෙනවා.

කලවානේ ගරු මන්ත්‍රීතුමාගෙන් (සරත් මුත්තෙට්ටුවේගම මහතා) මම එක ප්‍රශ්නයක් අහන්න කැමතියි. තමුන්නාන්සේලා කම්කරුවන් ගැන කථා කරනවා. කම්කරුවන්ගේ දුක්ගැනවිලි ගැන කථා කරනවා. තමුන්නාන්සේත් ඇතුළුව, තමුන්නාන්සේගේ පක්ෂයේ උදවිය සිරිමා බණ්ඩාරනායක රජයේ සිටියා. අද තමුන්නාන්සේලා කියන දේවල් එදා කර ගන්නට බැරි වුණේ ඇයි? කලවානේ ගරු මන්ත්‍රීතුමා තම කථාවේදී මේ ප්‍රශ්නයට කාරුණික පිළිතුරු දෙන්න.

තමුන්නාන්සේලා කී හැටියට, මේ රටේ මුදල් මේ රටේම පුළුවන් තරම් තිබෙන්නට හැර, පිටරටින් ගෙන්වන බඩු සීමා කර උද්ධමනය නැති කරන්නට පුළුවන් වේදැයි අපි පසුගිය කාල සීමාවේදී කල්පනා කර බැලුවා. උද්ධමනය නැති කිරීමය කියන්නේ මේ රටේ මිනිසුන්ට කන්න නැති, ජීවත් වන්නට බැරි අවස්ථාවක් ඇති කිරීමදැයි මම විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් අහන්න කැමතියි.

නුවරඑළිය මස්කෙලියේ දෙවන ගරු මන්ත්‍රීතුමා (අනුර බණ්ඩාරනායක මහතා) මෑතදී ප්‍රකාශ කීපයක් කර තිබුණා. "අපේ රජයෙන් පසුගිය කාල සීමාවේදී වැරදි සිදු වුණු බව අපි පිළිගන්නවා, පිටරටින් ගෙන්නූ කුණු කරවල ටිකවත් මහජනයාට නිසි අන්දමින් බෙදා දීමට අපේ වෙළඳ ඇමතිව සිටි ඉලංගරත්න මහතාට බැරි වුණා." යයි එතුමා ප්‍රකාශ කර තිබෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසිංහ මල්ලිමාරච්චි මහතා]

නවා. මේ කියන්නේ මම නොවෙයි. නුවර එලිය මස්කෙලියේ දෙවන ගරු මන්ත්‍රීතුමා. එතුමා මෙහෙම කියන්නෙ එතුමන්ලාගේ රජයේ සිටි ජ්‍යෙෂ්ඨ ඇමතිවරයකුට. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එක කණ්ඩායමක නියෝජ්‍ය නායකයා යයි කියා ගන්නා පුද්ගලයයි මෙහෙම කියන්නේ. මේ රටේ ප්‍රවෘත්ති පත්‍ර කියවන උදවිය රජය ගැනත් විරුද්ධ පක්ෂය ගැනත් සැලකිල්ලෙන් ඉන්නවා. එහෙම නම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය අපට කියන්නේ එතුමන්ලාගේ කාලයේ තිබුණු තත්ත්වය නැවත ඇති කරන්නද?

පිටරටවලින් යන්ත්‍ර සූත්‍ර ගෙන්නීමෙන් පමණක් මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවකට රැකියා ලැබුණා. නමුත් ලොරියක් ගෙන්වූවත් අපට දොස් කිව්වා. පසුගිය කාලයේදීත්—පසුගිය අයවැය ලේඛන විවාදයේදීත්—කිව්වා, පුළුවන් තරම් ලොරි ගෙන්වා තිබෙනවා, බස් ගෙන්වා තිබෙනවා, පුද්ගලික සමාගම් වලට බලය දී තිබෙනවා, පුද්ගලයන්ට ඉඩ දී තිබෙනවා රටේ දුප්පත් ජනතාව සූරා කන්න කියා. නමුත් මම කියන්න කැමතියි, අපි ඒ නිදහස දුන්නේ නැත්නම්, මහජනතාව දස දහස් ගණනක් මහමඟ ඉඳිවි, පාරේ ඉඳිවි, ගොඩවෙන්න බස් එකක් නැතිව; ගමනක් යන්න බස් එකක් නැතිව. ජීවන වියදම මීටත් වඩා ඉහළ යන්න පුළුවන් අපි ලොරි ගෙන්වන්න බලය දීල නැත්නම් මොකද වෙන්නෙ? එක ලොරියක් තිබෙන විට—1970—77 කාලයේදී වගේ—මොකද වෙන්නෙ? එදා වැලිමඩ සිට කොළඹට ලොරියක එළවළු පටවා ගෙන එන්නට මොන තරම් කරදර වුණාද? කීයක් අය කළාද? හම්බන්තොට සිට කොළඹට ලොරියක් එන්න කීයක් අය කළාද? එදා ලොරි හිමියන් සීග්‍රයෙන් පොහොසතුන් බවට පත් වුණා. ලොරි හිමියන් ඒකාධිකාරයක් ඇති කරගෙන සිටියා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ළඟින් සිටි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් ළඟින් සිටි උදවියට පමණයි, බස් එකක් ගන්න, ලොරියක් ගන්න, ලියවන පට්ටලයක් ගන්න, වෙනත් ඕනෑම දෙයක් ගන්න පුළුවන් වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ රජය කාලයේත්, අපේ රජය කාලයේත් ඇති වෙනස පෙන්නා දෙන්න මා කැමතියි. අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමා දැන් කථා කළා. ඒ කාලයේදි මේ රටේ ජීවත් වුණ මිනිසෙකුට අසනීපයක් ඇති වුණ අවස්ථාවකදී හදිසියට පිටරටකින් බෙහෙතක් ගෙන්වා ගන්නට සිදු වුණොත් එයට අවස්ථාවක් තිබුණාද? මේ රටේ නැති බෙහෙතක් ගෙන්වා ගන්නට සිදු වුණොත්, එයට පුළුවන්කමක් තිබුණේ නැහැ. කොළඹ නගර සභාවේ මා නියෝජනය කළ කොට්ඨාශයේ සිටි එක්තරා පුද්ගලයෙකුට බෙහෙතක් ගෙන්වා ගන්නට පවුම් 13 ක් වුවමනා වුණා. බඩේ අමාරුවක් නිසා ශල්‍ය කර්මයක් කරන අවස්ථාවේදී බෙහෙතක් ගෙන්වා ගැනීම සඳහා පවුම් 13 ක් රජයෙන් ඉල්ලා සිටියා. දුන්නේ නැහැ. ඒ පුද්ගලයා හය මාසයකට පසු මිය ගියා. එවනි තත්ත්වයක් මේ රටේ තිබුණා. අද එවැනි තත්ත්වයක් තිබෙනවාද කියා මම අහන්න කැමතියි. අද මුදල් තිබෙනවා නම් ඕනෑම බෙහෙතක් ගෙන්වා ගන්න පුළුවන්. අසනීපයක් ඇති වුණ කෙනෙකුට අවශ්‍ය බෙහෙත් මේ රටේ නැත්නම්, ඔහුට මුදල් නැති විට මුදල් තිබෙන ධනවතෙකුට හෝ කියා ඒ බෙහෙත පිටරටකින් ගෙන්වා ගන්නට පුළුවන්. ඒ විධියට මහජනතාවට ඕනෑ දෙයක් ගෙන්වා ගන්නට අපි නිදහස දී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු මුදල් ඇමතිතුමා එතුමාගේ කථාවේදී පැහැදිලි කළා, මෙය සංවර්ධනය කරා සීග්‍රයෙන් යන සංවර්ධන අයවැය ලේඛනයක් බව. මේ සංවර්ධනය කියන එක ගැනත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුත් විරුද්ධ පක්ෂයේ අනික් මන්ත්‍රීවරුත් කතා කරන්නේ වැරදි විධියකටයි. සංවර්ධනය වෙනම පැත්තකට හරවා මහජනතාවට වෙනත් ආකල්පයක් පෙන්වා දෙන්නටයි, උත්සාහ කරන්නෙ. මම ඒ මන්ත්‍රීතුමන්ලාගෙන් එක් කාරණයක් අහන්න කැමතියි. ජීවන වියදම ගැන කොමියුනිස්ට් පක්ෂය ඉපදුණ දා සිට මැරෙන තෙක්මත් ලංකා සමසමාජ පක්ෂය ඉපදුණ දා සිට මැරෙන තෙක්මත් කථා කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අතරමඟ සිට පටන් ගත්තා. විරුද්ධ පක්ෂයේ වෘත්තීය සමිති හැමදාමත් කෑගැහුවේ ජීවන වියදමට සරිලන වැටුපක් දිය යුතුය කියලයි. ජීවන වියදම ගැන කථා කළා. ජීවන වියදමට සරිලන වැටුපක් දෙන්නය කියා වෘත්තීය සමිති නායකයන් වශයෙන් උගුර කඩාගෙන වේදිකාවල නැගිටල කෑගැහුවා. පිට්ටනි පාලු කළා. පාලු පිට්ටනිවලට වී දෙන්නෙක් තුන් දෙනෙක් හිටියත් මහ වේගයෙන් කථා කළා. මොනම රජයකින්වත් එය ලැබුණේ නැහැ. මොනම අයවැය ලේඛණයකින්වත් එය ලැබුණේ නැහැ. අපේ මේ ගරු මුදල් ඇමතිතුමා තමයි, පළමුවැනි වරට ඒ කාරණය ඉටු කළේ. ජීවන වියදම 360 සිට වැඩි වෙන හැම අංකයකටම රුපියල් දෙක බැගින් ගෙවන්න නියම කළා. නමුත් ඊයේ පෙරේදා පත්තරවල මොකක්ද කියන්නෙ? විශේෂයෙන්ම 'ඇත්ත' පත්‍රයෙන් මොකක්ද කියන්නෙ? "අපි ඒක නොවෙයි ඉල්ලුවෙ. අපි ඉල්ලුවේ රුපියල් 300 ක පඩි වැඩිවීමක්" කියන එකයි. 300 නොවෙයි, නමුත්නාන් සේලාට 500 ක් දෙන්න තිබුණා. සිරිමා රජය කාලයේදී කොයි තරම් දුන්නාද? සිරිමා රජය කාලයේදී දෙන්න තිබුණා නේද? ආචාර්ය එන්. එම්. පෙරේරාටත්—දිවංගත වෘත්තීය සමිති නායකයාටත්—බැරි වුණා, 500 ක් දෙන්න. අපි අන ඇල්ලුවේ නැහැ.

**සරත් මුත්තෙට්ටුවේගම මහතා** (කලවාන)
*(திரு. சரத் முத்தெட்டுவெகம—கலவான)*
(Mr. Sarath Muttetuwegama—Kalawana)

ඒක දීලත් අගමැතිතුමා අස්වෙන්න ගියාලු.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
*(திரு. வீரசிங்க மல்லிமாரச்சி)*
(Mr. Weerasinghe Mallimaratchchi)

දවල්ද?

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

පත්තරේ තිබුණා.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
*(திரு. வீரசிங்க மல்லிமாரச்சி)*
(Mr. Weerasinghe Mallimaratchchi)

පත්තරවල තිබෙන දේවල් ගැන කථා කරන්න ගියොත් අපට වෙන දෙවල් ගැන කථා කරන්න හම්බ වන්නේ නැහැ.

නමුත්නාන්සේලා මේ රටේ කර තිබෙන එක දෙයක් තිබෙනවා. එය කර තිබෙන බව අවිවාදයෙන් පිළිගන්න ඕනෑ. මොනවා, ඒ? ජීවන වියදම ගැන කථා කිරීම, කම්කරුවන් ඉදිරියේ 'පඩි වැඩි කළ යුතුයි, වුවමනා තරම් ආහාර දිය යුතුයි' කියන අතර, විප්ලවය ගැනත් කථා කිරීම! නමුත්නාන්සේලා—විශේෂයෙන් ලංකා සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය— ඊළඟට කර තිබෙන්නේ මොකක්ද? දන්නා දේවලුයි, මා කියන්නේ; පොත බලා ගෙන නොවෙයි.

තමන්ගේ ගෙදරකට ආවොත් තේ කෝප්පයක් දෙන්නේ නැහැ. කම්කරුවෙක් මැරුණොත් විහහට මළ ගෙදර ගිහින් මල් වඩමක් තබනවා. පණ්ඩිතලා වාගේ වෘත්තීය සමිතිකාරයන් උපවාසයක් කළොත්, කැමර කාරයනුත් එක් කරගෙන එතැනට ගිහින් අර අයගේ ඔළුව අත ගා 'ෆෝටෝ' ටිකක් අර ගෙන, පත්තරේ දමනවා. හැබැයි, කලවානේ මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවේගම මහතා) නම් එහෙම යනවා මා දැක්කේ නැහැ. වර්ජනයක් තිබුණොත්, වර්ජකයන් ළඟට ගිහින් තමන්ගේ සහයෝගය පළ කරනවා. අවුරුදු හතළිස් ගණනක් වූ ඔවුන්ගේ මුළු දේශපාලන ජීවිතය තුළම ගෙන ගිහින් තිබෙන්නේ මේ බොරුව නේද? එහෙම නැතිව අවංකව, වැඩ කරන ජනතාව වෙනුවෙන් මොකක්ද, කර තිබෙන්නේ?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! The hon. Deputy Chairman of Committees will now take the Chair.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [திரு. எட்மண் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. EDMUND SAMARAWICKREMA] *took the Chair.*

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)*
**(Mr. Weerasinghe Mallimaratchchi)**

නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේ මූලාසනයට පැමිණීම මගේ සතුටට කාරණයක්. ඒ මොකද කීවොත්, තමුන්නාන්සේත්, මාත් කොළඹ මහ නගර සභාවේ එකට සිටිද්දී, තමුන්නාන්සේ එහි මූලාසනය ගත් අවස්ථාවල මට දුන් සහයෝගය නිසයි. ඒ සහයෝගය මට අදත් තමුන්නාන්සේගෙන් ලැබේයයි මා බලාපොරොත්තු වෙනවා.

**(නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**
*(குழு உப தலைவர் அவர்கள்)*
**(Mr. Deputy Chairman of Committees)**

දැන් මේ සභාව ගැන කථා කරමු.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)*
**(Mr. Weerasinghe Mallimaratchchi)**

නියෝජ්‍ය සභාපතිතුමනි, මා කියාගෙන ආවේ මෙයයි: ජීවන වියදම් අංකය අනුව දීමනාවක් ගෙවීම ගැන කිසිම වැඩක් නොකළ නමුත්, මුදල් ඇමති ධුරය හා තවත් නොයෙක් ඇමති ධුර දැරූ වම්මංශිකයන් මේ රටේ හිටියා. ඔවුන් ඒ ඇමති ධුර දරද්දීවත් නොකළ වැඩක් තමයි, අද අපේ මුදල් ඇමතිතුමා කර තිබෙන්නේ. එම නිසා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් මේ අයවැය ලේඛනයට පක්ෂව ඡන්දය දිය යුතුයි.

එතුමන්ලාගේ වෘත්තිය සමිතිවලින් ඉල්ලුවේ රු. 300 කයි. දැන් එයින් 107 ක් දී තිබෙනවා. ඒ හැරෙන්න වැඩි වන ජීවන අංකයකට රු. 2 බැගින් දෙනවා. ඒ අනුව තව මාස 6 ක් යන විට ඉල්ලූ රු. 300 ම ලැබෙනවා. හය මාසයකින් නැත්නම් අවුරුද්දකින් ඒ මුළු මුදලම ඒ අයට ලැබෙනවා. ජීවන වියදම අඩු කරන්න අපට බැහැ. තමුන්නාන්සේලා නැවත බලයට පත් උනත් බැහැ. කවුරු ආවත් එය කරන්න බැහැ. එය අප කියන ඇත්තක්.

තමුන්නාන්සේලා කියන්නේ රු. 300 ක් දී නවතින්න කියාද? රු. 300 කින් නවත්වන්න අපේ නම් බලපොරොත්තුවක් නැහැ. අපේ බලාපොරොත්තුව, තමුන්නාන්සේලා බොරුවට ඝෝෂා කළ දේවල් ඇත්ත වශයෙන්ම ක්‍රියාවට පරිවර්තනය කිරීමයි.

විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ට, යම් යම් දේවල් කියන්න නම් බොහොම ලේසියි. පොතක් වුණත් කියවාගෙන කියවාගෙන යන්න බොහොම ලේසියි. එහෙත් කියවන දේ කල්පනාවට භාජන කර, එයින් ගත යුතු ප්‍රයෝජන ගැනීම හුඟක් අමාරු වැඩක්. පොතක පිටු 10 ක් කියවන්න යන කාලය වගේ තුන් ගුණයක් ගත වෙනවා, එයින් එක පිටුවක ප්‍රමාණය තෝරා බේරාගෙන එයින් ප්‍රයෝජන ගන්න.

තමුන්නාන්සේලා කී දේවල් අප ක්‍රියාවට පරිවර්තනය කරන්නේ කොහොමද? එකක්, ධනපතියන්ට බදු පැනවීම ගැන බලමු. මෙපමණ බදු බරක් ධනපතියන් පිට පටවයි කියා තමුන්නාන්සේලා කිසි කෙනෙක් බලාපොරොත්තු වුණේ නැහැ. මේ රටේ ධනපතියන්ට, කොම්පැණිකාරයන්ට, මුදලාලිලාට අප ඒ විධියේ බරක් පටවයි කියා තමුන්නාන්සේලා හිතුවේ නැහැ.

ඒක කළාට පසු දැන් මොකක්ද කියන්නෙ? ඔය ටික දෙනෙකුට කළාය කියනවා. එපමණක් නොවෙයි. කලවානේ මන්ත්‍රීතුමා දැන් වක්‍ර විධියටත් කථා කරනවා. ලොකු මුදලාලිගෙ ආරක්ෂාවට වගෙ කථා කරනවා. අපි මොකක්ද කරන්නෙ කියල බලන්න ඒ විධියටත් කථා කරනව. එහෙම කථා කරල අපව කුලප්පු කරල "කඩවත් ටිකක් ගහපියව්" කියන්නට හද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නවා. "බදු බර තවත් පටවපල්ල" කිය නවා. අපි බදු බර පටවන්නෙ පක්ෂයක් බලල නොවෙයි. පුද්ගලයෙක් බලල නොවෙයි. මා මුදල් ඇමතිතුමාට කියන්නට කැමතියි, කොම්පැණිකාරයින්ට මේ පටවා තිබෙන බදු බර මදි බව.

1948 සිට මේ රටේ තිබුණු හැම රජයක ටම හිස රුදාවක් වුණේ කොම්පැණිකාරයො තමයි. ඒ උදවිය තමයි පාලනය කරන්නට බැලුවේ. මුදල් පාලනය කරන්නට බලනවා. රජය පාලනය කරන්නට බලනවා. ඇමතිවරුන් පාලනය කරන්නට බලනවා. මන්ත්‍රීවරුන් පාලනය කරන්නට බලනවා. පංගුවක් උදවියගේ සාක්කුවට බසින්නටත් බලනවා. මේ තත්ත්වය නේද තිබුණේ? මෙය වර්තමාන මුදල් ඇමතිතුමාගේ සටනේ පටන් ගැනීම බව මට කියන්නට පුළුවනි.

මුදල් ඇමතිතුමාගෙන් මා තවත් ඉල්ලීමක් කරන්නට කැමතියි. තමුන්නාන්සේගේ ඔය කන්නාඩි දෙකට පෙනෙන්නේ නැත්නම් අලුත් කන්නාඩි දෙකක් හරි ගන්න. මේ රටේ සිටින ධනපතියන්ට -සුපිරි ධනපතියන් කියන උදවියද-පිටරට වල කොපමණ කොම්පැණි තිබෙනවාදැයි සොයා බලන්න. ඒ උදවිය මේ රටේ ධනය කොපමණ ප්‍රමාණයක් පිටරටවල තැන්පත් කර තිබෙනවාදැයි සොයන්න. කොම්පැනිකාරයින්ගෙන් ගන්නා බද්ද මීට වඩා දෙගුණයක් තුන් ගුණයක් කරන්නැයි මා ඉල්ලා සිටිනවා. මේ රටේ සමහර ධනවත් උදවිය, කොම්පැණිකාරයො-සුපිරි ධනපතියො- පිටරටවල කොපමණ මුදලක් තැන්පත් කර ඇත්දැයි තරුණකර සොයන්න. එසේ සොයා බැලුවොත් අවුරුදු හයක් තිස්සේ—පාර්ලිමේන්තුවක නිල කාලය තිස්සේ—එක ආසනයක ජීවත් වන සියලුම මිනිසුන්ට නොමිලේ කන්න බොන්න දිය හැකි තරම් මුදලක් සමහර විට එක් පුද්ගලයකු හෝ දෙදෙනෙකු පිට රට තැන්පත් කර තිබෙන බව තමුන්නාන්සේට පෙනී යනවා ඇති. කොහොමද මේ මුදල් පිටරට ගෙන ගියේ? කවුද මේවා ගෙනියන්නට ඉඩ දුන්නේ? කොයි කාලයේදීද මේවා ගෙන ගියේ?

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
*(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)*
**(Mr. R. J. G. de Mel)**
1970 සිට 1977 දක්වා වූ කාලයෙ තමයි ඔක්කොම ගෙන ගියෙ.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)*
**(Mr. Weerasinghe Mallimaratchchi)**
ඒවා දැන් තමුන්නාන්සෙ භාර අරන් තිබෙනව. ඒ ගෙන ගිය අය අල්ලා ගෙන ඒ අයට දෙන්න පුළුවන් දඬුවම දෙන්න.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
**(Mr. Sarath Muttetuwegama)**
අල්ලා ගත්තම නිදහස් වෙනවා.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)*
**(Mr. Weerasinghe Mallimaratchchi)**
නිදහස් වන අය නම් අතන්තයි, අප්‍රමාණයි.

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
*(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)*
**(Mr. R. J. G. de Mel)**
කලවානේ මන්ත්‍රීතුමාගෙ ඔය තරම් ඥාතිවයන්ට මාමණ්ඩියට බැරි වුණා, හිදස් නැතිව ඉඩම් පනත් දෙකක්ම ඉදිරිපත් කරන්නට. ඒ මනුෂ්‍යයා ඒවායින් රිංගා ගෙන ගියා.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
**(Mr. Sarath Muttetuwegama)**
කොයි මනුෂ්‍යයද?

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
*(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)*
**(Mr. R. J. G. de Mel)**
උපාලි විජේවර්ධන.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වාටත් බැරි වුණා හිදස් නැතිව ඉඩම් පනත් දෙකක්ම ඉදිරිපත් කරන්නට. ඒ මනුෂ්‍යයා රිංගාගෙන ගියා අක්කර 30,000 කුත් එක්ක.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
**(Mr. Sarath Muttetuwegama)**

දැක් වන්දි ගෙවන්නත් යනවා.

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
*(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)*
**(Mr. R. J. G. de Mel)**

ඒ ඔක්කොම පත්‍රවල හිදස් තියපු හින්දයි. ගිය ආණ්ඩුව ඕනෑවටම හිදස් තියපු නිසා. මා ඒක කෙලින්ම කියනවා. මා චෝදනා කරනවා.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)*
**(Mr. Weerasinghe Mallimaratchchi)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කලවානේ මන්ත්‍රීතුමා දුප්පත් මිනිසුන් ගැන කොපමණ කථා කළත් එයත් "අප්පො" කෙනෙක්. ඔය අප්පො කැල්ල ගැවුණු මිනිස්සු ධනපති පන්තියට රදළයින්ට කත් අදින මිනිස්සු. ඒක නැහැ කියන්න බැහැ. ඒක ලේවලින් ඇවිත් තිබෙනවා. ඒ ගැන ඒ අය ආඩම්බර වන අවස්ථාත් තිබෙනවා. ඒ අය ගිහින් ගේත්තු වෙන්නෙත් ඒ වගේම පවුල්වලට නොවැ. කලවානේ මන්ත්‍රීතුමා පොඩි පවුලකටද ගිහින් ගේත්තු වුණේ? විශාල ධනවත් පවුලකට. නමුත් එතුමා දුප්පත් පීඩිත පන්තිය ගැනයි කථා කරන්නෙ. අපි එහෙම නොවෙයි. අපි පීඩිත පන්තිය වෙනුවෙන් කථා කරනවා. පීඩිත පන්තිය සමග ඉන්නවා. ඒකයි අප දෙගොල්ල අතර තිබෙන වෙනස.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා තවත් කාරණයක් ඉදිරිපත් කරන්නට සතුටුයි, කලවානේ මන්ත්‍රීතුමාගේ අවධානයට. මමත් කොමියුනිස්ට් රටවල් කීපයකට ගිහින් තිබෙනවා. මා කලවානේ මන්ත්‍රීතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. මිනිහෙකුට ඉඩමක් දී ගෙයකුත් දෙන තත්ත්වයක් ඇති කර තිබෙන්නේ මොන කොමියුනිස්ට් රටේද? අපේ අගමැතිතුමාගේ අමාත්‍යාංශයකින් මේ රජය යටතේ තමයි, ගෙවලුත් ලබා දී, ඉඩනුත් ලබා දෙන ක්‍රමයක් මේ රටේ ඇති වුණේ කියන එක මම නමුන්නාන්සේලාට මතක් කරන්නට කැමතියි. නමුන්නාන්සේලාගේ මේ සමාජවාදය ගැන කතා කරන, අවුරුදු තිස් හතළිස් ගණනකට කලින් සිටම නමුන්නාන්සේලාගේ සමාජවාදී නායකයෙක් වෙලා සිටිය, අවුරුදු 20 ක් පමණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වෙලා සිටිය, සිරිමා බණ්ඩාරනායක රජයේ කැබිනට් ඇමතිවරයෙක් වුණු, පීටර් කෙනමන් මන්ත්‍රීතුමා මේ අගමැතිතුමා දරන ඇමතිකමම දැරුවා නේද? එයා ගෙවල් කීයද හැදුවේ එතුමාට ගෙවල් හදන්න පමණක් නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වාගේ ක්‍රමයක් ඇති කරන්නට කල්පනා කරන්නවත් පුළුවන්කමක් තිබුණේ නැහැ. එහෙම නම් නමුන්නාන්සේලා කියන සමාජවාදයෙනුත්, අපේ සමාජවාදයෙනුත් හොඳ කෝකද කියා මා අසන්නට කැමතියි. සමාජවාදය ගැන කතා කරලා, එක ගෙයක්වත් හදන්නට බැරුව, එක ඉඩම් කැබැල්ලක්වත් දෙන්නට බැරුව, අලුත් ක්‍රමයක් සකස් කරන්නට බැරිකමට කතා කරන අයට ඡන්දය කවුරු හරි දෙනවාද? ඒ අය හරිය කියා කවුරු හරි පිළිගන්නවාද? එසේ නැත්නම් එහෙම මොකවත් කතා නොකර අපි මහජනයා සමගයි ඉන්නේ, අපි සමාජවාදී පියවරවල් ගන්නවාය කියා මිනිසුන් ලක්ෂ සංඛ්‍යාත ගණනකට ඉඩම් කැබලි හා ගෙවල් ලබා දෙන එක හොඳද? මේ දෙකින් කොයි එකද හොඳයි කියා පිළිගන්නේ?

ඊළඟට, තව කතාවක් කියනවා, මම "ඇත්ත" පත්තරයේ තිබෙනවා දැක්කා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ "දිනකර" ජේස් කොළයේත් තිබුණා, "ජනදින" පත්තරෙත් තිබුණා, සමහර ගෙවල් කුකුළු කොටු වගෙයිලු. එහෙමත් කතාවක් තිබෙනවා. මේක යන වේගය බලාගෙන නිකම් ඉන්න බැරිව ගිහින් අමාරුවට මොකක් හරි කියනවා. මමත් කොමියුනිස්ට් රටවලට ගිහින් තිබෙනවා. අපේ මේ ගෙවල්වලට වැඩිය ඉතාමත් කුඩයි එහෙ සමහර ගෙවල්. මම කියන්නේ නැහැ, රට මොකක්ද කියා. නමුන්නාන්සේ දන්නවා. නමුන්නාන්සේ කීප වතාවක්ම ගමන් කර තිබෙන රටට ගිහින් බලන්න. තට්ටු නිවාස දස දහස් ගණන් තිබෙනවා. සමහර තැන්වල මිනිත්තු පහකට-දහයකට ගෙවල් තුන්සියයක් පමණ ඉදි වෙනවා. ඒ ගෙවල්වල එක කාමරයයි තිබෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පොඩි කුස්සියක්වත් නැහැ. කෑම කන කාමරයයි, කුස්සියයි දෙකම එකයි. ඒ ගෙවල්වල එහෙම. තත්ත්වයකුයි තිබෙන්නේ. ඒවා කුකුළු කොටු නොවේද කියා මම අහන්නට කැමතියි.

නිදහස ලබා ගත්තා පසුව, සාමාන්‍ය, දුප්පත්, එදා වේල කන්න නැති ජනතාව, ඉන්න පැල්පතෙන් වෙනත් මඟකට යොමු කර ඉඩමක් සහ ගෙයක් ලබා දුන් රජයක් තිබුණා නම් ඒ එක්සත් ජාතික පක්ෂයේ මේ රජය පමණයි. ඒකයි අපේ අගමැතිතුමාගේ වැඩ පිළිවෙළ. තමුන්නාන්සේලා ඒක නැති කරන්න තමයි, 'වීක් එන්ඩ්' පත්තරේත් හරි කොහෙන් හරි මොකක් හරි අහුලාගෙන ඇවිත් මෙන්න මෙහෙමයි වෙන්න යන්නේ කියා අපේ ඔළුවට දමන්නට බලන්නේ. ඇයි තමුන්නාන්සේලාට මතක නැද්ද පසුගිය කාලයේ ඔයිට වැඩිය කොච්චර ලොකු දේවල් සිදු වුණාද කැබිනට් ඇමතිවරු අතරේ? කථානායකතුමාත් සිටින වේලාවක මේ ගරු සභාව ඇතුළතදීම ඇමතිවරු ගහගත්තේ නැද්ද? මේ පාර්ලිමේන්තුව ඇතුළේ ලේ හලා ගත්තේ නැද්ද? මන්ත්‍රීවරුන්ගේ ඇඟට වමනය දැම්මේ නැද්ද? අගමැතිණියගේ ඇඟට වමනය දමන්න ගියේ නැද්ද? එංගොල්ලන්ව උස්සගෙන ගියේ නැද්ද? තමුන්නාන්සේලා බලා ගෙන සිටියා නේද? එහෙම විකාරයක්, විපිරියාසයක් අපේ රජය යටතේ මේ ගරු සභාවේදී වෙලා තිබෙනවාද? කවදාවත් වෙන්නේ නැහැ. දැනුත් ඔය සිටින හත් දෙනාට එකතු වෙලා ඉන්න බැහැනේ, දෙවියනේ! එක් කෙනෙක් කතා කරන්න නැගිට්ටොත් 'තමුන්නාන්සේට කතා කරන්න බලය නැහැ' කියනවා. 'අපේ පක්ෂයේ නායකයා මමයි' කියනවා. ඔය තත්ත්වය නේද තිබෙන්නේ? එසේ තබාගෙනත්, 'අසූ තුනේදී අපි එන්නම්' කියනවා. කලවානේ මන්ත්‍රීතුමාගේ පක්ෂයත් ඕකට මුක්කු ගහනවා.

කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) ගැන කල්පනා කරන විට මට එක වෙලාවකට දුකත් හිතෙනවා. මෙපමණ දක්ෂ නීතිඥයෙක්. හොඳට තරුණ භාවය තවමත් තිබෙනවා. මේ ඔක්කොමත් තිබෙද්දී තමුන්නාන්සේගේ ඔය කල්පනාව, රටට වැඩක් කරන පක්ෂයකට එකතු වී 'අපි වැඩක් කරමු' කියන්න පැටිච්චි නොකරන්නේ ඇයි? මොනාවාට කැගහනවාද? මොනාවාට අමාරුවේ වැටෙනවාද? තමුන්නාන්සේ දැන් සිටින පක්ෂය අවුරුදු හතළිහක් තිස්සේ කරලා, කරලා, අපි දණ ගාන කාලයේ ඇති කළ පාර්ලිමේන්තුවට අපි එන විට—ඇවිත් බලනකොට—අන්තිමේදී එංගොල්ලන්ගෙන් එක් කෙනෙක්වත් එතාන නැහැ. එවැනි තත්ත්වයක් ඇති වුණු පක්ෂයක තමුන්නාන්සේ තව අවුරුදු කීයක් ඉන්න යනවාද? තමුන්නාන්සේට මම ආරාධනා කරන්නේ මෙන්න මේකයි. මගේ පක්ෂයට තව එක් කෙනෙක් වැඩි කර ගන්න නොවෙයි. අපට එකසිය හතළිස් ගණනක් සිටිනවා. තමුන්නාන්සේට රටට වැඩක් කරන්න පුළුවන් මේ කාලයේ නිකම් කාලය අපතේ යවන්න එපා. මා කියන දෙය තමුන්නාන්සේට තේරෙන්නේ තව අවුරුදු 20 ක් පමණ ගියාට පසුවයි. එතකන් තේරෙන්නේ නැහැ. එදාට තමයි, හරිය කියා මේ පැත්තට එන්නේ. එතකන් බලාගෙන ඉන්න එපා. මොන නමින් හරි—එක්සත් ජාතික පක්ෂය නමින් හරි, කොමියුනිස්ට් පක්ෂය නමින් හරි වෙන නමකින් හරි—තමුන්නාන්සේලාට වුව මනා වැඩය අපි කරනවා නම්,—හොඳ වැඩක් අපි කරනවා නම්—ඒක තමයි සමාජවාදය කියන්නේ. තමුන්නාන්සේලාට ඕනෑ දුප්පත් මිනිසුන්ට ගෙවල් දෙන්න නම්, ඉඩම් දෙන්න නම්, අපි ඒක කරනවා නම්, ඕකට කොමියුනිස්ට් එක ගැවුනත්, එක්සත් ජාතික පක්ෂය ගැවුණත් මොකද? තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය මේ රටේ සිටින ඔක්කොම මිනිසුන්ට ඉඩම් දෙන්න නම්, ඒකත් අපි කරනවා නම්, කොයි පක්ෂයේ සිටියත් එකයි නේද වැඩේ කෙරෙනවා නම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට මෙන්න මේ කාරණයට තමුන්නාන්සේගේ අවධානය යොමු කරවන්නට මා කැමතියි. පසුගිය අවුරුදු ගණනාව තුළදීම මේ රටේ වැඩ වර්ජනයක් පටන් ගත්තා නම්, එය පටන් ගත්තේ කොහෙන්ද? කොළඹ හාබර් එකෙන්. එතැනින් තමයි පටන් ගත්තෙ. තිප්පොල එතැන තමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසිංහ මල්ලිමාරච්චි මහතා]

විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් පිළිගන්නට ඕනෑ අපේ වෙළඳ ඇමතිතුමාගේ පාලනය යටතේ එහි දියුණුව ඇති වී තිබෙන බව. කෝ අද වැඩ වර්ජනයක්? ලොකු වර්ජනයක් කළා වෙනත් තැන්වල. හුඟ දෙනකුට රක්ෂාව නැතුව මාස ගණනක් ඉන්න සිදු වුණා. සමහරුන්ට අවුරුද්දක් පමණ ඉන්න සිදු වුණා. ඇත් ඒ අයට රක්ෂා ලැබීගෙන යනවා. කෝ වර්ජනය කළාද මරාගේ කම්කරුවන්? අපි ඒ අයව අතින් අල්ලා ගත්තාද? වර්ජනය කරන්න එපා කියා අපි ගැහුවාද? හිරේ දැම්මාද? දඬුවමක් දුන්නාද? ගෙවල්වලට ගිහිල්ලා රැට කථා කළාද? අපි මොකුත් කළේ නැහැ. කොහොමද නැවතුනේ? ඔවුන් වැඩ කරන ප්‍රමාණය බලා ඒ අනුව පඩියක් දෙනවා. 'ඕවර් ටයිම්' අතිකාල දීමනා ඕනෑ නම් ඒවාත් දෙනවා. වෘත්තීය සමිති තිබෙනවා. නමුත් නාත්සේලගෙන් වෘත්තීය සමිතියක් තිබෙනවා. දැන් එය දියවෙලා ගිහිල්ලා, දෙසිය ගණනකට බැහැලා. මොකක්ද වෙනස? ඒ මිනිසුන් දුප්පත් වුණාට ඔවුන්ට තේරෙනවා අපි යම්කිසි වැඩක් කරනවා කියා.

මම කියන්නෙ නැහැ අපි කරන වැඩ සම්පූර්ණ කර ඉවරයි කියා. අපි සියයට සියයක් වැඩ කරලා ඉවර නැහැ. තවම වැඩ පටන් ගත්තා පමණයි. අපටත් අමාරුකම් තිබෙනවා වැඩ කරන්න. ඒ නිසා කවුරුවත් කියන තුරු ඉන්න ඕනෑ නැහැ. විරුද්ධ පක්ෂය කියනතුරු ඉන්න ඕනෑ නැහැ. අපි කැමැති නැද්ද දිගටම මේ රජය පවත්වාගෙන යන්න? අපි කැමැති නැද්ද දුප්පත් කෙනකුට ඉඩමක් දෙන්න? දුප්පත් කෙනෙකුට ගෙයක් දෙන්න? පඩි වැඩි කරන්න කවුරුවත් කියනතුරු ඉන්න ඕනෑද? කාගෙවත් පොතක්—මාක්ස්ගෙවත්, ලෙනින්ගෙවත් පොතක්—අපට ඕනෑ නැහැ. ඒවා කරන්න. අපට වැඩ කරන්න බුද්ධියක් ඕනෑකමක්, බලයක් තිබෙනවා.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

මාක්ස්ගේ පොත ඕනෑ උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමාටයි.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

ලැස්තියි.

වීරසිංහ මල්ලිමාරච්චි මහතා
(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)
(Mr. Weerasinghe Mallimaratchchi)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රී ලංකාවෙ පමණයි රජයේ සේවකයන් ආදායම් බද්දෙන් නිදහස් කර තිබෙන්නෙ. ගරු මුදල් ඇමතිතුමා ඊයෙ මාගේ කථාවේදී එය විස්තර කළා. ලෝකයේ තිබෙන රටක—(කොමියුනිස්ට් රටකවත්)— නැති තීරණයක් අප ගෙන තිබෙන්නේ, රජයේ සේවකයන් ආදායම් බද්දෙන් නිදහස් කිරීමෙන්. එසේ ආදායම් බද්දෙන් නිදහස් වූ රජයේ සේවකයන්ට මාසයට රුපියල් එකසිය හතළිහක් වැඩි වෙන විට වාසි දෙකක් එක වර ලැබෙනවා දෙපැත්තෙන්. අපේ රජය පටන්ගත් දා සිට අද වන තුරු රු. 332 ක් වැඩි කර තිබෙනවා මේ අවුරුදු හතරට. නමුත් එදා ආණ්ඩුව විශ්‍රාම වැටුපත් නැති කළා, රජයේ සේවකයන්ට. එහෙම නැති කරලා, එදා රෑම භුවන් විදුලියෙන් කිව්වා, පුවත්පත්වල පළ කළා එන්. එම්. පෙරේරා මහතා රජයේ සේවකයන්ට "'ප්‍රොවිඩන්ට් ෆන්ඩ්'' දෙනවා කියා. ඒ දවස්වල කම්කරු නායකයො කවුරුවත් හිටියෙ නැහැ, කෑ ගහන්න. මා හිතන්නෙ ඒ අයගේ කටවල්වල පැලැස්තර අලවා තිබෙන්නට ඇති. ඒ අය නිකම්ම හිටියා. කෝ කතා කළාද? කාටද මතක් වුණේ? කව්ද මතක් කළේ? ඒ කාලේ වුණත් මතක් කර ගන්නට වුවමනාවක් තිබුණේ නැහැ. මතක් කර ගැනීම අමතක කළා එදා.

නමුත් නාත්සේලා හුඟ දෙනෙක් සිතනවා—විරුද්ධ පක්ෂයේ වාමාංශික කොටසෙවල මන්ත්‍රීවරු සිතනවා—ඒ පක්ෂ නායකයෙන් හිතනවා මේ රටේ මිනිසුන්ට හුඟක් දේවල් අමතක වෙනවාය කියා. නමුත් ඔවුන්ට නොවෙයි අමතක වෙන්නෙ. ඔවුන්ට හොඳට මතක තිබෙනවා. දුප්පත්, පොඩි මිනිසුන්ට, අහිංසක,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අසරණ මිනිසුන්ට මතක තිබෙනවා. මේවා අමතක වෙන්නෙ විශේෂයෙන්ම වාමාංශික නායකයින්ටයි, කාලයෙන් කාලයට. ඒක තමයි වරද? එසේ අමතක වුණු නිසා තමයි, මේ රටේ දුප්පත් ජනතාව අවුරුදු තිහක් යන කොට නිසි පාඩම් උගන්වන්න පුළුවන් තත්ත්වයකට ඇවිත් තිබෙන්නෙ. 'උඹලා එකෙක්වත් පාර්ලිමේන්තුවට එන්න එපා, උඹලාගෙන් වැඩක් නැහැ. ගෙදර පලයල්ලා, ගිහින් සුවසේ නිදා ගනිල්ලා' කියන තත්ත්වයකට තීන්දුවක් දුන්නෙ. ඒකෙන් පාඩමක් ඉගෙන ගන්න සමහර උදවියට තව මත් බැරිවෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැඩි වන ජීවන වියදමට වැඩි කළ මුදල් ප්‍රමාණය, ප්‍රමාණවත් වෙනවාය කියා මම කියන්නේ නැහැ. රුපියල් 107 ක් නොවෙයි 207 ක් වුණත් දෙන්න පුළුවන් නම් කමක් නැහැ. නමුත් එහෙම දෙන්න ක්‍රමයක් තිබෙනවාද කියා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු කල්පනා කර බලන්න ඕනෑ. අපට වෙනත් සම්පතක් නැහැ. තෙල් එන්නෙත් නැහැ. නමුත් මැතිණියගෙ පසුගිය රජය කාලයෙ කොලොන්නාවට ගිහින් ක්විත්ක් කුප්පියකට තෙල් දමා ගෙන ඇවිත් දේසාලෙන් තෙල් ගෙනාවා යයි කිව්වා. පත්‍රය පවා පින්තූරයත් සමග මේ ප්‍රවෘත්තිය දමා තිබුණා. අන්තිමේදී තෙලුත් නැහැ, කුප්පියත් නැහැ, මොකක්වත් නැහැ. ඔන්න ඔය විධියෙ තත්ත්වයකුයි තිබුණේ. අපි එහෙම කළේ නැහැ. සරන්නෙත් නැහැ. අපිට බොරු කියන්න ඕනෑ කමක් නැති බව විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියනවා. 1948 අප රටට නිදහස ලබා ගත් දා සිට මේ වනතුරු ඇත්ත කතා කළ රජයක් තිබුණා නම්, වැඩියෙන් ම ඇත්ත කිව් රජය තමයි අපේ රජය.

විරුද්ධ පක්ෂයේ නමුන් නානා සේලා අවබෝධ කර ගන්න ඕනෑ, බොරු කීමෙන් ප්‍රයෝජනයක් වෙන්නෙ නැති බව. ඒ නිසා තමයි, ලෝකයේ කොයි රටකින් හෝ ණයක් ගත්තා නම් එසෙ ගත්තාය කියා අපි එළිදරව් කරන්නෙ. අපි ඒ ණය ගෙවනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රජා උරුමය අහිමි කිරීමේ බණ්ඩාර

නායක මැතිණිය කියා තිබෙනවා— අද පත්‍රයක පළ වී තිබෙනවා—මේ අය වැය ලේඛනය ක්‍රියාත්මක කිරීමේ දී අමාරුකම් පැන නගිනවාය, එම නිසා කොයි මොහොතේ හෝ මැතිවරණයක් ඇති වෙනවාය කියන බලාපොරොත්තුවෙන් සිටින්නටය කියා. ඒ බලාපොරොත්තුව හැමදාම තබා ගන්නවා නම් තමයි හොඳ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු සිටියා නම් මට කියා දෙන්න තිබුණා. මේ බලාපොරොත්තුව මොකක්ද කියා. ඇත්තෙන් ම ඒ ගොල්ලන්ට වුවමනා කර තිබෙන්නෙ රටට වැඩ කරන්න නොවෙයි. මිනිසුන්ට ගෙවල් දෙන්න නොවෙයි, මිනිසුන්ට ඉඩම් දෙන්න නොවෙයි, රජයේ සේවකයන්ගෙ පඩි වැඩි කරන්න නොවෙයි, මිනිසුන්ට හොඳ ආහාර වේලක් දෙන්න නොවෙයි, පාර්ලිමේන්තුවට එන්නටයි. මෙන්න මේකයි අද ඕනෑවී තිබෙන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජීවන වියදම ගැන කල්පනා කරන විට රජයේ සේවකයන් ඉතාම අසරණ අසීංසක තත්ත්වයට වැටී සිටි බව අප දන්නවා. ජීවන අංකය අනුව රුපියල් දෙක බැගින් ඉදිරියට ලැබෙනවා. එපමණක් නොවෙයි, මේ රජය හතර වතාවක දී රුපියල් 332 කින් පඩි වැඩි කර තිබෙනවා. අනාගතයේදී තවත් වැඩි කිරීමට මුදල් ඇමතිතුමා ක්‍රියා කරයි. එසේ වුණත් අපේ රජයේ සේවකයන් තේරුම් ගත යුතු කාරණයක් තිබෙනවා. අප මේ ඔක්කොම කරන්නෙ විශාල මුදල් ප්‍රමාණයක් පිට රටින් ආධාර වශයෙන් ලබා ගෙනයි. එහෙම ණය ගන්න කොට, මේ රජය ගෙන යන්නෙ අනාගත පරම්පරා ගණනාවක් ණය කරලාය කියලා විරුද්ධ පක්ෂය කියනවා. නමුත් එහෙම කියන්නෙ හරියට සිරිමා බණ්ඩාරනායකගේ ලාච්චුව ඇරලා එයා ගෙවනව වාගෙයි, එයා ගෙවන්න බලාපොරොත්තු වෙනවා වාගෙයි. අපි ආධාර ලබාගෙන තිබෙනවා. නමුත් ඒ ආධාර කවදාවත් අපතේ යවලා නැහැ. සාමාන්‍ය ප්‍රමාණයට මේ රටේ කරන හැම වැඩකදීම කිසියම් නාස්තියක් සිදුවන බව ඇත්ත. මම ඒක නැතැයි කියන්නෙ නැහැ. නමුත් අපි ඕනෑකමින්ම අපතේ යවලා නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසිංහ මල්ලිමාරච්චි මහතා]

යම් යම් කටයුතු කර ගෙන යන කොට සමහර තැන්වලදී අපතේ යාම් ඇති වන්නට පුළුවනි. ඒක බොරුවක් යයි කියන්න බැහැ. නමුත් මොන රජයෙන්ද ඒක නැති කළේ ? කොයි රජය තිබුණත් ඒක සම්පූර්ණයෙන්ම නැති කර දමන්න අමාරුයි. ඒක නැති කර දමන්න නම් කවුරුත් විනය ගරුකව ක්‍රියා කරන්න ඕනෑ. නාස්තිය, දූෂණය නැති කරන්න නම්, විනය ගරුක පිරිසක් ඇති කරන්න නම් රටේ පළමුවෙන්ම සාමය—සමාදානය තිබෙන්න ඕනෑ. ජාතීන් අතර සහෝදරත්වය--එකමුතුකම තිබෙන්න ඕනෑ. එහෙනම් මම විරුද්ධ පක්ෂයෙන් අහනවා—ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්, කොමියුනිස්ට් පක්ෂයෙන්, සමසමාජ පක්ෂයෙන් අහනවා— එම සහෝදරත්වය ඇති කරන්න තමුන්නාන්සේලා ගෙන් දපට දුන් රුකුල මොකක්ද කියා. විරුද්ධ පක්ෂයේ තමුන්නාන්සේලා ක්‍රියා කරන හැටි හිතන කොට මට වෙලාවක හිතෙනවා, මේ පාර්ලිමේන්තු ක්‍රමය මොන පිස්සු වැඩක්ද කියල. අපි ගෙනෙන ඕනෑම හොඳ යෝජනාවකට වුණත් ඒ ගොල්ලන් විරුද්ධයි. අපි ආහාර වේලක් නිකම් දෙන්නම් කිව්වොත් රත්තරන් පවුමකුත්, කෝපි කෝප්පයකුත් එක්ක ඒක දුන්නොත් හොඳයි කියල ඒ අය කියයි.

මොනවා දුන්නත් හොඳ නැහැ. අපි මොන හොඳ ක්‍රම ගෙනාවත් හරි නැහැ. මොන හොඳ යෝජනාවක් ගෙනාවත් අනික් පැත්තටයි, අත උස්සන්නේ. එහෙනම් මොකක්ද මේ ක්‍රමය? අපි 1948 සිට හැමදාම කථා කර තිබෙනවා. දෙපැත්තට බෙදී වාද කර තිබෙනවා. මොකක්ද වාද කිරීමෙන් ඇති ඵලය? මොකක්ද වේදිකාවලට ඇවිත් කෑගැසීමෙන් ඇති ඵලය, හොඳ වැඩක් කරන විට එය කඩාකප්පල් කරනවා නම් කියා මා අහන්න කැමතියි. මොකක් හරි වරදක් තිබෙන්න පුළුවන්. මට හිතෙන විධියට මේ ක්‍රමය තමයි, සමසමාජ පක්ෂයට සහ කොමියුනිස්ට් පක්ෂයට ඇති ඉතාම හොඳ ක්‍රමය. මොකද ඒ ගොල්ල කැමති හැමදාම බොරුවට කෑගහ ගහ විරුද්ධ පක්ෂයට ඉන්න ඕනෑකමයි.

එතකොට මහජනයාට කියන්න පුළුවන් "අපි තමුසෙලා වෙනුවෙන් කථා කරන්නේ, එහෙත් කරන්න බැහැ ධනපතියො හින්දා, ධනපතියො ඉඩ දෙන්නේ නැහැ" කියා.

අපේ ගොවිකම් ඇමතිතුමා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළා. අපි රජය බාර ගන්නා විට ගොවිතැන අතින් මේ රටේ තිබුණු තත්ත්වය මොකක්ද කියා. වී ගොවිතැන කොයි තත්ත්වයට බැස තිබුණාද කියා කල වානේ ගරු මන්ත්‍රීතුමාගෙන් (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) මා අහන්න කැමතියි. මොන තත්ත්වයේද තිබුණේ? හැම තැනම පෝලිමක් තිබුණා. මා මේ කියන කොටස පරණ වෙන්න පුළුවන්. ඒ හින්දා තමයි, අපට බලය දුන්නේ කියන එකත් මා පිළිගන්නවා. කලින් සිටි අය හොඳ නැති හින්දා, ඒ අයට කරන්න බැරි වූ හින්දා, තමයි අපට බලය දුන්නෙත්. එහෙත් ඊට පසුව 1977 සිට අද වන තුරු මේ රටේ ජනගහනය කොපමණ වැඩි වුණාද? එසේ වැඩි වූ එක මිනිහෙක් වත් බඩගින්නේ හිටියද? නැහැ. හාල් නැහැ කියා ඉඳලා තිබෙනවාද? එහෙත් හැත්තෑ ගණන්වල අපි කොතරම් බිය කින්ද මේ රටේ ජීවත් වුණේ? මේ සහෝදරවරුන් එය තේරුණේ නැහැ. හාල් ආවේ නැත්නම්, ඊළඟ මාසයේ නැව ආවේ නැත්නම්, බඩගින්නේ ඉන්න වෙයි කියා බලා ගෙනයි සිටියේ. එක වරක් මතකද හාල් ප්‍රමාද වෙලා ආර්. ජී. සේනානායක ඇමතිතුමා චීනයට යැව්වා? ගිහින් එන විට චීන හාලුත් අරගෙන හැරම්පියකුත් අරගෙනයි ආවේ. එවැනි තත්ත්වයක් නේද තිබුණේ?

අද හාල් ටොන් 80,000 ක් පමණයි, ගෙන්වන්නට බලාපොරොත්තු වන්නේ. ඒකත් ගෙන්වන්නේ වුවමනා වුණොත් පමණයි. "වුවමනා වුණොත් පමණක්" කියන වචනත් එයට අඩංගු කර තිබෙනවා. එහෙම නම් මේ අමාරු අඩියේ ඉඳගෙන, පිට රටින් ආධාර අරගෙන, අපේ හිතවත් ජාතීන්ගෙන් ආධාර අරගෙන, කොතරම් වැඩ කොටසක් කර තිබෙනවාද? කොතරම් දියුණු තත්ත්වයකට ඇවිත් තිබෙනවාද? එහෙනම් විරුද්ධ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පක්ෂයට තිබෙන්නේ අපට ආධාර කරන්නයි; මේ කර තිබෙන වැඩ කොටස හොඳයි තවත් කරන්න කියා වචනයක් හෝ කථා කරන්නයි. එහෙත් පටන් ගත් හැටියේම ඒ අය කියන්නේ මොකක්ද? "මොකක්ද මේ වැඩේ? මොන වාද මේ කර තිබෙන්නේ? ඉන්න වකො අපි අසූතුනේ දෙන්" නම් කො." හරියට ඒ වැඩේ තිබෙන්නේ ඒ අයගේ අතේ වගේ කථා කරන්නේ. අපි ජනතාවත් සමග සම්බන්ධ වී වැඩ කරන්නේ නැහැයි කියන්නේ පැත්තකට වී නිකම් ඉන්නා අයයි. ඒ ගොල්ලන්ගේ ගෙදර ගෝරි බේරා ගන්න ඒ අයට බැහැ. ඒ ගොල්ල උසාවියේ ඉඳගෙනයි, අපට මෙහෙම කෑ ගහන්නේ.

මා කලවානේ ගරු මන්ත්‍රීතුමාට මිත්‍රයෙක් වශයෙන් ගෞරවයෙන් ආරාධනා කරනවා ලංකාවේ තිබෙන ඕනෑම ආසනයකට යන්න. ලංකාවේ තිබෙන සෑම ඡන්ද කොට්ඨාශයකම 1977 සිට අද වන විට විශාල පරිවර්තනයක් වෙලා තිබෙනවා; විශාල වෙනසක් ඇති වී තිබෙනවා. වෙනසක් පමණක් නොවෙයි 1948 න් පසුව බලයට පත් වූ මන්ත්‍රීවරු මහජනතාවත් සමග වැඩිම වශයෙන් ගැටසුණා නම් මහජනතාවත් සමග එකට සිටියා නම්, එසේ සිට ඇත්තේ 1977 සිට අද වන තුරුයි කියාත් මේ ගරු සභාවේදී කියන්නට මට පුළුවන්. එය නැහැ කියන්න බැහැ. කොපමණ අමාරුකම් තිබුණත්, කොපමණ මුදල් අමාරුකම් තිබුණත්, අපි වේගයෙන් ගමන් කර තිබෙනවා. අපේ ඇමතිවරු, මොන ප්‍රශ්න තිබුණත් මොන දුක් කරදර තිබුණත් මොන අමාරුකම් තිබුණත් මහජනයාගේ සුවසෙත පිණිස ගමන් කර තිබෙනවා; දුප්පත් මිනිසාගේ ඕනෑඑපාකම් ගැන ඇහුම්කන් දී තිබෙනවා.

අපි සියයට සියයක් කරලා නැහ. එහෙම කරන්න මොන රජයකටවත් පුළුවන්කමක් නැහැ. විරුද්ධ පක්ෂයේ නායකයින්ය කියා පිළිගත් ආචාර්ය එන්. එම්. පෙරේරා, පීටර් කෙනමන්, දොස්තර වික්‍රමසිංහ, අපේ කලවානේ ගරු මන්ත්‍රීතුමාගේ මාමණ්ඩිය වන ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා ආදී ප්‍රධාන පෙළේ නායකයින් ඉඳලත්—තුන් දෙනෙක් කැබිනට් මණ්ඩලයේ ඉඳලත්—විසඳන්නට බැරි වූ ප්‍රශ්න, ඒ අය ඇහුම්කන් නොදුන් ප්‍රශ්න, අපි විසඳා තිබෙනවා. සමහර අවස්ථාවල අපි තදින් ක්‍රියා කරන්නට ඇති. අපි තදින් සිටියා නම් ඒ මේ රටේ මහජනයා අතර සමගිය ආරක්ෂා කිරීමටයි. මේ රටේ මහජනයා ආරක්ෂා කරන්ට ඕනෑ නිසයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජයක් එහෙම 1977 දී මේ රටේ ඇති වුණා නම් අපට අද මෙහෙම කථා කරන්න අවස්ථාවක් ලැබෙයිද? අපට කියන්නේ මහජනයාට. මහජනයාට පාරේ කථා කරන්ට අවස්ථාවක් ලැබෙයිද? පෝස්ටරයක් අලවන්න අවස්ථාවක් තියෙයිද? අද මේ රටේ තිබෙන්නා වගේ පත්‍ර නිදහසක් තියෙයිද?

අපි ලේ මාස තුනේ හදිසි නීතිය පවත්වා ගෙන ගියාය කියල තමුන්නාන්සේලා කොච්චර උඩ පැන්නාවද? සමහර පත්‍රකාරයො කොච්චර උඩ පැන්නාවද? මැතිනිය පටන් ගත්තෙත් හදිසි නීතියෙන්, අවසන් වුණෙත් හදිසි නීතියෙන්. එපමණක් නොවෙයි, වාමාංශික නායකයොත් තියා ගෙන හදිසි නීතිය කොයිතරම් කල් ගෙන ගියාද? කවුද, කථා කළේ? කවුද එදා ඇහුවේ? අපි මේ මාස තුනේ, හැම මාසෙම පාර්ලිමේන්තුවට ඇවිල්ලා යෝජනාවක් සම්මත කරගෙන තමයි, හදිසි නීතිය පවත්වා ගෙන ගියේ. මහජනයා අතර කලබල ඇති වීම වළක්වන්නටයි අපි ඒක කරන්නෙ. කොයි පැත්තෙත් තිබෙන දුර්වලකම් නිසා කලබල ඇති වෙන්න පුළුවන් නිසයි. අපේ රජය කොයිතරම් බුද්ධිමත්ව කල් පනා කර තියෙනවද? මේ රටේ නිදහස ලබා ගැනීමෙන් පසුව අපේ ජනාධිපතිතුමා තරම් ඉවසූ නායකයෙක් නවත් නැහැ, යම් යම් ප්‍රශ්නවලදී.

අපේ අගමැතිතුමාත්, ජනාධිපතිතුමාත් මේ යන ගමන ගැන හුඟ දෙනෙකුට රුදාවක් ඇති වී තියෙනවා. ඒකත් මම මේ සභාවේදී මතක් කරන්ට ඕනෑ. බොහොම ලොකු කැක්කුමක් බොහොම ලොකු අමාරුවක් හැදිල තියෙනවා. මේ නායකයන් දෙදෙනා එකට ගමන් කරන තාක් කල් අපේ වැඩ පිළිවෙළ කඩාකප්පල් කරන්න බැහැ බව දන්න නිසයි ඒ අමාරුව ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසිංහ මල්ලිමාරච්චි මහතා]

වී තිබෙන්නෙ. සමහර පත්‍රකාරයන්ටත් අළුතක ඉඳල කුලප්පුවක් හැදිල තියෙනවා. සල්ලි තියෙන හින්ද කොල කෑල්ලක් මුද්‍රණය කරල එළියට දානවා. ඒ ගොල්ලො හිතන්නේ 'අපි තමයි නියම ප්‍රවෘත්ති පත්‍ර කලාවේදීන්; අපි තමයි මේ රට පාලනය කරන්නෙ' කියලයි. මේ අතර තමන්ගේ රාජකාරිය හොඳට කරන ප්‍රවෘත්ති පත්‍රත් තියෙනවා. හොඳට කුඹුරක් හාමින් ඉන්න කොට කොහේ හරි ඉඳල මී හරකෙක් ඒ කුඹුරට කඩා පැනල ඇනගෙන ඇනගෙන යන්න වගේ හෙද පත්‍ර අතරට පැනල පත්‍ර පවත්වාගෙන යන්න සමහරු බලාපොරොත්තු වෙනවා. මොන විකාරද මේ? මේවාට තමයි 'නියම පිස්සු' කියන්නෙ. මුදල් වැඩිපුර තියෙනවා නම් පිනක් දහමක් කරගෙන යහතින් කල් ගෙවන එක වඩා හොඳයි. 'බැරි වැඩ නොකරන්, අබරෝ' කියා කතාවක් තියෙනවා. ඒ නිසා බැරි වැඩ පටන් ගන්න එපා යයි මම ඒ මිනිසුන්ට කියන්නට කැමතියි. මුදල් තිබුණු පලියට නිකම් හැප්පෙන්න එන්න එපා යයි මම කියන්නට කැමතියි.

අපේ රජය භේද භින්න කරන්න එපා. ඒවාට ඉඩ දෙන්නෙ නැහැ. අපේ පසුපෙළත්, දුප්පත් අහිංසක මහජනතාව වෙනුවෙන් කැපවීමකින් ඇවිත් සිටින අනික් මන්ත්‍රීවරුන් කවදාවත් අපේ රජය කැඩෙන්න ඉඩ දෙන්නෙ නැහැ. කාටවත් කඩන්න ඉඩ දෙන්නෙත් නැහැ. අපි අවංකව අදී සිටින පිරිසක්. අපේ අමාරුකම් ගැන අපේ කණ්ඩායමේදී කරන කථා, අපේ ඇමතිවරුන් අමතා අපි කරන කථා දන්නෙ අපියි. විරුද්ධ පාර්ශ්වය ඒවා දන්නෙ නැතිව ඇති. ඒ ගොල්ලන්ට පුළුවන්, ඔත්තු සේවයකින් ගෙනෙනවා වගේ මොනව හරි ලියාගෙන ඇවිත් කියවන්න විතරයි. අපේ වාද භේද ගැන, අපි යන මේ ගමන ගැන කථා කරනවාට වඩා හොඳයි, ඒ අය තමතමන්ගේ අඩුපාඩුකම් හදා ගන්න එක.

ආඩි හත් දෙනාගේ කැඳ හැළිය වගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් තුන් දෙනෙක් එක පැත්තක. තව තුන් දෙනෙක් අනික් පැත්තෙ. ඒ අය කලබල කරගෙන උසාවි ගිහින්. ඒ අස්සෙ එක් කෙනෙක් මැද්දෙ ඉඳගෙන 'වාසි පිළට හෝයියා' කියන්න බලාගෙන ඉන්නවා. මේවා කතා කරනවාට වඩා හොඳයි අපි මේ යන ගමනට ටිකක් ආධාර කළොත්. එහෙම නම් මිනිස්සු ටිකක් අනුකම්පා කරයි. උසාවි යන මිනිස්සු කොහොමද, මේ වගේ ප්‍රබල රජයකට අවවාද අනුශාසනා කරන්නෙ? මම මීට වඩා කථා කරන්නට අදහස් කරන්නෙ නැහැ. මට මේ අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**ඇල්බට් ද සිල්වා මහතා** (කඹුරුපිටිය)
*(திரு. அல்பட் த சில்வா—கம்புறுப்பிட்டிய)*
(Mr. Albert de Silva—Kamburupitiya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ජේ. ආර්. ජයවර්ධන ජනාධිපති උතුමාණන් වහන්සේ එක්සත් ජාතික පක්ෂ රජයේ පස් වෙනි අයවැය යෝජනා ගරු මුදල් ඇමතිතුමා විසින් පසුගිය දා ඉදිරිපත් කරන්න යෙදුණා. සන්තෝෂයි කියන්න, මම මේ අයවැය යෝජනා ගැන මගේ ආසනයේ කීප දෙනෙක් සමග සාකච්ඡා කළා.

**ආර්. ප්‍රේමදාස මහතා (අග්‍රාමාත්‍යතුමා, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා, මහාමාර්ග කටයුතු පිළිබඳ ඇමතිතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
*(திரு. ஆர். பிரேமதாச—பிரதம அமைச்சரும் உள்ளூராட்சி, வீடமைப்பு, நிர்மாண அமைச்சரும் பெருவீதிகள் அமைச்சரும், பாராளுமன்றச் சபை முதல்வரும்)*
(Mr. R. Premadasa—Prime Minister, Minister of Local Government, Housing & Construction, Minister of Highways and Leader of the House of Parliament)

කෙසි ආසනයේද?

**ඇල්බට් ද සිල්වා මහතා**
*(திரு. அல்பட் த சில்வா)*
(Mr. Albert de Silva)

දෙපළේම. ඒ මහත්වරු කිසිසේත් අසතුටු වීමක් නැහැ. සන්තෝෂයට පත් වී සිටිනවා. විශේෂයෙන් රජයේ සේවක මහත්වරුන් කීප පළක් මට කිව්වා, බඩු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මිල ටිකක් ඉහළ ගියත්, මේ රජය ඉතාමත් අමාරු තත්ත්වයක ඉඳගෙන හෝ රු. 107 ක දීමනාවක් ලබා දීමට ක්‍රියා කිරීම ගැන තමන්ගේ කැමැත්ත හා සතුට ප්‍රකාශ කරනවාය කියා. කොමියුනිස්ට් පක්ෂයට සම්බන්ධ සේවක මහත්මයෙකුත් මට කිව්වෙ ඒ විධියටමයි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අවුරුදු 7 ක ආණ්ඩු කාලයක් තුළදී, සේවකයන්ට වැඩි වීමක් කෙළේ එක වතාවක් පමණය, එය රු. 60 ක දීමනාවක් දීමය කියා ඒ උදවිය මට කිව්වා. ඒ පිළිබඳව එදා සමහර සේවකයන් විරුද්ධ වූ වෙලාවෙ එවකට සිටි දිවංගත එන්. එම්. පෙරේරා මුදල් ඇමතිතුමා කිව්වාලු, පටි තද කර ගන්නය කියා. නමුත් අපේ රජය එසේ නොවෙයි. අපේ මේ ගරු මුදල් ඇමතිතුමා මාස ගණනක් තිස්සේ අපේ දුප්පත් ජනතාව ගැන, රජයේ සේවකයන් ගැන, සංස්ථා සේවකයන් ගැන කල්පනා කර සාධාරණ අය වැයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා අපි සන්තෝෂ වෙන්න ඕනෑ, මෙවැනි අමාරු දුප්පත් අවස්ථාවක මේ විධියේ ඉතාමත් හොඳ අයවැයක් ඉදිරිපත් කිරීම ගැන.

ගම්පහ ගරු මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මහතා) එතුමාගේ කථාවේදී කිව්වා, මේ රටේ සියයට 97 ක් මන්දපෝෂණයෙන් පෙළෙනවාය කියා. මම දන්නෙ නැහැ, එතුමා එය කිව්වෙ පසුගිය අවුරුදු හතේ කාල සීමාව ගැනද කියා. අපි දන්නවා අද බඩු මිල වැඩි වුණත්, පුද්ගල ආදායම වැඩි වී තිබෙනවාය කියා. විශේෂයෙන් කඹුරුපිටිය ආසනය සම්බන්ධයෙන් බලන විට පසුගිය මාසය වන තුරු ඒ ප්‍රදේශයේ අක්කර 4,100 පමණ කුඹුරු පාළු වී තිබුණා. එවකට කඹුරුපිටිය මන්ත්‍රීවරයාව සිටි කොමියුනිස්ට් පක්ෂයේ දිවංගත දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ මහතා මේ පිළිබඳව උනන්දුවක් දක්වා තිබුණත්, අවුරුදු 30 ක් තිස්සේම ඒ පාළුවීම වළක්වා ගන්න බැරි වුණා. එසේ වුණේ, මේ නිල්වලා ගඟේ අත්තක් කඹුරුපිටිය ආසනය මැදින් මාතර දිස්ත්‍රික්කයට ගලා යාමෙන් ඇති වූ ප්‍රතිඵල නිසයි. ඒ ප්‍රදේශයේ ගොවි මහත්වරුන් මට කිව්වා—මම පිට ගමක මිනිහෙක් නිසා මම මේක කරාවි කියා ඒ ගොල්ලො හිතුවෙ නැහැ—අනේ මේක කර දෙන්න පුළුවන් නම් ඉතාමත් විශාල සේවයක් සැලසෙනවාය කියා. මම මේ පිළිබඳව ඉඩම් සංවර්ධන ඇමතිතුමාට කරුණු දැක්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් නොයෙකුත් විශාල යන්ත්‍රසූත්‍ර යොදවා ලක්ෂ 50 ක් පමණ වියදම් කර ඒ ගඟ හරවා ඇනිකට් 5 ක් බැඳ සංවර්ධන යෝජනා ක්‍රමයක් ආරම්භ කළා. පසුගිය මාසයේ ඒවා සියල්ලම විවෘත කර දැන් ඒ කුඹුරු අක්කර 4,100 ම පාළු නොවන විධියට දෙකන්නයම වැඩ කරන්න පුළුවන් වී තිබෙනවා. දකුණු පළාතේ කඹුරුපිටිය ආසනයේ තමයි, අක්කරයකට වී බුසල් 83 ක් නිෂ්පාදනය කර වාර්තාවක් ලබා ගෙන තිබෙන්නෙ. ඒ වාගෙම අපි බලාපොරොත්තු වෙනවා, මේ අක්කර 4,100 සංවර්ධනය කිරීමෙන් අක්කරයකට බුසල් 10 බැගින් නිෂ්පාදනය කළත්, එක් කන්නයකට වී බුසල් 41,000 ගණනේ දෙකන්නයට වී බුසල් 82,000 ක් ලබා ගැනීමට පුළුවන් වේවිය කියා. අප වාගේ පුංචි මන්ත්‍රීවරු ඇමතිතුමන්ලාගේ ආධාර උපකාර ලබා ගෙන මුදල් වියදම් කර මේ වාගේ යෝධ ව්‍යාපාර කිරීම ගැන ඇත්තවශයෙන්ම සන්තෝෂ වෙන්න ඕනෑ. ඒ අනුව අපි හිතනවා 1982 වන විට අපට පිට රටින් හාල් ගෙන්වන්න ඕනෑ නැත කියා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය මොනවාද කියන්නේ? ඒ කාලයේදී මොනවද උනේ? හාල් සේරු දෙකක් ගෙනියන්න දුන්නේ නෑ, පොල්ල දාලා හරස් කළා. මිරිස් සත 95 ට ගෙනත් රුපියල් 40 ට වික්කා. මාත් අනේ, පාන් ! ගෙඩියක් ගන්න සමූපකාරෙ පෝලිමේ ගියා, කාඩ් එකක් අරන්. දොරකඩට යනකොටම හරියට පහට ඉවරයි කිව්වා. මොකක් කරන්නද? හැරිල ආවා. කන්නයැ? කාඩ් එකට අවුන්ස බාගයයි දුන්නෙ, හීන් ! දුරු; කොත්තමල්ලිත් එහෙමයි. සමූපකාරෙ මැනේජර් එක්ක යාළු වෙලා හිටිය නම් පස්ස දොරෙන් මොනව හරි හම්බ වෙනවා. රෙදි පිළි නෑ. ඉතින්, මේ විධියට දුකෙන් හිටපු ජනතාව නියම උත්තරය දුන්න, 1977 දී. මට පුදුම මේගොල්ලන්ට ආසන හතක් ආපු එක ගැනයි. සමහර ආසන ඩබල් හීන්ද ආවා.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇල්බට් ද සිල්වා මහතා]

ජීවන වියදම අඩු කරන්න ඒ ආණ්ඩුව මොනවද කළේ? දහස් ගණන් තරුණ තරුණියන් අමු අමුවේ කපා දැම්මා. එතකොට ආහාර ඕන නැහැනේ. නමුත් අපේ රජය යටතේ දැන් ආහාර ඕනෑ තරම් තිබෙනවා. දැන් දවසකට දරුවන් 900ක් උපදිනවා. කිරි ආහාර තීරු ගාස්තුවෙන් නිදහස් කළා. [බාධ කිරීමක්] අපට බව නවත්වන්න ඇහැකිද? ආහාර තත්ත්වය දැන් හොඳයි.

දැන් බලන්න, සෞඛ්‍යය ගැන. පසු ගිය ආණ්ඩු කාලයේදී සත 25 මුද්දරය නැතුව බේත් ගන්න බැහැ, ඉස්පිරි තාලෙන්. ඒ කාලයේදී දුප්පත් මිනිහාවයි, තැලුවේ. දැන් අපේ රජයට හැමදෙනාම ප්‍රසංශා කරනවා. 1983 දීත් අපි එනවා. ගලන ගඟක් වාගේ අපි එනවා. ඒක නතර කරන්න බෑ, කාටවත්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය ආය කවදාවත් එන්නේ නැහැ. ඒවා හිතෙන් අස් කරගන්න. ආයෙත් ඒගොල්ල ආවොත් ඉවරයි. කොල්ලො කෙල්ලො ටික මරා දමාවි. ඒ ගොල්ල අපේ රත්තරන් වාගේ තරුණ තරුණියන් මරා දැම්ම. ගෑනු ළමයයි පිරිමි ළමයයි කකුල් දෙකෙන් එකට බැඳල ගිං ගඟේ මිනී පාවෙ නවා මම දැක්කා. අඩල්ලේ සොහොනේ එක පෙළට තියා තරුණයන්ට වෙඩි තිබ්බා. දැක්ක අයගේ ඇස් දෙකෙන් කඳුලු ගලනවා. ඒ මිනී වළලන්න වළ කැපූ මිනිහත් කලන්තෙ දමා වැටුණා. පසුවදා ඒ මිනිහාත් මැරුණා. ඔය විධියටයි, ඒ ආණ්ඩුව වැඩ කළේ.

අපි කොච්චර හොඳ අය වැය යෝජනා ගෙනාවත් මේ උදවිය ඒවාට හොඳයි කිය න්න නැහැ. පඩිවැඩිකල එකවත් හොඳයි කියන්න ඕනැනේ. අපේ හැම දේටම විරුද්ධ වෙලා අරක හොඳ නෑ, මේක හොඳ නෑ කියනවා. ඒ ආණ්ඩුව කීයද පඩි වැඩි කළේ? අපේ ආණ්ඩුව රු. 70 ක් දුන්නා, 1000 ක් දුන්නා, 107 ක් දුන්නා. හතර පාරක් පඩි වැඩි කරලා තිබෙනවා. ඊළඟට, බඩු දැන් ඕනෑ තරම් තියෙනවා. මම වෙළෙන්දෙක් එක්ක කතා කළා. සියයට 5 ක පිරිවැටුම් බද්දක් වැඩි වුණාට ඒක අපිට ඒ තරම් දෙයක් නෙමෙයි, අපි ඒක දුප්පත් මිනිහාගේ පිට දාන්නේ නැහැයි එයා මට කිව්වා. මේ වාගේ ඉතා හොඳ අය වැයක් මුදල් ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙනවා. මේක ගිය වර අය වැයටත් වැඩිය හොඳයි. බඩු තිබෙනවා. කවදත් බඩු නගිනවා. ඒක නතර කරන්න බැහැ. ඒව ගේම පඩිත් නගිනවා. දැන් මේසන් කෙනෙකුට කීයද? වඩු මහත්මයකුට කීයද? කම්කරුවකුට කීයද? ඒ නිසා මේක හොඳම අය වැයක් හැටියට මට කියන්න පුළුවන්.

මේ රටේ ඉතාම ඉහළ ධනපතියන් ස්වල්ප දෙනෙක් ඉන්නවා. අපේ ගරු මුදල් ඇමතිතුමා ඒ අයට ඕංගක් රිදෙව්වා. වෙළඳ දැන්වීම්වලින් බද්දක් අය කිරීම ගැන මම මුදල් ඇමතිතුමාට ප්‍රසංශා කරනවා. වෙළඳ දැන්වීම් නිසා වැඩිපුර බඩු විකිණෙනවා. ඒ නිසා වෙළඳ දැන්වීම් වලින් බද්දක් අය කිරීම සාධාරණයි. මා නියෝජනය කරන කඹුරුපිටිය ආසනය වාමාංශික ආසනයක්. මම හිතන්නේ ඊලියන් නානායක්කාර මහත්මයා තමයි, ගිය වතාවේ කාලයේ මෙම ආසනයේ මන්ත්‍රීවරයා වශයෙන් හිටියෙ. මම යන කොට ඒ පාරවල්වලවත් යන්න බැහැ. කිසිම දෙයක් කරල නැහැ. මිනිස්සු රවට්ල පමණයි. අද නමුත් නාන් සේලා ගිහින් බලන්න, මම පිට ගමක කෙනෙක් වුණත් කර තිබෙන වැඩ ටික. මම විශේෂයෙන්ම අගමැතිතුමාට ස්තුති වන්න වෙනවා. පාලම් දෙකක් කැඩිල තිබුණා. එක පාලමකින්—එය වැල් පාල මක්—හාමුදුරු නමක් මරණ ගෙදරකට පාංශකූලය දීම සඳහා යන විට ඇදගෙන වැටුනා. අනේ ඉතින් මොනවා කරන්නද? බොහොම අමාරුවෙන් උස්සලා ගොඩට ගත්තා. නමුත් මට රුපියල් තුන් ලක්ෂ හැට දහසක මුදල් ලැබුණා. මේ පාලමේ වැඩ ආරම්භ කරන්න. දෙසැම්බර් වලදී විවෘත කරන්න පුළුවන්.

ඒ වගේම ගෙවල් 350 කට වඩා කඹුරු පිටියේ සාදා තිබෙනවා. ගිහින් බලන්න, උදාගම් ව්‍යාපාරය. අක්කර 83 ක රජයට අයත් ඉඩමක් කැලෑවක් බවට පත්ව තිබුණා. උප දිසාපතිතුමාත් නිවාස කොම සාරිස්තුමාත් සමඟ මම ගියා බලන්න. ඒ ඉඩමට යන්න ඕනෑ වෙලක් පසු කර ගෙන පොඩි අඩි පාරකින්. මම ඒ ප්‍රදේශයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබුණු පොඩි පැල්පත්වල හිටිය අයත් සමග කතා කළා. ඒ ප්‍රදේශයේ ඉන්න කෙනෙක් අසනීප වුණොත් පුටුවල තබා ගෙන කරගහගෙන තමයි,, එන්න වෙන්නෙ. මම එහෙ පැය ගණනක් තිස්සේ ඇවිද්දා. මම අධිෂ්ඨාන කළා, මේ ඉඩමේ තමයි, ගෙවල් හදන්න ඕනෑ කියා. ඒ නිසා මම කොම්පියක් පත් කරගෙන ශ්‍රම දානයක් පටන් ගත්තා. පාරවල් කපන්න හැටුවා. පාරවල් කපන්න බැහැ, ගල්. මහ විශාල ගල්. නමුත් මම සන්තෝෂයි කියන්න, මට මාතර දිසා ඇමතිතුමා සමග සාකච්ඡා කිරීමෙන් අසුව යන්ත්‍රයක් ලබා ගන්න පුළුවන් වුණා. දිවා රෑ වැඩ කළා. අපට දවස් පහක් හයකට පමණයි, යන්ත්‍රය ලැබුණෙ. නමුත් ඒ බුයිවජ් මහත්මයත් සමග කතා කරගෙන ඒ මහත්මයාට හොඳට සංග්‍රහ කර රෑ වන තෙක්ම වැඩ කළා. දැන් බස් රථයක් වුණත් ඒ හරියට ගෙන යන්න පුළුවන්. හැම ගෙයකටම වාහනයක් ගෙන යන්න පුළුවන්. ජනවාරි මාසයේදී ඒ ගෙවල් විවෘත කරන්න එන්නය කියා මම අගමැතිතුමාට ආරාධනා කර ලන් තිබෙනවා.

හැම ගෙයකටම ජීප් එකකින් හාන්නම් රථයකින් යන්න පුළුවන්. ඒ මිනිස්සු "අනේ පුදුම දෙයක්; ජීවිතේටවත් මෙහෙම ගෙයක් ලැබෙයි කියල හිතුවේ නැහැ" කියල පින් දෙනවා. අපට පින් දෙනවා; රජයට පින් දෙනවා. බලන්න අගමැතිතුමා මොන තරම් දුක් විඳිනවාද? අද ගාල්ලෙ නම් හෙට නුවරඑළියෙ. ගෙවල් කොයි තරම් හදනවාද? මට මේවා කරන්න සල්ලි හම්බ වෙලා තිබෙනවා. රුපියල් ලක්ෂ 10 ක් පමණ එතුමාගෙන් ලැබුණා. ඒ වගේම අනික් ඇමතිවරුන්ගෙන්, ඉඩම් ඇමතිතුමාගෙන්, මහවැලි සංවර්ධන ඇමතිතුමාගෙන් මුදල් ලැබෙනවා. මේ මන්ත්‍රීවරු කියනවා, අපි මුදල් වියදම් කරනවාය කියා. තමුන්නාන්සේලා අවුරුදු 30 කින් නිම කරන්නට බලා පොරොන්තු වුණ දේ අපි අවුරුදු පහකින් හයකින් නිම කරන්න යනවා. ගොවිතැන් සශ්‍රීක කරනවා. ඒ වගේම විදුලි බලය ලබා දෙනවා. ඒ නිසා මේ කටයුතු ගැන අවංකව කතා කරන්න ඕනෑ. මේ අයවැය ලේඛනය ඉතාම හොඳයි.

මන්ත්‍රීවරයෙක්
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

ගාල්ල කොහොමද?

ඇල්බට් ද සිල්වා මහතා
*(திரு. அல்பட் த சில்வா)*
**(Mr. Albert de Silva)**

ඔව්, මම ගාල්ල ගැනත් කියන්න ඕනෑ. මම අවුරුදු දෙකක් එහෙ හිටියා. ඒ කාලය වෙනකොට ගාල්ල කියන්නෙ මොකක්ද? පරණ ගොඩනැගිලි පමණයි. මොනවා කරන්නද? නමුත් මම පොරොන්දු වුණා; තමුන්නාන්සේලා මට ඡන්දය දුන් දුන්නොත් මම මේ ගාල්ල හදනවාය කියා මම කිව්වා. "තමුන්නාන්සේලා මට ඡන්දය දෙන්න, මම මන්ත්‍රීවරයෙක් වෙනවාට තමුන්නාන්සේලා කැමති නැද්ද; අවුරුදු 30 ක් එතුමා හිටියා නම් මටත් දෙන්න" කියා මම කිව්වා. ඒ වගේම පක්ෂය වෙනුවෙන් මට විශිෂ්ට ජයග්‍රහණයක් ලැබුණා. මම වැඩ කරන්න පටන් ගත්තා. මම මුලින්ම පටන් ගත්තෙ දිගම "බස් ස්ටෑන්ඩ්" එක හදන්නයි. වර්ෂාවට තෙමී තිබුණ පරණ 'බස් ස්ටෑන්ඩ්' එක මම හැදුවා. අද ඒ මිනිස්සු අපේ ආණ්ඩුවට පින් දෙනවා. ඊළඟට ඒ මිනිස්සුන්ට රෝහලක් ඕනෑයි කිව්වා. රෝහල් ඇමතිතුමාටත් මේ ගැන කිව්වා. මම මන්ත්‍රීවරයා හැටියට පත් වුණ දා සිටම, මම දකින කොට මට වැඳ වැඳ කියන්නේ, රෝහලක් ලබා දෙන්න කියලයි. කෝ ඉතින් සල්ලි? අන්තිමට ලක්ෂ 30 ක මුදලක් ලැබුණා. දැන් අපි කරාපිටියෙ අක්කර 40 ක භූමි ප්‍රමාණයක එය හදාගෙන යනවා. මුළු දකුණු පළාතටම සේවයක් වන විධියට එම රෝහලේ වැඩ ආරම්භ කර තිබෙනවා. මා හිතන්නෙ, ලක්ෂ 1,200 ක් විතර වැය වේවි. මම හිටිය නම් ඒ වැඩය ඉවරයි. කනගාටුයි; කරන්න දෙයක් නැහැ; මාව තල්ලු වුණා. ඒ කොහොම වුණත්, මගේ ජීවිත කාලය තුළ කොහොම හරි ඒ රෝහල, තැපැල් කන්තෝරුව, පොලීසිය [බාධා කිරීම්] ඒ වැඩ ආරම්භ කර ටික-ටික කෙරීගෙන ගියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇල්බට් ද සිල්වා මහතා]

1977 මහ මැතිවරණයේදී ගාල්ලේ ඡන්ද දායකයන්ට මම කිව්වා, මාව ගාල්ලෙන් දිනෙව්වොත් ගාල්ල පුංචි සිංගප්පූරුවක් කරනවාය කියා. මම ඡන්දෙන් දිනුවා. ඒ වැඩ කරගෙන ගියා. නමුත් අවාසනාවකට ඡන්ද නඩුවෙන් මම පැරදුණා. ඊට පසු අපේ ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් මා කෙරෙහි අනුකම්පා කර කොහොම හරි ගාල්ලෙන් ටිකක් ඈතට තල්ලු කර තැනක් දුන්නා. මට නම් කොහෙත් එකයි. මුල් කාලයේ දී කඹුරුපිටියෙ මට විරුද්ධ යුද්ධයක් තිබුණා. සත්‍යාග්‍රහයක් තිබුණා. [බාධා කිරීම්] මට ඇතුළු වන්න ඉඩ දුන්නේ නැහැ.

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
*(திரு. ஆர். ஜெ. ஜீ. த மெல்)*
**(Mr. R. J. G. de Mel)**

හෙලිකොප්ටරුත් තිබුණා !

**ඇල්බට් ද සිල්වා මහතා**
*(திரு. அல்பட் த சில்வா)*
**(Mr. Albert de Silva)**

උඩින් එනවා, අරගෙන් එනවා; මෙහෙන් එනවා. කොහොම නමුත් ධර්මිෂ්ට නායකතුමාගේ ධර්මිෂ්ට මන්ත්‍රීවරයෙක් හැටියට වැඳ වැඳ ඇතුළු වුණා. කොහොම වුණත් මාසකීපයක් යන විට, කලින් මට විරුද්ධව සිටි අයත් මට අනුකම්පා කළා. දැන් මගේ ඡන්ද කොට්ඨාශයේ එක්සත් ජාතික පාක්ෂිකයන් 100% ම ඉන්නේ, මගේ පැත්තේ, තමයි. අර උඩින් එන, සල්ලිකාර මහත්මයාගේ දකුණු අත හැටියට හිටපු මහත්මයාත්, මාසයකට විතර කලින් මගේ ගෙදරට ඇවිත් මගෙන් වැඩක් කරවා ගත්තා. රාජපක්ෂ කියා හාමු කෙනෙක්. [බාධා කිරීම්] මට කමක් නැහැ. අපි මෛත්‍රී කරමු. දැන් ඒ සියලු දෙනාම මට උදවු කරනවා. දැන් ඒ අය කියනවා, 'අනේ මන්ත්‍රීතුමා, අප අත්හැර දමන්න නම් එපා' කියා. මා කීවා, එය තිබෙන්නේ මගේ අතේ නොවෙයි කියා, [බාධා කිරීම්] ගාල්ලේ එක්සත් ජාතික පාක්ෂිකයන් 100% ම අඬනවා, 'අනේ ! අපට වෙච්ච දේ' කියා. [බාධා කිරීම්] ලියුමක් දෙන්නේ නැහැ. 'පොපි මන් පැරද්දුවා' කියා ඒ අය එලවා ගන්නවා. ඒක හරි නැහැ. අවංක එක්සත් ජාතික පාක්ෂිකයන් වැඩ කරන්නේ එහෙම නොවෙයි. අපි මෛත්‍රී කරමු. ඒ කොහොම වුණත් මට සන්තෝෂයෙන් මැරෙන්න ඇහැකි, අර වැඩ ටික කරල. [බාධා කිරීම්]

ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් ගෙනුත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් ගෙනුත්, කලවානේ මන්ත්‍රීතුමා ගෙනුත් (සරත් මුත්තෙට්ටුවේගම මහතා) මා ඉල්ලා සිටිනවා, කරුණාකර මේ අයවැය ලේඛනයට පක්ෂව ඡන්දය දෙන්නය කියා. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් මේ අය වැය ලේඛනය සම්බන්ධයෙන් කථා කරන විට මෙහි තිබෙන හොඳ දේවල් ගැනත් කියන්න ඕනෑ, 'මේ ටික නම් හොඳ නැහැ' කියන ගමන්. එහෙම නැතිව කොයි තරම් හොඳ දේවල් තිබුණත් හොඳ නැතැයි කීම වැරදියි.

ඒ සම්බන්ධයෙන් මම උදාහරණයක් දෙන්නම්. විරුද්ධ පාර්ශ්වයෙ මන්ත්‍රීතුමකුට අපේ ගෙදර ඇවිත් කෑම ටිකක් කන්න ආරාධනා කළාය කියමු. එතුමාට හොඳට කෑම ලෑස්ති කරල දෙනවා. කාල ඉවර වෙලා එතුමා කියනවා, 'කෑම හොඳ නැහැ' කියා. ඒ මොකද කියා ඇහුවාම කියනවා; 'කෝ කරවල බැදල තිබුණේ නැහැනෙ?' කියා. කරවල බැදල තිබ්බොත් අහනවා; 'කෝ, සුප් එක?' කියා. එහෙම මොකක් හෝ අඩුපාඩුවක් හොය-හොයා වැරදි කියන්නේ නැතිව 'කෑම ටික රසයි, හොඳයි' කියනවා නම් නේද, හොඳ? එතුමන්ලා මේ අයවැය ලේඛනය සම්බන්ධයෙන් අදහස් දක්වන්නේත් ඒ විධියටයි.

හොඳයි, බැරි වෙලාවත් මේ ආණ්ඩුව වෙනුවට එතුමන්ලාගේ ආණ්ඩුවක් තිබුණා නම් ඒ ගොල්ල මොනවාද, කරන්නේ? ඒවා ගැන කියන්න දෙයක් නැහැ. [බාධා කිරීම්] එක කාලයක හතු පිපෙන්න වගේ තිබුණා. වැඩිකල් යන්නෙ නැහැ. [බාධා කිරීම්] සල්ලිවලට යට වෙන්නෙ නැහැ, මිනිස්සු මට කීප වරක් පණිවිඩ එවා තිබුණා, එන්නය කියා. මා ගියාද?

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
*(திரு. ஆர். ஜெ. ஜீ. த மெல்)*
**(Mr. R. J. G. de Mel)**

කවුද? එන්න කීවේ? උඩින් එන— [බාධා කිරීම්].

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඇල්බට් ද සිල්වා මහතා**
*(திரு. அல்பட் த சில்வா)*
(Mr. Albert de Silva)

අපේ උපාලි මහත්තය. [බාධා කිරීම්] මගේ තරහක් නැහැ, එතුමාත් එක්ක. මා එතුමාට ආරාධනා කරනවා, අපත් සමග එකට වැඩ කරන්න එන්නය කියා. එතුමාගේ අදහසක් තිබුණා, උසස්ම ස්ථානයට යන්න. ඉස්සෙල්ලාම පනින්න හැදුවෙ, උඩටයි. එන්න ඕනෑ, බිම ඉඳලනෙ? අපේ මහජනයා සල්ලිවලට යට වෙන්නෙ නැහැ.

මේ රජයේ ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත්, කැබිනට් ඇමතිවරුත්, මන්ත්‍රීවරුත් යන සියලු දෙනා වැඩ කරන්නේ එකට-එකතු වෙලායි. ඒ ගැන අප සන්තෝෂ වන්න ඕනෑ. මීට කලිනුත් එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු තිබුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුත් තිබුණා. එහෙත් මේ ආණ්ඩුව විතර—අපේ ජනාධිපතිතුමා, අපේ අගමැතිතුමා, ඇමතිවරුන් හා මන්ත්‍රීවරුන් විතර—'මේ රට අපේය' කියා හිතාගෙන වැඩ කළ ආණ්ඩුවක් මීට කලින් තිබුණේ නැහැ. අන්න ඒකයි සන්තෝෂය. අපි එහෙම නැහැ. අපට බය නැතිව 1983 වන විට මහජනතාව ඉස්සරහට යන්න පුළුවනි. අපි වැඩ කළා. ඒ ගැන මහජනතාව සතුටුයි. කඹුරුපිටිය ආසනයේ හුඟක්ම ඉන්නේ කොමියුනිස්ට් පාක්ෂිකයෝ. නමුත් ඒ අය ලබන මහා මැතිවරණයේදී මට ඡන්දය දෙනවාය කිව්වා. "කවුරු වුණත් අපට කමක් නැහැ, වැඩ කරනවා නම්" කියලා ඒ උදවිය කියනවා. ඒ නිසා මා කලවානේ මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔන්න ඔය පක්ෂය වීසි කර අපත් සමග එකතු වී වැඩ කරන්න එන්න. මේක මගේ රට, මේක අපේ රට කියන හැඟීම ඇති කරගෙන රට සංවර්ධනය කරමු. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙනුත් මා එම ඉල්ලීම කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම අයවැය ලේඛනය ඉතාම ශ්‍රේෂ්ඨ අයවැය ලේඛනයක් බව රජයේ මන්ත්‍රීවරයකු හැටියට [illegible] ප්‍රකාශ කරමින්, මෙම අයවැය ලේඛනයෙන් අනාගතයේදී මහජනතාවට සෙතක්ම ඇති වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

**චන්ද්‍ර රණතුංග මහතා** (මාවනැල්ල)
*(திரு. சந்திர றணதுங்க—மாவனல்ல)*
(Mr. Chandra Ranatunga—Mawanella)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමාගේ ඉතාම අගනා කථාවෙන් පසු මට විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට ඉඩ ලැබීම ගැන මා ඉතාම සන්තෝෂ වෙනවා. නවක මන්ත්‍රීවරයකු වන මට විසර්ජන පනත් කෙටුම්පතක් දෙවන වර කියවීම පිළිබඳ විවාදයකට සහභාගි වෙන්නට ලැබුණු ප්‍රථම අවස්ථාව මෙයයි. මීට පෙර විසර්ජන පනත් කෙටුම්පතක් දෙවන වර කියවීමේ විවාදයකදී මා කථා කර නොතිබුණත් මුදල් ඇමතිවරුන් මෙවැනි විසර්ජන පනත් කෙටුම්පත් ඉදිරිපත් කළ අවස්ථාවලදී ඒ සම්බන්ධව ඇති වූ විවාද සම්බන්ධයෙන් මා විමසිල්ලෙන් කරුණු පරීක්ෂා කර බලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාවනැල්ල ආසනයේ ඡන්දදායකයන් වෙනුවෙන්, මා මුලින්ම මෙවැනි අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීම ගැන ගරු මුදල් ඇමතිතුමාට මගේ ප්‍රශංසාව ඉදිරිපත් කරන්න සතුටුයි. අද රටේ තිබෙන උද්ධමනකාරී තත්ත්වය අනුවත්, ලෝකයේ තිබෙන උද්ධමනකාරී තත්ත්වය අනුවත් වර්තමාන මුදල් ඇමතිවරයා හැර වෙන කිසිම ආණ්ඩුවක මුදල් ඇමතිවරයකුට මේ අන්දමේ අයවැය වාර්තාවක්—මුළු රටම මේ තරම් පිළිගන්නා අයවැය වාර්තාවක්—ඉදිරිපත් කරන්නට පුළුවන්කමක් තිබෙනවාය කියා මා සිතන්නේ නැහැ.

අපේ මේ අයවැය ලේඛන විවාදයේ දී අපේ කල්පනාවට ගතයුතු කරුණු කීපයක්ම තිබෙනවා. 1977 දී අපේ රජය බලයට පැමිණි අවස්ථාවේදී මේ රටේ මොන තත්ත්වයක් තිබුණාද කියා පළමුවෙන්ම මතක් කර ගත යුතුව තිබෙනවා. ඊට කලින් 1970 වර්ෂයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලයට පැමිණි අවස්ථාවේදී එසේ බලයට පැමිණියේ මොන මොන දේවල්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[චන්ද්‍රා රණතුංග මහතා]

මහජනතාවට ඉදිරිපත් කිරීමෙන්ද යන කාරණය ගැනත් අපි කල්පනා කරන්නට ඕනෑ. 1965 සිට 1970 දක්වා වූ කාලය ඇතුලත අපේ එක්සත් ජාතික පක්ෂයේ රජයක් මගින් රටේ යම් වැඩ පිළිවෙළක් ගෙන ගියා. ඒ ගෙන ගිය වැඩ පිළිවෙළ නිසා රටේ යම් සංවර්ධන තත්ත්වයක් ඇති වුණා. නමුත් 1970 දී මහා මැතිවරණයට ඉදිරිපත් වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මහජනතාවට නොයෙකුත් විධියේ පොරොන්දු රාශියක් දුන්නා. ඒ පොරොන්දුවලට මුලා වූ මහජනතාව 1970 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බලය දුන්නා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එදා මහජනතාවට දුන් පොරොන්දු කීපයක් ගැන අපි මතක් කර බලමු. කවුරුත් කථා කරන එක පොරොන්දුවක් ගැන මම පළමුවෙන්ම කියන්නම්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව වශයෙන් සිටි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය එදා මහජනතාවට දුන්නා මේ විධියේ පොරොන්දුවක්. මේ රටේ මහජනතාවගේ ආහාරය සඳහා හාල් මේ රටේ නිපදවන්නට බැරි වුණොත්, පිටරටිනුත් ගෙන්වන්නට බැරි වුණොත් හඳට ගිහින් හරි හාල් ගෙනැවිත් මහජනතාවට කන්න දෙනවාය කියා ඇය කිව්වා.

ඔන්න ඔය වගේ පොරොන්දු දීලයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය 1970 දී බලයට පැමිණියේ. එහෙම බලයට පැමිණිලා 1970 සිට 1977 වන තුරු මොන විධියේ ක්‍රියාමාර්ගයක් ගත්තාද කියන එක අප කාටත් ඉතාම හොඳින් මතක තිබෙන දෙයක්. අපි දන්නවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලයට පමුණුවන්න හුඟක් වෑයම් කරපු, හුඟක් මහන්සි වුණු තරුණ පරම්පරාවම 1971 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජයට එරෙහිව කැරලි ගැසීමෙන් අපේ රත්තරන් තරුණ තරුණියන් දහස් ගණනක් වෙඩි උණ්ඩවලට යටවෙලා මරණයට පත් වුණා. එතැනින් අවසන් වුණේ නැහැ. ඉන්පසු ඒ රජයේ සම්පූර්ණ කාල සීමාව තුලදීම මහජනතාවගේ නිදහස වළලා දමා හදිසි නීතියෙන් මේ රට ආණ්ඩු කළා. ඒ ආණ්ඩු කළ කාල සීමාවේදී මහජනතාවට අවශ්‍ය වුණ කිසිම දෙයක් ලබා ගන්නට පහසුකමක් තිබුණේ නැහැ.

එදිනෙදා අවශ්‍ය වන ආහාර ටික ගන්නට දවස පුරා පෝලිම්වල ඉඳලා අන්තිමේදී, රෑ බෝ වුණායින් පසුව, ඒ පෝලිමේ ඉඳලාවත් අවශ්‍ය හාල් ටිකවත් ගන්නට බැරිව හිස් අතින් ගෙදර යන්නට සිදු වුණ අවස්ථා අපි දන්නවා. උදේ 4 ට පාන් පෝලිමට ඇවිදින් පැය ගණනක් ඒ පෝලිමේ ඉඳලා අන්තිමේදී පාන් ටික අවසන් වුණාය කියා ඒ පෝලිමෙන් පාන් රාත්තල ලබා ගන්නට බැරිව ගෙදර ගිය අවස්ථා අපි දන්නවා. එපමණක් නොවෙයි, ඒ පාන් පෝලිම්වල ඉඳලා පාන් ගෙඩියක් ලබා ගන්නට බැරි වුණ අවස්ථාවල තමන්ගේ කුඩා දූ දරුවන් බඩගින්නේ ගෙදර හඬන එක ගැන කල්පනා කර, තව කෙනෙක් ගත් පාන් ගෙඩිය උදුරාගෙන ගොස් රණ්ඩු දබර වුණු අවස්ථා අපි දන්නවා. ඔය විධියේ තත්ත්වයකුයි, 1970 සිට 77 දක්වා කාලය තුළ තිබුණේ.

එපමණක් නොවෙයි, එදා මහජනතාවට වුවමනා කරන ඇඳුම් ටික ගන්නට තිබුණාද? ලාම්පු තෙල් ගඳ ගහන චීත්ත යාර 4 ක් ගන්න පෝලිමේ දවස් ගණනක් ඉන්න වුණා. ඇත්ත වශයෙන්ම ඒ රෙදි යාර හතරක් දුන්නේ අපේ අම්මා කෙනෙකුට හරියට ඇඳ ගන්න නොවෙයි. අපේ සිංහල කාන්තාවන් රෙද්ද-හැට්ටය අඳිනවා. එහෙම නැත්නම් ඔසරිය අඳිනවා. එහෙමත් නැත්නම් සාරිය අඳිනවා. ඔය කොයිම ක්‍රමයකටවත් ඒ ලබා දුන් රෙදි යාර හතරෙන් ඇඳ ගන්නට පුළුවන්කමක් තිබුණේ නැහැ. සමහර විට මුදල් නැතිකම නිසා, ඒ රෙදි යාර හතර ගන්නටත් කාලයක් තිස්සේ බලාගෙන ඉන්න සිදු වුණා. එහෙම ඉඳලා ලබා ගත් ඒ රෙදි යාර හතර, අම්මාට ගමනක් යන්නට වුවමනා වුණොත් අම්මා ඇඳගෙන යනවා. ඉන්පසු දුවටත් ගමනක් යන්නට වුවමනා වුණොත් අම්මා ගෙදර එන තුරු බලා ඉඳලා, අර රෙද්දයි හැට්ටයයි ඇඳගෙන දුවටත් යන්නට සිදු වුණු අවස්ථා අපි දන්නවා.

එපමණක්ද, තව මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. මට ඉතාමත් කණගාටුයි කියන්නට, අපි කරුණු ඉදිරිපත් කරන මේ අවස්ථාවේදී, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එකම මන්ත්‍රීවරයෙක්වත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ ගරු සභාවේ නැහැ. ඒ අයට වුවමනාවක් නැහැ. ඒ අයගේ ආණ්ඩුව තිබුණු කාලයේදී සිදුවූ දේවල් මතක් කර දෙන වෙලාවට ඒවා අහගෙන ඉන්න. එපමණක් නොවෙයි, අර ගම්පහ ගරු මන්ත්‍රීවරයා (එස්. ඩී. බණ්ඩාරනායක මහතා) කතා කරන විට හැමදාම එතුමට පුරුදු 'විප්ලවය' වාගේ වචන පාවිච්චි කරමින් ප්‍රකාශයක් කළා මිසක් ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ අයවැය කථාව ගැන කිසිම සාර්ථක අදහසක් ඉදිරිපත් කළේ නැති බව මා මේ අවස්ථාවේදී ඉතාමත්ම කණගාටුවෙන් මතක් කරනවා. අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා අපේ කුඩා ළමයිනුයි, බල්ලොයි, බළල්ලුයි එකට එකතුවෙලා මුඩුක්කු ගානේ තිබුණු කුණු බක්කි පෙරලාගෙන කාපු අවස්ථා ගැන. අපටත් ඒවා දකින්නට ලැබුණා. එහෙම තත්ත්වයක් තිබුණු රටක, සංවර්ධනයෙ නාමයෙන් කිසි දෙයක් නොවුණු අවධියක—1977 දී—අපේ ගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් අපේ රජය බලයට පත් වුණා.

අපි ආඩම්බරයෙන් ප්‍රකාශ කරනවා 1977 දී බලයට පැමිණි විට අපේ නායකතුමන්ලා කිසි කෙනෙක්, අපේ මන්ත්‍රීවරු කිසි කෙනෙක් කිසිම අවස්ථාවක අර 1970 දී කිව්වා වාගේ 'හඳට ගිහිල්ලා හාල් ගෙනෙනවා කිව්වා වාගේ පොරොන්දු කිසිවක් දුන්නේ නැති බව. අපේ රටේ තිබුණු තත්ත්වය අපේ නායකතුමන්ලා හරියාකාරව එදා අවබෝධ කරගෙන සිටියා. අපේ නායකතුමන්ලා එදා ප්‍රකාශ කළා 'අපේ රටේ තත්ත්වය මෙහෙමයි; අපි බලයට පැමුණුනොත් අපට ලැබෙන්නේ හිස් භාණ්ඩාගාරයක් ය' කියා. 'මේ භාණ්ඩාගාරයේ කිසිම දෙයක් නැහැ නමුත් අපේ පක්ෂයේ, අපේ රජයෙ ප්‍රතිපත්ති අනුව, අපි මහජනතාවට තිබෙන දුක් වේදනා පුළුවන් තරම් දුරට නැති කර අපේ රට සංවර්ධනය කර, ඒ ව්‍යාපාර මාර්ගයෙන් අපේ කාල සීමාව තුළදී හැකි නම්, ඒ සම්පූර්ණ සංවර්ධන ව්‍යාපාරය නිම කරන්නට පුළුවන්කමක් නැති වුණත් අපේ තිබෙන සැලැස්මවල් මත මේ රට සංවර්ධනය කර, සෑහෙන [illegible]

යේ ප්‍රගතියක් ඇති කරන්නට බලාපොරොත්තු වෙනවා' කියාත් කිව්වා. අන්න ඒ නිසා අපේ රජය බලයට පත් කරන්න කියා එදා අපි ඉල්ලා සිටියා.

අපි ආඩම්බරයෙන් දැන් කියනවා, අපේ මහජනතාව 1970 දී 'හඳෙන් ගෙනත් හාල් සේරු දෙකක් දෙනවා කියා කී අවස්ථාවේදී මුළා වුණත්, 1977 දී ඉතාමත් බුද්ධිමත්ව අපේ රජය, අපේ පක්ෂය බලයට පත් කළ බව. අපට කියන්නට පුළුවන්, 1977 දී අපේ රජය බලයට පත් වුණාට පසුව අපේ ගරු මුදල් ඇමතිතුමා මෙවර ඉදිරිපත් කළ අයවැය කථාව සමග අයවැය කථා පහක් ඉදිරිපත් කර තිබෙන බව. මේ රටේ තිබෙන තත්ත්වය අනුවත්, ලෝකයේ සෑම රටකම තිබෙන තත්ත්වය අනුවත්, මේ රට සංවර්ධනය කරන්නට පුළුවන් එකම ක්‍රමය එතුමාගේ මේ අයවැය ලේඛනවලින් ඉදිරිපත් වෙලා තිබෙනවා. එතුමා ප්‍රකාශ කළා, අයවැය ලේඛනයක ප්‍රතිඵලය බලන්නට පුළුවන් වන්නේ කලකට පසුවය කියා. එය සම්පූර්ණ සත්‍යයක්. අපට තේරෙනවා එතුමාගේ මේ අයවැය ලේඛනය සකස් කිරීම ඉතාමත්ම අමාරු කාර්යයක් වුණාට කිසිම සැකයක් නැති බව.

විපක්ෂයේ මන්ත්‍රීවරුන් කවුරුත් දැන් මෙතන නැහැ. අපේ විපක්ෂ නායකතුමා පමණයි ඉන්නේ. කෙසේ වෙතත්, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු අද පිළිගත යුතුව තිබෙනවා, මේ රටේ උද්ධමනය තිබෙන නමුත් එය අපේ රටට පමණක් සීමා වුණු දෙයක් නොවන බව. ලෝකයේ සෑම රටකම මේ තත්ත්වය අද පවතිනවා. මේ අනුව 1970 දී කිසියම් ද්‍රව්‍යයක් අපේ රටට පිටරටකින් ගෙන ආවා නම්, එදා ඒ ද්‍රව්‍යය සඳහා ගෙවූ මිල මෙන් විසි ගුණයක් ගෙවාවත් ඒ ද්‍රව්‍යය ලබා ගන්නට අද පුළුවන්කමක් නැති බව තේරුම් ගන්න ඕනැ. විශේෂයෙන්ම තෙල් නිපදවන රටවල් තෙල් මිල වැඩි කිරීම නිසා සෑම දෙයකම මිල මේ අන්දමට වැඩි වී තිබෙන බව අප දන්නවා. තෙල් මිල වැඩි වීම නිසා ප්‍රවාහන වියදම් වැඩි වෙනවා. තෙල් මිල වැඩි වන විට තෙල් ප්‍රයෝජනයට ගන්න කර්මාන්ත ශාලාවලින් නිපදවන ද්‍රව්‍යවල මිල වැඩි වෙනවා. මේ අන්දමට සෑම දෙයකම මිල වැඩි වී තිබෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[චන්ද්‍ර රණතුංග මහතා]

නවා. තත්ත්වය මෙසේ පවතිනවා නම්, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ මේ අය වැය ලේඛනය විවේචනය කරන කොට සාධාරණත්වයක් වශයෙන් මහජනතාවට ප්‍රකාශ කළ යුතුව තිබෙනවා, මේ රටේ අද පවතින මේ උද්ධමනකාරී තත්ත්වය අප රටට පමණක් සීමාවුණු දෙයක් නොවන බව; මෙය මුළු ලොවටම බලපා ඇති ප්‍රශ්නයක් බව. ඇත්ත වශයෙන්ම මහජනතාව මුළා කිරීම පිණිස, මේ රජයෙන් කරන සෑම දෙයක්ම —රජය ගන්නා සෑම පියවරක්ම—වැරදියි කියා කියනවා මිස, කරන වැරැද්ද මොකක්ද, මොන අන්දමින් ඒ වරද නිවැරදි කරන්නෙ කියා පැහැදිලි කිරීමක් හෝ විසඳන ක්‍රමයක් හෝ විරුද්ධ පක්ෂයෙන් කියා දෙන්නෙ නැහැ.

මෙම විවාදය ආරම්භයේදීම අපේ වෙළඳ ඇමතිතුමා කීප වතාවක්ම විරුද්ධ පක්ෂගය වැරදි නම්, නිවැරදි ක්‍රියා මාර්ගය ගය වැරදි නම්, නිවැරදි ක්‍රියා මාර්ගග මොකක්දැයි පෙන්වා දුන්නොත්, පෙන්වා දෙන එම ක්‍රියා මාර්ගය තුළින් අනාගතයේදී මේ රටට මෙයට වඩා සෙතක් සැලසෙනවා යයි පිළිගන්න පුළුවන් නම්, එය පිළිගැනීමට තමන් සූදානම් බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පක්ෂයෙන් ගම්පහ මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මහතා) මෙම විවාදයේදී කතා කළා. නමුත් එතුමා කළ කතාව ගැන මා කලින් සඳහන් කළා වාගේ නැවතත් මගේ කණගාටුව පළ කරනවා. නවක මන්ත්‍රීවරයකු වශයෙන් මා බලාපොරොත්තු වුණා, ගම්පහ මන්ත්‍රීතුමා වැනි අවුරුදු විස්සක්—විසි පහක් පමණ කාලයක් මේ සභා ගර්භයේ මන්ත්‍රීවරයකු වශයෙන් සිටි මන්ත්‍රීවරයකුගෙන්, මෙම අයවැය ලේඛනය සම්බන්ධයෙන් මීට වඩා සාර්ථක අදහස් ඉදිරිපත් වේය කියා. අපේ මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ මේ අයවැය ලේඛනය ප්‍රතික්ෂේප කළ යුතුය කී නමුත් එසේ කළ යුතු වන්නෙ මොන කාරණයක් නිසාද කියා පිළිගත හැකි එකම තර්කයක් වත් එතුමාට ඉදිරිපත් කරන්නට, මා හිතන හැටියට, පුළුවන් වුණේ නැහැ. එතුමා කිව්වා, ජීවන වියදම මෙතරම් නැග තිබෙද්දී රජයේ සේවකයන්ට මෙන්ම සංස්ථා සේවකයන්ට රු. 107 ක මාසික වැටුප් වැඩිවීමක් ලබා දෙන්න බලාපොරොත්තු වෙනවාය; කිසිසේත්ම ප්‍රමාණවත් නැත කියා. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ රජය කාලයෙදි වැඩි වන ජීවන වියදම අනුව වැටුප් වැඩි කිරීමට හෝ රජයේ සේවකයන්ට වෙනත් ක්‍රමයකින් වැඩි වැටුපක් ලබා දීමට හෝ පියවර ගත්තාද කියන කාරණය ගැන එතුමා කල්පනා කළේ නැහැ. ඇත්ත වශයෙන්ම එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජයට වාමාංශික පක්ෂ එකතු වී සිටියා. ඒ අය දැන් රජයේ සේවකයන්ගේ යම් යම් ඉල්ලීම් ගැන ඉතා උනන්දුවෙන් මේ ගරු සභාවේදී කතා කරනවා. නමුත් තමන් බලයේ සිටි ඒ කාලයේදී මේ කතා කරන හැටියට ඒ කිසිම කෙනෙක් කතා කළේ නැහැ. කෙසේ වුණත්, මීට පෙර කිසිම රජයක් වැඩි වන ජීවන අංකය අනුව වැටුප් වැඩි කිරීමට පියවර ගත්තේ නැහැ. මා ඉතාමත්ම සන්තෝෂයි කියන්න අප ගරු මුදල් ඇමතිතුමා පමණයි ඒ කාරණය රජයේ සේවකයින්ට පහදා දී ජීවන අංකය යම් විධියකින් වැඩි වෙනවාද එසේ වැඩි වන ප්‍රමාණය අනුව තම තමන්ගේ වැටුප් ප්‍රමාණයත් වැඩි වන විධියේ වැටුප් ක්‍රමයක් ඇති කිරීමට පියවර අරගෙන තිබෙන්නේ. එපමණක් නොවෙයි. මේ ගරු මුදල් ඇමතිතුමා පමණයි රජයේ සේවකයින් උපයන වැටුපෙන් ආදායම් බද්දක් ගැනීම නතර කළේ. පසුගිය කාලයේ අපේ ගරු මුදල් ඇමතිතුමා මේ කාරණය ගැන කල්පනා කර—රජයේ සේවකයින්ට තිබෙන අමාරුකම් ගැන කල්පනා කර—රජයේ සේවකයින් ලබන වැටුප ආදායම් බද්දෙන් නිදහස් කර ඒ අයට තමන්ගේ වැටුප සම්පූර්ණයෙන් ලබා ගැනීමට අවස්ථාව සලසා දුන්නා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇයි මේවා කල්පනා නොකළේ? අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ වැටුප් වැඩි කිරීම මදියි කියනවා. ඒ අය ඉල්ලුවේ රු. 300 ක මාසික වැටුප් වැඩි කිරීමක්, ඇයි එය නොදෙන්නේ කියා. අහනවා. අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමා ඉතාමත්ම හොඳින් විග්‍රහ කළා, රජයේ නිලධාරීන්ට පමණක් නොවෙයි සෑම නිලධාරියෙකුටම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැටුප් ගෙවන්නේ කොයි විධියෙන්ද කියා. එතුමා පෙන්වා දුන්නා මේ ගෙවන මුදල් ගරු ජනාධිපතිතුමාගේ මුදල්වත් අපේ ගරු මුදල් ඇමතිතුමාගේ මුදල්වත් එහෙම නැත්නම් අප කාගේ හෝ මුදල්වත් නොවෙයි මේවා අපේ රටේ නිපදවන ධනයෙන් අපි අපේ රටේ සේවය කරන සේවකයින්ට ගෙවන මුදල්ය කියා.

ඇත්ත වශයෙන්ම අපට කියන්න පුළුවන් අපේ ගරු ජනාධිපතිතුමා අපේ ගරු අගමැතිතුමා අපේ ගරු මුදල් ඇමතිතුමා පමණක් නොවෙයි, මේ සභා ගර්භයේ සිටින සෑම මන්ත්‍රීවරයෙක්මත් එමෙන්ම අපේ පක්ෂයේ සෑම දෙනෙක්මත් කිසිම පැකිලීමක් නැතිව ඉදිරිපත් වෙනවා අපේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය නගා ලීමට වැටුප් වැඩි කිරීමට අවස්ථාවක් තිබෙනවා නම් ඒ කාරණය ඉටු කිරීමට. එහෙත් අපි කල්පනා කළ යුතුව තිබෙනවා මෙවැනි වැටුප් වැඩි කිරීමක් කිරීමේ දී අපි කොයි විධියටද ඒ වැටුප් වැඩි කිරීම නිසා ගෙවන්නට වන මුදල් ප්‍රමාණය සොයා ගන්නේ කියා. මේ ප්‍රශ්නයට විරුද්ධ පාර්ශ්වයේ කිසිම මන්ත්‍රීවරයෙක් උත්තරයක් සපයන්නේ නැහැ. ඒ අය පෙන්වා දෙන්නේ නැහැ, මේ අන්දමට වැටුප් වැඩි කිරීමේ දී මෙපමණ මුදලක් ගෙවන්න වෙනවා; මෙන්න මේ ආකාරයෙන් ඒ මුදල සොයා ගන්න පුළුවන් කියා. එහෙම නම් මා මේ අවස්ථාවේ දී කියනවා විරුද්ධ පාර්ශ්වයේ සිටින සෑම මන්ත්‍රීවරයෙක්ම මේ අයවැය ලේඛනය නොසුදුසු අයවැය ලේඛනයක්ය කියනවා නම් එසේ කියන්නේ ද්වේශසහගතවයි කියා. අපේ රජයට තිබෙන විරුද්ධත්වය ප්‍රකාශ කිරීම පිණිස—සාධාරණ විරුද්ධත්වයක් නොවෙයි, ජනතාව මුලා කිරීම පිණිස, නිසියාකාරව කරුණු ඉදිරිපත් නොකර, මේ රජය ගන්නා පියවරවල් සුදුසු පියවරවල් නොවෙයි කියා ද්වේශසහගතව ජනතාවට කියා සිටීමට—කරන කරුණු ඉදිරිපත් කිරීමක්ය කියා මා මේ අවස්ථාවේ දී කියන්න කැමතියි.

ඇත්ත වශයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේට මා මේ අවස්ථාවේ දී කිය යුතුව තිබෙනවා, අපේ ගරු මුදල් ඇමතිතුමාගේ පසුගිය අයවැය ලේඛන වලිනුත් මේ වර්ෂයේ ඉදිරිපත් කර තිබෙන අයවැය ලේඛනයෙනුත් මේ රටේ සංවර්ධනය සඳහා මොන විධියේ පියවරවල් අරගෙන තිබෙනවාද කියා. අපි අපේ කෘෂිකර්ම අංශය ගැන කල්පනා කර බැලුවොත් අපට ආඩම්බර වෙන්න පුළුවන්. අපේ රටේ වී ගොවිතැන ගැන කල්පනා කර බැලුවොත් මේ රටේ කිසි දිනක ඇති නොවූ අන්දමට විශාල ලෙස සංවර්ධනයක් වී ගොවිතැන පිළිබඳව ඇති වී තිබෙනවා. අපේ රටේ වී ගොවිතැන මේ යන ක්‍රමයට ගියොත් තව අවුරුද්දකින් පමණ අපේ රටට පිටරටින් ගෙන්වන සහල් ප්‍රමාණය සම්පූර්ණයෙන්ම නතර කර මේ රටේ නිෂ්පාදනය වන වී ප්‍රමාණයෙන් පමණක් මහ ජනතාව ස්වයම්පෝෂිත කිරීමට මේ ගරු මුදල් ඇමතිතුමාගේ ප්‍රතිපත්ති අනුව අපට පුළුවන් වෙනවා.

අද මේ රටේ පවතින පෝර මිල ගණන් අපි දන්නවා. අනික් දේවල වගේම පෝරවල මිලත් ලෝකයේ සෑම රටකම වගේ වැඩි වී තිබෙන බව පෙනී යනවා. ඒ වුණත් අපේ ගරු මුදල් ඇමතිතුමාගේ යෝජනා අනුව විශාල සහනයක් ගොවි ජනතාවට විශේෂයෙන්ම වී ගොවිතැන් කරන ගොවි මහත්වරුන්ට, ලැබී තිබෙන බව මතක් කරන්නට කැමතියි. පසුගිය අවුරුදු හතර කාලසීමාවේදී අප නොසිතූ අන්දමට මේ රටේ වී නිෂ්පාදනය අපට වැඩි කර ගන්නට පුළුවන් වී තිබෙන්නේ ඒ නිසයි.

පසුගිය අවුරුදු කීපය තුළදී තේ රබර් වැනි අපේ අනිකුත් නිෂ්පාදනවල සුළු බැස්මක් ඇති වී තිබෙන බව අපි දන්නවා. එය එසේ වීම වළක්වන්නට අප කිසි කෙනෙකුට පුළුවන්කමක් තිබුණේ නැහැ. අපි ඒ ගැන කල්පනා කර බලන විට අපට පෙනී යන්නේ 1970 සිට 1977 දක්වා පැවති රජයේ ප්‍රතිපත්ති නිසා මේ තත්ත්වය ඇති වී තිබෙන බවයි. ඉතාම හොඳ නිෂ්පාදනයක් තිබුණු තේ සහ රබර් වතු රජයට භාරගෙන, ඒ වගාවන් ගැන කිසිම අවබෝධයක් නැති ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ට, එහෙම නැත්නම් ඒ අයට සහයෝගය දුන් ඇත්තන්ට, සමහර ග්‍රාම සේවා නිලධාරීන් වැනි අයට, ඒවා පාලනය කර කරන්නට භාර දීම නිසයි, ඒ තත්ත්වය ඇති වුණේ. ඒ කාලය තුළ ඒ වගාවන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[චන්ද්‍ර රණතුංග මහතා]

යෙදිය යුතු පෝර ආදිය හරිහැටි යොදන්නේ නැතිව ලබාගත හැකි උපරිම අදායම ලබා ගන්නට උත්සාහ කළ නිසා සම්පූර්ණයෙන්ම ඒ වතු ප්‍රපාතයට ගියා. අපේ රජය බලයට පත්වීමෙන් පසු ඒ වතුවල නිසි පාලනයක් යොදා, හොඳ පුහුණුවක් ඇති අය ඒ වතු පාලනය සඳහා යොදවා, නිසි ලෙස වතුවලට පෝර ආදිය යොදවමින් ක්‍රමයෙන් ඒවා යථා තත්ත්වයට පත් කරන්නට ක්‍රියා කළා. එහෙත් 1976 සිට 1977 දක්වා ගෙන ගිය ක්‍රියාමාර්ගය නිසා අපේ ආණ්ඩුවට පුළුවන්කමක් තිබුණේ නැහැ, මේ සුළු කාලසීමාව තුළ දී ඒ වතුවල පහත වැටුණු නිෂ්පාදනය යළිත් යථා තත්ත්වයට ගෙන එන්න.

එමෙන්ම මුළු ලෝකයේම තේවල සහ රබර්වල මිල ක්‍රමයෙන් පහත බැස්සා. ඒ නිසාත් තේවලින් සහ රබර්වලින් අපේ රටට ලැබෙමින් තිබුණු ආදායම පහත බැස්සා. මේ තත්ත්වය නිසා, තේ වතු රබර් වතු දියුණු කිරීම සඳහා නවතවත් මුදල් දීමට මුදල් ඇමතිතුමා අදහස් කළත්, එසේ මුදල් ආයෝජනය කරන්නට අපේ ආර්ථිකයට ශක්තියක් තිබුණේ නැහැ. එහෙත් අපේ ආණ්ඩුව අනුගමනය කරන ප්‍රතිපත්ති අනුව සෑම කෘෂිකාර්මික නිෂ්පාදනයක්ම උසස් තත්ත්වයට නඟා ලීමට හැකිවීම ගැන අපට සන්තෝෂ වෙන්න පුළුවන්.

1970-77 කාලසීමාවේදී කෙනෙක් බස් රථයකින් ගමනක් යන්නට මහා මාර්ග යට බැස්ස නම්, පැය ගණනක් බලා ඉඳලත් බස් එකකට නැග ගන්න පුළුවන් තත්ත්වයක් තිබුණේ නැහැ. අපේ රජයේ ප්‍රතිපත්තිය අනුව අපේ රජය පියවරක් ගෙන තිබෙනවා, මහජනතාවගේ සුව පහසුව සඳහාම පෞද්ගලික බස් රථ හිමියන්ට බස් රථ ගෙන්වා අද මහජනයාට තිබෙන ගමනාගමන තදබදය නැති කරන්න අපි දන්නවා අද ඕනෑම කෙනෙකුට කොළඹ සිට නුවර ගොස් ඒමට හෝ, කොළඹ සිට ගාල්ලට ගොස් ඒමට හෝ එසේ නැත්නම්, වෙන කොහේවත් ගොස් ඒමට හෝ ලංගම බස් රථයකට නැඟ ගන්නට බැරි වුණත්, ඒ සඳහා ඕනෑ තරම් පෞද්ගලික බස් රථ තිබෙන බව. මිනිත්තු 15ක් පමණ සිටින විට කිසිම කරදරයක් නැතිව ඒ පෞද්ගලික බස් රථයකට නැග ඉතාමත් සුවපහසුවෙන් ගමන් කරන්නට පුළුවන් තත්තවයක් අද ඇති වී තිබෙනවා.

එපමණක් නොවෙයි, ඒ පෞද්ගලික බස් රථවලින් ගමනාගමනය සම්බන්ධයෙන් මහජනතාවට ඇති වුණු පහසුව පමණක් නොවෙයි, ඒ බස් රථවල රියැදුරන්, නඩත්තු කරන්නන්, කොන්දොස්තරවරුන් ආදී සේවකයන් හැටියට රක්ෂා නැතිව සිටි දහස් සංඛ්‍යාවකට රක්ෂා ලැබීමත් සුළු පටු සහනයක් නොවෙයි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**

*(குழு உபதலைவர் அவர்கள்)*

(Mr. Deputy Chairman of Committees)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

**අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන් නියෝජ්‍ය කථානායකතුමා, [නෝමන් වෛද්‍යරත්න මහතා] මූලාසනාරූඪ විය.**

*அதன்பிறகு, குழு உபதலைவர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, உப சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER [MR. NORMAN WAIDYARATNA] *took the Chair.*

**චන්ද්‍රා රණතුංග මහතා** (මාවනැල්ල)

*(திரு. சந்திர றணதுங்க—மாவனல்ல)*

(Mr. Chandra Ranatunga—Mawanella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රකාශ කළේ අපේ රජයේ විවෘත ප්‍රතිපත්තිය නිසා පෞද්ගලික බස් රථ හිමියන්ගෙන් මේ රටට වුණ සේවය ගැනයි. එදා 1970-77 කාලයේ තිබුණු තත්ත්වය නොවෙයි අද තිබෙන්නෙ. පෞද්ගලික බස් රථ හිමියන් නිසා ගමනාගමන සේවය අතින් හා රැකීරක්ෂා අතින් ද මහජනතාවට විශාල සේවයක් ඇති වී තිබෙනවා.

ඒ වාගේම මේ රටේ කර්මාන්ත පිළිබඳ තත්ත්වය බලමු. තමුන්නාන්සේ දන්නවා අද මහ පරිමාණයේ කර්මාන්ත රාශියක් මේ රටේ ඇති කර තිබෙන බව. අපේ රජය අද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙන යන ප්‍රතිපත්තිය අනුව මහවැලි ව්‍යාපාර වැනි ව්‍යාපාරවලට මුදල් යොදවා ඉතාම කෙටි කාල සීමා ඇතුළත ඒ ව්‍යාපාර වලින් අපේ රජය බලාපොරොත්තු වන විධියේ ප්‍රතිඵල ලබා ගැනීමට හැකි පියවර වල් ක්‍රියාත්මක කිරීමට වෙන කිසිම රජය කට පුළුවන්කමක් තිබෙනවාය කියා මම හිතන්නේ නැහැ. නමුත් නාන්සේ දන්නවා, මහවැලි ව්‍යාපාරය අවුරුදු 30 ක කාලයක් තුළ නිම කිරීමටයි පසුගිය රජය කල්පනා කර තිබුණේ කියා. නමුත් අපේ රජය බලයට පත් වුණාට පස්සෙ අපි ඒ කාල සීමාව කෙටි කළා. ඒ ව්‍යාපාරය අවුරුදු 6 කින් 7 කින් නිම කිරීමට, එහි පල ප්‍රයෝජන මහජනතාවට කලින් ලබා ගැනීමට, අපි පියවර ගෙන තිබෙනවා.

ඇත්ත වශයෙන්ම අපි යම්කිසි ව්‍යාපාර යක් පටන්ගන්න විටම ඒ ව්‍යාපාරයේ පල ප්‍රයෝජන ලබාගන්න පුළුවන්කමක් නැහැ. නමුත් එවැනි ව්‍යාපාර මගින් අපේ රට සංවර්ධනය කිරීමට අපි බලාපොරොත්තු නොවුණොත් මම හිතන්නෙ නැහැ, අපි දැන් ඉන්න තත්ත්වයෙන් මිදීමට, අපේ රට දැන් තිබෙන තත්ත්වයෙන් වෙනස් ස්වභාවයකට පත් කිරීමට අපට පුළුවන් වේවිය කියා; මහජනතාවගේ ජීවන තත්ත්වය නගා ලීමට කටයුතු කරන්න පුළුවන් වේවි කියා. ඇත්ත වශයෙන් 1970 සිට 1977 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙම මහවැලි ව්‍යාපාරය වැනි ව්‍යාපාරවලට මුදල් යට කර රට සංවර්ධනය කිරීම පිණිස පියවර ගෙන තිබුණා නම් අද මේ රටේ මහ ජනතාවට මේ තරම් අමාරුකම්වලට මුහුණ පාන්නට වෙන්නෙ නැහැ. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් විරුද්ධ පක්ෂයේ හැම දෙනාමත් කියනවා, මේ රජය මෙවැනි ව්‍යාපාරවලට මේ තරම් විශාල මුදලක් වියදම් කරනවාය නමුත් ඒ වියදම් කරන මුදල් වලින් නිසියාකාර පල ප්‍රයෝජන ගන්නෙ නැත කියා. ඒ උදවිය ඔය විධියට තර්ක කරනවා. නමුත් අපි දැනගත යුතුව තිබෙනවා, කෝටි ගණන් මුදල් වියදම් කර යම් යම් ව්‍යාපාර ආරම්භ කරන විට ඒ ව්‍යාපාර සඳහා යම් යම් කටයුතු කරගෙන යන විට ඒ කටයුතු කරගෙන යන අතරතුරදී ඉතා සුළු මුදල් ප්‍රමාණයක් [illegible] වලක්වා ගැනීමට නොහැකි තත්ත්වයන් ඇති වන බව. එවැනි අවස්ථාවක් තිබෙන විට, රටට ළැදි, මහජනතාවට ළැදි, මහජන තාවගේ ජීවන තත්ත්වය නගාලීමට අදහස් කරන සෑම කෙනෙකුගේම අධිෂ්ඨානය විය යුත්තේ, ඒ සිදුවන අක්‍රමිකතා වැළැක්වීමට, නැතිකිරීමට අපි සියලුදෙනාම එක්ව කටයුතු කරමින්, රජය ගෙන යන ව්‍යාපාරය සම්පූර්ණ සහයෝගය දීමයි.

මීට වඩා දුර කතා කළ යුතුයයි මම හිතන්නේ නැහැ. මම මුලින් කීව්වා වාගේ අද අපේ රටේ තිබෙන තත්ත්වය අනුව, ලෝක තත්ත්වය අනුව, අපේ ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ අයවැය යෝජනා සම්බන්ධයෙන් මේ සභාවේ සිටින සෑම මන්ත්‍රීවරයකුගේම අදහස් ප්‍රකාශ කර, අද රටේ තිබෙන තත්ත්වය අනුව මීට වඩා සුදුසු අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීමට වෙනත් කිසිම කෙනකුට පුළුවන් කමක් නැති බව මහජනතාවට මේ සභව තුළින් ප්‍රකාශ කර මේ සභාවේ සෑම මන්ත්‍රීවරයෙක්ම මේ අය වැය ලේඛනයට සහයෝගය දෙනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය මින් හමාර කරනවා.

අ. භා. 7.26

**බී. එච්. සේනාධීර මහතා** (කරන්දෙනිය)
*(திரு. பி. எச். சேனாதீர—கரந்தெனிய)*
**(Mr. B. H. Senadheera—Karandeniya)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සාකච්ඡා වන්නේ මේ රජයේ 5 වැනි අය වැය ලේඛනයයි. ගරු මුදල් ඇමතිතුමා 1982 වර්ෂය සඳහා ඉතාම විශිෂ්ට අයවැය ලේඛනයක් ඉදිරිපත් කර තිබෙනවා. නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ මේ තරම් හොඳ අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීම පිළිබඳව ප්‍රථමයෙන්ම මම එතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද සාකච්ඡා වන්නේ ජේ. ආර්. ජයවර්ධන රජයේ 5 වැනි අය වැය ලේඛනයයි. 1977 සහ 1978 පළමුවැනි හා දෙවැනි අය වැය ලේඛනවලින් ගරු මුදල් ඇමතිතුමා ප්‍රතිපත්තිමය වෙනස්කම් රාශියක් ඇති කළා. අපි මේ සිව් අවුරුදු කාලසීමාව තුළදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. සේනාධිර මහතා]

යම් කිසි දියුණුවක් ලබා තිබෙනවා නම් එය ලබා තිබෙන්නේ, මුල් අය වැය ලේඛන වලින් ඇති කරන ලද වෙනස් කම් නිසායි. ඒ පළමුවැනි හා දෙවැනි අය වැය ලේඛන මගින් ගරු මුදල් ඇමතිතුමා ආර්ථිකය නිදහස් කිරීමට, නැත් නම්, නිදහස් ආර්ථික ක්‍රමයක් ගොඩනගන්නට කටයුතු කර තිබෙනවා. ඒ වාගේම එතුමා, මුළුමහත් පලන සීමා පද්ධතියම බිඳ හෙලා, සියලුම කෝටා ක්‍රම, සලාක ක්‍රම අහෝසි කර විවෘත වෙළඳ පොළක් ඇති වන විධියට කටයුතු කළා.

1977 දී විනිමය අනුපාතික ගණනාවක් තිබුණා අපට මතකයි. 'fපික්ස් රේට්ස්' තිබුණා. අත්‍යවශ්‍ය භාණ්ඩවලට වෙනම විනිමය අනුපාතිකයක් තිබුණා. 'බ්ලැක් මාර්කට් fෆොරින් එක්ස්චේන්ජ්' විනිමය අනුපාතික ගණනාවක් තිබුණා. ඒ සියල්ලම අහෝසි කර එකම විනිමය අනුපාතිකයක් ඇති කිරීමට එතුමා කට යුතු කළා. ඒ වගේම තිබෙන්නාවූ සම්පත් උපරිම පරිදි ආයෝජනයට නැත් නම් නිෂ්පාදන කටයුතුවලට යොදා ගැනීම සඳහාත්, පරිභෝජනය සඳහා සහනාධාර අඩුකිරීමටත් කටයුතු කළා. ඒ වගේම නිෂ්පාදනය සහ අපනයනය සඳහාත් දිරි ගැන්වීම් නැත් නම් අනුබල ලබා දීමටත් කටයුතු කළා. විදේශීය ආයෝජන දිරි ගැන්වීමට කටයුතු කළා.

ඔය විධියට ක්‍රියා කර, වෙනස්වීම් ඇති කර, එදා තිබුණු ආර්ථිකයේ සංවර්ධනයක් ඇති කිරීමට, රටට අවශ්‍ය ආර්ථික වාතාවර ණය සකස් කිරීමට එතුමා පළමුවැනි හා දෙවැනි අය්වැය ලේඛනවලින් කටයුතු කළා. ඒ අනුව රටේ විශාල සංවර්ධනයක් ඇති වී තිබෙනවා. 1977 දී ඔය වෙනස්කම් කළාට පසුව 1978 වර්ෂය වෙන විට සියයට 8.2ක වර්ධන අනුපාතයක් ලබාගැනීමට පුළුවන් වුණා. 1977 තිබුණු තත්ත්වය අනුව බලන විට, 1978 වන විට මේ තරම් වර්ධන අනුපාතිකයක්—සියයට 8.2 ක වර්ධන අනුපාතිකයක්—ඇතිවුණාය කියා හිතන්නත් අමාරුයි. නමුත් සියයට 8.2ක වර්ධනයක් අපේ ආර්ථිකයේ ඇති වුණා. 1979 වර්ෂයේදී සියයට 6.2 ක වර්ධනයක් ඇති වී තිබෙනවා.

1980 වන විට වර්ධන අනුපාතිකය සිය යට 5.5 කින් පහත බැස තිබෙන බවක් මහ බැංකු වාර්තාවෙන් පෙන්නුම් කර නවා. බැලූ බැල්මට එවැනි පහත වැටීමක් පෙන්නුම් කරනවා. සමහරු කල්පනා කර නවා, මොකද මේ කියල. ඊට හේතු වශ යෙන් අපට පෙනී යන්නේ විශේෂයෙන්ම වැවිලි කාර්මාන්ත අංශයේ දුර්වල ක්‍රියා කාරිත්වයයි. ඒ වගේම නිෂ්පාදන කර් මාන්ත සහ තැනීම් කටයුතු අංශවල පහළ මට්ටමක වර්ධනයක් වාර්තා වී තිබෙනවා. නමුත් වෙළඳාම, ප්‍රවාහනය සහ අනිකුත් සේවා අංශවල ඉහළ මට්ටමක වර්ධනයක් පෙන්නුම් කරනවා. කෙසේ වුණත් අපි සමස්ථයක් වශයෙන් අරගෙන බැලුවොත් විශාල සංවර්ධනයක් දකින්නට පුළුවන්. දළ ජාතික නිෂ්පාදනය අරගෙන බැලුවම අපට පෙනෙනවා, ඒ ස්ථාවර මිල අනුව විශාල වර්ධනයක් ඇති වී තිබෙන බව. මේ තරම් විශාල දියුණුවක්, සංවර්ධනයක් ඇති වුණේ මුල් අයවැය ලේඛනවලින් ඇති කරන ලද ප්‍රතිපත්තිමය වෙනස්කම් නිසා බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය සිව් වසර තුළ රජයේ හා පෞද්ගලික අංශවල ආයෝජන විශාල වශයෙන් වැඩි වී තිබෙනවා. ඒ ආයෝජන වැඩිවීම නිසා රැකීරක්ෂා වැඩිවී තිබෙනවා. ඒ හේතුව නිසා රක්ෂා ගිහය අඩුවී තිබෙනවා. විරුද්ධ පාර්ශ්වය බොහොම උත්සාහ කළා, සංවර් ධනයක් ඇතිවී නැති බව පෙන්නුම් කරන්න. මහ බැංකුවේ සංඛ්‍යා ලේඛනවල සත්‍යතාවය පිළිගන්න පුළුවන්ද කියන එක නොවෙයි, ප්‍රශ්නය. ඒවා පිළිගත්තා හෝ නොගත්තා හෝ මේ රටේ සංවර් ධනය පිළිබඳ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කිරීමට මේ රටේ තිබෙන එකම ආයතනය මහ බැංකුවයි. අපි තර්ක කරනවා නම් තර්ක කරන්න ඕනෑ ඒ අනුවයි. නමුත් මා හිතන්නේ නැහැ මේ සභාවේ ඉන්න කිසිම මන්ත්‍රීවරයෙකුට සංඛ්‍යා ලේඛන අවශ්‍ය වේවිය කියා, මේ රටේ සංවර්ධන යක් ඇතිවෙලා තිබෙනවාද නැද්ද යන්න ගැන තර්ක කරන්න. සෑම මන්ත්‍රීවරයකු ටම පුළුවන් කම තිබෙනවා, ගත වූ සිව්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වසර තුළ යම්කිසි සංවර්ධනයක් වී තිබෙ නවාද-නැද්ද කියා තමාගේ ගෙදර ඉඳ ගෙනම තීරණය කරන්න. මගේ ගම් ප්‍රදේශයේ, මගේ මැතිවරණ කොට්ඨාශ යේ ඇති වී තිබෙන දියුණුව ගැන මට හිතන්න පුළුවන්, මගේ ගෙදරම ඉඳගෙන. ඒ වැඩය කරන්න මහ බැංකුවේ සංඛ්‍යා ලේඛන අවශ්‍ය නැහැ.

එදා, 1977 දී පයින් ගිය නැනැත්තා අද යන්නේ බයිසිකලයෙන්. එදා බයිසිකල යෙන් ගිය නැනැත්තා අද යන්නේ මෝටර් බයිසිකලයෙන්. එදා මෝටර් බයිසි කලයෙන් ගිය නැනැත්තා අද යන්නේ මෝටර් රථයෙන්. එයයි, ගමේ තත්ත්වය. 1977 මැතිවරණ සමයේදී මගේ මුළු මැති වරණ කොට්ඨාශයටම තිබුණේ, මෝටර් බයිසිකල් 3 යි. එයින් එකක් ආර්. සී. ඕ. ගේ ; තව එකක් කුරුඳු වෙළෙන්දකුගේ ; අනෙක් එක වෙද මහත්මයකුගේ. එහෙත් අද මගේ මැතිවරණ කොට්ඨාශය ඇතුළත මෝටර් බයිසිකල් 300 කට අධික ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසයි, මා කීවේ මහ බැංකුවේ සංඛ්‍යා ලේඛන අවශ්‍ය නැහැ කියා. ගෙදර සිටම බලන්න පුළුවනි, පසු ගිය සිව් අවුරුදු කාලය තුළ මේ රටේ ඇතිවූ වෙනස ; වී තිබෙන සංවර්ධනය. වෙනදා නගරයේ පමණක් දක්නට ලැබුණු මෝටර් බයිසිකල් අද ගම් සිසාරා යනවා නම් අප කල්පනා කළ යුතුයි නේද, කොයි තරම් සංවාදයක් මේ මට්ටමින් ඇති වී තිබෙනවාද කියා ? කොයිතරම් දියුණු වක් අපේ ගම්බද ප්‍රදේශවල සිදුවී තිබෙන වාද කියා ?

1977 දී මගේ මැතිවරණ කොට්ඨාශයේ තිබුණේ, ලොරි 2 යි. එහෙත් අද තිබෙ නවා, 15 ක්. 1977 දී එකම බස් හිමියෙක් වත් හිටියේ නැහැ, මගේ මැතිවරණ කොට්ඨාශයේ. එහෙත් අද පෞද්ගලික බස් රථ හිමියන් 10 දෙනෙක් ඉන්නවා. එදා ට්‍රැක්ටර් 2 යි, තිබුණේ. අද තිබෙ නවා, 15 ක්. එයයි, ගමේ පෙනෙන්න තිබෙන සංවර්ධනය.

විදුලිය ලැබේයයි කවදාවත් හිතන්න බැරි පාරවල විදුලි රුහැන් ඇද තිබෙනවා නම්, තාර නොදමුණු පාරවල තාර දමා තිබෙනවා නම්, එතෙක් නොතිබුණු පාසල් හා වෙනත් නොයෙකුත් විධියේ ගොඩනැගිලි ඉදි කර තිබෙනවා නම්, ඒවාට නේද, සංවර්ධනය කියන්නේ ? එවැනි දේවල් පෙනෙන්න තිබෙනවා නම් අප පිළිගන්න ඕනෑ, රටේ යම්කිසි වෙනස්වීමක්, සංවර්ධනයක් සිදු වී තිබෙ නවාය කියා. මෙවැනි තත්ත්වයක් පැහැ දිලිව දකින්න තිබෙද්දීත් මේ රටේ සංවර් ධනයක් වී නැතැයි යමෙක් කියනවා නම්, සංවර්ධනය කියන්නේ මොකක් දැයි ඒ අය දන්නේ නැතිව ඇති. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් ඇතුළුව විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු වරුන්, මේ රටේ සංවර්ධනයක් වී නැතැයි තර්ක කරන්න සූදානම් වන්නේ ඒ නිසා වෙන්න ඇති.

පාරක් නොතිබුණු ප්‍රදේශයක අලුතින් පාරක් කැපී තිබෙනවා නම් අප පිළි ගන්න ඕනෑ, එතැන සංවර්ධනයක් තිබෙන බව. ළිඳක් නොතිබුණු තැනක පොදු ජන පහසුව තකා ළිඳක් කැපී තිබෙ නවා නම්, එතැන සංවර්ධනයක් තිබෙ නවා. පාලමක් නොතිබුණු තැනක පාලු මක් ඉදි වී තිබෙනවා නම්, එතැන සංවර් ධනයක් තිබෙනවා. විදුලිය නොතිබුණු ප්‍රදේශයකට විදුලිය සැපයී තිබෙනවා නම්, එතැන සංවර්ධනයක් තිබෙනවා. ඔය විධි යට කල්පනා කර බලන විට, ගත වූ සිව් වසර තුළ මේ රටේ විශාල සංවර්ධනයක් ඇති වුණාය කියා අප පිළිගන්න ඕනෑ.

1982 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කෙරුණු මේ අයවැය ලේඛනය, මේ රජ යේ ප්‍රතිපත්ති සහ ක්‍රියා කලාපය ඉදිරි යට ගෙන යෑම සඳහා ඉදිරියට තැබූ පියව රක් හැටියට පෙන්වා දෙන්න පුළුවනි. මේ අයවැය ලේඛනය මඟින් රජයේ වියදම් පාලනය කිරීමටත්, අතිරේක ආදායම් මාර්ග ඇති කර ගැනීමට හා තිබෙන ආදා යම් වැඩි කර ගැනීමටත් කටයුතු කර තිබෙනවා. ඒ වගේම, මේ අයවැය ලේඛ නය මඟින් නිෂ්පාදනය සහ අපනයනය වැඩි කිරීම සඳහා අනුබල දීමකුත් කෙරී තිබෙනවා. එසේම, සමාජ සාධාරණත්වය ඇලසීම සඳහා දුගී-දුප්පත් පන්තියේ අයට උපකාර කිරීමටත් මුදල් ඇමතිතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. සේනාධීර මහතා]

කටයුතු කර තිබෙන බව අපට පෙනෙනවා. මේ සඳහා කර ඇති යෝජනා පිළිබඳව කල්පනා කර බලන විට ඒවා ඉතාම ප්‍රශංසනීය බව මට කියන්නට පුළුවනි.

ගරු මුදල් ඇමතිතුමා සිවුවන වරටත් රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමට පියවර ගෙන තිබෙනවා. මීට කලින් තුන් වතාවකදී එතුමා රජයේ සේවකයන්ගේත් සංස්ථා සේවකයන්ගේත් පළාත් පාලන සේවකයන්ගේත් වැටුප් වැඩි කිරීමට කටයුතු කළා. දැන් මේ රජය හතර වන වරටත් රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමට කටයුතු කර තිබෙනවා. මේ විධියේ උද්ධමනකාරී තත්ත්වයක් ඇති වන විට මාසිකව ස්ථිර වැටුප් ලබන අය—බාහිර ආදායමක් නොමැති අය—විශේෂයෙන්ම අපහසු තත්ත්වයකට මුහුණ දෙන බව රජය දන්නවා. එම නිසා ඒ කොටස්වලට මෙම අයවැය ලේඛනයෙන් සහනයක් සලස්වා දී තිබෙනවා. වැටුප් වැඩිවීමක් ඉල්ලා විශාල වශයෙන් උද්ඝෝෂණයක් කිරීමට රජයේ සේවකයන්ට වුවමනාවක් වුණේ නැහැ. පසුගිය ආණ්ඩුව කාලයේදී වැටුප් වැඩිවීමක් ලබා ගත්තා නම් ලබා ගත්තේ අවුරුදු ගණනාවක් තිස්සේ ඉල්ලීම් ඉදිරිපත් කර, වැඩ වර්ජනය කර ඊට පසුවයි. නමුත් අපේ රජයේ සෑම අයවැය ලේඛනයකින්ම වාගේ රජයේ සේවකයන්ගේ පඩි වැඩි කිරීමට කටයුතු කළා.

ඒවාගේම රජයේ සේවකයන් ආදායම් බද්දෙන් නිදහස් කළ එකම රජය මෙම රජය බව කවුරුත් දන්නවා. ඒක විශේෂ සිද්ධියක්. ලෝකයේ බොහෝ රටවල රජයේ සේවකයන් ආදායම් බද්දට යටත් කර තිබෙනවා.

රජයේ සේවකයන්ගේ වැටුප් ක්‍රම ගැන අධ්‍යයනය කොට ප්‍රතිශෝධන නිර්දේශ කිරීම සඳහා අපේ රජය විසින් පත් කරන වික්ටර් තෙන්නකෝන් වැටුප් විමර්ශන කමිටුවේ නිර්දේශ රජය පිළිගෙන තිබෙනවා. ඒ අනුව කටයුතු කරන්නට ඕනෑය කියාත් රජය පිළිගෙන තිබෙනවා. ඒ කමිටුවේ ප්‍රධාන නිර්දේශයක් තමයි, ජීවන වියදම් දර්ශකයේ වෙනස්වීම් සමඟ වැඩි වන ජීවන වියදම් දීමනාවක් ගෙවීම. ජීවන වියදම් දර්ශකයේ 360 ට වැඩි වන සෑම අංකයකටම රු. 2 බැගින් මෙම දීමනාව ගෙවිය යුතුය කියා නිර්දේශ කර තිබෙනවා. එම නිර්දේශය රජය පිළි අරගෙන තිබෙනවා. ඒවාගේම දැනට තිබෙන වැටුප් පරිමාණ තෙන්නකෝන් කමිටුව විසින් නිර්දේශ කරන ලද නව වැටුප් පරිමාණවලට පරිවර්තනය කිරීමේදී සෑම රජයේ සේවකයකුටම අවම වශයෙන් මාසයකට රු. 45 කට නොඅඩු වැටුප් වැඩිවීමක් ලැබෙනවා. ඒ අනුව බලන විට අවම වශයෙන් සෑම රජයේ සේවකයකුටම ජනවාරි මාසයේ සිට මාසයකට රු. 107 ක වැටුප් වැඩිවීමක් ලැබෙනවා. ජීවන වියදම් දර්ශකය අනුව ජීවන වියදම් දීමනාව අඩු වැඩි වෙන්නට පුළුවනි. ජීවන අංකය අනුව වැඩි වන දීමනාවක් ලබා දෙන්නය යන ඉල්ලීම මේ රටේ දීර්ඝ කාලයක් තිස්සේ කරන ඉල්ලීමක්. මේ රටේ වෘත්තීය සමිති නායකයින් මුදල් ඇමතිකම් කරද්දීවත් මේ ඉල්ලීම ඉටු කළේ නැහැ. නමුත් අපේ මුදල් ඇමතිතුමා ඒ ඉල්ලීම ඉටු කිරීමට කටයුතු යොදා තිබෙනවා. ඒ පිළිබඳවත් ගරු මුදල් ඇමතිතුමාට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා. තමුන්නාන්සේලා සියලු දෙනාටම ස්තුතියි.

වසන්ත උදයරත්න මහතා (අරනායක)
(திரு. வசந்த உதயரத்ன—அரநாயக்க)
(Mr. Wasantha Udayaratna—Aaranayaka)

Mr. Deputy Speaker, we must congratulate the Hon. Minister of Finance on introducing a very reasonable and acceptable Budget this time. I must say that the Budget that he has introduced this time is a continuity budget. I wish to emphasise the word "continuity" for the reason that we find that there is a continuity of the Minister. Unlike in the past where we have seen the Finance Ministers change, in our Government it is a unique feature that there is the continuity of the Minister. Secondly, there is continuity in the vision and the perspective of the Minister and the Government.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

You would see that from the first Budget this Government introduced there is a very clear perspective, there is a vision with the emphasis notably on development. If one compares or does a comparative study of the period of seven years of the previous Government and its budgets, with the budgets of this Government, one would see that there is a continuity in the vision of this Government. In the past it was not so. I am saying this with the criticism that we saw in the press a couple of days ago about this Budget. In the past there was no development, there was no vision. There was no perspective on the basis of development on the one hand, and, on the other, the people were starving. But you would see that throughout the period of this Government. during the last five years, there is development in the agricultural field, there is development in the industrial field and there is also development in the cultural field. When balancing the development features of the country, you would see—and anybody would agree—that there is no starvation in the country. You would see that there is a balance of development and there is also warding off of starvation.

It is quite easy to introduce a budget, to frame a budget if there are no difficulties. But this is a time—it is not something phenomenal in this country—when the whole world is passing through a period of untold economic troubles. There is a direct impact of the international economy on our country's economy. Our country's economy is a dependable economy—I must say, much more dependable than the economy of a Middle East country. If we have no difficulties in the economy of this country the Hon. Minister will have no difficulty in framing a budget which can be free of criticism. I must say this with respect, that criticisms which appeared in the press in regard to this Budget by some of those eminent people who were in Parliament and we are out now, saying that we are deviating from the vision, the economic perspective we had, namely, the free trade system, the open free trade system we had, and that we are pursuing, it must say that there is not a wee bit of digression from the system that we are following. In the past it was not so. There were barriers all over. There were barriers to development, and I must say, the entire development was at a standstill on the one hand, while the people were starving on the other. But, it is not so now.

This is why I must say there is a continity in the system that we are following, and this continuity in the system that we have launched has to be understood by the country. This is our message to the country. This system, I must say, with respect, is accepted by this country now—the economic system that we are following and we have launched is accepted by this country. There is freedom today for anybody who has the capital to get into any development field that he likes, and there are no fetters today. Of course, there are little difficulties. There is no doubt about it. But we are doing our best to see that the people do not starve, specially the middle class, and those in the government service. As correctly emphasised by an hon. Member just now, this is the fourth or fifeth time that we have increased the salaries of government servants. This time the increase is something unprecedented. The criticisms levelled against this Budget should be constructive. Everybody is agreed that the international economic impact, the international economic problems have a direct impact on the economy of our country, and very specially the rising prices of fuel. Meeting the rising prices of fuel and meeting the rising prices of other raw materials, we are doing our best to develop this country.

As the hon. Member for Kamburupitiya just now said when one is critizising the Budget, the credit that is due for what is good and the good features in the Budget must be recognized. If there is no continuity in the development work that we have start-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වසන්ත උදයරත්න මහතා]

ed, then of course you must say so. Our emphasis on the agricultural development of the country is there; the various schemes that we commenced are continuing—the Mahaweli Project and other projects. We are continuing with them, and we know that it is only in development, in developing the agricultural sector that there is salvation for this country. We cannot go on depending on imported food. We have not digressed from any one of the schemes that we started. We have not curtailed our development in the field of industry. You will see that much money is being voted this time for agricultural development and the development of industry.

At the same time, in this Budget there is another unique feature. A considerable amount of money has been voted for the disabled and for the cultural upliftment of the country. What more can we do? In fact, what more can the Hon. Minister of Finance do?

Sir, Budget making is not a very easy task; it is a tremendous task. I must say that we have introduced this time a Budget geared for development as well as for feeding the poor. I believe, Sir, the salvation of this country lies through development and the Budget has voted a considerable amount of money for development activity in spite of all the difficulties that we are faced with today.

As such, in considering this Budget we must congratulate the Hon. Minister of Finance for not diviating from the policies we started with the introduction of the first Budget of this Government in the matter of development in the fields of agriculture and industry. This Budget has also provided relief to the poor, in their difficulties, especially to the middle-class by giving them an increase of salary. In these circumstances the Hon. Minister has done a good job of work.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**

(திரு. எம். வின்சன்ற் பெரேரா—பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)

(Mr. M. Vincent Perera—Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)

I move,

"That the Debate be now adjourned."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 1981 නොවැම්බර් 17 වන අඟහරුවාදා පවත්වනු ලැබේ.

இதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.

விவாதம் 1981 நொவம்பர் 17, செவ்வாய்க்கிழமை மீளத்தொடங்கும்.

*The Debate stood adjourned accordingly.*

*Debate to be resumed on Tuesday the 17th November, 1981.*

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

Item 2.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**

(திரு. எம். வின்சன்ற் பெரேரா)

(Mr. M. Vincent Perera)

I would like Items 2 and 3 to stand down.

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

Let them stand down.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## පරිපූරක මුදල: ධීවර කර්මාන්ත පාලනය හා සංවර්ධනය

குறைநிரப்புத் தொகை: கடற்றொழிலை ஒழுங்குபடுத்தலும் அபிவிருத்தி செய்தலும்

## SUPPL'MENTARY SUPPLY: REGULATION AND DEVELOPMENT OF FISHERIES

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**

*(திரு. எம். வின்சன்ற் பெரோரா)*

(Mr. M. Vincent Perera)

On behalf of the Minister of Fisheries,—I move,

"That a supplementary sum not exceeding Rupees Two million (Rs. 2,000,000) be payable out of the Consolidated Fund of the Government of the Democratic Socialist Republic of Sri Lanka, or any other fund or moneys of, or at the disposal of, the Government of the Democratic Socialist Republic of Sri Lanka, or from the proceeds of any loans obtained by the Government of the Democratic Socialist Republic of Sri Lanka, for the service of the financial year beginning on 1st January, 1981 and ending on 31st December, 1981 and that the said sum may be expended as specified in the Schedule hereto:

SCHEDULE

| | Rs. |
|---|---|
| Head: 136—Minister of Fisheries | |
| Programme: 2—Regulation and Development of Fisheries .. | 2,000,000" |

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## පරිපූරක මුදල: කතරගම චන්ද්‍රනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක් ඉදිකිරීම

குறைநிரப்புத் தொகை: கதிர்காமத்தில் மடம் கட்டுதல்

## SUPPLEMENTARY SUPPLY: CONSTRUCTION OF MADAM AT KATARAGAMA

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**

*(திரு. எம். வின்சன்ற் பெரோரா)*

(Mr. M. Vincent Perera)

On behalf of the Minister of Regional Development, I move,

"That a supplementary sum not exceeding Rupees Three million (Rs. 3,000,000) only be payable out of the Consolidated Fund of the Government of the Democratic Socialist Republic of Sri Lanka, or any other fund or moneys of, or at the disposal of, the Government of the Democratic Socialist Republic of Sri Lanka, or from the proceeds of any loans obtained by the Government of the Democratic Socialist Republic of Sri Lanka, for the service of the financial year beginning on 1st January, 1981, and ending on 31st December, 1981, and that the said sum may be expended as specified in the Schedule hereto:—

S3HEDULE

| | Rs. |
|---|---|
| Head: 180—Minister of Regional Development | |
| Programme: 2—Hindu Religious and Cultural Affairs and the Implementation of the Tamil Language Provisions of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka .. | 3,000,000" |

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

Question put, and agreed to.

## පරිපූරක මුදල: නියං ආධාර

குறைநிரப்புத் தொகை: வரட்சி நிவாரணம்

## SUPPLEMENTARY SUPPLY: DROUGHT RELIEF

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**

*(திரு. எம். வின்சன்ற் பெரோரா)*

(Mr. M. Vincent Perera)

On behalf of the Minister of Social Services, I move,

"That a supplementary sum not exceeding Rupees Fifty seven million three hundred thousand (Rs. 57,300,000) only be payable out of the Consolidated Fund of the Government of the Democratic Socialist Republic of Sri Lanka, or any other fund or moneys of, or at the disposal of, the Government of the



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. වින්සන්ට් පෙරේරා මහතා]
Democratic Socialist Republic of Sri Lanka, or from the proceeds of any loans obtained by the Government of the Democratic Socialist Republic of Sri Lanka, for the service of the financial year beginning on 1st January, 1981, and ending on 31st December, 1981 and that the said sum may be expended as specified in the Schedule hereto :—

Schedule

| | Rs. |
|---|---|
| Head : 159—Department of Social Services | |
| Programme : 2—Provision of Financial Assistance and Social Services—Recurrent Expenditure .. | 57,300,000." |

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## පරිපූරක මුදල : විභාග පරිපාලනය හා ඇගයීම

## குறைநிரப்புத் தொகை : பரீட்சைகள் இணைக்களம் : பரீட்சை நிர்வாகமும் மதிப்பீடும்

## SUPPLEMENTARY SUPPLY : ADMINISTRATION AND EVALUATION OF EXAMINATIONS

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
*(திரு. எம். வின்சன்ற் பெரேரா)*
(Mr. M. Vincent Perera)

On behalf of the Minister of Youth Affairs and Employment and Minister of Education, I move,

"That a supplementary sum not exceeding Rupees Ten million and fifty thousand (Rs. 10,050,000) be payable out of the Consolidated Fund of the Government of the Democratic Socialist Republic of Sri Lanka, or any other fund or moneys of, or at the disposal of, the Government of the Democratic Socialist Republic of Sri Lanka, or from the proceeds of any loans obtained by the Government of the Democratic Socialist Republic of Sri Lanka, for the service of the financial year beginning on 1st January, 1981 and ending on 31st December, 1981 and that the said sum only be expended as specified in the Schedule hereto :—

Schedule

| | |
|---|---|
| Head : 71—Department of Examinations | |
| Programme : 1—Administration and Evaluation of Examinations | |
| Recurrent Expenditure .. | 9,850,000 |
| Capital Expenditure .. | 200,000 |
| | 10,050,000." |

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## ජාතික ලුණු සංස්ථාව : වාර්තාව

## தேசிய உப்புக் கூட்டுத்தாபனம் : அறிக்கை

## NATIONAL SALT CORPORATION : REPORT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
*(திரு. எம். வின்சன்ற் பெரேரா)*
(Mr. M. Vincent Perera)

On behalf of the Minister of Industries and Scientific Affairs, I move,

"That in terms of Section 14 (3) of the Finance Act, No. 38 of 1971, the Report of the Board of Directors of the National Salt Corporation, being report incorporating the Auditor-General's observations for the year ended 31st December, 1979 which was presented on 6th November, 1981, be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## මුදල් පනත : ජනවාස කොමිෂන් සභාව විසුරුවා හැරීම

## நிதிச் சட்டம் : மக்கள் குடியிருப்பு ஆணைக்குழுக் கலைப்பு

## FINANCE ACT : DISSOLUTION OF THE JANAWASA COMMISSION

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
*(திரு. எம். வின்சன்ற் பெரேரா)*
(Mr. M. Vincent Perera)

On behalf of the Minister of Agricultural Development and Research, I move,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"That this Parliament resolves in terms of Section 19 of the Finance Act, No. 38 of 1971, to authorise the Minister of Agricultural Development and Research to dissolve the Corporation called and known as the Janawasa Commission established under the Janawasa Law, No. 25 of 1976, and appoint one or more persons to be the liquidator or liquidators of the aforesaid Corporation."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව: වාර්තාව

*அரசாங்க அச்சகக் கூட்டுத்தாபனம்: அறிக்கை*

## STATE PRINTING CORPORATION : REPORT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
*(திரு. எம். வின்சன்ற் பெரேரா)*
(Mr. M. Vincent Perera)

On behalf of the Minister of State, I move,

"That in terms of Section 25(3) of the State Printing Corporation Act, No. 24 of 1968, the Annual Report of the State Printing Corporation, incorporating the Report of the Auditor-General and the Statement of Accounts together with the Balance Sheet for the period from 01.01.1979 to 31.12.1979 which was presented on 3rd November, 1981, be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## රාජ්‍ය දැව සංස්ථාව: වාර්තාව

*அரசாங்க மரக் கூட்டுத்தாபனம்: அறிக்கை*

## STATE TIMBER CORPORATION : REPORT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
*(திரு. எம். வின்சன்ற் பெரேரா)*
(Mr. M. Vincent Perera)

On behalf of the Minister of Lands and Land Development and Minister of Mahaweli Development, I move,

"That in terms of section 14(3) of the Finance Act, No. 38 of 1971, the Annual Report of the State Timber Corporation including the observations of the Auditor-General for the year 1979, which was presented on 3rd November, 1981, be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## කල් තැබීම

*ஒத்திவைப்பு*

## ADJOURNMENT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
*(திரு. எம். வின்சன்ற் பெரேரா)*
(Mr. M. Vincent Perera)

I move,

"That the Parliament do now adjourn."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 8.02 ට අද දින සභා සම්මතිය අනුව 1981 නොවැම්බර් 17 වන අඟහරුවාදා පූ. භා. 9 වන තෙක් කල් ගියේ ය.

*அதன்படி, பி. ப. 8.2 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க 1981 நொவம்பர் 17, செவ்வாய்க்கிழமை மு. ப. 9 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 8.02 p.m., until 9 a.m. on Tuesday, 17th November 1981. Pursuant to the Resolution of the Parliament this day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

**1981 නොවැම්බර් 17 වන අඟහරුවාදා**

*செவ்வாய்க்கிழமை, 17 நொவம்பர் 1981*

*Tuesday, 17th November 1981*

**පූ. භා. 9 ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [අල් හාජ් එම්. ඒ. බාකීර් මාකාර්] මූලාසනාරූඪ විය.**

*பாராளுமன்றம் மு. ப. 9 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [அல்ஹாஜ் எம். ஏ. பாகீர் மாகார்] தலைமை வகித்தார்கள்.*

*The House met at 9 A.M.*, MR. SPEAKER [AL HAJ M. A. BAKEER MARKAR] *in the Chair.*

## පාර්ලිමේන්තුවේ කටයුතු
### பாராளுமன்ற அலுவல்
### BUSINESS OF THE PARLIAMENT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**

*(திரு. எம். வின்சன்ற் பெரேரா—பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுக்கள் அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)*

(Mr. M. Vincent Perera—Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)

I move,

"That the proceedings on Item 1 of Public Business appearing on the Paper be exempted at this day's Sitting from the Provisions of Standing Order No. 23."

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**

*(திரு. எம். வின்சன்ற் பெரேரா)*

(Mr. M. Vincent Perera)

I move,

"That the proceedings on Item 1 of Public Business appearing on the Paper be exempted at this day's Sitting from the Provisions of Standing Order No. 70 (3)."

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## මහජන ආරක්ෂක ආඥාපනත: යෝජනාව
### பொதுசனப் பாதுகாப்புக் கட்டளைச்சட்டம்: தீர்மானம்
### PUBLIC SECURITY ORDINANCE: RESOLUTION

**ආර්. ප්‍රේමදාස මහතා (අග්‍රාමාත්‍යතුමා, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා, මහාමාර්ග කටයුතු පිළිබඳ ඇමතිතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**

*(திரு. ஆர். பிரேமதாச—பிரதம அமைச்சரும் உள்ளூராட்சி, வீடமைப்பு, நிர்மாண அமைச்சரும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)*

(Mr. R. Premadasa—Prime Minister, Minister of Local Government, Housing & Construction, Minister of Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රයේ පළමුවැනි අංකය වශයෙන් සඳහන් වන මෙම යෝජනාව මම ඉදිරිපත් කරන්නට කැමතියි:

"1959 අංක 8 දරන පනතින් සහ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සංශෝධිත (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ 1981 නොවැම්බර් මස 16 වන දින දරන ප්‍රකාශනය මගින් ජනාධිපතිතුමාණන් විසින් ඉහත කී ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන, ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතුය."

මේ යෝජනාව ඉදිරිපත් කරන විට මම මතක් කරන්න ඕනෑ, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අද මේ යෝජනාව සම්මත කර ගැනීමට තුනෙන් දෙකක ඡන්ද බලයක්, මන්ත්‍රීවරුන්ගේ කැමැත්තක් ලබා ගත යුතුව තිබෙන බව. අනූ දවසකට වැඩිය මහජන ආරක්ෂක ආඥාපනත ක්‍රියාත්මක කරන විට එසේ කිරීම අවශ්‍යයයි. මේ මහජන ආරක්ෂක ආඥාපනත ක්‍රියාත්මක කිරීම තවත් මාසයකින් දීර්ඝ කිරීමට රජය කල්පනා කර තිබෙනවා. ඒ අනුව ජනාධිපතිතුමා විසින් මේ පැනවීම කර තිබෙනවා. දවස් 10 ක් ඇතුළත මේ පාර්ලිමේන්තුව විසින් එය අනුමත කිරීම අවශ්‍යයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යම් යම් අවාසනාවන්ත සිද්ධීන් නිසා මහජන ආරක්ෂක ආඥාපනත ක්‍රියාත්මක කරන්න අපට සිදු වුණ බව මා කියන්නට කැමතියි. ඒ පිළිබඳව තොරතුරු නමුත් නාන්සේලා දන්නවා. ඒ අවස්ථාවේදී විපක්ෂය පවා ඊට පක්ෂ වුණා. ප්‍රමාද වුණා වැඩියි කියාත් අපට කිව්වා. මහජන ආරක්ෂක ආඥාපනත යටතේ තමයි, ඒ කලබලකාරී සිද්ධීන් මැඩ පවත්වන්නට අපේ ආරක්ෂක හමුදාවලට, පොලිසියට අවකාශ ලැබෙන්නේ කියා කවුරුත් පිළිගත්තා. ඒ වාගේම සාමාන්‍ය නීතිය යටතේ වැඩපැවැත්වීම අසීරු බවත් පිළිගත්තා.

මීට කලින් හැම වතාවකම කිව්වා වාගේ, දැන් මේ තුන්වැනි මාසය ඉක්මවන මේ වේලාවේත් කියන්නට කැමතියි, රජය කිසිම කැමැත්තකින් නොවන බව, මේ පනත පනවන්නේ. මොකද, අපේ රජය පිළිගෙන තිබෙන ප්‍රතිපත්තියක් තමයි, හැකි තාක් හදිසි නීතිය ඉවත් කිරීම. හදිසි නීතිය පවතින විට නොයෙක් විධියේ වැරදි ක්‍රියාවන් ඇති වන්නට ඉඩ තිබෙන බව නමුන්නාන්සේ දන්නවා. මේ හදිසි නීතිය ක්‍රියාත්මක කරන විටතත් බොහොම ප්‍රවේශමෙන්, කල්පනාකාරීව, ඒ බලතල ඉක්මවන්නේ නැතිව ක්‍රියා කරන ලෙස රජය හමුදාවන්ට විටින් විට උපදෙස් දී තිබෙනවා. එහෙම උපදෙස් දී තිබුණත් යම් යම් අවස්ථාවලදී මේ බලතල අනිසි ලෙස පාවිච්චි කළාය කියා අපට පැමිණිලි ලැබෙන බව නමුන්නාන්සේ දන්නවා. ඒ හැම අවස්ථාවකදීම රජය ඒ සම්බන්ධයෙන් නිහඬ වුණේ නැහැ ; ගත හැකි හැම පියවරක්ම ගත්තා. විරුද්ධ පක්ෂයේ නායකතුමා දන්නවා, නොයෙක් අවස්ථාවලදී එතුමා පැමිණිලි ගණනාවක් ඉදිරිපත් කළ බව. ඒ හැම අවස්ථාවකදීම ජනාධිපතිතුමාත්, රජයත් ඒවා සම්බන්ධයෙන් නොපැකිලී ක්‍රියා කළා. ඒ අනුව අපේ චේතනාව කොයි තරම් පැහැදිලිද කියන එක එතුමා හොඳින් දන්නවා. අපට ක්‍රියා කරන්නට සිදු වී තිබෙන්නේ හදිසි තත්ත්වයක් යටතේ නිසා ඇතැම් අය යම් යම් අවස්ථාවලදී මේ ආරක්ෂක නීති වැරදි ලෙස පාවිච්චි කරන්න නපුළුවන්. එම නිසා අපේ බලාපොරොත්තුව හැකි ඉක්මණින් මෙය ඉවත් කරන්නටයි.

අපි කල්පනා කළා, ගිය වාරයේදී මෙම විවාදය මේ සභාවේදී අවසන් වුණාම, කඩිනමින් එය ඉවත් කරන්න පුළුවන් වෙයි කියා. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු කීප දෙනෙක්ම කියා සිටියා, දැන් හදිසි තත්ත්වයක් රටේ නැහැ, එම නිසා මේ නීතිය ඉවත් කරන්න පුළුවන්ය කියා. මගේ හිතේ විවාදය ඉවර වෙලා දවසක්-දෙකක් යන්නටත් ලැබුණේ නැහැ, සිද්ධීන් ගණනාවක් රටපුරා ඇති වුණා. කෙසේ වුණත් ඒ තත්ත්වය දැන් හුඟක් දුරට මගහැරී තිබෙන බව සතුටින් ප්‍රකාශ කරනවා. දැන් රටපුරාම හදිසි තත්ත්වය මාසයක පමණ කාලයක්—සමහර විට කාලය ඊට වඩා අඩු වෙන්න පුළුවනි—පවත්වා ගෙන යන්නට සිදු වී තිබෙන්නේ යම් යම් සිද්ධි සම්බන්ධයෙන් කරගෙන යන පරීක්ෂණ අවසන් කිරීමට මේ හදිසි නීතිය යටතේ ලැබෙන බලතල ආරක්ෂක හමුදාවලට අවශ්‍ය නිසයි. මෙවර රාජ්‍ය රක්ෂක අංශයෙන් ලියවිල්ලකින්ම දැනුම් දී තිබෙනවා, තව ස්වල්ප කාලයක් අවශ්‍යය කියා මේ පරීක්ෂණ කටයුතු සතුටුදායක අන්දමින් නිම කරන්න.

ඒ අතර සාමාන්‍ය ජීවිතයට අත්‍යවශ්‍ය පහසුකම්වලට හා නිදහසට මේ අණපනත්වලින් බාධා ඇති වෙන්නට ඉඩ තබා නැහැ. රැස්වීම් පැවැත්වීම ආදී සාමාන්‍ය දේශපාලන කටයුතුවලට ඇති අවකාශය නැති කර නැහැ. නොයෙක් රැස්වීම්—දේශපාලන රැස්වීම් පවා—රටපුරා පැවැත්වෙන බව මට පෙනී යනවා. නමුත් ආරක්ෂක අංශය බොහොම ප්‍රවේශම් වෙනවා, ඇතැම් කොටස්වලට අවකාශ දෙන විට ජාතිභේදවාදී, ප්‍රකෝපකාරී හැඟීම් අවුස්සා නැවතත් රටේ ජනතාව අතර අසමාදානය, අසංවරය අයුතුකම් ඇති වන්නට ඉඩ නොලැබෙන අයුරින් ක්‍රියා කිරීමට. නමුත් දේශපාලන පක්ෂ වශයෙන් කල්පනා කර බැලුවොත් ඒවායේ කටයුතු කර ගෙන යන්නට කිසිම බාධාවක් නැහැ. එම නිසා දැන් පවතින විධියට මේ කටයුතු පැවතුනහොත්, ආරක්ෂක අංශය මගින් කර ගෙන යන්නාවූ යම් යම් පරීක්ෂණ කටයුතු අවසන් කර ගන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

පුළුවන් වුණොත්, පසුගිය සති දෙක-තුන තුළදී ඇති වුණු සමහර සිද්ධීන් සම්බන්ධ යෙන් කෙරෙන පරීක්ෂණ කටයුතු ඉවර කර ගන්නට වුළුවන් වුණොත්, මාසයක්ම මෙය පවත්වා ගෙන යන්නට අපේ බලා පොරොත්තුවක් නැහැ; හැකි තරම් ඉක්මණින් ඉවත් කරන්නට බලා පොරොත්තු වෙනවා.

එම නිසා මා ඉල්ලා සිටිනවා, මෙම යෝජනාව තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත කර ගන්නටය කියා. ගරු මන්ත්‍රීවරුන්ට මේ ගැන සාක්ච්ඡා කරන්න අවකාශ දීම පිණිස අපේ පක්ෂවල නායකයන් තීරණය කර ගත්තා, පෙරවරු 11 ට මේ පිළිබඳව ඡන්දය විමසන්න. මටත් අවසානයෙදි පිළිතුරු දෙන්න මිනිත්තු 15 ක පමණ කාලයකට ඉඩ තබා 10.45 වන තුරු මේ යෝජනාව ගැන ගරු මන්ත්‍රීවරුන්ට සාකච්ඡා කරන්න පුළුවනි. ඒක තවත් අතකින් ප්‍රයෝජනයි, තුනෙන් දෙකක ඡන්දයක් ගන්නට තිබෙන නිසා, අපේ ගරු මන්ත්‍රීවරුන්ට මේ සභා ගර්භ යට පැමිණෙන්ට. එම නිසා මේ යෝජනාව මම සභාව හමුවේ තබනවා.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

පූ. භා. 9.10

**ඒ. අමිර්තලිංගම් මහතා (කාන්කසන්තුරෙයි)**

*(திரு. எ. அமிர்தலிங்கம்—காங்கேசன்துறை)*

(Mr. A. Amirthalingam—Kankesanturai)

Mr. Speaker, I appreciate the concern of the Government to maintain law and order. It is the primary responsibility of the Government to safeguard the lives and property of law-abiding people from attacks by lawless elements, from whatever section of the population they may be, be they civilians or from the armed forces.

Unfortunately we have had occasion in this country to request the Government to avail itself of emergency powers in order to bring extraordinary situations under control. I have to accept the position that in August this year we of the Tamil Liberation Front, and I am also aware, the Hon. Minister for Rural Industrial Development, made the request to His Excellency the President that the Government should declare a state of emergency in order to bring the situation under control.

Now, a government with emergency powers is always dangerous. We have had in this country occasions when members of the armed forces got other ideas when they were called upon to use emergency powers for long periods. There have been charges made on two occasions that certain sections of the armed forces tried to usurp the power of government under emergency. So that, governing under emergency powers can be dangerous to the Government. It is doubly dangerous to the Opposition because the Oppositon's freedom of speech, freedom of assembly, freedom of expression can all be curbed under emergency powers. In fact the Hon. Prime Minister himself remarked yesterday that under the last government for six long years under emergency lots of things were done. We cannot condone actions of that type. It has become trebly dangerous for members of a minority nationality like the Tamil people.

We are actually on the horns of a dilemma. On the one hand, without the Emergency our people living in the midst of the Sinhalese majority run the risk of being attacked, being victimized, being robbed and even killed. I will agree with the Hon. Prime Minister that that situation has not completely changed. Even two weeks ago there were acts of arson in certain areas, there were acts of robberies committed in certain parts of the country which may necessitate extraordinary powers being assumed by the Government. In fact the burning of five shops belonging to Tamil people in Bandarawela—I think it was

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

on the 5th of this month— is attributed by certain persons to a short circuit in electricity in one of the shops, but I am now told that in the particular shop, which is called "Ranjana Stores", in which the short circuit is supposed to have occurred. the power supply has been cut off the previous day by the Electricity Department and they were working in candle-light that evening. So, whatever the reason may be, there is fear in the minds of people. Therefore, on the one hand, Emergency powers become necessary for safeguarding the lives and property of such people. On the other hand, the armed forces use Emergency powers to wreak vengance and to act on certain occasions in a communal way.

I am very thankful to His Excellency the President, the Hon. Prime Minister and the hon. Deputy Minister of Defence that whenever instances of excesses committed by the armed forces in our areas were brought to their notice they have taken prompt action. But we can only bring it to their notice after the damage is done, after a man is injured, after his head is broken, after he is hospitalized. Therefore, we must put a stop to these things happening altogether.

In the Tamil-speaking areas, even now certain acts have been committed by the armed forces in excess of their legitimate functions. It was brought to my notice that on the 6th of this month, in my own electorate near Senthankulam, under cover of searching for some contraband articles, army personnel had entered the house of a constituent of mine. He has made a complaint to the Kankesanturai Police that not only was he beaten up but even certain articles including a certain sum of money are missing from his house after the search. I know that the hon. Deputy Minister will be very anxious to put a stop to this, and I should say that Colonel Kobbekaduwe, who is there at the Jaffna Headquarters, has been taking prompt action whenever complaints were brought to his notice.

But you cannot keep watch on every one of these men, and when they are clothed with Emergency powers they tend to abuse these powers. Some of them, I know—I will not say all of them—go to the North only with the idea of enriching themselves in some way or the other. So, if you give police powers and powers of that nature to such men, they are bound to abuse them. That is why I said, we, speaking on behalf of the Tamil-speaking people, actually in a dilemma: without Emergency there is a problem for us, with Emergency there is a problem for us. We are in this unfortunate situation in this country, and we have to give expression to it here. That is why, Sir, while not opposing the present Motion, in order to impress on the Government and the authorities in charge of defence the necessity to put a complete stop to all these excesses, to make them realize that, while Emergency powers can be used for safeguarding the lives and property of law-abiding citizens, they can also be used by the armed forces to act unlawfully, lawlessly and very cruelly towards sections of the population, the TULF has decided not to vote either way on this Motion because, as I said, we find ourselves in this predicament of not being able to vote against it or for it for the reasons that I mentioned.

I thank you.

එස්. ඩී. බණ්ඩාරනායක මහතා (ගම්පහ)
*(திரு. எஸ். டி. பண்டாரநாயக்க—கம்பஹ)*
(Mr. S. D. Bandarnayake—Gampaha)

The Sri Lanka Freedom Party opposes the extension of this Emergency in this country. There are two aspects of this matter that is facing this country. Actually, there are two aspects to this looting, thuggery and lawlessness that the hon. Leader of the Opposition quite rightly pointed out and the terrorism that is prevailing in this country today. Let us examine the situation that this country is facing and analyse both aspects of the situation dispassionately.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

The thugs who, immediately after the July 1977 elections, were rampant, looting, breaking down houses and setting fire to houses of innocent,, lawabiding people; the thugs who were responsible for looting the shops and boutiques of Tamil-speaking people in August 1977; the thugs who were used to beat up the students in universities with iron rods; the thugs who were used to beat up trade union workers and trade union leaders in broad daylight for trade union activity in Colombo Fort; the thugs who were used against the CTB workers, about whom the Minister of Transport himself had complained to the Government; the thugs who were taken from Colombo and used on the 31st of May and 1st of June 1981 in Jaffna and who looted shops, set fire to the township of Jaffna, the Public Library and the house of the Member of Parliament for Jaffna, about which matters the Reverend Buddhist Theras of Naga Vihara in Jaffna, the Archbishop of Colombo, the Bishop of Jaffna, the Bishop of Kurunegala and the Citizenship Committee of Jaffna had complained to His Excellency the President; the thug who all over the country looted the shops and boutiques of Tamil-speaking people in June and July 1981; the thugs who looted the houses of plantation workers in 43 estates all over the country and set fire to their dwellings, as pointed out even today by the hon. Leader of Opposition; the thugs about whom His Excellency the President complained to the Working Committee of the United National Party, stating that he was not prepared to solve the problems that the country was faced with by thuggery and that if the party felt that way he was not prepared to lead the party; like a Frankenstein monster, the thugs organized by certain people in the Government had let themselves loose in the country. None of these acts are communal, as certain extraneous elements and leaders who organized these thugs are trying to make out.—[*Interruption.*]

සිරිල් මැතිව් මහතා (කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමා)
(திரு. சிறில் மத்திவ்—கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)
(Mr. Cyril Mathew—Minister of Industries & Scientific Affairs)

The thugs from Gampaha who threw a bomb at Mrs. Bandaranaike. Let him mention that also.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Are you raising a point of Order?

එස්. ඩී. බණ්ඩාරනායක මහතා
(திரு. எஸ். டி. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

I am not giving way.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Let Members be not disturbed! Yes, carry on.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

There is thuggery here!

එස්. ඩී. බණ්ඩාරනායක මහතා
(திரு. எஸ். டி. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

Yes there is thuggery here. You are quite right. There is thuggery here, as one of the Government MPs is pointing out, Sir.

Certain people endeavoured to make out that this was a Sinhala-Tamil communal problem by stating in Parliament and outside Parliament that Tamil-speaking people should be hanged on Galle Face Green. No, Sir! When these people found they could not solve the economic problems that the country is faced with they tried to bring about communal discord. That is what they are trying to do—some of the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

leaders today. This is utter nonsense. I do not blame these young MPs. They have been drawn into this and put into an embarrassing position. But this outlook that certain extremists have been trying to build up must be completely eradicated. These organized thugs must be given employment, like what the Government party organizer in Gampaha has done. As a matter of fact, the Government party organizer in Gampaha has given all these people jobs there, quite rightly, after the operation was done, from his point of view. They have been given jobs, and he is getting a good job done in Gampaha. As a matter of fact, I must tell these Government MPs that this organizer in Gampaha is doing a splendid job. So, is the Government prepared to discipline this army of thugs, give them employment and put them to some useful work in the country ?

The other aspect of this matter is the terrorism that is fast spreading in the coutnry. From North to South, from East to West,, it is fast spreading in the country. When the state, in the present world economic crisis, cannot guarantee to the people certain fundamental human rights, such as employment for all young people, a free national health scheme and old age pensions, a serious contradiction arises in society between the state and the people. The result is terrorism. This state of affairs is fast spreading and has taken root from North to South and East to West in Sri Lanka. The young people feel that a grave injustice is being perpetrated on them by society as a whole. They have no employment, their parents cannot afford to give them food to eat or a a decent pair of trousers and shirt to wear, they have not the wherewithal to get married and a house to live in. Everyone likes to live a contented life, everyone in the world. Everyone has the right to live a contented life. And the youth ask society for action. Now they have started action, and terrorism is their action. "Have we not the right to live as human beings ?" they want to know. "What are you trying to do in Parliament ?" they ask. "You are trying to impose the law from Parliament, use the gun, and use force not to stop acts of terrorism" they say.

Let us face this problem. I ask the Government, can you do this

මන්ත්‍රීවරයෙක්
*(அங்கத்தவர் ஒருவர்)*
(A Member)

What ?

එස්. ඩී. බණ්ඩාරනායක මහතා
*(திரு. எஸ். டி. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

Has any country in the world been able to do this ? No. Therefore, I urge the Government to face the issues in their true perspective and provide solutions to these problems. I ask the Government to solve these problems.

Sir, the next matter that I want to raise relates to the police and the grama sevakas who are called upon to perform Emergency duties. They are not paid the Rs. 10 allowance that is paid to military personnel. This should be paid to them if the Government expects the co-operation of all in solving these problems.

I wish, in conclusion, to ask the Government, is the Government prepared to give us permission to hold a five-party meeting in Colombo to discuss this Budget ?

මෛත්‍රීපාල සේනානායක මහතා (මැදවච්චිය)
*(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி)*
(Mr. Maithripala Senanayeke—Medawachchiya)

නැඟී සිටියේය.
*rose.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Do you like to follow a Government speaker ?

**නිශ්ශංක විජේරත්න මහතා (අධිකරණ ඇමතිතුමා)**
*(திரு. நிஸங்க விஜயரத்ன—நீதி அமைச்சர்)*
(Mr. Nissanka Wijeyeratne—Minister of Justice)

They are two different parties, Sir.

**මෛත්‍රීපාල සේනානායක මහතා**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන්, අපි මේ යෝජනාව අනුමත නොකරන බව මා පළමුවෙන්ම ප්‍රකාශ කරන්න සතුටුයි. මේ ගරු සභාවට මතක ඇති, හදිසි නීතිය පළමු වන වතාවට මේ ගරු සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේ අපි එයට පක්ෂව ඡන්දය දුන් බව. ඒ අවස්ථාවේදී අපට පෙනී ගියා රටේ තිබුණු තත්ත්වය අනුව යම් විධියක කැරලිකාර තත්ත්වයක් ඇති වේගෙන එන ලකුණු පහළ වුණා නම් එය මැඩ පවත්වා සාමය ආරක්ෂා කිරීමට රජයට තිබෙන ආයුධයක් වශයෙන් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කර ඒ යටතේ යම් යම් ක්‍රියාමාර්ග ගැනීමට රජයට සිදු වන බව. ඒ අනුව අපි එදා එය අනුමත කළා.

එහෙත් දැන් මෙය නැවතත් දීර්ඝ කරන්නේ හතර වැනි වරටයි. මාස 3 ක් අවසාන වී හතර වැනි වරට නැවතත් මේ යෝජනාව ඉදිරිපත් කරන මේ අවස්ථාවේ අපට පෙනී යන්නේ නැහැ, එදා තිබුණු ඒ තත්ත්වය දැන් රටේ පවතිනවා කියා. දැන් එවැනි තත්ත්වයක් උද්ගත වී නැහැ. එහෙත් මෙහෙන් සුළු සුළු සිද්ධීන් ඇති වෙන්න පුළුවන්.

**සිරිල් මැතිව් මහතා**
*(திரு. சிறில் மத்திவ்)*
(Mr. Cyril Mathew)

තමුන්නාන්සේලාගේ කාලයේ අවුරුදු 6 ක් තිබුණේ.

**මෛත්‍රීපාල සේනානායක මහතා**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

හැමදාම ඔය බණේ කියන්න බැහැ. "තමුසෙලා මෙහෙම කළා, ඒ නිසා අපිත් මෙහෙම කරනවා" කියා හැමදාම කියන්න බැහැ. මෙය ඉවරයක් වෙන්න ඕනෑ. දැන් අවුරුදු 4 ක් ගිහිල්ලත් කියන්න දෙයක් නැතිව තවමත් ඒ බණමයි කියන්නේ. අපි කියන්නේ අද තිබෙන තත්ත්වය අනුවයි. අවුරුදු 4 ක් හෝ 5 ක් අපි එසේ කළ බව කියා තමුන්නාන්සේලා අපව විවේචනය කළා. මහජනතාව ඒ විවේචන බාරගෙන පසුගිය මහා මැතිවරණයේදී අප පරාජය කර තමුන්නාන්සේලාට බලය දුන්නා. එසේ තිබියදී ගරු ඇමතිතුමා කියන්නේ ඒ නිසාම අපිත් එය කරනවා කියන එකයි.

ගරු කථානායකතුමනි, අද තිබෙන තත්ත්වය අනුව හදිසි තත්ත්වයක් අවශ්‍ය නැහැ. හදිසි නීති නැතිව සාමාන්‍ය පරිපාලන කටයුතු අනුව හමුදාව හා පොලීසිය පාවිච්චි කර යම් තත්ත්වයක් පවතිනවා නම් එය මැඩපැවැත්වීමට හැකියාව තිබෙනවා කියන එකයි අපේ අදහස.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ මා වෙනත් ප්‍රශ්නයක් මතු කරන්න සතුටුයි. එනම්, සාමාන්‍යයෙන් ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිළිවෙළක් අනුගමනය කරන පක්ෂයක් වශයෙන් මා පැහැදිලිව කියන්න සතුටුයි, අපි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, කලබලකාරී තත්ත්වයක් අනුගමනය කරන්නේ නැති බව. වෙනත් යම් කොටසක් එවැනි වැඩ පිළිවෙළක් අනුගමනය කරනවා නම් අපි එහි කොටස්කාරයින් වන්නේ නැති බවත් මා පැහැදිලිවම කියන්න ඕනෑ. නීති කඩන්නට හෝ වෙනත් මාර්ගවලින් බලය අල්ලා ගන්නට හෝ වෙනත් යම් පිරිසක් සූදානම් වෙනවා නම් මා කියනවා මා නියෝජනය කරන නියම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එය අනුමත කරන්නේ නැහැ කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සිරිල් මැතිව් මහතා**
*(திரு. சிறில் மத்திவ்)*
(Mr. Cyril Mathew)

තමුන්නාන්සේ නියම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ය කියන්නේ, අනියම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයකුත් තිබෙනවාද?

**මෛත්‍රීපාල සේනානායක මහතා**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

තිබෙනවා නම් තමුන්නාන්සේලා සොයා ගන්න.

ගරු කථානායකතුමනි, මේ හදිසි නීතිය නිසාම, ගම්පහ ගරු මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මහතා) පොඩ්ඩක් කිව්වා වගේ, නියම විධියට රැස්වීම් පවත්වා ගැනීමට අපට බාධාවක් ඇති වී තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදීව මහජනතාවට කරුණු කියා දී ප්‍රජාතන්ත්‍රවාදීව මැතිවරණයක් තුළින්, ඡන්දයක් තුළින්, බලය අල්ලා ගැනීමේ අයිතිය තරමක් දුරට හෝ සීමා වී තිබෙනවා, හදිසි නීතිය නිසා. අන්න ඒ නිසයි, අපි විශේෂයෙන්ම අද කියන්නේ මේ හදිසි නීතිය ඉවත් කර අපට ඒ තත්ත්වය ලබා දීමට කටයුතු කරන්නය කියා.

එයට සම්බන්ධ වන කරුණකුත් ඇති වී තිබෙනවා. අපේ පක්ෂ කාර්යාලය වසා දමා සීල් තබා තිබෙනවා. එදා අපේ පක්ෂයේ වැඩබලන ලේකම් වශයෙන් මස්කෙළියේ දෙවැනි මන්ත්‍රී අනුර බණ්ඩාරනායක මහතා—

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
(A Member)

ඇයි දැන් නුවරඑළිය කැල්ල නැද්ද?

**මෛත්‍රීපාල සේනානායක මහතා**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

නුවරඑළිය-මස්කෙළිය දෙවැනි මන්ත්‍රීතුමා. තමුන්නාන්සේලා ඔය දෙබිඩි නම් දැන් අත්හරින්නනෙ හදන්නේ. දිස්ත්‍රික්ක වශයෙන් ඡන්ද ගන්නනෙ යන්නේ. ඒ කෙසේ වෙතත්, එතුමා එදා පැහැදිලිව පොලීසියටත් පැමිණිලි කර පොලිස්පතිතුමාටත් ලිපියක් යවා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් ලිපියක් යවා කිව්වා පක්ෂ කාර්යාලය මෙහෙම කර තිබෙනවා, එය අපට ලබා දෙන්න කියා. අපි කියනවා, කාර්යාලය භාර දිය යුත්තේ අපට කියා. මන්ද අද මේ පාර්ලිමේන්තුවේ බැලුවත්, මෙහි සිටින මන්ත්‍රීවරුන් 4 දෙනෙක් අපේ මධ්‍යම කාරක සභාවේ සභිකයෝ. ඒ වගේම එදා තිබුණු මධ්‍යම කාරක සභාවේ හිටිය 13 දෙනෙක්ම අද අපේ මධ්‍යම කාරක සභාවේ සභිකයෝ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිති ව්‍යාපාරයක් තිබෙනවා නම්,—රාජ්‍ය අංශයේ වෘත්තීය සමිති ව්‍යාපාරයත්, පෞද්ගලික අංශයේ වෘත්තීය සමිති ව්‍යාපාරයත් දෙකම— නියෝජනය කරන්නේ අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. යම් පැවිදි සංවිධානයක් තිබෙනවා නම්, ඒවාත් අපි සමගයි. තරුණ සංවිධානයක් තිබෙනවා නම් ඒවාත් අප සමගයි. කාන්තා සංවිධානයක් තිබෙනවා නම් ඒවාත් අප සමගයි. මේ අන්දමට සියයට 70 ක් පමණ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අප සමග සිටින නිසා අපි තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. ඒ නිසා කරුණාකර ඒ කාර්යාලය අපට භාර දෙන ලෙස ගරු අගමැතිතුමා මාර්ගයෙන් අපි මේ රජයෙන් ඉල්ලා සිටිනවා.

තවත් කරුණක් තිබෙනවා. මේ කාර්යාලය ගැන යම් පුද්ගලයෙක් පැමිණිලි කළා නම් ඒ පැමිණිලි කළ පුද්ගලයාත් අද ඉන්නේ විත්තිය සමගයි. පැමිණිලි ලත් විත්තියත් දැන් එක්ව සිටින නිසා මෙතැන පැමිණිල්ලක් නැහැ. ඒ නිසා වැඩි කල් යන්නට මත්තෙන් ඒ කාර්යාලය අපට භාර දෙන හැටියට රජයෙන් ඉල්ලා සිටිනවා.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

කවුද, පැමිණිල්ල කළේ?

**මෛත්‍රීපාල සේනානායක මහතා**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

පැමිණිල්ල කළේ පාලක ලේකම් කරුණාජීව මහත්මයායි. දැන් ඒ මහත්මයා ඉන්නෙ අප සමගයි. පැමිණිලි කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෛත්‍රීපාල සේනානායක මහතා]
තිබුණේ අනුර බණ්ඩාරනායක මහත්මයා ගිහින් අයුතු විධියට කාර්යාලය අල්ලා ගත්තා කියායි. අනුර බණ්ඩාරනායක මහත්මයා රජයටත්, පොලීසියටත්, ආරක්ෂක අමාත්‍යාංශයටත් ලියා තිබෙනවා, කාර්යාලය නැවත අපට භාර දෙන්න කියා. ඒ නිසා හදිසි නීතිය ඉවත් කරල—දැන් මෙම කාර්යාලයේ ප්‍රශ්නය නඩුවකට සම්බන්ධ කාරණයක් වශයෙන් උසාවිය ඉදිරියේ තිබෙනවා—නඩුව කෙසේ වෙතත්, නියම අයිතිකාරයන් කවුදැයි සොයා බලා ඒ පිරිසට කාර්යාලය භාර දෙන ලෙසයි අපි ඉල්ලා සිටින්නේ.

මෙම කාර්යාලය පෞද්ගලිකව කෙනෙකුට අයිති දෙයක් නොවෙයි. මේක පක්ෂයට අයිති එකක්. පක්ෂයට අයිති දෙයක් නම් එදා තිබුණු දේශපාලන මණ්ඩලයේ මධ්‍යම කාරක සභාවේ සිටි 17 දෙනාගෙන් 12 දෙනෙක්ම සිටින සංශෝධනයෙන් පසුව 22 දෙනාගෙන් 13 දෙනෙක් සිටින කණ්ඩායමට භාර දීම සුදුසු බවයි මම මේ ගරු සභාවට මතක් කරන්නේ. එපමණක් නොවෙයි භාරකාර මණ්ඩලයේ වැඩි දෙනෙක් ඉන්නෙත් අප සමඟයි.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)
කවුද ඒ භාරකාර මණ්ඩලය ?

**මෛත්‍රීපාල සේනානායක මහතා**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)
සභාපති, උප සභාපතිවරුන් දෙදෙනෙක්, ලේකම්, භාණ්ඩාගාරික මේ අයගෙන් වැඩි දෙනෙක් ඉන්නෙ අප සමඟයි. ඒ නිසා භාරකාර මණ්ඩලයේ වැඩි දෙනෙක් සිටින අපේ පක්ෂයට එහි අයිතිය භාර දෙන ලෙස අපි රජයෙන් ඉල්ලා සිටිනවා.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)
කවුද, සභාපති ?

**මෛත්‍රීපාල සේනානායක මහතා**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)
පක්ෂයේ සභාපති, එතකොට මම. ගරු අගමැතිතුමනි, ගරු කථානායකතුමනි, මේක හිනාවෙන කාරණයක් නොවෙයි. මහජන මුදලින් ඉදි කළ පක්ෂ මූලස්ථානය පෞද්ගලිකව කෙනෙකුට අයිති නැහැ. ඒකෙ අයිතිය ලැබිය යුත්තේ එක්කො භාරකාර මණ්ඩලයට ; නැත්නම් මධ්‍යම කාරක සභාවට.

ජූලි 28 වෙනිදා අනුමත කර ගත්තා අපේ ව්‍යවස්ථාව අනුව තුන් මාසයක් ඇතුළත නිලවරණය පැවැත්විය යුතුයි. ඒ අනුව සැප්තැම්බර් 27 වෙනිදා මධ්‍යම රාත්‍රියට පෙර සියලුම නිලවරණ පැවැත්විය යුතුයි. අපි සැප්තැම්බර් 27 වෙනිදා මධ්‍යම රාත්‍රියට පෙර නීත්‍යානුකූලව සියලුම නිලවරණ පැවැත් වූ නිසා, නීත්‍යානුකූල පක්ෂය අපේ පක්ෂය බව මා නිර්භයව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

අපි, ප්‍රජාතන්ත්‍රය විශ්වාස කරන පක්ෂයක් හැටියට, කලබලකාරී වැඩ පිළිවෙළවලට කිසිම විධියකින් ආධාර අනුබල නොදෙන කොටසක් හැටියට, ගරු අගමැතිතුමාගෙනුත් රජයෙනුත් මේ ගරු සභාවෙනුත් ඉල්ලා සිටින්නේ මේ ප්‍රශ්නය විසඳා, අපට ලැබිය යුතු අයිතිය ලබා දී, අපේ පක්ෂ කාර්යාලය අපට බාර දී, අප වෙනුවෙන් යුක්තිය ඉෂ්ට කරන හැටියටයි. එහෙම වුණොත්, ප්‍රජාතන්ත්‍රවාදීව ප්‍රසිද්ධ රැස්වීම් තබා, මහජන මතය අනුව, ලබන අවුරුද්දේ හෝ 1983 හෝ මේ රටේ මැතිවරණයක් පැවැත්වෙන අවස්ථාවේදී, තීරණයක් ගැනීමේ වගකීම මහජනතාවට බාර දීමට අපිත් සූදානම් බව මම මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරනවා.

අපි මේ යෝජනාවට විරුද්ධයි. යම් විධියක බාධාවන්, ප්‍රමාදයන් අද ඇති වී තිබෙනවා නම්, හදිසි නීතිය ඉවත් කර සාමාන්‍ය නීතිය යටතේ ඒවා විසඳා, යුක්තිය ඉෂ්ට කරන හැටියට ප්‍රජාතන්ත්‍රවාදය විශ්වාස කරන පක්ෂයක් වශයෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

...නිශ්ශංක විජයරත්න මහතා
(திரு. நிசங்க விஜயரத்ன)
(Mr. Nissanka Wijeyeratne)

Mr. Speaker, we have heard today the views expressed on the Emergency both from the Opposition and from what now appears a united Sri Lanka Freedom Party in this House. Mr. Speaker, emergencies are introduced when certain conditions of a general nature exist in a country, but unfortunately it is on a specific matter of great concern to the now truly accepted leader of the SLFP that the submission has been made that the Emergency must be removed to solve a purely domestic problem, namely, the housing problem of the now apparently united S.L.F.P.

Sir, some time ago on the day when this unfortunate— unfortunate as far as their party was concerned—incident occurred, I was coming to my office. I came up to Ward Place and turned, about lunch time, down Wijerama Mawatha to drop in at a private hospital to see a patient. Unfortunately, I saw a rather aggressive looking crowd gathering, near the temple at which they used to worship, at the Rosemead Place Junction.—[*Interruption.*] Yes, I became a convert to a better faith in good time. Mr. Speaker, if they heard the comments that were offered about them, if they saw the aggressive nature of the crowd, I am quite sure that even now they will justify the intervention by the police at that crucial moment. They think the situation has eased, but unfortunately last Sunday in Kandy, there was a rather large meeting, a seminar, held at the United Buddhist Centre, which had been hired out to a dissident section of the now legally claimed S.L.F.P., presided over by, I believe, someone who has unfortunately lost the civic rights. If they heard what those people said on their way back home, I am quite sure the Members of this House belonging to the S.L.F.P. will only be too happy that an Emergency does in fact exist. J

Mr. Speaker, the Sri Lanka Freedom Party now apparently united, without having a Gampaha section or an Attanagalla section, sits endorsing everything that their truly accepted leader says. Then it behoves us to give consideration to what the true leader of the S.L.F.P. says. This has to be examined in the light of the police reports, the information the police has obtained in regard to the violent hostility and hatred that exist against the Parliamentary section or the Parliamentay S.L.F.P. But if, on the other hand, we find that the position is not so acute and bearing in mind the general situation in the country, this Government will only be too prepared to act in the democratic way to which it is committed.

I would ask the SLFP section to bear in mind that one of its speakers mentioned the spread of trouble in this country from north to east, south to west. He rambled on the tragedy of the poor youth, on the violence which he does not like, because he never liked the cultural revolutions in some countries. He does not like violence. He eschews violence. In fact, he had nothing to do, whatever the people say, in the famous incident of Imbulgoda or in the attempted bombing recently in Gampaha of the person who lost her civic rights. Violence has never been the credo of the hon. Member for Gampaha, and we like to hold him to that even though a little fire came in his speech after many months in this House.

But he talked of violence. We know there is violence. That is why, very correctly, the hon. Leader of the Opposition mentioned that they were on the side of the Sinhalese people. he feared that the violence was only on the side of the SinhaleJse people. I wonder whether the police reports are correct about the innumerable death of Tamil people in Jaffna ? Listening to the hon. Leader of the Opposition, one would have imagined that only

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නිශ්ශංක විජයරත්න මහතා]

in the Sinhalese areas were innocent Tamil citizens being assaulted and killed. If that is so, then all the talk of the police and all their inquiries in regard to the death of police person nel and human beings in Jaffna must be truely a figment of their imagination. I think the position is otherwise.

There is violence, and there is violence because violence is like grasping a tiger's tail. You just cannot control violence over-night. We must exhort the people to do so, and I hope even now the hon. Leader of the Opposition and the members of his party, the leaders of the true SLFP and other sections will join us in a public meeting to condemn violence. I think that is very essential. An invitation has been extended, and we still hope that it will be accepted.

As far as this Government is concerned, we have an obligation outside the narrow confines of political party definitions, to all the people of the country, to see that violence is completely eliminated from our country, and where there is a likelihood of violence raising its head, to vest the police and the other forces of law and order with the necessary authority to bring those who violated the law to book in as speedy and effective a manner as possible.

Thank you.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා (කලවාන)

(திரு. சரத் முத்தெட்டுவேகம—கலவான)

(Mr. Sarath Muttetuwegama—Kalawana)

ගරු කථානායකතුමනි, හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳව මගේ අදහස් කියන්නට පෙර එහි ප්‍රතිඵල දෙකක් ගැන, ඇති වී තිබෙන ප්‍රති විපාක කීපයක් ගැන, වචන ස්වල්පයක් කියන්නට බලාපොරොත්තු වෙනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ සිදුවුණු අලාභ හානි පිළිබඳව රක්ෂණ සංස්ථාවට දැනුම් දීමෙන් පසුව එම අලාභහානි පිළිබඳව තක්සේරු කිරීම සඳහා රක්ෂණ සංස්ථාව විසින් පත් කර තිබෙන්නේ එකම තක්සේරුකරුවෙකු පමණයි. මුළු දිස්ත්‍රික්කයටම පත්කර තිබෙන්නේ එකම තක්සේරුකරුවෙක් පමණයි. Loss Assessor වරුන් එක් කෙනෙයි පත් වෙලා තිබෙන්නෙ. ඔහු රත්නපුර, කහවත්ත, බලන්ගොඩ, නිව්තිගල ආදී හැම තැනකම සිදුවූ අලාභහානි පිළිබඳව තක්සේරු කරන්න ඕනැ. මේ නිසා ද්‍රවිඩ හා සිංහල දෙපක්ෂයේම අලාභ හානි සිදුවුණු අයට ලොකු ප්‍රමාදයක් ඇති වී තිබෙනවා, තමන්ගේ රක්ෂණ මුදල් ලබා ගැනීමට. ඒ නිසා ඒ සම්බන්ධයෙන් සොයා බලා තව තක්සේරුකරුවන් කීප දෙනෙක් පත් කර, ඉක්මන් විධිමත් වැඩ පිළිවෙලක් යොදන්නය කියා වෙළෙඳ ඇමතිතුමාගෙන් මම ප්‍රථමයෙන්ම ඉල්ලා සිටිනවා.

අනික් කාරණය නම්, රත්නපුර දිස්ත්‍රික්කයේ සිටින යුද හමුදාවට සම්බන්ධ සමහර උදවිය—හැමෝම නොවෙයි—එතු සුපිරින්ටෙන්ඩන්ට්වරුන් සමග එකතු වී විටින් විට ඒ ප්‍රදේශයේ තිබෙන වෘත්තිය සමිතිවලට බලපෑම් කළ අවස්ථාවල් තිබෙනවා. මම හිතන්නේ එකක් ගැන මම පැමිණිල්ලක් කරලත් තිබෙනවා. ඇන්දාන වත්තෙත්, ස්ප්‍රින්ගුඩ් වත්තෙත් යන වතු දෙකේම වැඩ කරන කම්කරුවන්ට තමන් කැමති වෘත්තිය සමිතියකට බැඳීමට අවහිර කිරීමට සමහර සුපිරින්ටෙන්ඩන්ට් වරුන් යුද හමුදාවේ යම් යම් උදලිය උපයෝගී කරගෙන තිබෙනවා. ඒ ගැනත් සොයා බලන්නය කියා ගරු අග මැතිතුමාගෙනුත්, ආරක්ෂක කටයුතු පිළිබඳ නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මේ වරත් හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳව අපි විරුද්ධ වෙන බව මතක් කරන්න කැමතියි. ඇත්ත වශයෙන්ම මේ වර හදිසි නීතිය දීර්ඝ කරන්නට කිසිම හේතුවක් නැහැ. ගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩු පක්ෂ රැස්වීමේදී කරන ලදැයි කියන කතාවක වාර්තාවක් ඊයේ පත්‍රවල පළවී තිබෙනවා මම දැක්කා. එම කතාවෙන් එතුමා කියා තිබෙන්නේ යම් යම් හොරකම් සහ දූෂණ යම් යම් පළාත්වල සිදුවෙන බවයි. හොරකම් සිදුවෙනවා. මේ රටේ දැන් උඩ ඉඳල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පහළටම හොරකම් සිදුවෙනවා. ඒවා ගැන සොයන්නත් හදිසි නීතිය පාවිච්චි කරන වාද කියා මා අහන්න කැමතියි. අද තිබෙන තත්ත්වය යටතේ මේ ආණ්ඩුවට හදිසි නීතිය නැතිව රට ආණ්ඩු කරගෙන යන්නට බැරි තත්ත්වයක් උදාවීගෙන එනවා. පසුගිය අවස්ථාවක රජිනගේ ගම නට හදිසි නීතිය පාවිච්චි කළා. රජිනගේ ගමනේ දීත් හොඳ දේවල් දකින්න ලැබුණා. මොනවා වුණත් මම දැන් ඒවා ගැන කියන්න යන්නෙ නැහැ. ඉතිහාසය ගැන කියල වැඩක් නැහැ. රජිනගේ ගම නේදීත් යම් යම් දේවල් දකින්න ලැබුණා. ආණ්ඩුවේ තිබෙන මත භේද රජිනගේ ගමනේදීත් පේන්න තිබුණා.

මන්ත්‍රීවරයෙක්
*(அங்கத்தவர் ஒருவர்)*
(A Member)
මොනවාද?

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)
ඔනෑ නම් මම කියන්නම්. දැන් රජින ගේ ගමන අවසන් වී අයවැය ලේඛනය ඉදිරිපත් කරල තිබෙනවා. අයවැය ලේඛ නයෙන් ඇති වෙන ප්‍රතිවිපාක වැළැක්වීම ටත් ආණ්ඩුව හදිසි නීතිය පාවිච්චි කරන් නට බලාපොරොත්තු වෙනවා. පුදුම ලෙස බඩු මිල ඉහළ යන්නට දැන් පටන් ගෙන තිබෙනවා. ව්‍යාපාරික පිරිවැටුම් බද්ද නිසා ඊයේ පෙරේදා ඉඳල බඩු මිල ඉහළ යන් නට පටන් ගෙන තිබෙනවා. මේ සම්බන් ධයෙන් ජනතා විරෝධය එන්න එන්නම වැඩි වෙනවා. ඒ සියල්ලටම වඩා හදිසි නීතිය ආණ්ඩුවට ප්‍රයෝජනවත් වී තිබෙන් නේ ආණ්ඩුව ඇතුලේ දැන් මතුවී තිබෙන භේද වළක්වා ගන්නටයි; නවත්නා ගන් නටයි; සඟවා ගන්නටයි.

මේ හදිසි නීතිය නිසා ප්‍රචාරත්ති පාලන යක් සිදුවෙනවා; ප්‍රසිද්ධ රැස්වීම් තහ නම්. කොයි තරම් කිව්වත් ප්‍රසිද්ධ රැස් වීමකට බලපත්‍රයක් ඉල්ලා සිටි විට, පොලිස් ස්ථානාධිපතිවරයා එය රෙකම දාරු කරන්නේ නැහැ. ගරු අගමැතිතුමාට මම මේ පැමිණිල්ල තුන්වරක්ම කර තිබෙ නවා, හදිසි නීතිය පිළිබඳ විවාද වෙන අවස්ථාවලදී. ප්‍රසිද්ධ රැස්වීම්වලට අවස් ථාවක් දෙන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ රැස්වීම් පවත්වනවා. අපේ රැස්වීම් පැවැත්වීමට අවසර ඉල්ලුවාම ඒවා ප්‍රතික්ෂේප කරනවා.

ආර්. ප්‍රේමදාස මහතා
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)
ප්‍රතික්ෂේප කර තිබෙන්නේ කොයි, කොයි ඒවාද කියා අපට කිව්වොත්.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)
අපි ඉල්ලූ ඔක්කොම ප්‍රතික්ෂේප කර තිබෙනවා.

කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා
*(திரு. கே. டி. எம். ஸி. பண்டார)*
(Mr. K. D. M. C. Bandara)
කොහේ, කොහේ, ඒවාද ප්‍රතික්ෂේප කර තිබෙන්නේ?

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)
සිද්ධීන් කීපයක් මට කියන්න පුළුවනි. ඒ විස්තර මම අද ගෙනාවෙ නැහැ. නමුත් රජයේ රැස්වීම් පවත්වනවා. අරක විවෘත කරන්න, මේක විවෘත කරන්න, මුල්ගල් තියන්න, රජිනගේ ගමනට, මේ හැම දේටම රජය රැස්වීම් පවත්වන වා. දැන් අරාබියේ රජ්ජුරුවෝ එන වාලු. ඒකටත් හදිසි නීතිය දික් කරන්න වෙයි. මේක මේ මාසයෙන් ඉවර වෙන්නේ නැහැ. සවුදියේ කාලිඩ් රජ්ජුරුවෝ ආවාම රත්තරන් ඔටුන්නක් ගේම පිළිගන්වා, රැස්වීමක් පවත්වා එයා පිළිගන්නවා. ආයෙත් කවුරුහරි ආවාම තවත් රැස්වී මක්. මේ රජ වත්දනාවෙන් රටේ ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. ආණ්ඩුවේ තිබෙන භේද වසා ගන්නට හදිසි නීතිය දැන් උප යෝගී වී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සරත් මුත්තෙට්ටුවෙගම මහතා]

දැන් මේ රජයේ ඇමතිවරුන්ට උදා වී තිබෙන තත්ත්වය බලන්න. මම මේ මන්ත්‍රණ සභාවට එන්නට පෙර, නිදහස් වෙළඳ කලාපයේ සභාපතිතුමා ගැන පෙත්සමක් ඉදිරිපත් කළා. එවැනි පෙත්සම් විභාග කිරීමට අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොමිටියක් තිබුණා. ඒක එසේ මෙසේ කොමිටියක් නොවෙයි. අගමැතිතුමා, රාජ්‍ය ඇමතිතුමා, මුදල් ඇමතිතුමා වැනි ඇමතිවරුන් බර ගණනක් ඒ කොමිටියේ හිටියා. කොමිටිය පැවැත්වුණේ අගමැතිතුමාගේ සභාපතිත්වයෙන්. ඒ කොමිටිය—මගේ පෙත්සම උඩ නොවෙයි කියමුකෝ—මොන හේතු නිසා හෝ, ඒකමතිකව තීරණය කළා, උපාලි විජේවර්ධන මහත්මයා ඒ වැඩේට සුදුසු නැත කියා. මොකටද? සභාපති වැඩේට. කිසිම දෙයක් වුණේ නැහැ. බලා හිටියා, ඇහැ ඒවා බැලුවා, පත්‍රවලට ලිව්වා. මොකවත් වුණේ නැහැ. දැන් ඒ මහත්මයා පත්‍රයක් පටන් ගෙන තිබෙනවා. විවෘතව මේ ආණ්ඩුව තුළ තිබෙන භේදය ඒ පත්‍රයෙන් එළිදරව් කර තිබෙනවා. "අයිලන්ඩ්" පත්‍රයෙන් "දිවයින" පත්‍රයෙන් විවෘතව ඒ මතභේදය මතු වී තිබෙනවා. හෙළිදරව් වී තිබෙනවා. දේශපාලන නිරීක්ෂකයෙකුට පමණක් නොවෙයි, ඕනෑම බබෙකුට පේනවා, මෙය පොඩි ප්‍රශ්නයක් නොව, මෙය බරපතල ප්‍රශ්නයක් බව. මට ආරංචියි, දැන් එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට භාර දී තිබෙනවාය කියා මේ උපාලි විජේවර්ධන මහත්මයා නිදහස් වෙළඳ කලාපයේ සභාපති හැටියට තවදුරටත් තියාගෙන ඉන්නවාද නැද්ද කියා තීරණය කිරීමට. ඒ කටයුත්ත භාර වූ මේ සභාවේ විශේෂ කාරක සභාවක් ගත්තු තීන්දුවක් ක්‍රියාත්මක කරන්නට බැරි නම් මම අහනවා, ඔය පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට ඒක කරන්න පුළුවන්ද කියා.

දැන් මේ මතු වී තිබෙන භේදය බලන්න. දැන් උපාලි විජේවර්ධන මහතා ඒ පත්‍රයෙන් ඇමතිවරුන් දෙතුන් දෙනෙකු පහර ගහනවා. අගමැතිතුමාට මුදල් ඇමතිතුමාට—මුදල් ඇමතිතුමා නම් කට ඇරියොත් කථා කරන්නෙ එයාට පහර ගහලයි. මේක විවෘත රහසක් වෙලා තිබෙනවා. මුළු රටම දන්නවා. අපි දන්නවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ භේදයක් තිබෙනවා. ඒ පක්ෂය දෙකට කැඩිලා තිබෙනවා. මේ පක්ෂයේ අද ඇති වී තිබෙන භේදය එසේ මෙසේ භේදයක් නොවෙයි. ඊයේ පෙරේදා මිගාර කියන ලේඛකයා "වීක් එන්ඩ්" පත්‍රයට ලියනවා. බොහෝම හාස්‍යකම් ඇති ලිපියක්. මේ මහතා ලියන ලිපිවල ඇති කාරණාවලින් එකක් මම කියන්නම්. එක දවසක් කිව්වා මිරිස්සෙදී ලීක්වාන් යූ මහතාත් ජනාධිපතිතුමාත් රාත්‍රී 2 වන තුරු කළ සාකච්ඡාවක් ගැන. ඒ කථාව මිගාර කියන ඒ මහතාට එක්කො ලීක්වාන් යූ මහතා කියන්න ඕනෑ, නැත්නම් ජනාධිපතිතුමා කියන්න ඕනෑ.

මිගාර කියන ලේඛකයා එසේ මෙසේ කෙනෙක් නොවෙයි, උඩින් පහළින් අංජනම් එළි බලන මහත්මයෙක්. එයා කියන දේවල් ලේසියෙන් අත හරින්න බැහැ. මොකද ඒක අංජනමකින් අඳුනකින් කියන දෙයක්. ලොකු ලොකු තැන්වලින් එන දේවල්. ලීක්වාන් යූ මහතාත් ජනාධිපතිතුමාත් කළ කථාව ඔන්න ඉරිදා පත්‍රයෙන් ජනතාවට කියා දුන්නා. ඊයේ නල්ලූර් මන්ත්‍රීතුමා (එම්. සිවසිතම්පරම් මහතා) කියා තිබෙනවා, කොතලාවල මහතා ඉන්න කාලයේ කිව්වලු, කැබිනට් මණ්ඩල රැස්වීම් ගෝල්පේස් එකේ පවත්වනවාය කියා. දැන් ගෝල්පේස් ඕනෑ නැහැ. කොහේ තිබ්බත් රූපවාහිනියෙන් වාගේ මිගාර අපට කියා දෙනවා. දැන් මේ ආණ්ඩුවේ තිබෙන භේදය මම කියන්නම්. අගමැතිතුමා ඉල්ලා අස්වෙන්න තර්ජනය කළාලු, ගිය බ්‍රහස්පතින්දා. ඊයේ අපේ කොළඹ දිසා ඇමතිතුමා කිව්වා, ඕක මොකක්ද මෙතන වමනෙ කර තිබෙන්නෙ. ගහගෙන තිබෙන්නෙ. ලේ හලාගෙන තිබෙන්නෙ කියා. එහෙම වෙන්න ඇති. දැන් අගමැතිතුමා ඉල්ලා අස්වෙන්න කළ තර්ජනය මිගාර අපට කියනවා. ඒක අපි පිළිගන්නවා, එහෙම වෙන්න ඇත කියා. මේවා පොඩි වැඩ නොවෙයි. හොඳ අංජනම්වලින් කියන දේවල්. මේවා හරි බරපතල වැඩ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මම තවත් වැදගත් කරුණක් කියන් නම්. තමුන් නාන් සේලා හදාගත් තා ව්‍යවස්ථාවක්. අපි කියනවා, ඒක ප්‍රජාතන්ත්‍ර විරෝධි ව්‍යවස්ථාවක් කියා. ඒ දවස්වල හදාගත් ඔය ව්‍යවස්ථාව හදාගත්තේ සදාකලිකවම බලයේ ඉන්න පුළුවන් ඉණි මගක් හැටි යටයි. දැන් එය පක්ෂයේ බෙල්ල වටේ තොන්ඩුවක් විශයෙන් වැටී තිබෙනවා. මම අහනවා එක ප්‍රශ්නයක්. මේ සභාවේ යු. එන්. පී. මන්ත්‍රීවරු 140 දෙනෙක් ඉන් නවා—[බාධා කිරීම්] මාව නිවැරදි කළා, කුණ්ඩසාලේ මන්ත්‍රීතුමා (ඩී. එම්. චන්ද්‍ර පාල මහතා)—143 දෙනෙක් ඉන් නවා. එයින් එක් කෙනෙක් අස් වෙලා—නම්බු පිටින් ගිහින්. ඒ නිසා 142 යි. මේ ව්‍යවස් ථාවේ හැටියට මේ මන්ත්‍රීතුමන්ලා ආස නයේ වැඩ කළුට මැඩන් නැහැ. ආසනයේ ඡන්දදායකයන්ගේ ආධාර ලබාගත්තට වැඩක් නැහැ. සිරිකොතේ වැඩ කරන්න ඕනෑ. ලැයිස්තුවේ උඩට එන්න සිරිකොතේ වැඩ කරන්න ඕනෑ.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Now where are you going? Are you discussing the Emergency?

සරත් මුත්තෙට්ටුවේගම මහතා
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

The Emergency, Sir. My case is that this party is so badly split that the Government is imposing the Emergency to keep the split from widening any further.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Then speak about that and not about party affairs.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)

I hope that you have no split.—[*Interruption.*]

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! Please be a little more audible. What did you say?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)

I just asked whether you also have a split.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

You can see whether there is a split here.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)

I do not see a split.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Yes, hon. Member for Kalawana (Mr. Sarath Muttetuwegama), carry on.

සරත් මුත්තෙට්ටුවේගම මහතා
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

ඒ නිසයි මා කියන්නේ, දැනට මේ ගරු සභාවේ ඉන්න එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් අඩු තරමින් 85 සට 90 කටවත් ලබන සැරේ එන්න බැහැ කියා, මේ ව්‍යවස්ථාව අනුව. එම නිසා දැන් ලොකු තරගයක් තිබෙනවා, ලැයිස්තුවේ ඉහළට එන්න. ඔවුන්ගේ මන්ත්‍රීකම විසඳෙන්නේ ඡන්ද කොට්ඨාශයෙන් නොවෙයි. "සිරිකොතෙනුයි."

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! I want the hon. Member to be more specific on the subject under discussion now.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

මා කියන්නේ, මේ සැරේ හදිසි නීතිය පනවා තිබෙන්නේ, ආණ්ඩු පක්ෂය ඇතුලේ තිබෙන භේදය නිසාය කියායි. එක්සත් ජාතික පක්ෂය තුළ තිබෙන ඒ භේදයේ එක සලකුණක් තමයි, ලැයිස්තුවේ ඉහලින් නම දමා ගැනීමට පොරකෑම. එම නිසා මන්ත්‍රීවරුන්ට මා කියනවා. පානදුරේ මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය නෙවිල් ප්‍රනාන්දු මහතා) වගේ නම්බු පිටින් පක්ෂයෙන් ඉවත් වෙන්න කියා. ඒ මන්ත්‍රීතුමාට මොකවත් කරන්න ආණ්ඩුවට බැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව එතුමා මේ ගරු සභාවෙන් ඉවත් කරන්නත් බැහැ; කරන්නෙත් නැහැ. එම නිසා අනෙක් මන්ත්‍රීවරුන්ටත් තිබෙන්නේ, නම්බු පිටින් ආණ්ඩු පක්ෂයෙන් ඉවත් වෙන්නයි. එහෙම කළොත්, තමන්ගේ මන්ත්‍රීකමට මොකවත් වෙන්නේ නැහැ; නියමිත කාලය ඉවර වන තුරු නිත්‍යානුකූලව මේ ගරු සභාවේ ඉන්නත් පුළුවන්කම ලැබෙනවා; සමහර විට අනාගතයක් තිබෙන්නත් පුළුවනි. එහෙම නැත්නම් ජනතාවට ඔවුන් තිකම්ම අමතක වෙන්න පුළුවනි. ඒ මොකද කීවොත්, ලැයිස්තුවේ පහළට නම වැටෙන නිසයි. ඒ විධියට ලැයිස්තුවේ පහළින් නම වැටුනාම මේ ගරු සභාවට එන්න පුළුවන්කම ලැබෙන්නේ නැහැ.

මේ අවස්ථාවේදී මතු කළ යුතු අනෙක් ප්‍රශ්නය, වැඩ වර්ජකයන් පිළිබඳ ප්‍රශ්නයයි. කථානායකතුමනි, තමුන්නාන්සේට මතක ඇති; ඒ සම්බන්ධයෙන් මේ ගරු සභාවේදී ඒ ඒ ඇමතිවරුන්ගෙන් මා ප්‍රශ්න වගයක් ඇසූ බව. මුදල් ඇමතිතුමා පිළිගත්තා, වැඩ වර්ජනයක් තිබුණාය කියා. සෞඛ්‍ය ඇමතිතුමා සහ අධිකරණ ඇමතිතුමා කීවා, වැඩ වර්ජනයක් තිබුණාය කියා. එහෙත් අනෙක් ඇමතිවරුන් කීවා, වැඩ වර්ජනයක් තිබුණේ නැහැ කියා. අද 'ඩේලි නිව්ස්' පත්‍රයේ, ආණ්ඩුවේ පාලනය වන පත්‍රයේ, සභාපති වශයෙන් ආණ්ඩුව විසින් බෝධිනාගොඩ මහතා පත් කරනු ලැබ තිබෙන ලේක් හවුස්' ආයතනයේ නිකුත් කරන පත්‍රයේ තිබෙන වාර්තාව මොකක්ද? 'ස්ට්‍රයික්' එක ගැනයි, එයින් කියන්නේ එහි එක තැනක තිබෙනවා, 'The 1980 Adventure' කියා. මේකට 'ස්ට්‍රයික්' කියන්නද, 'ඇඩ්වෙන්චර්' කියන්නද, එහෙම නැත්නම් වෙන මෙකක් හෝ කියන්නද කියන එකත් ඒ අයට ප්‍රශ්නයක්.

ආණ්ඩුව — ජනාධිපතිතුමා — කියනවා, වැඩ වර්ජකයන්ට ආපසු රක්ෂා දෙනවාය, සමහරුන්ට 'පෙන්ෂන්' දෙනවාය කියා. ගරු අගමැතිතුමාගෙන් මා අහනවා, වැඩ වර්ජකයන් පිළිබඳව මේ ආණ්ඩුව අනුගමනය කරන ප්‍රතිපත්තිය මොකක්ද, කියා. 'වැඩ වර්ජකයන්' කියන වචනය හොඳ නැත්නම් '1980 ජූලි මාසයේදී සේවය අහිමි වුණු අය' පිළිබඳව මේ රජයට ස්ථිර ප්‍රතිපත්තියක් තිබෙනවාද කියා මා අහනවා.

ජාත්‍යන්තර කම්කරු සංවිධානය කියා යටතිබෙනවා, වැඩ වර්ජකයන් ආපසු සේවයට ගන්නය කියා. ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන ඇමතිතුමා 'Food and Beverages Trade Union International' එකෙන් නැත්නම් 'ICFU' ඒකෙන් අස් කරනු ලැබුවා, වැඩ වර්ජකයන්ට මේ විධියට සලකන ආණ්ඩුවක ඇමති ධුරයක් දරනවාය කියා. මියුනික්වල තිබුණු සම්මේලනයේදීයි, ඒ තීරණය ගත්තේ. ඒ බව මේ ගරු සභාවේදී මා එතුමාට කීවා.

වැඩ වර්ජකයන් අතුරින් 9 දෙනෙක් ඇනටමත් සිය ජීවිතය නැති කර ගෙන—දිවිනසාගෙන—තිබෙනවා. ඒ වැඩ වර්ජනයට ඇනට අවුරුද්දකුත් මාස තුනක් ගත වී තිබෙනවා. අධිකරණ අමාත්‍යාශය වැඩ වර්ජකයන්ගෙන් 95% ක් පමණ නැවත සේවයට අරගෙන තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයෙත් ඒ විධියට කටයුතු කර තිබෙනවා. මුදල් අමාත්‍යාංශය 75% ක් පමණ ආපසු වැඩට ගෙන තිබෙනවා. එහෙත් අනෙක් අමාත්‍යාංශ වැඩ වර්ජකයන් වැඩට ගන්නවාද, නැද්ද? තමන්ගේ අනාගතය මොකක්ද කියා. ඒ වැඩ වර්ජකයන්ට දැන ගන්න වුවමනා කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මහා මැතිවරණයට ඉස්සරවෙලා අපි හිතුවා, අඩු ගණනේ මේ හැම දේශපාලන පක්ෂයකින්ම එක් කෙනෙක්වත් එයි කියා. ඉස්සරවෙලා අපි එහෙම සඳහන් කළේ ඒ නිසයි. අපි කැමතියි, හැම දේශපාලන පක්ෂයක්ම සම්බන්ධ කර ගන්න. මහජනයා පැරද්දුවාට අපි මොනව කරන්නද? සමසමාජ පක්ෂය පැරද්දුවාට අපි මොනව කරන්නද? කොමියුනිස්ට් පක්ෂය පැරදුවාට අපි මොනව කරන්නද? මේ සභාවට පත්වුණු සියලුම පක්ෂවල නායකයන් අපි ඒ සාකච්ඡාවට කැඳෙව්වා.

ගරු කථානායකතුමනි, පොදු යහපත පිළිබඳ හැඟීමක් තිබෙනවා නම් මේවා බාධා නොවෙයි. මේ රටේ සාමය, සංවරය ඇති කරන්නට අවංක කැමැත්තක් තියෙනවා නම් අපි සියලු දෙනාම ඒ සඳහා අපේ ශක්තිය පාවිච්චි කරන්න ඕනෑ. යම්කිසි පුරවැසි කණ්ඩායමක් එකතුවෙලා ළඟදී මේ ගැන ආයාචනයකුත් කර තිබුණු බව මා දැන ගත්තා. කොයි එක වුණත්, රට සාමකාමී තත්ත්වයට පෙරළීගෙන එන මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

අවස්ථාවේ අපි හැම විටම කල්පනා කරන්න ඕනෑ, ඒ සාමය තහවුරු වන විධියට කටයුතු කරන්න. ඒ නිසා මං කියන්නට කැමතියි, අද අපි මේ යෝජනාව සම්මත කරන්නේ අවසාන පියවරක් හැටියටය කියා. මං විශ්වාස කරනවා, අද මෙතැන මේ සභාවේ සිදුවූ සාකච්ඡාවලින් වත් ඒ සාමයට බාධාවක් නොවෙයි කියා. ඉදිරි කාලයේදී අපට එකතු වෙලා මේ තොරතුරු ගැන කථා කරන්නට පුළුවන් වෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා යම් යම් කාරණා ඉදිරිපත් කරනවා නම්, අපි ඒවාත් සලකා බලන්න ලැහැස්තියි. ඒ වුණත් අපට වුළුවන්කමක් නැහැ, මේ සභාව විසින් ප්‍රජා උරුමය අහිමි කළ පුද්ගලයෙක්, ඒ සම්පූර්ණ කාලය අවසන් වන තුරු ඒ කිසිම සාකච්ඡාවකට කැඳවන්න.

**එස්. ඩී. බණ්ඩාරනායක මහතා**
(திரு. எஸ். டி. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

එහෙම නම් අපේ සභාය ලැබෙන්නෙ නැහැ.

ප්‍රශ්නය විමසන ලදී.

කඩහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

வினா விடுக்கப்பெற்றது.

குரல்களின்படி "ஆம்" என்றவர்களுக்கு வெற்றியென சபாநாயகர் அவர்களால் பிரகடனப் படுத்தப்பட்டது.

*Question put.*

MR. SPEAKER, having collected the *Voices, declared that the "Ayes" had it.*

**මෛත්‍රීපාල සේනානායක මහතා**
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

Divided!

පාර්ලිමේන්තුව 43 වන ස්ථාවර නියෝගය යටතේ—පක්ෂව 134; විරුද්ධව 6; යනුවෙන්—බෙදුණේය.

பாராளுமன்றம், 43 ஆம் நிலைக் கட்டளையின் கீழ் பிரிந்தது: சார்பாக 134; எதிராக 6.

*The Parliament divided (under Standing Order No. 43): Ayes 134; Noes 6.*

# විසර්ජන පනත් කෙටුම්පත, 1982

*ஒதுக்கீட்டுச் சட்டமூலம், 1982*

## APPROPRIATION BILL, 1982

කල් තබන ලද විවාදය නැවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [නොවැම්බර් 12.]

"පනත් කෙටුම්පත දැන් දෙවනවර කියවිය යුතුය."—[ආර්. ජේ. ජී. ද මැල් මහතා] ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

ஒத்திப்போடப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது. வினா—[12, நொவம்பர்]

"சட்டமூலம் இப்பொழுது இரண்டாம் முறை மதிப்பிடப்படுமாக" [திரு. ஆர். ஜே. ஜீ. த மெல்] வினா, மீண்டும் எடுத்தியம்பப்பட்டது.

*Order read for resuming Adjourned Debate on Question—[12th November.]*

"That the Bill be now read a Second time". [*Mr. R. J. G. de Mel.*]

*Question again proposed.*

**වසන්ත උදයරත්න මහතා** (අරනායක)
(திரு. வசந்த உதயரத்ன—அரநாயக்க)
(Mr. Wasantha Udayaratna—Aranayaka)

Mr. Speaker, last night I was on the point that the key note of our Budget was development. The vision and the perspective of this Government on development is manifested in the Budget. We would see, perusing the allocations of various Ministries, that a sizeable proportion of the money is allotted for development purposes while at the same time maintaining the utility services which are not I must say, directly productive, like social services, education, culture and so on. You would see that on the development programme which we launched a couple of years ago, we have set aside the biggest proportion of our money. The question would be as to whether the adverse criticisms that are levelled against the Budget are justifiable. They say that the deficit, the budget gap, this time is unprecedented, that we have borrowed heavily and that we are

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

borrowing and that the future, unborn, generations of this country would be tied like slaves to the countries that we borrow, that the prices are spiralling up, that we would not be able to put a stop to inflation, that the salary increase is a meagre increase and that it would not meet the rising index.

Now, Sir, the other question that we would ask is whether it is wrong to borrow, or whether the previous government that levelled criticisms against us has not borrowed, and whether there is anything inherently incorrect in borrowing and whether there is anything wrong in borrowing, when we very well know that the fiinancial position of this country is so low. We are in the process of development and therefore borrowing is necessary and it is indispensable.

Then, Sir, the other feature that I must stress upon is this: that our economy is a dependant economy, and that the various imports to this country, and especially the fuel imports to this country have risen up. At the same time, meeting the various price increases on raw material, fuel and so on and so forth, we have not cut down our expenditure on development. But it was not so during the previous government. There was no visible development in the field of agriculture, industry or anything. And at the same time one cannot say that the people lived a comfortable life. There was starvation and there were plenty of hardships. But today we can proudly say that the pace of development is accelerated in this country and at the same time there is no starvation in this country. I must say with respect that—this is something that is very visible, as the Hon. Minister too said—there is untold wastage in most of the government departments; we can see that.

Then again, the other question we and the Hon. Minister must give thought to is about population. I am one who very strongly believes in the population theory of Malthus. I must say that whatever we do to develop the economy of this coutnry, if there is no check, control and management of population, the rate of development will be thwarted by the increase in unchecked, uncontrolled population.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order please! The Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [திரு. எட்மன் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER left the Chair, and MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. EDMUND SAMARAWICKREMA] *took the Chair.*

**වසන්ත උදයරත්න මහතා**
*(திரு. வசந்த உதயரத்ன)*
(Mr. Wasantha Udayaratne)

Sir, I would like to suggest that the Hon. Minister must give thought specially to the problem of management and control of population.

Sir, no country can develop if there is no peace and unity. The hon. Leader of the Opposition is here, and he would agree with me that if there is no peace, whether it be as a result of racial or other differences in the country, and development or welfare measure will not have the desired effect. I would suggest that we may even bring in legislation and ban the use of words like 'Tamil', 'Sinhalese', 'Muslim' and so on, which cause these differences and call ourselves Sri Lankans. Let us forget all differences and put an end to these racial and other conflicts that we have today and think of ourselves as one Sri Lankan nation. Without this foundations. I must say that what-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වසන්ත උදයරත්න මහතා]

ever development we may think of or have launched on, will not have the desired results. We will not achieve results if these conflicts go on from day to day.

I do not wish to take any more time. Finally, I would say that the Budget that we have introduced this time is a continuity budget, a continuation of our policy, reflecting the vision and the prespectives of this Government, and we congratulate the Hon. Minister for introducing a very reasonable Budget.

**ඩබ්. ජේ. එම්. ලොකුබණ්ඩාර මහතා** (හපුතලේ)

*(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார —ஹப்புத்தளை)*

(Mr. W. J. M. Lokubandara—Haputale)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අයවැය සම්බන්ධයෙන් කථා කිරීමේ දී ආපසු හැරී කල්පනා කර බලන්නට අපට සිදු වී තිබෙනවා, එදා යටත් විජිතවාදී කාලයේ සිට පැවති සම්ප්‍රදායානුකූලව ඒ සා දීර්ඝ කාලයක් මෙසේ දෙවෙනි වර කියවීමටය, තුන්වෙනි වර කියවීමටය කියා මාස ගණන් කැප කිරීම අද වැනි යුගයක දී අවශ්‍යද කියා. මේ කාරණය කෙරෙහි මම පළමුවෙන්ම මේ සභාවේ අවධානය යොමු කරන්න කැමතියි.

මීට ප්‍රධාන හේතුවක් තිබෙනවා. දැන් මොහොතකට පෙර ඉතාමත් වැදගත්, විශේෂයෙන් ව්‍යවස්ථානුකූලව නැතිවම බැරි කාරණයක් සඳහා නොහොත් හදිසි නීතිය දීර්ඝ කිරීම සඳහා මේ පාර්ලිමේන්තුවේ කැමැත්ත ලබාගැනීමට පැවැත් වූ විවාදයේ අවසානය තමුන්නාන්සේගේ අවධානයට ලක් කිරීමට කැමතියි. මෙම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 134 දෙනෙක් ඉඳුරාම ඒ යෝජනාවට පක්ෂ වුණා. ඒකෙන් පෙනී යනවා, 134 ට 6 යි විරුද්ධ වුණේ කියා. ඒ අනුපාතය තිබෙන විට, සාමාන්‍යයෙන් විරුද්ධ පක්ෂයක් තිබිය යුතුය, ප්‍රජාතන්ත්‍රවාදී විරුද්ධ පක්ෂයක අදහස් ඕනෑය කියන අදහස සම්බන්ධයෙන් ඊට අනුපාතිකව කල්පනා කිරීමේ වැදගත්කමක් තිබෙනවා. ඒ පිළිබඳව මුළු පාර්ලිමේන්තුවේම මතය ඒ [illegible] බිඹු වුණා නම්, 134 දෙනෙකුගේ කැමැත්තට විරුද්ධ වුණ ගණන 6 යි කියන තත්ත්වය පැහැදිලි වුණා නම් අපි ඉතින් ඒ පැරණි ආකල්ප අනුව මාස ගණනක් දෙවෙනි වර කියවීමටය තුන්වෙනි වර කියවීමටය කියා කාලය ගත කළ යුතුද?

ඔබතුමා දන්නා පරිදි 1977 මැතිවරණයෙන් පස්සෙ නිවහල් දැහැමි සමාජයක් ඇති කිරීමේ අරමුණින් ඒ කටයුත්ත නීත්‍යනුකූලව ක්‍රියාවට නැංවීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අපි සම්මත කර ගත්තා. ඒ ව්‍යවස්ථාවේ හැටියට මේ රජය ඒකීය රාජ්‍යයක්. ඒකීය රාජ්‍යයක් වශයෙන් කාටත් සමාන දක්ෂතාවලට සමාන අවස්ථාවන් ලැබෙන අයුරින්, කාටත් පොදුවේ දියුණුව සැලසෙන අයුරින් තමන් උපන්නේ මොන කුලයේද, තමන් අයත් වන්නේ මොන පංතියටද යනාදී කිසිම භේදයකින් තොරව කාටත් පොදුවේ සමානාත්මතාවෙන් කටයුතු කරන්නට ඇප කැප වුණු ඒ අරමුණු ඉටු කර ගැනීමටම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇති කරගෙන ඉක්බිතිව අයවැය යෝජනා පිළිබඳ විවාදය පටන් ගෙන තිබෙනවා. ඒ අතින් බලන විට මේ අයවැය විශේෂයෙන් වැදගත් වෙනවා, අපේ ආණ්ඩුවේ 5 වෙනි අයවැය නිසා මෙන්ම මැතිවරණයකට ඉදිරියේ පෙර නිමිති තිබියදී පවත්නා අයවැයක් නිසා. ආණ්ඩු පක්ෂය තරම්, අයවැය සහන සලස්වන්නට කැමති වන තවත් පක්ෂ ඇතැයි කියා මට සිතන්න බැහැ.

අයවැය හා සම්බන්ධව කථා කරන විට අපට අමතක කරන්න බැරි දෙයක් තමයි කාසිය. ඔබතුමා හොඳට දන්නවා මුදල්වල තිබෙන බලය. මුදල්වල ඇති බලය එසේ මෙසේ බලයක් නොවෙයි. වාණිජ සමාජයේ මුදලට ලැබෙන තැන වෙනත් කිසිම දෙයකට ලබන්න බැරි තත්ත්වයක් තිබෙනවා. මේ ගැන සමාජ විද්‍යාඥයෝ නොයෙක් විග්‍රහ කර තිබෙනවා. අපේ සමාජය එදා පටන් පිළිගත්තු හතර ආකාරයක පංතියක් තිබෙනවා. ඒ පංති 4 න් පළමුවැන්න බමුණු නොහොත් පූජක පක්ෂය. දෙවැනිව ක්ෂත්‍රියයො නොහොත් රාජ. තුන් වෙනිව වෙළඳ. හතර වෙනිව ගොවි කම්කරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොහොත් වැඩකරන ජනතාව. ඉතිහාසයේ එක් යුගයක දී පාලනය පිළිබඳ සම්පූර්ණ බලය තිබුණේ බ්‍රාහ්මණ නොහොත් පූජක පක්ෂයටයි. එදා පුරෝහිත බ්‍රාහ්මණයෝ හිටියා. ඒ අය කියන විධියටයි, රජ්ජුරුවෝ වැඩ කෙළේ. ඒ යුගය ඉවර වී, වේද යුගය ඉවර වී, උපනිෂද් යුගය ඉවර වී ඉක්බිතිව එළඹුණා රාජ යුගය.

අපේ මුදු හාමුදුරුවෝ පහළ වූ යුගයේ දී දඹදිව වැනි රටවල තිබුණේ ක්ෂත්‍රිය බලයයි. බමුණු යුගයේදී පොතට පතට තැන තිබුණා; නීතියට තැන තිබුණා; දැනුමට තැන තිබුණා; ඥානයට තැන තිබුණා. එහෙත්, රාජ යුගයේදී කඩුවට බලය තිබුණා. දැන් තිබෙන්නේ ඒ යුගය නොවෙයි. සමාජ විද්‍යාඥයන් මේ ගැන විග්‍රහ කරමින් කියනවා. දැන් 'වාණිජ යුගයයි' කියලා. වෙළඳ යුගයේ බලය තිබෙන්නේ කාසියටයි; මුදලටයි. කාර්මික විප්ලවයෙන් පසු මුදලට තැන ලැබුණා. මුදලට කළ නොහැක්කක් නැති තත්ත්වයක් එළඹුණා. එදා පොතට පතට, දැනුමට, ඥානයට තිබුණු තැන කඩුවටද ඉක්බිතිව තුන්වෙනුව කාසියටද ලැබුණා. මිල මුදලට බලය ලැබෙන යුගයක් එළඹුණා. දැන් දැන් යොමු වී තිබෙන්නේ ගොවි කම්කරු යුගයකට, වැඩ කරන ජනතාවගේ යුගයකට. එම නිසා මේ අයවැය ගැන කථා කරන කොට මේ අයවැය ඉදිරිපත් කර තිබෙන යුගය අමතක කරන්නට බලයක් නැ.

අද එළඹ තිබෙන්නේ ලංකාවට එක් රටක් වශයෙන් ජීවත් වන්නට පුළුවන් තත්ත්වයක් නොවෙයි. මුළු ලොවේම නොයෙක් අතේ වෙනස්කම් ඇති වෙනවා. නවීන විද්‍යාව, තාක්ෂණික ඥානය නොයෙක් අතේ පෙරළි කරනවා. මිනිසා විසින් ස්වභාව ධර්මය පුදුමාකාරයෙන් මෙල්ල කරගෙන යනවා. තමන්ගේ ගමේ රටේවත් කෙනකුට තනියෙන් ජීවත් වන්නට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. වාණිජ සමාජයේ නොයෙකුත් විපර්යාශයක් සිදු වෙමින යනවා. ඒ සමාජ විපර්යාශවලට අපගේ වැනි රටවල් පමණක් නොව, ගොවි කම්කරු ජනතාවගේ පාලනයක් ඇතැයි කියන කොමියුනිස්ට් රටවල් පවා හසු වී තිබෙනවා. ඒ රටවලට සම

තමන්ගේ දේශපාලන දර්ශන හා න්‍යාය අනුව තනියෙන් ජීවත් වන්නට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා.

එබඳු පෙරළියක් ඇති වෙමින යන සමයක දී අපගේ වැනි පුංචි රටකට ඒ වාණිජ බලපෑමෙන් මිදෙන්නට පුළුවන් කමක් නැහැ. ඒ කාලයේදී අපගේ රට හැඳින් වුණේ 'පෙරදිග මුතු ඇටය' වශයෙන්. එතරම් සමෘද්ධිමත්, ඉසුරු බර යුගයකදී පවා, පෙරදිග කිසියම් විශාල ලක්ෂණයක් පිළිබිඹු කරන 'හස්ති රාජයා' වැනි දෙයක් සුබ නිමිත්තකට ගත්තේ නැහැ. මුතු ඇටය පොඩි වුවත් වටිනාකම බොහෝම වැඩියි. අපගේ රට බොහෝම පුංචි රටක්. අනෙක් රටවල බලතල ඉක්මවා බලපෑම් කරන්නට අපට ශක්තියක් නැති වීම අපේ රටේ වරදක් නොවෙයි. මුළු ලොවේ ප්‍රචලිත ආර්ථික රටාවේ ප්‍රතිඵල ඉක්මවන්නට අපට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. එය මුළු ලෝකයේම පවත්නා සදාතනික තත්ත්වයක්. එම නිසා, එදා පැවැති නිශ්චල සමාජයේ තිබුණු අන්දමට, එංගලන්ත පාර්ලිමේන්තු සම්ප්‍රදාය අප වෙත එළඹෙන යුගයේදී තිබුණු අන්දමට, ප්‍රශ්න සාකච්ඡා කර—කර, කෝපි බිබී, තේ බිබී, ඔහේ කාලය ගත කරන්නට පුළුවන් තත්ත්වයක් අද අපට තිබෙනවා දැයි අපි කල්පනා කරන්නට ඕනෑ.

134 ට හය දෙනයි විරුද්ධ වුණේ. එහෙම නම් අපි මාසයක්ම මේ අයවැය ගැන තර්ක කරන්න ඕනෑද? මුළු විරුද්ධ පක්ෂය වෙනුවෙන්ම නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමා කථා කළාට පසු, අපේ ගරු වෙළඳ ඇමතිතුමා පිළිතුරු දුන්නා. දවල් 12 ට රැස්වීම කල් තබන අවස්ථාව එන විට විරුද්ධ පක්ෂයේ කථාවේ සියලුම මර්මස්ථානවලට කෙළින්ම පහර දීලා ඉවරයි. මූලික ප්‍රශ්න සියල්ලටම කෙළින්ම පිළිතුරු දුන්නා. එතුමා කරුණු තුනක් ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම ඒ කරුණු ගැන කල්පනා කර බැලුවාම, අපි මොන තරම් අමාරු තත්ත්වයක පසුබිමක් ඉදිරියේද යන්නේ කියන කාරණය අමතක කරන්නට බැරි බව පැහැදිලි වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වි. ජ. මූ. ලොකුබණ්ඩාර මහතා]

'පළමුවෙන්ම විරුද්ධ පක්ෂය වෙනුවෙන් කථා කළ නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමා තමන්ගේ ජාතියේ ස්වාධීන භාවය ගැන, ඒ කියන්නේ රට බෙදීම ගැන කරුණු මේ අයවැය ප්‍රශ්නයේදී මතු කරන තත්ත්වයක් තිබෙන විට, අවශ්‍ය—අනවශ්‍ය හැම තැනදීම එය මතු කරන තත්ත්වයක් තිබෙන විට, එයම පිහිට කොටගෙන, එයම ප්‍රතිඥා කොටගෙන ඒ උදවිය කථා කරන විට, මේ සමාජයේ අද පවතින ආර්ථික විස මතා අතරින් අපි මේ ආර්ථිකය ආරක්ෂා කර ගන්නේ කොහොමද කියන කාරණය අපි කල්පනා කරන්නට ඕනෑ. බැලූ බැලූ පැත්තෙන් ඉන්නේ බෙදීම ගැන කතා කරන අය. බැලූ බැලූ පැත්තෙන් ඉන්නේ කොයි ආකාරයෙන් හරි ආණ්ඩුවක් කඩන්න සමගිය නැති කරන්න බලන අය. හැම තැනම පෙනෙන්නේ ආත්මාර්ථක මිත්වය මිසක් පොදුවේ රටේ වාසිය ගැන හිතන අය නොවෙයි. එබඳු පසු බිමක් යටතේ මේ අයවැය සාකච්ඡා කරන විට, මට පුදුම හිතෙන්නෙ ගරු සභාපතිතුමනි, එබඳු ආකල්පයක් ඇතිව, මේ රට මේ තත්ත්වයෙන්වත් පවතින එක ගැනයි.

සමගිය ගැන සමාදානය ගැන කතා කරන අයම එය ඉටු කරන්න සැබැවින්ම අවංක පියවරක් ගන්නවාද කියන ප්‍රශ්නය නැඟිය යුතු තත්ත්වයක් තිබෙන කොට, අපි ඒ පසුබිම යටතේ කල්පනා කරන්න ඕනෑ, මේ රට කොහොමද මේ තත්ත්වයෙන්වත් පවතින්නේ කියා. ඒ නිසා ඉත ම වැදගත්ම කාරණය නම්, අපි අද පස්වැනි අයවැය ලේඛනය ඉදිරිපත් කරන කොටත්, ගරු මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමාම, 1977 දී මෙන්ම ඒ එකම ඇමතිතුමාම, මේ කාලය වන තෙක්ම අයවැය ලේඛන පහක් ඉදිරිපත් කළාය කියන එකයි. මේ පසුබිම යටතේ එයත් ඉතාම වැදගත් කාරණයක්. එයින් එතුමාගේ දක්ෂ විචක්ෂණ භාවය මෙන්ම එය පසුපස තිබෙන අපේ නායකත්වයේ අචල භාවයත්, දූරදර්ශී භාවයත් පෙනෙනවා. 1977 සිට 1978, 1979, 1980, 1981 යන වර්ෂවලට අදාළ අයවැය ලේඛන කියවන කියවන හැම විටකම අපට පෙනී යන දෙයක් තමයි, නිශ්චිත දර්ශනයක් ඇතිව, දූරදර්ශීව අපි නියත ඉලක්කයක් කරා ගමන් කරන බව.

දෙවැනි කාරණය හැටියට විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් පෙනනුම් කරනවා, ලෝක බැංකුව පිළිබඳ ප්‍රශ්නයක්. ලෝක බැංකුවෙන් ආධාර ගැනීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ආධාර ගැනීම වරදක්ය යනාදී වශයෙන් කියනවා. මා හිතනවා, අපේ ගරු වෙළඳ හා නාවුක ඇමතිතුමා තවත් කිසිම පිළිතුරක් අවශ්‍ය නොවන තරමට ඒ ගැන පැහැදිලි කර දුන්නාය කියා.

නල්ලූර් මන්ත්‍රීතුමා, (එම්. සිවසිතම්පරම මහතා) තවත් කාරණයක් හැටියට කිව්වා, මහ බැංකුව අවශ්‍ය තොරතුරු දෙන්නේ නැතිලු. ගරු සභාපතිතුමනි, මා ළඟ Central Bank News Survey කියල පොතක් තිබෙනවා. 1981 ජූලි මාසයේයි එය පළ කර තිබෙන්නෙ. යටත් පිරිසෙයින් මේ සඟරාව කියෙව්වා නම් එතුමා එහෙම කියන්නෙ නැහැ. මෙය මීට පෙර —වෙනත් විටෙක—පළ කළේ නැහැ. මේ පළමුවැනි වෙළුම, කලාප අංක 1. මහ බැංකුව අවංක ප්‍රයත්නයක් දරනවා, මේ ආර්ථික රටාව පිළිබඳව—ආර්ථික තත්ත්වය පිළිබඳව—දැනුම එක්තරා පැලැන්තියකට සීමා නොකරන්න.

'කල්පනා' නමැති කාල්පනික අදහස් පුබුදු වන සඟරාවක් දැන් ප්‍රකාශ කරනවා. ඒ නිසා පැහැදිලිව පෙනී යනවා, හිඟ අය වැය කියන්නේ මොකක්ද? හිඟ අයවැය පරතරය කියන්නෙ මොකක්ද? අපට හිඟ අයවැයක් තිබෙන එක ලැජ්ජාවට කාරණයක්ද? අද ලෝක තත්ත්වය යටතේ පුළුවන්ද සමතුලිත, සියල්ලටම සම බර වූ අයවැය ලේඛනයක් ඉදිරිපත් කරන්න, යනාදී කරුණු ගැන. ඒ නිසා කරුනු වසන් කිරීමක් තිබෙනවා කියා කියනවා නම් එය ඉතාම වැරදියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ටෝකියෝවේ තිබුණු සමුළුවේදී ගරු මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමා කළ කතාවෙන් —මීට මාස දෙකකට පමණ පෙර කළ කථාවෙන්—පිළිබිඹු වුණා, ඉතාම පැහැදිලිව, නිශ්චිතව මේ රටේ ආර්ථික පසුබිම සකස් කරන්නට ගන්නා වෑයමත්, අපේ අයවැය ලේඛනයේ තිබෙන්නේ කවර දර්ශනයක්ද යන්නත්. ඒ නිසා මේ තරම් විවෘතව, එළිඑය, කාටවත් සඟවන්නේ නැතිව කරුණු ඉදිරිපත් කරන වෙනත් රජයක් තිබෙනවාද කියන එක ගැන අපි ටිකක් කල්පනා කර බලන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුමනි, ටෝකියෝ සමුළුවේදී අපේ මුදල් ඇමතිතුමා කර තිබෙන කතාවෙන් එතුමා පැහැදිලිව කියා තිබෙනව—එම කතාව සභාගත කළ නිසා අපි දැක්කා—කොයි ආකාරයටද අපි මුදල් ඉල්ලන්නෙ, මොන මොන කොන්දේසිවලටද අපි යටත් වෙන් නෙ කිය. එතනදී එතුමා තිර සර විධියට ප්‍රකාශ කරල තිබුණා, කිසිසේත්ම සහනා ධාර යනාදිය වශයෙන් අන්තිමටම පීඩිතම පංතියේ ඉන්න අයට යම්කිසි සහනයක් දෙනවා නම් ඒවා නැති කරන්නේ නැතැයි කියා. එවැනි කොන්දේසියකට යටත් වෙන්නේ නැහැ කිව්වා. සමහර විට විරුද්ධව දීන් බලාපොරොත්තු වෙන්න ඇති, රු. 300න් පහළ මාසික ආදායමක් ලබන අන්ත දුගී ජනතාවට දෙන ආහාර මුද්දරේ පවා මේ සැරේ නැතිවේය කියා. ඒ විධියේ අශුභවාදී දර්ශන ගැන ඇතම් අය හිතන්න ඇති. ඒ අය කඩාකප්පල්කාරී වූ මනසකින්, අපේක්ෂා භංගත්වයෙන්,—ඉච්ඡා භංගත්වයෙන්—දැන් සිටින්නෙ. ඒ වගේම එතුම එතන දී ඉතාම පැහැදිලිව නිහඬ ජනතාවට—silent majority—සෑම දුප්පත් රටකම තුන්වැනි ලෝකයේ, නැඟී එන ලෝකයේ, ඌන සංවර්ධිත ලෝකයේ, දියුණු වෙන ලෝකයේ ඉන්න වැඩි දෙනෙක් නිහඬ ජනතාව—ඒ අයට ලැබෙන සහනය කිසි ආකාරයකින් නොකපා මේ අයවැය ලේඛනය සකස් කිරීම සම්බන්ධයෙන් අපේ ගෞරවය මුදල් ඇමතිතුමාට, අප මේ අවස්ථාවේදී පිරිනමනවා.

නියෝජ්‍ය සභාපතිතුමනි, දේශපාලන ස්ථාවර භාවය තරම්, රටක ආර්ථික වර්ධනයට අවශ්‍ය තවත් සාධකයක් තිබෙනවා යයි කියන්න බැහැ. මේ රජය බලයට පත් වූ පසු ඉදිරිපත් කෙරුණු අයවැය ලේඛන 5ම මේ මුදල් ඇමතිතුමා විසින්ම ඉදිරිපත් කරනු ලැබීමම, ඒ දේශපාලන ස්ථාවර භාවයට හොඳ නිදර්ශනයක්. ඒ සඳහා පරම නිදර්ශනය වශයෙන් එයම ඇති.

එපමණක් නොවෙයි, ගිය ඉරිදා 'රිවිරැස' පත්‍රයේ පළ වී තිබුණු වාර්තාවකින් කියා වෙන්නේ මොකක්ද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය එදා—1971 දී—මිනිස් ඝාතන සමූලඝාතනය කිරීම පිළිබඳව තැබූ ඉතිහාස ගත වාර්තාව, අපේ දුප්පත් ගොවි-කම් කරු ජනතාවගේ අහිංසක දූ-පුතුන් මරා යාට බිළි කළ ඒ භීම සමයේ ඇති කළ ඒ දුෂ්ට වාර්තාව ගැන කල්පනා කළාම අපේ මතකයට එන ජනතා විමුක්ති පෙරමුණේ නායක රෝහණ විජේවීරයන්ම කියනවා; 'එදා වගේ නෙවෙයි, අද මේ රටේ තිබෙන සාමකාමී වාතාවරණය යටතේ අපට අවි-ආයුධ වුවමනා නැහැ, අප ඡන්දය විශ්වාස කරනවා' කියා. එදා ඒ තරම් සාහසික, දාම රික ගතිවලට යටවුණු ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය පවා, අද වෙඩි උණ්ඩයට වඩා ඡන්ද බලය පිළිගන්නවාය කියනවා නම්, ගත වුණු අවුරුදු 4 වැනි සුළු කාලය තුළ ඔවුන් එය පිළිගන්න තත්ත්වයකට ආවා නම්, අප දේශපාලන ස්ථාවර භාවය අතින් තබා ඇති වාර්තාව අනුපමේ යයි කියන්න ඕනෑ; අසහායයි කියන්න ඕනෑ; අසමානයි කියන්න ඕනෑ. අනෙක් වාමාංශික කඳවුරු දිය වෙමින් යද්දී යම් නාම් හිස ඔසොවාගෙන ඉන්න එකම වාමාංශික පක්ෂය වන ජනතා විමුක්ති පෙරමුණ පිළිගන්නවා නම්, මේ රටේ සාමකාමී පරිසරයක් තිබෙනවාය, ප්‍රජාතන්ත්‍රවාදීව ආණ්ඩු මාරු කරන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවාය කියා, එය ඉතාම ප්‍රාමාණික ප්‍රකාශයක්.

එපමණක් නොවෙයි. හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ යෝජනාව සම්බන්ධයෙන් අද මේ ගරු සභාවේ ඡන්දය සිමසූ අවස්ථාවේදී ඊට පක්ෂව ඡන්ද 134 ක් ලැබුණ අතර, විරුද්ධව ලැබුණේ ඡන්ද 6 ක් පමණයි. පසුගිය වාරවල ඒ යෝජනාවට විරුද්ධව ඡන්දය දුන්නාවූ යම්කිසි කෙනෙක් ඉන්නවා නම් ඒ අයට මතක හිටින්නත් එක්ක, අද ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් ක්‍රියා කළා. හදිසි නීතිය පැනවීම හෝ දීර්ඝ කිරීම වැනි ප්‍රශ්නවලදී අපේ ආණ්ඩුව ගන්නා තීරණයේ සාධාරණ භාවය ඒ අයත් පිළිගන්නා තත්ත්වයක් අද පිළිබිඹු වුණා. එයිනුත් අපට පෙනී යනවා, මේ අවුරුදු හතරේ කාලය තුළ අප ගිය ගමන හරි බව ප්‍රතිඵල අනුවයි, අපට තේරුම් ගන්න පුළුවන් වන්නේ, අපේ [illegible]මගේ නිවැරදි භාවය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වි. ජ. මු. ලොකුබණ්ඩාර මහතා]

නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට මා කැමැතියි, අපේ ආණ්ඩුවේ තිබෙන දූර දර්ශී භාවය පිළිගන්නා, මේ සභා ගර්භය තුළ නැති ජනතා විමුක්ති පෙරමුණේ අයත්, සභා ගර්භය තුළ සිටින ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ අයත් අතර ඇති සමීප භාවය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයත් සමඟ සංසන්දනය කරන්න. ඇත්ත වශයෙන්ම, අපේ විරුද්ධවාදීන්ට හඬක් නඟන්න බැරි තරමේ මෙවැනි දේශපාලන ස්ථාවර භාවයක්, වෙන කිසිම යුගයක තිබුණායයි අපට කියන්න බැහැ. අපේ විරුද්ධවාදීන් මොන තත්ත්වයකට වැටී තිබෙනවාද කියනවා නම් මොහොතකට කලින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් කියැවුණා, 'හැම දේශපාලන පක්ෂයකම බෙදුම් තිබෙනවා, මේවා අමුතු දේවල් නොවෙයි, ඒ නිසා අප ඒ ගැන අමුතුවෙන් කලබල වන්න ඕනෑ නැහැ' කියා.

අප දන්නා විධියට, වමේ දේශපාලකයන් මෙන් පිටරටින්ම කරපින්නා ගත් දේශපාලන නායකත්වයක් නොව, මොකක් හෝ මේ රටේම දේශපාලන නායකත්වයක්—බණ්ඩාරනායක කියන්නේ මේ රටේම ඉපැදුණු වීරයෙක් වශයෙන් සලකා බැලුවොත් මේ රටේම මනුෂ්‍යයකුගේ නායකත්වයක්—පිළිගන්නා පක්ෂයක් වශයෙන් සලකන්න පුළුවනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. එහෙත් අපේ ගමේ-රටේ තවමත් ඉන්නවා, මොන තරම් හොඳක් කළත් පිළිගන්නේ නැති, ඒ බවට 'රෙජිස්ටර්' වෙලාම ඉපැදුණු සමහර ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්.

කොහොම වුණත් ඒ අයත් සෑහෙන සංඛ්‍යාවක් සිටින නිසා මා මේ අවස්ථාවේදී කැමතියි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අර්බුදය ගැන සුළු විග්‍රහයක් කරන්නට. අද පවතින දේශපාලන තත්ත්වය යටතේ මේ අයවැය ලේඛනය ගැන කථා කරන විට ඒක ඉතාම වැදගත් වෙනවා. මොන විධියට ඒ පක්ෂය භේද භින්න වුණාද කියන එකට ඉතාම හොඳ සාධකය මොකක්ද? අම්මා නායිකාව වුණු පක්ෂයක, පුතාට ඒ අම්මාගේ නායකත්වය පිළිකුල් වී තිබෙනවා. ගැමි සංස්කෘතියේ ගමේ මනුෂ්‍යයාගේ සභ්‍යත්වය මෙන් කල්පනා කරන විට ගමේ සමාජ අංශයෙන් බලන විට මේ තරම් දුෂ්ට ද්‍රෝහි ප්‍රතිපත්තියක් තවත් නැහැ. අපි නායකත්වයකින් බලාපොරොත්තු වන්නේ ආදර්ශයයි. මම නායකත්වයට ගත යුත්තේ මට වඩා උසස් කෙනෙක්. කිසිම කිසි කෙනෙකු තමන්ට වඩා පහළ එකෙක් තමාගේ නායකයා කර ගනියි කියා මා සිතන්නේ නැහැ. එතකොට තමනුත් පහළට යනවා. සිරිපාදෙ නඟින්න කරුණා කරන මම පහළට යන එකා පස්සෙ ගියොත්—පහළට කරුණා කරන එකා පස්සෙ ගියොත්—මට සිරිපාදෙ යන්න බැහැ. අපේ නායකයා යන්නේ යම් තැනකටද ඒ විධියටමයි අපේ ගමන් මග හැදෙන්නේ. අනුගාමිකයා මනින්න පුළුවන් නායකයාගෙන්. නායකයා මනින්න පුළුවන් අනුගාමිකයාගෙන්. මේ දෙගොල්ල හරියට කණ්ණාඩියෙන් මූණ වැටෙනව වගෙයි. දෙගොල්ලගෙන්ම ගෙන යන ක්‍රියා පටිපාටිය මැන ගන්නට පුළුවනි. ඒ අතින් බැලුවාම මේ ශත වර්ෂයේ නොවෙයි අපේ රටේ දේශපාලන ඉතිහාසයේ කිසිම කිසි කලෙක මේ වාගේ ඛේද වාචකයක් කොතැනකවත් තිබුණායයි කියන්නට බැහැ.

අම්මාත් පුතාත් අතර මේ සට්ටනය. ඉතාම භයානක තත්ත්වයක්. මේ තරමට පැසවලා ආපු සට්ටනයක් කිසිම තැනක නැහැ. අම්මා කෙනෙක් පුතෙක් වදන්න මොනා තරම් දුක් ගන්නවාද? එසේ මෙසේ අමාරුවක්ද? පුතා පිළිසිඳ ගත් දවසේ ඉඳල විඳින දුක එසේ මෙසේද? මේ දරුවා දවසක් දෙකක් නොවෙයි, සතියක් දෙකක් නොවෙයි, මාසයක් දෙකක් නොවෙයි, දස මාසයක්ම කුස තුළ දරාගෙන ඉන්න ඕනෑ. වික වේලාවකට හරි, "අනේ පොඩ්ඩක් එළියෙ ඉඳපන්" ය කියා එළියෙන් තියන්නෑ. අනුර බණ්ඩාරනායක පුත්‍රයා වුණත් දස මාසයක්ම ඉන්න ඇති. මාසයෙන් දෙකෙන්, "නැහැ මම දැන් එනවා" ය කියන්නෑ. එහෙම එකක් නොවෙයි. ඒ අනුර බණ්ඩාරනායක මහත්මයාත් පුත්‍රයා වශයෙන් මැතිනියගේ කුස තුළ ඉන්න කොට කිසිම සැකයක් නැහැ එතුමියටත් දොළ දුක් ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙන්න ඇති. එතුමියටත් ඔය පුතා ඉන්න කාලෙ ඔය පුතා දරා ගෙන ඉන්න තිබුණා මයි. මිනිත්තුවකට හරි, "පුතා මට ගමනක් යන්න හිතෙනව" කියල එළියෙන් එහෙම තියල යන්න බැහැ. ඒ කාලෙ එතුමිය උත්සවවලට එහෙම ගියා දැයි මා දන්නේ නැහැ. දස මාසයක්ම දරා ගෙන ඉන්න ඕනෑ. එසේ දරාගෙන සිටින නිසා තමයි දරුවා කියන්නෙ. දාරක කියන්නෙ ඒකයි. දරුවා. ඒ වාගේම මවන නිසා මවු. ඊට වැඩිය මැවිල්ලක් ලෝකයේ නැහැ. හරිම දුදුම වැඩක්. දස මාසයකින් පසු බිහි වුණාට පසු ඔහු යන්ත්‍රයක් වගෙ ඇවිදිනවා. කථා කරනවා. වැඩ කරනවා. අම්මාටම විරුද්ධත් වෙනවා. එහෙමත් කරන්නට පුළුවනි. මේ වාගේ නිර්මාණයක් තවත් තිබෙනවාද? ඒ අතින් බැලුවාම අපේ පාරම්පරික සභ්‍යත්වයේ බෞද්ධ උරුමයේ මුදුන් මුලටම පහර ගැසීමක් තමයි අම්මා කෙනෙකු පුතාට විරුද්ධ වෙනවාය, පුතෙක් අම්මා කෙනෙකුට විරුද්ධ වෙනවාය කියන්නේ. එතැනත් පුතා අම්මාට විරුද්ධවීමට තරම් භයානක දෙයක් තවත් නැහැ. මෙයින් ගමට ලැබෙන ආදර්ශය මොකක්ද? ගමක කවුරු හරි අම්මාට විරුද්ධව යන එකෙකු ඉන්නවා නම් බුද්ධාගමේ හැටියට ඌ පංචානන්තර්‍ය පාප කර්මයෙන් එකක් කරනවා.

අද මේ වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අනුගාමිකයන් ඉන්නේ නිසැක්යෙන්ම නිරයේ ගිනි දැල් පෙනෙන තත්ත්වයක. පංචානන්තර්‍ය පාප කර්මයට අසු වූ එකා මේ ආත්මයෙන් පසු කෙලින්ම යන්නේ නරකාදියට. එහෙම නායකත්වයක් ඒ පක්ෂයට තිබෙන්නේ. අම්මා කෙනෙකුට කාට සමාව දෙන්න බැරි වුණත් පුතාට සමාව දෙන්න බැරි තත්ත්වයක් තිබෙනවා නම් ඒ අම්මාගේ ලේ කිරි වුණාද කියන ප්‍රශ්නයක් මතු වෙනවා. අම්මා කෙනෙකුත් පුතෙකුත් අතර, ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය වූ මේ විධියේ හටනක් තවත් තිබෙනවාද?

මොන රටේද? ඇමෙරිකාවෙ තිබෙනවාද? ඉන්දියාවෙ තිබෙනවාද? කොයි ලෝකෙ තිබෙනවාද? බල කමයෙන් මත්වෙලා, බීපු කිරි අමතක වෙලා, තමන්ගෙ අම්මා එක පැත්තක, දරුවා එක පැත්තක, අම්මාට පුතාත්, පුතාට අම්මාත් අමතක වෙලා යන තරම් බල කාමයෙන් මත්වුණු, මේ විධියට දේශපාලනයෙන් පිරිහුනු තත්ත්වයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට උදාවීමෙන් පෙනී යනවා, මේ අවුරුදු පහ අතරතුර දී මොන තරම් දියුණු විධියට අපි අපේ ආර්ථික ප්‍රශ්න, සමාජ ප්‍රශ්න, සංස්කෘතික ප්‍රශ්න යනාදිය විසඳුවාද කියා. එමනිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතනවා මේ දේශපාලන ස්ථාවර භාවය තව තවත් දිනෙන් දිනම දියුණු වෙනවා කියා. ඒක වළක්වන්න මේ කපේ දී කාටවත් පුළුවන් වන්නෙ නැහැ.

මේ නිසාම විරුද්ධ පක්ෂය හදිසි නීතිය ගැන කථා කරන්න ගියත්, අයවැය ගැන කතා කරන්න ගියත්, කතා කරන්නේ; අනේ, මේ එක්සත් ජාතික පක්ෂය තුළ මොකක්දෝ භේදයක් තිබෙනවා කියා, මොනවා හරි අර්බුදයක් ඇති කරන්නයි. ඒ තරමට දඟලන එකෙන් පෙනී යනවා ඔවුන්ගේ හිතේ තිබෙන ලොකුම මන දොළ, හිතේ තිබෙන ආශාව කොයි විධියට මේක පුපුරයිද කියා බැලීම බව. එහෙත්, අවුරුදු පහක් ගියත්, 134 ට 6 ක් ලැබී මෙන් දැන් මේ මොහොතකට පෙරත් පෙනී ගියා දේශපාලන වශයෙන් අපට තිබෙන ස්ථාවර භාවය. ඒ ස්ථාවර භාවය අරක්ෂා වන අන්දමට කටයුතු පවතින මේ අයවැය ලේඛනය මගින් ඇතිවන වැදගත් තත්ත්වය තමයි, අපට ඉදිරියට ගමන් කරන්නට පුළුවන්ය කියන එක.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විරුද්ධ පක්ෂය වෙනුවෙන් කථා කළ නල්ලූර් හි ගරු මන්ත්‍රීතුමා (ඇම්. සිවසිතම්පරම් මහතා) කියනවා, ලෝක බැංකුව ආධාර දෙන්නේ හරියටම නහය මට්ටමටය, නහය මට්ටමෙන් උඩට යන්න දෙන්නෙත් නැහැ, නහය මට්ටමෙන් පහළ ඉන්න දෙන්නෙත් නැත කියා. එහෙම නම් මීට වැඩිය හොඳ ණය දෙන්නෙක් ඉන්නවාද? ඇත්ත නේ? මහන්සිවෙලා ණය ගන්නෙ මොකටද නහය මට්ටමෙන් පහළට ගිහිල්ලා? ණය ඕනෑ වෙන්නේ අය නැති වුණාමයි. අය නැත්තේ ණය. ණය වුවමනා නැහැ කියනවා නම් තියෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වි. ජ. මු. ලොකුබණ්ඩාර මහතා]
එකාට ණය දෙන එකෙන් අමාරුවේ වැටෙනවා. ඒ නිසා මේක බොහොම හොඳයි. කාරුණිකයි. ලෝක බැංකුව කවදාවත් නහය මට්ටමෙන් උඩට ගිනිල්ලා ගිලෙන්න ණය දෙන්නේ නැත්නම්, එහි ඉතා වැදගත් තත්ත්වයක් තිබෙනවා. අමාරුවෙ දාන්න ණය දෙන්නෙ නැහැ. ඉල්ලා ඉල්ලා බොන්න ණය දෙන්නෙ නැහැ. අරක්කු බොන්න, සූදු කෙළින්න සමහර විට ණය ඉල්ලන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ණයක් දෙනවිට හදවතේ තිබෙන්නට ඕනෑ, දයාව, කරුණාව. ණයක් දෙන විට කිසිසේත් ම නොදී බැරි නිසා, නැත්නම් බය නිසා ණය දීම හරි නැහැ. එහි වටිනාකමක් නැහැ. ඒ නිසා යම්කිසි කොන්දේසියක් ඇතුවම ණය දෙන්න ඕනෑ. නැත්නම් එහි සීමාවක් නැති වෙනවා. ඉල්ලන ඉල ලන තරමට දෙන්න ගිහයාත් එතන ප්‍රශ්නයක් ඇති වෙනවා. අපට ඉතා පැහැදිලිව පෙනී යනවා, සෙන්ට්‍රල් බෑන්ක් එකේ "නිව් සර්වේ" කියන පොතෙන්, මොකක් ද මේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියන්නේ කියන එක. විස්තර ඇතුව එහි තියෙනවා. මේ කරුණු බැලුවා නම්, ඒ විරුද්ධ පක්ෂයේ මතය සම්පූර්ණයෙන්ම අනාථ වෙනවා, මේ වාගේ කාරුණිකව ණය දෙන වෙනත් ආයතනයක් නැති නිසා.

ඒ එක පැත්තක්. අනෙක් අතට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මුදල් ඇමතිතුමාගේ අයවැය කථාවෙන් ඉතා පැහැදිලිව කියා තිබෙන එක දෙයක් තමයි, ලෝකයේ මේ තරම් උග්‍ර ආර්ථික අර්බුද තිබුණත්, අපේ රටේ තිබෙන ආර්ථික ප්‍රතිපත්තියේ හොඳකම නිසා, හිතකර භාවය නිසා, මොන ආකාරයකින් හරි මේ තරම් කෝටි ගණන් මුදල් ලබාගන්න සමත් වුණු බව. එහෙම නම් අපේ යුතුකමක් තිබෙනවා අපේ ස්වදේශීය ආර්ථික රටාව හරි විධියට ගළපා ගන්න. ඒ සම්බන්ධයෙන් එතුමා විශේෂ පණිවුඩයක් දී තිබෙනවා අයවැය ලේඛනයෙන්. මේ රට තුළ මේ දේශය තුළ තිබෙනවා නම් යම්කිසි නාස්තියක්, ඒ නාස්තිය නැති කරන්නට අප ගතයුතු පියවර මොකක්ද කියන එක එතුමා කියනවා.

මෙහිදී අපට අමතක කරන්න බැහැ අපේ ආණ්ඩුව පළමු වතාවට රාජ්‍ය ව්‍යවසාය පිළිබඳව, රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන්, ඉතා දූරදර්ශීව කල්පනා කර රාජ්‍ය සමායතන සම්බන්ධ කමිටුවක් පත්කිරීම. ආණ්ඩුවේ නොයෙකුත් සංස්ථාවලට, සංයුක්ත මණ්ඩලවලට ආධාර දී තිබෙනවා නම් ඒ ආධාර මහජනතාවගෙන් ලබා ගත් ඒවා මිස වෙන කගෙන්වත් ගත් දෙයක් නොවෙයි. අපේ ගරු මුදල් ඇමතිතුමා විසින් මෙවර පත් කරන ලද ඒ කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ දෙස බැලුවාම අපට ඉතා ම පැහැදිලිව පෙනී යනවා අපි මේ අවුරුදු කිපය තුළ ඉදිරියට යන්නට අරගෙන තිබෙන මූලික ප්‍රයත්නයන් අතරින් එකක් තමයි, නාස්තිය නැති කිරීම. නොයෙකුත් අමාත්‍යාංශ වලට සම්බන්ධ කර නාස්ති වැළැක්වීමේ කමිටු ඇති කර අරගෙන තිබෙන පියවර නිසා, කටයුතු කරන ආකාරයෙන් ඉන්ධන සම්බන්ධයෙන් වේවා, ගොඩනැගිලි ද්‍රව්‍ය ආදිය සම්බන්ධයෙන් වේවා—පළමු තිබුණු අන්දමේම විනාශයක් නැති බව අපට පෙනී යනවා.

එහෙත් මේ අවස්ථාවේදී ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, යම්කිසි කෙනෙක් පොදු දේපොළ විනාශ කරනවා නම් ඊට වඩා බර පතල හානියක් තවත් නැහැ. මුදල් ඇමතිතුමා රටින් රට හිඟාගෙන ගිහින් කොහොම හරි ආධාර ලබා ගෙන ආවත්, අපේ මිනිසුන්ට මොන තරම් අකැමැත්තෙන් වුණත් බරක් පැටෙව්වත්, මොන ආකාරයෙන් අයවැය ලේඛනය තුලනය කළත්, මේ රටේ අපෙම දේ අප විසින්ම විනාශ කරන තත්ත්වයක් තිබෙනවා නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට වැඩක් වෙන්නේ නැහැ. එමනිසා ගරු මුදල් ඇමතිතුමාගේ කාරුණික අවධානය එක් කරුණක් කෙරෙහි මා යොමු කරනවා.

තමුන්නාන්සේගේ මේ අයවැය ලේඛනයෙන් බලාපොරොත්තු වන අරමුණු සැබවින්ම ඉෂ්ට වෙන්න නම්, අපේ ජනතාව බලාපොරොත්තු වන ඉසුරුබර සමය කරා ළඟා වෙනන්ට නම්, යම්කිසි ආයතනයක් පාලනය කරන කෙනෙක් ඕනෑම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සංඝාවක සභාපති කෙනෙක් වේවා, වෙනත් ආකාරයක වගකිවයුත්තෙක් වේවා—පුද්ගලික මට්ටමින් අඩු ගණනේ රජයේ පොදු දේපොළ විනාශ කිරීම සම්බන්ධයෙන් වගකියන්නට ඕනෑය කියා, වගකීමෙන් බැඳිඉන්න ඕනෑය කියා, නීතියක් ගෙනෙන ලෙස මා ඉල්ලා සිටිනවා. බොහෝ රටවල ඒ තත්ත්වය තිබෙනවා. "ඉකොනොමික් ඔෆේපන්සස්" නැත්නම් ආර්ථික දණ්ඩන කියා එකක් තිබෙනවා. ජනතාවට ආර්ථිකමය වශයෙන් පාඩු සිදු වන මොකක් හෝ ද්‍රෝහී ක්‍රියාවක් කළා නම් ඒ අයට දඬුවම් කරන්නට ඕනෑ. හිරිහැර කරන්නට ඕනෑ ඒ අයට නිකම් පැනලා යන්නට ඉඩ දෙන්න බැහැ. කෝටි ගණන් ගහලා, හෙම්හිට ඉල්ලා අස්වෙලා පැනලා යන සභාපතිවරුන් පිළිබඳව අපට නොයෙක් විට පුවත්පත් යනාදියෙන් දකින්නට ලැබෙනවා. සමහර උදවිය ලෝක වෙළඳ තත්ත්වය යනාදිය දැන ගෙනම මේ රටේ සාමාන්‍ය ජනතාවට කන්න බොන්න තිබෙන පාරිභෝගික ද්‍රව්‍යවලින් පවා කෝටි ගණන් කොමිස් ගත් අවස්ථා අපට පෙනී යනවා. එබඳු හැම අවස්ථාවකදීම සාමාන්‍ය ජනතාව අමාරුවේ වැටෙනවා. සාමාන්‍ය ජනතාවට ඒ වන්දිය ගෙවන්නට වෙනවා. මුදල් අමාත්‍යාංශයට සල්ලි සොයන්නට මහන්සි වෙන්න වෙනවා. අපි මොන විධියට මහන්සි වුණත් වැඩක් වෙන්නේ නැහැ. ඒ අයට තනි තනිව දඬුවමක් දෙන්නේ නැත්නම්.

එමනිසා රජයේ දේපොළ කඩාසිතියා කරන, රජයේ දේපොළ විනාශ කරන සංස්ථා ප්‍රධානීන්ට, දෙපාර්තමේන්තුවල ලොකු ලොක්කන්ට උපරිම දඬුවම් දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. ඕනෑ නම් ප්‍රසිද්ධියේ කස පහර දෙන්න. පුළුවන් තරම් බර පතල දඬුවම් දෙන්න. එහෙම දඬුවම් නොදුන්නොත් මෙය කිසි තේරුමක් නැති වැඩක්. හරියටම කියනවා නම් හිල් කලයට වතුර දමන්නා වගෙයි. කලය තමයි, අපට කැටය වගේ අර්ථශාස්ත්‍රය පිළිබඳව තිබෙන වැදගත් සංකේතය, මෙය උපමාවක්. කලය අපට කියා දෙනවා පොඩ්ඩ පොඩ්ඩ බින්දුවෙන් බින්දුව, ටික ටික එකතු වුණාම මොන ආකාරයට එක්රැස් කර ගන්න පුළුවන්ද කියන එක. කලයේ උපමාවෙන් අපට පෙනී යනවා,එක දවසින්ම පොහොසත් වෙන්න වුවමනාවක් නැති බව, මහන්සියෙන් එක් රැස් කර ගන්න පුළුවන් කියන එක. මේ කලයේම හිලක් තිබෙනවා නම් මොකටද මේකට තව තව වතුර දමා මහන්සි වෙන්නේ.

එමනිසා මේ දේශ ද්‍රෝහීන්ට, සමාජ ද්‍රෝහීන්ට, ඒ ද්‍රෝහී ක්‍රියාවල ප්‍රතිඵල විඳින්නට සිදු වී තිබෙන අහිංසකයන්ගේ නාමයෙන් එබඳු දඬුවම් පැමිණවීමේ ක්‍රමයක් ඇති කරන ලෙස මම ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටිනවා. එබඳු ප්‍රයත්නයක්, ක්‍රියාත්මක ප්‍රයත්නයක් නොදැරුවොත් අපි මේ යන ගමන, සාර්ථක කරගන්න ලැබෙන්නේ නැහැ. මෙතරම් දේශපාලන ස්ථාවර භාවයක් තිබියදී, මෙතරම් පිටරටින් මුදල් ලැබෙද්දී, මේතරම් අපේ ජනතාව කැප කිරීමට සූදානම්ව සිටියදී, ඇප කැප වී වැඩ කරද්දී, කොයි ආණ්ඩුවක් තිබුණත් වැජඹෙමින් තමන්ගේ වයි මාරු කරමින් ආණ්ඩුවක් පෙරළෙන, පෙරළෙන අවස්ථාවලදී අනිත් පැත්තට කකුල තබා ගන්නට බලාපොරොත්තුවෙන් යම්කිසි පිරිසක් සිටිනවා නම් ඒ අයට පාඩමක් හැටියට මෙබඳු ක්‍රියාත්මක පියවර ගත යුතුයි කියා මම යෝජනා කරනවා.

මේ අයවැය යෝජනාවලින් යම් කරදරකාරී තත්ත්වයක් අපේ අහිංසක ජනතාවට ඇවිත් තිබෙනවා නම්, එය අපට සතුටු වන්න පුළුවන් දෙයක් නොවෙයි. අපි දන්නවා, ජනතා හිතවාදී, සුභසාධන රජයක් මුදල් ඇමතිතුමා වශයෙන් ජනතාවට කිසියම් හිරිහැරයක් වී ඇත්නම්, එවැනි තත්ත්වයක් සකස් කිරීමට, හරි ගැස්සීමට අපේ ගරු මුදල් ඇමතිතුමා අවශ්‍ය අවස්ථාවලදී පියවර ගන්නා බව. එතුමා කවදාවත් අපේ අහිංසක දුප්පත් ජනතාව අමතක කරන්නෙ නැහැ. අහිංසක දුප්පත් කම්කරුවෙක් කිඩියක් එහෙම බොනවාය කියන කාරණය එතුමා කවදාවත් අමතක කරන්නෙ නැහැ. පුළුවන් සැනින් එතුමා ඒකත් අඩුකර දෙයි. එතුමා බීර මිල බැස්සුවා නම්, එසේ කරලා එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. ජ. මූ. ලොකුබණ්ඩාර මහතා]

ගින් රටේ සුරා ප්‍රතිපත්තියෙ වෙනසක් කරන්නට බැලුවා නොවෙයි. කොහොම වුණත්, අපේ රටේ සාමාන්‍ය ජනතාවට ගිරිහැරයක් කරදරයක් වන කිසියම්ම යෝජනාවක් තිබෙනවා නම්, ඒ තත්ත්වය නැති කරන්න, ඒ දුෂ්කරතාව අඩු කරන්න එතුමා පියවර ගන්නවාට කිසිම සැකයක් නැහැ; දයාබර මවක් වාගේ, දයාබර පියෙක් වාගේ ඒ පිළිබඳව කටයුතු කරනවාට මගේ නම් කිසිම සැකයක් නැහැ.

ඒ වාගේම ගරු කථානායකතුමනි, ඉතාම නපුරුම ආර්ථික තත්වයකට වැටී තිබුණු රටක්, සුළු කාලයක් තුළදී ඒ තත්ත්වයෙන් ගොඩ ගෙන අනාගත බලාපොරොත්තු ඇති කර ගත හැකි තත්ත්වයකට ආර්ථිකය සකස් කිරීම එතරම් ලෙහෙසි පහසු දෙයක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂයට කෙළින්ම විරුද්ධය, සටන් වදිනවාය කියන ජාතික විමුක්ති පෙරමුණ පවා, දැන් මේ රටේ සාමකාමී වාතාවරණයක් තිබෙනවාය කියා පිළිගැනීමම, අම්ම-පුතා නැතිවන තරමට, ඔවුන් එකිනෙකාට කෙළින්ම විරුද්ධ වන තරමට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එකිනෙකා නැතිවන තත්ත්වයෙන් භේද භින්න වී තිබෙන තරමටම, අපට පෙනී යනවා, මොන තරම් මේ රජයේ දේශපාලන ස්ථාවර භාවයක් පවතිනවාද කියා. කෙසේ වෙතත්, ඉදිරිපත් කර ඇති මෙම අයවැය යෝජනා ක්‍රියාත්මක කළාම තව අවුරුදු පහක-හයක්-හතක් යන විට, මේ රටේ ජනතාවට අනුන්ට අත නොපා මුදල් ඇමතිතුමාට වෙනත් රටවලට හිගමනේ යන්න ඉඩ තියන්නේ නැතුව අපේම ශක්තියෙන්— ස්වශක්තියෙන් නැගී සිටින්නට හැකි සමාජයක් ඇති වන්නට තරම් අපේ රට සෞභාග්‍යය කරා ගමන් කරනවාය, දියුණු වෙනවාය කියන කාරණය මට පෙනී යන නිසා, මෙවැනි අයවැයක් සකස් කර ඉදිරිපත් කිරීම සඳහා වෙහෙස මහන්සි වූ ගරු මුදල් ඇමතිතුමාටත්, ඒ වාගේම දිවා—රෑ වෙහෙසුණු භාණ්ඩාගාරයේ නිලධාරි මහතුනටත් මගේ ප්‍රශංසාව හිමි කරමින් මගේ කතාව මෙයින් අවසන් කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy-Speaker)

Order, please! There being no more hon. Members to speak now, I suspend the Sitting till 2 p.m.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 2 ට කථානායකතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு பி. ப. 2 மணி வரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 2* P.M. *and then resumed*, MR. SPEAKER *in the Chair.*

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා (නියෝජ්‍ය උසස් අධ්‍යාපන ඇමතිතුමා)**

*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க—உயர் கல்விப் பிரதி அமைச்சர்)*

(Mr. A. M. R. B. Attanayake—Deputy Minister of Higher Education)

ගරු කථානායකතුමනි, අපේ ආණ්ඩුව 1977 සිට මේ වන විට අයවැය ලේඛන ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ හැම අයවැය ලේඛනයක්ම දම්වැලක පුරුක් එකට සම්බන්ධ වන්නා වගේ එකිනෙකට සම්බන්ධ කර ජාතිය හා රට සංවර්ධනය කරා ගෙන යන්නට පුළුවන් වන ආකාරයටයි, සකස් කර තිබෙන්නේ.

ගිය අවුරුද්දේ අයවැය ලේඛනය ඉදිරිපත් කරමින් ගරු මුදල් ඇමතිතුමා ප්‍රකාශ කළා, මොන තරම් බාධක තිබුණත්, ජාත්‍යන්තර බාධක තිබුණත්, ජාතික බාධක තිබුණත්, ඒ ඔක්කොම දිනා ගෙන සංවර්ධනයට ජාතිය යොමු කිරීම සඳහා මේ අයවැය ඉදිරිපත් කරනවා කියා. එතුමා අයවැයෙන් නොකියා කිව්වා විශේෂ රහසක්, ආයෝජන අයවැයක් සකස් කළා කියා. එතුමා ජාතියට සංවර්ධනය සඳහා ධනය ආයෝජනය කරන්න පුළුවන් වන පරිදි පරිසරයක් අයවැය ලේඛනවලින් සකස් කර දුන්නා. ඒ පරිසරය මේ අයවැය ලේඛනයෙන් තවත් ස්ථාවර කර තිබෙනවා. මේ අයවැය ලේඛනය ශ්‍රී ලංකා ඉතිහාසයේ සැලකියයුතු කඩඉම් ස්ථානයක සිටින අයවැය ලේඛනයක්ය කියා මට සඳහන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්න පුළුවන්. ලෝක ආර්ථිකයත් ජාත්‍යන්තර ප්‍රශ්නත් එකට ගලපා ඉදිරිපත් කළ අයවැයක් හැටියටයි, මෙය දකින්න ලැබෙන්නේ. හේතුව ගරු කථානායකතුමනි, ලෝකය පිල් කීපයකට බෙදා තිබෙනවා. අපි ඉන්නේ තුන් වැනි පිලේ තුන් වැනි ජාතියක් වශයෙනුයි. දියුණු වන ජාතීන් අතර තුන් වන වර්ගයේ රටක් හැටියටයි, ලංකාව ගමන් කර තිබෙන්නේ.

ඒ තුන් වන ලෝකයේ රටවල් අතර කිසිම ජාතියකට පුළුවන්කමක් ඇති වී නැහැ, දිනපතා, මාස්පතා, වාර්ෂික වශයෙන් ඇතිවීගෙන යන ජීවන වියදමත් සමග ගලපන්නට පුළුවන් ගෙවුම් ශේෂයක් ආණ්ඩුවට වෙන් කරන්නට. එහෙම කරන්නට පුළුවන් වුණා නම් පුළුවන් වී තිබෙන්නේ ශ්‍රී ලංකාවට 1982 අයවැය ලේඛනයෙන් බව ඉතා ආඩම්බරයෙන් කියන්න ඕනෑ.

අවශ්‍ය පුද්ගලයන් මේ අවස්ථාවේදී සභාවේ නැතත් මේ ප්‍රශ්නය ගැන විස්තරාත්මකව කරුණු කියා දෙන්නට මට සිදු වී තිබෙනවා. කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවේගම මහතා) දරන දේශපාලන පක්ෂ න්‍යාය යටතේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දරන දේශපාලන න්‍යාය යටතේ, ඒ කට්ටිය හිතෙන් වත් හිතුවෙ නැහැ, ජීවන අංකයට අනුව ශ්‍රමිකයන්ට වැටුප් ගෙවන්නට වර්තමාන රජයට පුළුවන් වෙයි කියා. මා හිතන්නේ තුන්වෙනි ලෝකයේ කිසිම රටක් කල්පනා කළේ නැහැ, අපට එහෙම දෙයක් කරන්නට පුළුවන් වෙයි කියා.

1948 සිට නොවෙයි, 1922 ඉඳලම, වාමාංශික වචන වලින් කියනවා නම්, සනාථන අරගලයක් බවට පත්වී තිබුණා. ශ්‍රමිකයන්ගේ වැටුප් ශේෂය පිළිබඳ අරගලය. 1924 කරන්න ස්ට්‍රයික් එකෙන් පටන් ගත් ඒ ව්‍යාපාරය ඒයේ-පෙරේරා වන තෙක්ම පුදුමාකාර විධියට ගෙන ගියා. හැම ආණ්ඩුවකටම සැලකිය යුතු හිස රදයක් වුණා, ශ්‍රමිකයන්ගේ, කම්කරුවන්ගේ, වැටුප් ප්‍රශ්නය. වැටුප් වැඩි කරන්නය, දරුවන්ට පොත් අරන් දෙන්න වෙනම ණය මුදලක් දෙන්න ආදි වශයෙන් නොයෙක් ඉල්ලීම් ඔවුන් ඉදිරිපත් කළා. තමුන්නාන්සේ ඉතිහාසය දන්නවා. ඉතිහාසය බලන විට මේ ස්ට්‍රයික් කණ්ඩායම් විසින් ආණ්ඩු පෙරළා දැම්මා. ශ්‍රමිකයන්ට ගෙවීම් ශේෂයේ පරතරය පියවා ගන්නට බැරි වුණාම, ගෙදර අයවැය පියවා ගන්නට බැරි වුණාම, ඔවුන් රාජ්‍ය සේවාව, ජාතික සේවාව පැහැර හැරියා.

එස්. ඩබ්ලිව්. ආර් ඩී බණ්ඩාරනායක මැතිතුමාගේ ආණ්ඩු කාලයේදී වැටුප් ප්‍රශ්නය මතම මේ රටේ ස්ට්‍රයික් 640 ක් පමණ ඇති වුණා. එතුමාගෙන් පසුව ඇති වුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩු කාලයේදී, 1977 අපි බලයට එන්න ප්‍රථමයෙන් ස්ට්‍රයික් නිසා ලංකාව සම්පූර්ණයෙන් මළ ගෙයක් බවට පත් වුණා. එදා තමන්ගේ දූ දරුවන්ට පොත් ටික අරන් දෙන්න රු. 300 ක ණයක් ඉල්ලා රජයේ සේවකයන් කෑ ගැසූ අවස්ථාව තමුන්නාන්සේට මතක ඇති. මේ බැරෑරුම් ප්‍රශ්නය කිසිම රජයකට ජය ගන්න දැම්මා. ශ්‍රමිකයන්ට ගෙවීම් ශේෂයේ පර කළේ නැහැ. මේ නිදහස ලැබීමෙන් පසු මේ රටේ ඇති වූ 8 වෙනි ආණ්ඩුව. ජනතාව විසින් විටින් විට ආණ්ඩු 7 ක්ම පෙරළා දැම්මා. හරියට රොටි ඒ පැත්ත මේ පැත්ත පෙරළන්නා වගේ ආණ්ඩු 7 ක් පෙරළා දැම්මා, මේ ප්‍රශ්න මතම. ජීවන වියදම හෙටට ගළපා ගන්න බැරි වන විට ජනතාව කල්පනා කරන්නේ වෙන පැත්තක් බලයට පත් කරන්නයි. ඒකයි, දර්ශනය. ඒකයි, දේශපාලන න්‍යාය. ජීවන වියදම ගළපා ගන්නට බැරි තැන අනෙකෙක් ගැන කල්පනා කරනවා, පාලනය භාර දෙන්න. ඒ නිසයි, ඒ ආණ්ඩු හත ඒ විධියට පෙරළා දැම්මෙ. මේ 8 වෙනි ආණ්ඩුවට ඒ ප්‍රශ්නය ජය ගන්නට හැකිවීම පිළිබඳව මම ශ්‍රීමත් ජනාධිපතිතුමාටත්, ගරු මුදල් ඇමතිතුමාටත්, අගමැතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයටත් අනේක වාරයක් ප්‍රශංසා කරනවා. තුන්වෙනි ලෝකයේ රටකට විසඳන්නට බැරි වුණ ප්‍රශ්නයක් ශ්‍රී ලංකාව වැනි කුඩා රටක් සදාකාලිකවම විසඳූ මට්ටමකින් ඒ ප්‍රශ්නය විසඳී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එම්. බී. ආර්. අත්තනායක මහතා]

මේ අයවැය ලේඛනයෙන් පස්සෙ මේ රටේ කිසිම ශ්‍රමිකයෙක්—රාජ්‍ය මට්ටමේ වේවා, පෞද්ගලික මට්ටමේ වේවා, සංස්ථා මට්ටමේ ජේවා, මණ්ඩල මට්ටමේ වේවා සේවකයෙක්—කෑ ගහන්නෙ නැහැ වැටුප් වැඩි කරන්න ඕනෑය කියා. ගරු කථානායකතුමනි, මේ ගැන විග්‍රහ කරන විට මට සිද්ධ වෙනවා, ලංකාවේ වාමාංශික ව්‍යාපාරය ගැන තමුන්නාන්සේට ටිකක් කියා දෙන්න. බේරුවල සිට කොළඹ එන විට තමුන්නාන්සේ හැම වෙලාවෙම දකින්න ඇති, මේ වාමාංශික ව්‍යාපාරය ගෙනයන ක්‍රියා පද්ධතිය කුමක්ද කියා. ඒ ක්‍රියා පද්ධතිය ශ්‍රී ලංකාවෙ කොයි තරම් දුරට අසාර්ථක වුණාද කියනවානම් තමුන්නාන්සෙ දන්නවා ඇති, 1922 දී ආරම්භ වුණ වාමාංශික ව්‍යාපාරය, 1935 දී තවත් අලුත් සමකට යොමු කර, 1964 වන විට තවත් මඟකට යොමු කර, 1970 දී අච්චාරු මඟකට යොමු කර, අන්තිමට 1977 දී ජනතාව ගහලා මේ මහා මන්දිරයෙන් පන්නාගත්තු බව. අවුරුදු හතළිස් ගණනක් ඇතුළත ලංකාවේ අසාර්ථක වුණ දේශපාලන ව්‍යාපාරයක් ඇති වුණා නම්, අවුරුදු හතළිස් ගණනක් ඇතුළත ජාතියක් විසින් ප්‍රතික්ෂේප කළ දේශපාලන දර්ශනයක් ඇති වුණා නම්, ඒ ශ්‍රී ලංකාවේ වාමාංශික දේශපාලන ව්‍යාපාරය බව අපට කියන්න පුළුවනි. මේ ව්‍යාපාරය ගැන අපි ටිකක් කථා කරන්න ඕනෑ. ඒ මොකද, මේක බොහෝම වැදගත් ප්‍රශ්නයක්.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

ඒ ව්‍යාපාරය ගැනද, අය වැය ගැනද කථා කරන්න තිබෙන්නෙ?

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**

*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*

**(Mr. A. M. R. B. Attanayake)**

මේ ව්‍යාපාරය අපේ ආර්ථිකයට බලපාන හැටිත්, එය අයවැය ලේඛනයට බලපාන හැටිත් පෙන්වා දෙන්නටයි, මම උත්සාහ කරන්නෙ.

තමුන්නාන්සේ අසා ඇති 1918 දී මුළු ලෝකයම එකම කැරලි මඩුවක් බවට පත් වූ අවස්ථාවක් ගැන. ශ්‍රී ලංකාවේත් ඒක ඇති වුණා. එතකොට ඉංග්‍රීසි ආණ්ඩුව පැවති කාලයයි. අපේ රට අධිරාජ්‍ය වාදීන් යටතේ පැවති කාලයේ අපේ රටේ පමණක් නොවෙයි, යුරෝපයේ පමණක් නොවෙයි, පෙරදිග රටවල පවා සෑම තැනකම මෙසේ කැරලි ඇති වුණා. මෙන්න මේ වකවානුවේ උපන ලැබූ පුද්ගලයෙක් තමයි, මේ වාමාංශික ව්‍යාපාරය ලෝකයට හඳුන්වා දුන්නෙ; මේ වාමාංශික ව්‍යාපාරය ආරම්භ කළේ. එතුමා ගැන කථා කිරීමෙන් එතුමාට මදි පුංචිකමක් කිරීමේ චේතනාවක් මා තුළ නැහැ. කලවාන මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) අමනාප වන එකක් නැහැ, මම නිවැරදි මට්ටමෙන් විග්‍රහයක් කිරීම ගැන.

කාල් මාක්ස් කියන මේ තැනැත්තා, ලෝකයට නව ආර්ථිකයක් පෙන්වූ, නව ආර්ථිකයක් හඳුන්වා දුන් පුද්ගලයෙක්. මේ ඇත්තා කල්පනා කළා, කාර්මික විප්ලවයෙන් පස්සෙ ලෝකයේ ආර්ථිකය වෙනස් මඟකට යොමු කරන්න. ඒ යොමු කිරීම සඳහා හැම රටකම ආර්ථිකය පිළිබඳ සැලකිය යුතු විග්‍රහයක් ප්‍රංශයේ එංගල්ස් කියන තම මිත්‍රයා සමඟ එතුමා කරන්න යෙදුණා. ඒ විග්‍රහයේදී කාල් මාක්ස් කියන ඒ තැනැත්ත "දාස් කැපිටාල්" කියන පොතෙන් ධනවාදය ගැන විග්‍රහයක් කළා. "කැපිටල්" කියන්නේ මූල්‍ය මුදල. අද ලංකාවේ වාමාංශික ව්‍යාපාරිකයො පාවිච්චි කරන "ධනවාදය" කියන වචනය වැරදියි. ධනවාදයක් කියා එකක් මෙහි නැහැ. ධනවාදය කියන වචනයේ අර්ථය විග්‍රහ කරන්න නම් එය කළයුත්තේ එතුමාගේ "දාස් කැපිටාල්" කියන පොතෙන්මයි. දාස් කියන්නෙ: "ද"; කැපිටාල් කියන්නෙ "මූල්‍ය ධනය" "දාස් කැපිටාල්" කියන්නේ මූල්‍ය ධනවාදය. මූල්‍ය ධනවාදය කියන වචන වැරදි විධියට, හෑවතට පිදෙන විධියට, සමහර විටක හදවත් ඇදගන්න පුළුවන් විධියට "ධනවාදී", අධිරාජ්‍යවාදී" කියන වචනවලට පරිවර්තනය කරගෙන අද පාවිච්චි කරනවා. මේකෙන් මම උත්සාහ කරන්නේ අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අයවැය ලේඛනය කොහේද යන්නේ කියා තමුන්නාන්සේට පැහැදිලි කර දෙන්නයි. අලුත් ආර්ථිකයක් ගොඩ නගන්නට කථා කළ මේ අමරණීය නායකයාගේ දර්ශනයෙන් ශ්‍රී ලංකාවේ රෝනී ද මැල්ගේ දර්ශනයත් යන දෙක අතර පරතරය මේ උත්තරීතර සභාව තුළින් රටට පැහැදිලි කර දෙන්න පුළුවන් වුණොත් එය වැදගත් වෙයි.

'දාස් කැපිටාල්' පොතේ එන 'කැපිටලිස්ම්' කියන්නේ මූලධන වාදයයි. කාල් මාක්ස් නමැති පුද්ගලයා මුළු රටක්, ගෝත්‍රයක්, ජාතියක්, මුළු ලෝකයක් විප්ලවීය මාර්ගයකට යොමු කළේ මේක ගැන පොතක් ලියලායි. 'ඉස්ම්' කියන්නේ 'වාදය', 'කැපිටල්' කියන්නේ මූලධනය. මේ මූලධන වාදය ලෝකයේ ක්‍රම දෙකකට ක්‍රියාත්මක වෙනවා. ඉන් එකක්, 'ස්ටේට් කැපිටලිස්ම්'. රාජ්‍යය විසින් මූලධනය පාලනය කිරීම. අනෙක් එක, "පීපල්ස් කැපිටලිස්ම්". මහජනයා විසින් මූලධනය පාලනය කිරීම. අපි අද ක්‍රියාත්මක කරන්නේ "පීපල්ස් කැපිටලිස්ම්" එකක්. ඒ අනුව අපේ අය වැය ලේඛනයෙන් කෙරෙන්නේ, මහජනයා විසින් නියම අන්දමට, නිසි පරිදි, රජයේ නීති රීති අනුව, ජාතියේ ව්‍යවස්ථාව අනුව, මූලධනය පරිහරණය කිරීමයි.

'ස්ටේට් කැපිටලිස්ම්' කියන රාජ්‍ය මූලධන වාදය අද ලෝකයේ පවතින්නේ සත්‍ය වශයෙන්ම කොමියුනිස්ට් රටවල පමණයි. රුසියාව, චීනය වැනි රටවල රාජ්‍ය මූලධන වාදය පවතිනවා. ඒ රටවල පෞද්ගලික අංශයේ කිසිම කෙනකුට කිසිම විධියකින් මූල ධනය ආයෝජනය කරන්න බැහැ. කෑම—බීම, නවාතැන්, ඉඩම—කඩම, දරුවන්ට ඉගැන්වීම යන හැම දෙයක් සඳහාම ධන ව්‍යවසාය රජය භාරයේයි පවතින්නේ. ඒ නිසා ඒ රටවල උපදින සෑම මනුෂ්‍යයෙක්ම ආර්ථික හිඟන්නෙක් බවට, ආර්ථික හිරකාරයෙක් බවට පත් වී සිටිනවා.

"පීපල්ස් කැපිටලිස්ම්" නැත්නම්, පොදු ජන මූල ධන වාදය යටතේ ආර්ථිකය ක්‍රියාත්මක වන්නේ ජනසම්මත වාදී පාලන ක්‍රමයක් අරන් ගත් රටවල පමණයි. අද ශ්‍රී ලංකාවේ පාලනය අරන් ගෙන තිබෙන්නේ ජනසම්මත වාදයයි. ජනතාව කැමති කාටද, ඔවුන් කොටස ජනතාව විසින් බලයට පත් කරනවා. එම කොටස විසින් සම්පූර්ණ නීති රීති තුළ මූලධනය මෙහෙයවීම ජනතාවට භාර කර තිබෙනවා. අද තිබෙන නිදහස් වෙළඳ කලාපය එහි හොඳ ලක්ෂණයක්. මූලධන ආයෝජනය එහි ක්‍රියාත්මක වන්නේ රජයේ නීති රීති මාලාවක් යටතේයි. කම්කරුවාගේ සිට නිෂ්පාදනයේ සියලුම අංශවල එක්තරා මහජන පාලනයක් ඇති කර තිබෙනවා. පෞද්ගලික ව්‍යාපාර කොම්පැනි, සමාගම් තිබෙනවා. ඒවා පාලනය කෙරෙනවා. 2

මීට සති දෙකකට පමණ උඩදී අපි මේ ගරු සභාවේදී 'සමාගම් නීතිය' වෙනස් කළා. එක්දාස් අටසිය ගණන්වල පැරණි නීතියක් තිබුණා. ඒක ජනතාවට නිසි විධියට, මහජන මූලධන වාදයට ගැළපෙන හැටියට වෙනස් කොට අපි ඒ ප්‍රශ්නය හරියට විසඳුවා. 'කැපිටලිස්ම්' හෙවත් මූලධන වාදය ව්‍යවහාරයට නොගන්නා, නුලුවුවුපුබුඩුග ණඩව්නාම ඩව්මම නවමම ක්‍රියාත්මක ස්වරූපයෙන් එය නොපවත්නා, කිසිම රටක් ලෝකයේ නොනැතක හෝ තිබෙනවාද කියා මම ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේ සියලුම වාමාංශික ව්‍යාපාර වලින් අහන්න කැමතියි. ගරු කථානායකතුමනි, එවැනි රටක් ලෝකයේ කොහේවත් තිබෙන බවක් තමුන්නාන්සේ දන්නවාද? හැම රටක්ම මූලධන ආයෝජනයන් කරනවා. එසේ නැත්නම්, රටක් වශයෙන් නැගී සිටින්නට බැහැ.

රුසියාවේ නොයෙක් ව්‍යාපාර, සංවර්ධන වැඩ, ගොඩනැගිලි හැදීම, පාරවල්, ඉස්කෝල, විශ්ව විද්‍යාල හැදීම සඳහා මූලධන ආයෝජනයන් කරනවා. එහෙම නම් ඒ රටේ 'කැපිටලිස්ම්' හෙවත් මූලධනවාදය පවතිනවා. අපේ රටේත් අපි එහෙම කරනවා. ඉමී දෙකේ තිබෙන්නේ නිදහසේ තිබෙන පරතරයයි.

ඒ රටවල පුද්ගලයකු විසින් උත්තරීතර මණ්ඩලයක්, රාජ්‍යයක් ය සියල තබා ගෙන, ඔහු විසින් සියලුම පුද්ගලයන් ආර්ථික [illegible]නේ බැඳුම්කරුවන්, සිරකරුවන්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එම්. ටී. ආර්. අත්තනායක මහතා]

වශයෙන් තබාගෙන ආර්ථිකය මෙහෙය වනවා. ජන සම්මතවාදය පවතින රටක එහෙම නොවෙයි. ජනතාවට රිසි පරිදි ඔවුන්ගේ ආයෝජනයන් ක්‍රියාත්මක කරන්න, දියුණු කරන්න කටයුතු සලසා දෙනවා. ඒ නිසා අද දුප්පත් පුද්ගලයෙකුට හෙට පුළුවන් පොහොසතෙක් වන්න. ඒ අනුවයි පවතින්නෙ. අද අපි මූලධන වාදය අනුගමනය කරනව කොලනි ව්‍යාපාර ඇති කරන විට. ඒ ජනසම්මතවාදී ආර්ථිකයේ ප්‍රතිඵලයක් තමයි නියෝජ්‍ය උසස් අධ්‍යාපන ඇමතිවරයා. බොහොම දුප්පත් පවුලක සිට ආණ්ඩුවෙන් කොලනි ගෙයක් ලබාගෙන, ඒකෙන් කුඹුරක් හදාගෙන, එයින් දියුණු වී ඉගෙන ගෙන අද මේ උත්තරීතර මණ්ඩලයට අවුත් සිටිනවා. තමුන්නාන්සේ ඉදිරියට අවුත් සිටිනවා. රුසියාවේ—මගේ මාතෘකාවේ ඒ එක කොටසක්—එහෙම පුළුවන්ද කියා මම ප්‍රශ්න කරනවා. ලංකාවේ ඉන්න, උත්තරීතර මට්ටමකින් දේශනා පවත්වන, සමාජවාදය ගැන කථා කරන ඇත්තන්ගෙන් මම ඒ ප්‍රශ්නය අහනවා. රුසියාවේ, චීනයෙ, යුගෝස්ලොවැකියාවෙ, පෝලන්තයේ, කියුබාවේ එහෙම වෙනවාද ? ගොවි කම්කරු පංතියෙන් මතු වුණු පුද්ගලයෙක් පාලන ක්ෂේත්‍රයෙ කිසියම් ස්ථානයක ඉන්නවද ? එහෙම නම් මම හෙට උදේට කොමියුනිස්ට් ධර්මය පිළිගන්න ලෑස්තියි. ගරු කථානායකතුමනි, ඔන්න ඔය කාරණයයි විග්‍රහ කරන්න තිබෙන්නෙ.

අපේ ආයවැය ලේඛනය යටතේ අපේ මූලධන ව්‍යවසාය යටතේ පුළුවන්කම තිබෙනවා, කාටත් එක සමානව ජාතික සම්පත්, දේශීය සම්පත් භුක්ති විඳින්න. නමුත් ඒ අයගේ මූලධන ව්‍යවසාය යටතේ කවදාවත් බැහැ, සාමාන්‍ය පංතියට ඒවා භුක්ති විඳින්න උපරිම මට්ටමකින්. එක් පිරිසකට සමණයි. අගමැතිවරයා, ජනාධිපතිවරයා පත් වෙන්නේ කොහොමද කියන්වවත් සාමාන්‍ය ජනතාව දන්නේ නැහැ. අපේ රටේ දන්නවා. ඔිපි හැටියේම ජනාධිපතිවරයා රහත් වෙනවා, ඒ රට වල්වල. තමුන්නාන්සෙත් එහෙම අහල ඇති. පත්තරවලින් දකිනවා ඇති. ස්වර්ගස්ථ වෙනවා. මොකද ඒ ? ජන සම්මත වාදයක් ; මහජන කැමැත්තක්, මහජන ආදරයක්, මහජන ඕනෑකමක්, මහජන ප්‍රසාදයක් තුළින් ඔහු ඇවිත් සිටියා නම් අතුරුදහන් වෙන්න බැහැ. අපේ ජනාධිපතිතුමා අද මුළු ජාතියෙන් සියයට 51 ක ප්‍රතිඵලයක් ; කැමැත්තේ ප්‍රතිඵලයක්. තමුන්නාන්සේ ඔය පුටුවේ වැඩ සිටින්නෙත් ඒ නිසයි. ඒකේ රහසක් නැහැ. එහෙම නම් අපි මෙතැන විග්‍රහ කර බලන්න ඕනෑ, ඒ ආර්ථිකයත් මේ ආර්ථිකයත් අතර ඇති වෙනස.

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේට පෙනෙන්න පුළුවන් මේ විධියට කථා කර ගෙන යන විට මම ආයවැය ලේඛනයෙන් පිට යනවාය කියා. නැහැ ; එහෙම පිට යාමක් නැහැ. මම මේ කරන්නේ ශ්‍රී ලංකාවත් සම්බන්ධ කරගෙන, ලෝකයේ ආය වැය ලේඛන මූලධර්මය විග්‍රහ කිරීමකුයි. මෙතැනදී මට තමුන්නාන්සේට පෙන්නා දෙන්න වෙනවා, මේ මාක්ස්වාදය කියන්නේ මොකක්ද කියා. ඒකයි, අපේ ආර්ථිකයේ හොල්මන. ඒක ආර්ථික හොල්මනක්. හොල්මනක් කියන්නේ මනසේ කැළඹීමක් විතරයි. දෙයක් නැහැ, එතැන. මනස කැළඹීමක් කරනවා ; නමුත් සිද්ධියක් නැහැ. ඒකටයි, හොල්මන කියන්නෙ. කෙසෙල් අත්තක් හඳපානේ වැනෙන කොට එතැන කවුදෝ ඉන්නවාය කියල හිතාගෙන භය වෙනවා. ගිහිල්ලා බැලුවාම කෙහෙල් අත්තක් එතැන තිබෙන්නෙ ; මනුෂ්‍යයෙක් නැහැ. හොල්මන කියන්නෙ ඒකටයි. මනසේ කැළඹීමක් ඇති කරනවා පමණයි.

ලංකාවේ හෝ වේවා ලෝකයේ හෝ වේවා මාක්ස්වාදය කියන්නේ එක්තරා හොල්මනක්. මේ හොල්මන ස්වර්ග මට්ටමකින් මවා පානවා. ළඟට ගොස් බලන විට එතැන ස්වර්ගයක් නැහැ. සාවුන් ඉන්න උද්‍යානයක් ගැන තමුන්නාන්සේ ඉංග්‍රීසි පොතකින් කියවලා ඇති. ඈත ඉඳලා බලන විට ඒ උද්‍යානයේ සාවුන් ඉන්නවා, විවිධ මට්ටමින්. ළඟට ගිහින් බලන විට සාවුන් නොවෙයි, පොඩි පොඩි වළාකුල් තිබෙන්නෙ. ඒ වගේ මනෝරාජ්‍යයක්. එය මමම පෙන්නුම් කර දෙන්න ඕනෑ. ඒ ආර්ථිකය උඩයි, මාක්ස් වාදය ලෝකයේ හොල්මන් කරන්නෙ.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ආර්ථික රටාවක් උඩයි, මාක්ස්වාදය ලෝකෙ පතුරුවන්න කල්පනා කරන්නෙ. එදා කාල්මාක්ස් මහත්මය ජර්මනියෙන් පන්නලදුල එංගලන්තෙ හිටිය වෙලාවෙ, එංගලන්තෙ හන්දිවලට උදේ පාන්දර ඇවිල්ල බැලුව. 'දැන් විප්ලවය අර මුල්ලෙන් එයි, මේ පාරෙන් එයි, අනිත් පාරෙන් එයි' කියල. හැන්දෑවෙ තින්දට ගියෙත් 'අද හැන්දෑවෙ විප්ලවය එයි' කියල හිතාගෙනයි. 'හෙට උදේ විප්ලවය එයි' කියල හිතුව. ඕ...හු... එහෙ විප්ලවයක් ආවෙ නැහැ. මාක්ස් න්‍යාය යටතේ, ද්විගටනවාදය කියන 'තියරි' එක යටතේ තීන්දුවක් ගත්තොත්, ඒකෙන් හරියට සාර්ථක ප්‍රතිඵල ලැබෙන්න ඕනෑ.

ඊයේ මේ සභාවෙ කථා කරව්ව, අපේ ගම්පහ ගරු මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මහතා). 1971 දී මේ රටේ ඇති වුණ තරුණ අරගලය එතුමා හංවඩු ගැහු විධිය ගැන තමුන්නාන්සෙට මතක ඇති. මං ඒ වෙලාවෙ අතුරු ප්‍රශ්නයකුත් ඇහුව. 'මොකක්ද, අන්තර් විප්ලවය කියන්නෙ' කියල. අන්තර් විල්පවයක් ඇති වෙන්න බෑ, කාල් මාක්ස්ගෙ 'තියරි' එක උඩ. 'දස් කැපිටාල්' පොතේ කියන හැටියට, ද්විගටනවාදය යටතේ, ඓතිහාසික නියතිවාදය යටතේ, කාල් මාක්ස්ගෙ 'තියරි' එකේ හැටියට, අන්තර් විල්පවයක් ඇති වෙන්න බෑ.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
(A Member)
ප්‍රතිවිප්ලවයක් !

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)
ඔව්, ප්‍රතිවිප්පවයක් ඇති වෙන්න බෑ. ප්‍රතිවිප්ලවයක් කියල කිව්වෙ, විප්ලවයක් තිබ්බ නිසයි. 1970 වෙ තිබ්බලු, විප්ලවයක්. ඒ වචනෙ හිත ඇතුළෙ තියාගෙන, ඒක නොකියා, ප්‍රතිවිල්පවයක් නැත්නම් අන්තර් විල්පවයක් ගැන කතා කරව්ව. ලස්සන කතාවක් ඒකෙ හැංගිල තියෙනව. එතුමා කල්පනා කරනව, 1970 ඇතිවුණ විල්පවයක් කියල. මෙන්න මෙහෙම ඒවට තමයි, 'හොල්මන් කුරුල්ලො' කියන්නෙ. 1970 දී ඇති වුණේ, විප්ලවයක්ද? 1971 දී ඇති වුණේ උපවිල්පවයක්ද? අපි එහෙම පිළිගමු. කාල් මාක්ස්ගෙ පොතේ හැටියට නම් ඒ විප්ලවයේ ප්‍රතිඵලය, කොමියුනිස්ට් සමාජයක් බිහිවීම වෙන්න ඕනෑ. එහෙම ඇති වෙලා තියෙනවද ?

ඇති වුණේ මොකක්ද? හාත්පසින්ම ප්‍රතිවිරුද්ධ උත්තරයක් හම්බ වෙල තියෙනව. 1970 විප්ලවයක් ඇති වුණ 1971 අන්තර් විප්ලවයක් ඇති වුණ. 1977 ප්‍රතිවිරෝධී උත්තරයක් ලැබිල තියෙනව. මොකක්ද, උත්තරේ? කොමියුනිස්ට්, සමසමාජ දර්ශන දරන පුද්ගලයන්ට පාර්ලිමේන්තුව ඇතුළට අඩිය තියන්නවත් ජනතාව ඉඩ දීල නැහැ. එහෙම නම් විප්ලවීය න්‍යාය සම්පූර්ණයෙන්ම බිඳ වැටිල තියෙනව. මොකද, මේක මෙහෙම බිඳෙන්නෙ? ඒකත් හොඳ නෑ. අපි ඒකත් හොයල බලන්න ඕනෑ, කථානායකතුමනි.

මහාජන සම්මතයක්, මහා විශාල ජනසමූහයක් මාක්ස්වාදය පිළිගෙන ඉන්නව. උගතුන් පිළි අරං ඉන්නව. විශ්ව විද්‍යාලත් පිළි අරං ඉන්නව. මහාචාර්යවරු පිළි අරං ඉන්නව. ආචාර්යවරු පිළි අරං ඉන්නව. අද්වකාත් උන්නාන්සෙල පිළි අරං ඉන්නව, එහෙම නම් මේක අසාර්ථක වෙන්නෙ ඇයි? අපි විග්‍රහයක් කරල බලන්න ඕනෑ, දෙස්තර උන්නාන්සෙල පිළි අරං ඉන්නව. මොකද අසාර්ථක වෙන්නෙ කියල.

මේක බොහොම ලස්සන කතන්දරයක්. මේක ඇති වුණේ 1904 දී. අර ඇත්තන්ට අපි ඉතිහාසෙ කියල දෙන්න ඕනෑ. 1904 මේ පිළිබඳව ලියවුණ, පොඩි ලියමක්. 'What is to be done' කියල ලියමක් ලිව්ව, එක් කෙනෙක්. කවුද, මේ ලියම ලිව්වෙ? ලෙනින් උන්නාන්සෙ. ඒ ලියුම ලිව්වෙ, සම්පූර්ණයෙන්ම ලෝකෙ උගතුන් සඳහායි. අපි මොකද, කරන්න ඕනැත්නෙ? ඔන්න ඔතනයි, උගතුන්ට වැරදුණ තැන. ලෙනින් උන්නාන්සෙ ඒ ලියුමෙන් කියල තියෙන්නෙ විප්ලවය සඳහා පන්ති විඥනයක් ඇති කරන්න ඕනෑ කියලයි. අපි කවරෙකුගේ හදවතේ පන්ති විඥනය ඇති කරමුද? පන්ති විඥනය, අපි ඇති කළයුත්තෙ බහුතර සංඛ්‍යාවකගේ හදව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එම්. බී. ආර්. අත්තනායක මහතා]

ඉන්සි එහෙනම්, බහුතර සංඛ්‍යාව. වැඩ කරන සාමාන්‍ය ජනතාවයි. එහෙනම් සාමාන්‍ය ජනතාව තුළ පන්ති විඥානය ඇති කරන්නෙ කොහොමද? 'What is to be done' කියන මාතෘකාවෙන් ලෙනින් උන්නාන්සෙ ලස්සන දෙයක් වදාළෙ. එතැන දී මුන්වහන්සේ කිව්වා කම්කරුවා ළඟ පන්ති විඥානයයක් නැති බව සැම උගතකුම මතක තබා ගත යුතුය කියා. එහෙම නම් අප විසින් කම්කරුවාට පන්ති විඥානය ලබා දිය යුතුය කිව්වා. එය ලබා දීමේ දී ආගම අමතක කළ යුතුය කිව්වා. පරම්පරාව අමතක කළ යුතුය කිව්වා. කවුරු මරාගෙන හරි, කවුරු තළාගෙන හරි, විනාශ කරගෙන හරි, බෝම්බ ගහල හරි, කැත්තෙන් උදැල්ලෙන් නැත්නම් පොල්ලෙන් ගහල හරි, කම්කරුවා තුළ පන්ති විඥානය ගොඩනගන්නට පුළුවන් නම් අන්න ඒක කරපල්ලාය කිව්වා. සමසමාජ විඥානය සමාජවාදය පහළ වන්නේ ඉන් පසුවය කිව්වා. ලක්ෂණ කථාවක්. මෙතැන දී පූජකයාගේ කාර්යයත් උගතාය කියන පන්තියට භාර කළා. ඔවුන් ඒ දර්ශනය ගත්තේ ශීඝ්‍රයට නොවෙයි, හෙමින්වයි. "අර මිනිහා තට්ටු දෙකක නැත්නම් පහක ගෙදරක ඉන්නවා, ඒ ගෙදර මෙපමණ ඉඩ කඩ තිබෙනවා, ඔහුට බැංකුවේ මුදල් තිබෙනවා, ඔහු හොඳට අඳිනවා, ඒක නරකයි, තුඹලාට සල්ලි නැහැ, තුඹලාගේ සතුරා ඒ මිනිහා තමයි" ආදී වශයෙන් උගන්වන්නට ඒ උගතුන් පෙළෙඹෙව්වා. දෙවියන් වහන්සේගේ ධර්මයත් අත් හැරියා. බුදුන් වහන්සේගේ ධර්මයත් අත් හැරියා. ධර්මවාද ඔක්කොම අත් හැරියා. "අමුඩය ගහගෙන හිටියට තුඹලාට මේ ආත්මයේ දීම ස්වර්ග සම්පත් විඳින්නට පුළුවනි, ඇයි තුඹලා මේ විධියට ඉන්නෙ? ඒ මිනිහට ගල් ගහපන්, කඩපන්, බිඳපන්, ඊර්ෂ්‍යා කරපන්" කිව්වා. අදත් ලෝකයේ විශ්ව විද්‍යාලවල වාමාංශික පැත්ත පිළිගන්නට ළමයින් පෙළෙඹෙන ගතියක් තිබෙනවා. ඒ අර තරුණයින්ට ගුරුවරුන් වශයෙන් පන්ති විඥානය කැවීමේ රාජකාරිය පැවරීමේ ප්‍රතිඵලයක්.

මොකක්ද පන්ති විඥානයෙන් බලාපොරොත්තු වුණේ? "What is to be done" කියන ලිපියෙන් ලෙනින් කියා දුන්නා කවදාවත් කම්කරුවාට පාලන බලයේ කට යුතු කරන්නට බැරිය, ඒක මධ්‍යම පන්තියේ වගකීමක්ය කියා. ඒක තුඹ කරන්නට ඕනෑය කියා, රජ වන හැටි, තමන් නායකයා වන හැටි, තමන් විධායකයා වන හැටි, පාලන බලය මෙහෙයවන හැටි, ධනය මෙහෙයවන හැටි, සමාජය මෙහෙයවන හැටි කියා දුන්නා. මේක දැක්කාට පසු මධ්‍යම පන්තික ගුරු පිරිසක් පහළ වුණා, මේ කණ්ඩායමට. පන්ති විඥානය ආරම්භ වුණේ ඔන්න ඔය විධියටයි.
ක,ඥනි ටසපසු ''ෑ'වී ඡඡ

ගරු කථානායකතුමනි, පිලිප් ගුණවර්ධන ගුණසිංහ ආදී පිරිසක් ලංකාවේ පන්ති විඥානය ගොඩනගන්නට හැදුවේ 1922 පමණ කාලයේදීයි. ඉස්සෙල්ලාම ලංකාවේ වාමාංශික ව්‍යාපාරය පටන් ගත්තේ පිලිප් ගුණවර්ධන මහත්මයා තමයි. සූරිය මල් ව්‍යාපාරය පටන් ගත් 1933 අවුරුද්ද හොඳ මංසන්ධියක්. පන්ති විඥානය තුළ කුල භේදයක් තියෙන්න බැහැ. කාල් මාක්ස් කියපු හැටියට ජාතිවාදයක් තියෙන්නත් බැහැ. ඒ විධියට දේශනා කළ ඒ රටවලත් අද ඒවා අසාර්ථක වී තිබෙනවා. ලංකාවේ අපේ ගුරුන් වහන්සේලා ටික එකතු වී කළේ මොකක්ද? "අවසාන ප්‍රතිඵලය සාර්ථක වේ නම් මරාගෙන හරි තුඹ යායුතු මාර්ගයේ පලයන්" යනුවෙන් කියා තිබෙනවා නොවැ. එම නිසා 1933 දී සූරිය මල් ව්‍යාපාරය පටන් ගත්තා. මොකටද ඒක පටන් ගත්තේ? තමුන්නාන්සේට මතක ඇති මට වඩා හොඳට. තමුන්නාන්සේ ඒ කාලයේ හිටියා. සූරිය මල් විකුණා සල්ලි හොයාගෙන ඒ මුදලින් කුලහීන මිනිසුන්ට ඇඳුම්, පරිප්පු, සීනි, තේකොළ ආදී දේවල් අරන් දුන්නා. කුලහීන මිනිසුන්ගේ ගෙවල්වලට ගිහින් ඒවා දුන්නා. මොකක්ද ඒකෙන් බලාපොරොත්තු වුණේ? අර ලෙනින්, කාල් මාක්ස් සඳහන් කළ අවසාන ප්‍රතිඵලය සඳහා කණ්ඩායමක් රැස් කිරීම පමණයි. ඇති වුණේ පන්ති විඥානයක් ගොඩනැඟීමක් නොවෙයි. ඒක හොඳට අවබෝධ කර ගන්නට ඕනෑ. අද උදෙත් අවසර ඉල්ලුවා පන්ති විඥානය ගොඩනගන්නට රැස්වීමක් තියන්ට. අපි ඒ අවසරය නොදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉන්නවාද? තමුන්නාන්සේ රුස්වීමකට අවස්ථාව නොදී ඉන්නවාද? නැහැ. නමුත් පන්ති විඥනය ගොඩනඟන්නට පුළුවන් වෙන්නේ රට දුප්පත් වුණොත්. රට අසහනයට පත් වුණොත් සාමාන්‍යයෙන් හොරකම් කරන්නට, මංකොල්ල කන්නට ඇතැම් අය පෙළඹෙනවා. එහෙත් හැම මිනිහාටම තම තමන්ගේ මූලික අවශ්‍යතාවන් තිබෙනවා නම්, නියම ක්‍රමයට ඒවා ලැබෙනවා නම්, රාජ්‍ය මට්ටමෙන් සාධාරණව බෙදනවා නම්, කවදාවත් ඔය අසාධාරණ පන්ති විඥනයක් උඩ මිනිස් සංහතිය දෙකට බෙදා, මිනිසුන් ඊර්ෂ්‍යා කරවන්න පුළුවන්කමක් ඇති වන්නේ නැහැ.

ශ්‍රී ලංකාවේ මාක්ස් ව්‍යාපාරය යටතේ පන්ති ව්‍යාපාරයක් ඇති කරන්න හිතා ගත් ගුරුවරුන් සිටිනවා නම්, ඒ අයට එයින් ඉවත් වෙන්න වෙයි, ගරු මුදල් ඇමතිතුමාගේ මේ අයවැය ලේඛනය නිසා. ආයේ බැහැ, ඒ අයට පන්ති විඥනය ගොඩනගන්න. එය තිබෙන්නේ භේදය, කොල්ල කෑම, මිනී මැරීම, ඝාතනය ආදිය උඩයි. හැම රටකම සිදු වුණේ ඒ විධියට තමයි. අපේ රටෙත් ඒක කරන්නයි හදන්නෙ. නමුත් ඒකට අවසානම උත්තරය මේ අයවැයෙන් ලැබී තිබෙනවා. පන්ති විඥනය කම්කරුවාගේ සාක්කුව දුර්වල වන විට ඇති කරන්න පුළුවන්. නමුත් මෙයින්—මේ අයවැයෙන්—ඒක ඇති වෙන්නෙ නැහැ. මේ අයවැය යටතේ ඒ කම්කරුවා රටේ ආර්ථික දේහයේ සාමාජිකයෙක් වෙනවා. නිෂ්පාදනයේ කොටස්කාරයෙක් වෙනවා. ජීවන අංකය වැඩි වෙන විට ඔහුටත් ඒ අනුව ලැබෙනවා, ප්‍රසාදයක්. එවිට ඔවුන්ට ප්‍රශ්නයක් නැහැ. තවත් කෙනකුට ඊර්ෂ්‍යා කරන්න ඔවුන්ට වුවමනාවක් නැහැ.

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේට මතක ඇති මේ ක්‍රමය යටතේ න්‍යාය කියන දේ තමයි, පන්ති විඥනය යටතේ, බොහොම තදේට දේශනා කළේ. න්‍යාය කියන කාල් මාකස් උන්නාන්සේ, ලෙනින් උන්නාන්සේ න්‍යායන් ගණනාවක් දේශනා කළා. පන්ති විඥනය ගොඩනගා විප්ලවය ආරම්භ කරවන්න න්‍යායන් දේශනා කළා. මේවා තමුන්නාන්සේ දන්වනවා ඇති. තුල්‍ය සටනාත්මක භෞතික වාදය, පන්ති විඥනය, සූරා කෑම, අධිරාජ්‍ය වාදය, නියති වාදය, ඓතිහාසික නියති වාදය ආදී වශයෙන් න්‍යායන් රාශියක් ගොඩනැගුවා. මේ න්‍යායන් ගැන අපි විමසා බැලුවොත් අපට පෙනී යනවා ඒව සියල්ලක්ම උපන් ගෙයිම—තිඹිරි ගෙයිම—මැරී ගිය බව.

මාක්ස් වාදයේ උගන්වන ලොකුම තුරුම්පුව, මේ වචන ටික නොදන්නා ඇත්තන්ට කියන එකය කියායි. ඒවා වේදිකාවට නැගී කියා, අහිංසක, දුප්පත්, දුගී මිනිසුන් පොළඹවනවා, ද්වි සංඝනාත්මක වාදය යටතේ. මේ ධනපතියාට පහර ගහන්න ඕනෑ, එසේ කිරීමෙනුයි අපට සමාජයක් බිහි වෙන්නෙ. සමානත්වය අඩු වන එකෙන් තමයි සමාජවාදය ඇති වෙන්නෙ. ගරු කථානායකතුමනි, ද්වි සංඝනාත්මක වාදයේදී කාල් මාක්ස් පෙන්වා දුන්නා, වාමාංශිකයො පෙන්වා දුන්නා, ලෝකයේ හැම දෙයක්ම මේ භෞතික සම්පත් මත පමණක් ඉදිරියට ඇදෙනවා කියා. ඒ අනුව දෙවියන් වහන්සේට අයිතියක් නැහැ, මිනිසා ගැන කථා කරන්න; බුදුන් වහන්සේට අයිතියක් නැහැ, මනුෂ්‍යකම ගැන කථා කරන්න; ක්‍රිස්තුන් වහන්සේට, අල්ලා දෙවියන් වහන්සේට අයිතියක් නැහැ, මිනිසුන් ගැන කථා කරන්න. ද්‍රව්‍ය මතයි සියල්ල පවතින්නේ කියන එකයි ඔවුන්ගේ ධර්මය. ඒ අනුව මිනිසා පරිහරණය කරන ද්‍රව්‍ය පමණයි, මිනිසාට අවශ්‍ය, ඉදිරියට යන්න.

මිනිසා හෝ වේවා, ද්‍රව්‍ය හෝ වේවා, ඒ දෙකම එකට හැපීමයි ද්වි සංඝනය කියන්නෙ. ඒ දෙක එකට හැපීම තුළිනුයි පහළ වන්නේ සමාජ වාදය. ඒක තමයි කාල් මාක්ස් ඉදිරිපත් කළ ද්වි සංඝක වාදය. නියති වාදය කිව්වෙත් ඒකටමයි. පැත්තකින් කිව්වා ඓතිහාසික නියති වාදය කියලත්. ඒ වාගේ හොඳ හොඳ ලස්සන නම් යොදා තිබුණා. ද්වි සංඝක වාදයේ දෙකක් එකට හැපීමෙන් වන්නා වූ ප්‍රතිඵලය සමාජ වාදයයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එම්. බී. ආර්. අත්තනායක මහතා]

ගරු කථානායකතුමනි, දෙකක් එකට හැප්පෙන හැම තැනකම සමාජ වාදය තිබෙනවාද ? මා තමුන්නාන්සේගෙන් ප්‍රශ්න කරන්නේ. [බාධා කිරීමක්] කොත්මලේ මන්ත්‍රීතුමාට මේවා ගෝචර වන්නේ නැහැ. එතුමා හුඟක් ඈත ඉන්නේ. දෙකක් එකට හැප්පුණා නොවෙයි, තුනක් එකට හැප්පුණා, 1970 දී. එතැන ඇති වුණේ තුන්‍ය වාදය. 1970 දී තුනක් එකට හැප්පිලා 1977 දී—අවසානයේ දී—ඇති වුණේ ශුන්‍ය වාදය. ඒ ශුන්‍යවාද යේ ප්‍රතිඵල තමයි මේ ඉන්නේ. එම නිසා එතුමාට මේක තේරෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මේ ඓතිහාසික නියතවාදය ගැනත් කතා කරන්න මා දන්නවා. නියතවාදය ගැනත් කතා කරන්න දන්නවා, ද්විඝටන වාදය ගැනත් කතා කරන්න දන්නවා. අදහස් උදහස් ඇතිව තේරුමක් ඇමතිවයි මා කතා කරන්නේ. මම ලැස්තියි ලංකාවේ නොවෙයි, ඕනෑම තැනක ප්‍රසිද්ධ වේදිකා වක් මේ වාද පිළිබඳව වාද කරන්න. තමුන්නාන්සේ සොයා බලන්න. ලංකා ඉතිහාසයෙන් නොවෙයි, ලෝක ඉතිහාස යෙන් සොයා බලන්න. ද්විඝඨනවාදය සාර්ථක වූ තැනක් කොහේද තිබෙන්නේ ? කිසිම තැනක සාර්ථක වෙලා නැහැ. දෙකක් එකට ගැටීමෙන් ඇති වන ප්‍රති ඵලය හැටියට සමාජවාදයක් කොතැනක වත් පහළ වෙලා නැහැ. එහෙම පහළ වුණා නම් ගරු කථානායකතුමනි, තමුන්නාන් සේ කල්පනා කර බලන්න අර අපේ දෙමළ සහෝදරවරු දුටුගැමුණු රජතුමාගේ කාලයේ සිටම අප සමඟ ගැටෙනවානේ. කෝ ද්විඝටනවාදය තුළින් සමාජවාදය පහළ වුණා ? නැහැ. ඒ ගැටුම අපේ ගරු ජනාධිපතිතුමාට පින් සිදු වෙන්නට, කැබිනට් එකට පින් සිදු වෙන්නට, ඒ ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ නායක තුමා බුද්ධිමත් පුද්ගලයකු වශයෙන් අපේ ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කර සාධාරණ මට්ටමින් විසඳා ගන්නට යනවා. එය සාර්ථක වන බව අපට පැහැදිලිව පෙනෙනවා. ද්විඝඨනවාදය අනුව හැප්පුනා නම් එක ගොල්ලයි ඉතුරු වෙන්නේ. එය සාර්ථක ප්‍රතිඵලයක්ද කියා මා ප්‍රශ්න කරනවා.

ගරු කථානායකතුමනි, ද්විඝඨනවාදයේ අසාර්ථක වූ තැන් බොහෝමයි. ජපානයත් එංගලන්තයත් ද්විඝඨනවාදය අනුව හැප්පුණා. ජපානය විනාශ වෙලා ගියා. අන්තිමේදී නිදහස ලැබුණාටත් පසුව තමයි ජපානයට දියුණු වෙන්නට පුළුවන් වුණේ. ජර්මනිය ද්විඝඨනවාදයෙන් විනාශ වෙලා ගියා. අද ඒ මිනිසුන් පුද්ගලයන් වශයෙන් තනියෙන් නැගී සිටිනවා. නමුත් ද්විඝඨන වාදයෙන් පලුවක් පැත්තකට ගියා. අද ඉන්දියාව දියුණු වේගන යනවා, අද ශ්‍රී ලංකාව දියුණු වේගන යනවා. ඒ ද්විඝඨනවාදයෙන්ද ? ද්විඝඨනවදාය සාර්ථක වී තිබෙන්නේ කොහේද ? ද්විඝඨනවාදය කියන්නේ දෙකක් එකට හැප්පීමෙන් ඇති වෙන්නා වූ, සම්පූර්ණ යෙන් වෙනස් හොඳ ප්‍රතිඵලයක්. මම තමුන්නාන්සේලාට උදාහණරයක් කියන්නම්. ගරු කථානායකතුමනි, තමුන්නාන්සේගේ ආගම අනුව පිළිගන්නවාද මම දන්නේ නැහැ, ලෝකය පැතලියි කියා අදහසක් තිබුණා. ලෝකය පැතලි වස්තුවක් කිව්වා. එහෙම අදහසක් තිබුණා. ඊට පසුව ලෝකය රවුම් බෝලයක් වගෙයි කියා අදහසක් ආවා. ඔන්න ද්විඝඨනවාදයට උදාහරණයක්. එක කණ්ඩායමක් ලෝකය පැතලියි කිව්වා. තව කණ්ඩායමක් ලෝකය බෝල යක් වගෙයි කිව්වා. ඔය ද්විඝඨනවාදය හරියට පිළිගන්නා නම් ලෝකය පලුවක් පමණයි. අර්ධවෘත්තාකාරයි. කල්පනා කර බලන්න. මේවා තව හොඳට විග්‍රහ කරන්න පුළුවන්. ස්වාමි පුරුෂයෙකුත් ස්ත්‍රියකුත් අතර ඇති වන ද්විඝඨනවාදයේ ප්‍රතිඵලය මොකක්ද කියන්න මට දන්නේ නැහැ. කාල් මාක්ස් උන්නැහේගේ ද්‍රව්‍යවාදයේ විස්තර කරන්නේ කොහොමද කියා මා දන්නේ නැහැ.

ද්විඝඨනවාදය ගැන තවදුරටත් කතා කරනවා නම් ගරු කථානායකතුමනි, න්‍යෂ්ටික ආයුද දිහා බලන විට, 'ඇටම්ස්' කියන පරමාණු කොටස අරගෙන බැලුවොත් ඒ කොටස් දෙකක් එකට ඝට්ඨනය වීමෙන් ද්විඝඨනයක් ඇති වෙනවා. ඒකෙන් ඇති වෙන්නේ සමාජවාදයක්ද? විනාශය සිද්ද? මොනවාක්ද ද්විඝඨනවාදය කිය

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

න්නේ ? අමූලික, අසාධාරණ, සොයා ගත්තේ නැති න්‍යායික කොටසක්, ජනතාව මුලාකරන පදයක් පමණයි, ද්විඝටන වාදය කියන්නේ.

ඊළඟට, මේ අය දේශනා කළා, ශ්‍රම න්‍යාය ගැන. ශ්‍රම න්‍යාය අනුව ලෝකයේ මිනිසුන්ට, කම්කරුවන්ට අසාධාරණයක් කරනවා. ශ්‍රමයේ අගය ගෙවිය යුතුයි මිනිසුන්ට. කොහේද එහෙම ගෙවන්නේ ? ගරු කථානායකතුමනි, මම නැගෙනහිර ජර්මනියට ගිය වෙලාවේ මට දැන ගන්නට ලැබුණා, එහි කම්කරුවකුට ගෙවන්නේ මාසයකට ඩොයිස් මාර්ක් හයසියයකට, හත්සියයකට අඩු මුදලක්. නමුත් බටහිර ජර්මනියේ පාරේ වැඩ යකරන සාමාන්‍ය කම්කරුවෙකුට තුන් දහසක් පමණ ගෙවනවා. එහෙම නම් ශ්‍රමයට වැඩිපුර ගෙවන්නේ කාල් මාක්ස්ගේ ධර්මය පිළිගන්නා රටේද ? නොපිළිගන්නා ජනසම්මතවාදී රටේද කියා ඔය පණ්ඩිතයන්ගෙන් මම ප්‍රශ්න කරනවා. මම එක් උදාහරණයක් ඉදිරිපත් කරන්නම්. අපේ කොත්මලේ මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) පමණයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉන්නෙ. ඒ වුනාට කමක් නැහැ මම කියන්නම්. මම දන්නවා එතුමාත් ෆාම් කිකිළියන් ඇති කරන බව. ෆාම් කිකිළියන්ගෙන් බිත්තර ලබා ගන්න ගියාම ඒ සඳහා බොහොම වෙහෙස වෙන්න මහන්සි වෙන්න, වියදම් කරන්න සිදු වෙනවා. ඔවුන් බිත්තර දමන කොට මුර කාරයො තබන්න වෙනවා. හොරුන්ගෙන් ආරක්ෂා කර ගන්න කූඩු ගහන්න වෙනවා. දිනපතා කෑම දෙන්න ඕනෑ. වතුර දෙන්න ඕනෑ. එක බිත්තරයක් ලබා ගන්න කොයි තරම් මහන්සි වෙන්න ඕනෑද? කොයි තරම් උපස්ථාන කරන්න වෙනවද? ගරු කථානායකතුමනි, තමුන්නාන්සෙත් දැක ඇති නෙ ගම් කිකිළියො. ගම් කිකිළියක් කාලය පුරා කොක් කොක් ගගා ඇවිදලා, අහුලා කාලා, බිත්තරයක් දමන්න ඕනෑ වුණාම ගේ මුල්ලට ඇවිත් බිත්තරය දමනවා. කිසි වියදමක් නැහැ. ගේ මුල්ලටම ඇවිත් බිත්තරය දමා යනවා. ශ්‍රමය අනුව ගණන් බලනවා නම් කොයි බිත්තරයටද වැඩිය ගෙවන්න ඕන කරන්නෙ?

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**
කවුද කුකුලා ?

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. எ. எம். ஆர். பி. அத்தநாயக்க)*
**(Mr. A. M. R. B. Attanayake)**
ඔව්, ඒකත් ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමනි, ශ්‍රමය අනුව ගණන් බලනවා නම් වැඩි මිලක් ගෙවන්න ඕනෑ කරන්නෙ අර ෆාම් කිකිළියගෙ බිත්තරයට. ඒකයි ගණන් වැඩි වෙන්න ඕනෑ. නමුත් අද මාකට් එකට ගිහින් බැලුවොත් තමුන්නාන්සේට වුණත් පෙනීයාවි, වැඩි මිලක් ගෙවන්න ඕනෑ ගම් කිකිළිගෙ බිත්තරේට බව. එහෙමනම් ශ්‍රමය අනුව නොවෙයි, වටිනාකම රැඳී තිබෙන්නෙ. එතැනදි ශ්‍රමය වැඩියෙන් වැය කරන කිකිළියගෙ බිත්තරයට අඩු මිලක් ගෙවනවා.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dasanayake)**
ඔව කුකුල් හොරුන්ගෙන්ම දැනගන්න ඕනෑ.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. எ. எம். ஆர். பி. அத்தநாயக்க)*
**(Mr. A. M. R. B. Attanayake)**
ඒක තමයි. එහෙම කෙනෙක් මෙතන ඉන්න හින්දයි මම කිව්වෙ. අපේ කොත්මලේ මන්ත්‍රීතුමාට මේවා ගැන හොඳින් තෙරෙනවා. ගම් කිකිළියකගෙ බිත්තරයකත්, ෆාම් කිකිළියකගෙ බිත්තරයකත් අතර වටිනාකමේ ඇති වෙනස එතුමා හොඳින් දන්නවා. කෙසේ හෝ වේවා, ශ්‍රම න්‍යාය අනුව ගෙවන්නට ඕනෑය කියන තර්කය ඉදිරිපත් කරමින්, එදා සිටම වාමාන්සික නායකයන් කළේ, අහිංසක කම්කරුවන්, පාලකයන් සමග සටනකට, යුද්ධයකට පෙළඹවීමයි. පාලක-පාලිත යන පිරිස් අතර ගැටුමක් ඇති කළ වාමාංශික නායකයො ඒ අහිංසක පිරිස ඉදිරියෙහි සිහින ලෝකයක්, සුන්දර ලෝකයක් කාල්පනික ලෝකයක් මවා පෙන්නුවා. වාත්තීය සංගම් ව්‍යාපාරය තුළින් අවුරුදු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එම්. බී. ආර්. අත්තනායක මහතා]

හතලිහකට වැඩි කාලයක් තිස්සෙ මෙම වාමාංශික නායකයන් කළේ අහිංසක කම්කරු පිරිස පෙළපාලි ගෙන යාමයි. පාලකයන්ට ගහන්න පෙළඹවීමයි. ගොඩනැගිලි බිඳ දමන්න. කර්මාන්ත ශාලා සුණු විසුණු කර දමන්න මාස්පතා පෙළපාලි යන්න පෙළඹ වීමයි.

ගරු කථානායකතුමනි, ශ්‍රීමත් ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව, පසුගිය අවුරුදු හතරක කාලය තුළදී අද වනතුරුවත්—අපේ කම්කරුවන් පාවිච්චි කළේ නැහැ, කාටවත් ගහන්න, බනින්න. පෙළපාලි ගියේත් නැහැ. කොයි කම්කරුවාටද බඩේ අමාරු හැදී තිබෙන්නෙ. පෙළපාලි ගියේ නැතැයි කියා. ප්‍රශ්න ඔක්කොම සාකච්ඡා මගින් විසඳනවා. කම්කරු සංවිධාන ගොඩනැගෙන්න ඕනෑ කරන්නෙ කම්කරුවාගේ සුභ සිද්ධිය ගැන සොයා බැලීමට මිස බලය ලබා ගැනීමේ ආශාවෙන් පෙළෙන, පිපාසාවෙන් පෙළෙන අතලොස්සකගේ වුවමනාවන් සඳහා කම්කරුවන් ලක්ෂ ගණනින් යොදවා ගන්නට නොවෙයි. පසුගිය කාලය තුළදී කම්කරු ජනතාව මේ තත්ත්වය හරි හැටි අවබෝධ කර ගෙන තිබෙනවා. ඒ බව අපේ කොත්මලේ මන්ත්‍රීතුමාටත් දැන් පැහැදිලි වෙන්නට ඇති. එක් පැත්තකින් මුට්ටි කාසි එකතු කර ගනිමින්, අනික් පැත්තෙන් කම්කරුවන්ගේ ශ්‍රමය හූරා කන පිරිස තමයි කම්කරුවන්ගේ විමුක්තිය ගැන කථා කළේ. නරියා ගෙදරට ඇවිත් කුකුළො ටික බලා ගන්නම් කියන්නා වාගේ තමයි, මේ වාමාංශිකයන් කම්කරු සංවිධාන තුළට ගිහින් කතා කළේ.

අපේ පක්ෂය නිසා අද එක කම්කරුවකුගෙවත් අතක්-පයක් කැඩිලා නැහැ. ඇහැක් පොට්ට වෙලා නැහැ. බෝම්බයක් වැදී නැහැ. කෙළඹ ජීවත් වන පැරණි හිඟන්නන් පිරිසක් සමග කතා කර බැලුවොත්, ඔවුන්ගේ අත-පය කැඩී බිඳී තිබෙන්නෙ, ඇස් පොට්ටවෙලා තිබෙන්නේ කොහොමදැයි අහලා බැලුවොත්, "එන්. එම්. පෙරේරා සහෝදරයත් එක්ක ගිහින් මේ කකුල කැඩුණා, එස්. ඒ. වික්‍රමසිංහ සහෝදරයත් එක්ක පෙළපාලි ගිහින් මේ ඇහැ පොට්ට වුණා, සරත් මුත්තෙට්ටුවෙගම සහෝදරයත් එක්ක ගිහින් පොලු පාරක් වැදිලා මගේ කකුල කොර වුණා" වාගෙ දේවල් ඒ අය කියනවාට කිසිම සැකයක් නැහැ. එක්සත් ජාතික පක්ෂයෙ නායකයන් එක්ක ගිහින් සටන් කරලා අතක් පයක් කැඩුණාය, ඇහැක් පොට්ට වුණාය කියන එකම හිඟන්නෙක්වත් සොයා ගන්න ලැබෙන්නෙ නැහැ. එහෙම නම් මෙයින් අපට තේරුම් යන්නෙ මොකක්ද? ඇත්ත වශයෙන්ම අපේ රටේ කම්කරු පන්තිය අහේනියෙන් අහේනිය කරා ගෙන ගිය දුර්දාන්ත ව්‍යාපාරයකුයි මේ රටේ මෙතෙක් පැවතුනේ. මේවාට උත්තර අපේ මුදල් ඇමතිතුමාගේ මේ අයවැය ලේඛනයෙන් ලැබී තිබෙනවා. අපේ ගරුතර ජනාධිපතිතුමා ඊට අවශ්‍ය විධායක තීන්දු දී තිබෙනවා. අපේ ගරු අගමැතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙනව. එම නිසා මින් පස්සෙ ශ්‍රම න්‍යාය ගැන කථා කිරීමෙන් වාමාංශිකයන්ට කිසිම ප්‍රයෝජනයක් අත් වෙන්නෙ නැහැ; එහෙම කතා කරන්න ගියොත් කම්කරුවො ඔවුනට ගහනවා. මින් පස්සෙ ද්විඝටක වාදය ගැන ලංකාවෙ කතා කරන්න ලැබෙන්නෙ නැහැ. ද්විඝටක වාදය තුළින්ම වාමාංශික නායකයන්ගෙ ඔළු දෙබෑ වෙනවා. කොත්මලේ ගරු මන්ත්‍රීතුමා ඒ ගැන කල්පනා කර බලන්න වටිනවා.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dasanayake)

නුවරට එන විට පරිස්සමෙන් ආවොත් හොඳයි.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. எ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

ඔව්, ඔව්, ඒ කතාව ඇත්ත. එතුමා බොහොම පරිස්සමින් නුවරට යායුතුයි. ඇයි දන්නවද කථානායකතුමනි, කාරණය? එතුමාට ඒක අමතක වන්නෝ නැහැ. මම හොඳටම දන්නා දෙයක්. ඔය සිද්ධිය වුණේ මේ පහලෙස් වෙනිදා. 15 වැනිදා ඇති වූ ඒ සිද්ධිය ගැන මටම දුකයි. නුවර බෞද්ධ මධ්‍යස්ථානයේ රැස්වීමක් තිබුණා. මේ කාරණය මතු කරන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එතුමාමයි. මට ඕනෑකමක් තිබුණේ නැහැ, මෙය කියන්න. එතුමා මතු කළ නිසා මා එතුමාට කියන්න ඕනෑ පරිස්සම් වීම සඳහා.

15 වැනි දා නුවර බෞද්ධ මන්දිරයේ තිබුණා රැස්වීමක්. ලංකාවේ ප්‍රජා අයිතිය අහිමි වූ නැනැත්තියක්—මම දන්නේ නැහැ නම මොකක්ද කියන්න—ඒ රැස්වීමේ නායකත්වය ගත්තා. නායකත්වය අරගෙන කිව්වා, හාරිස්පත්තුවේ දෙවැනි මන්ත්‍රීවරයා (ආර්. පී. විජේසිරි මහතා) මින් ඉදිරියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉවත් කළ බව සලකන්න කියා. අද බලා ගෙන ඉන්නවා, තමුන්නාන්සේලා නුවරට යන තුරු ඔළුව පලන්න. අපේ ජනාධිපතිතුමාටත් අගමැතිතුමාටත් පිං සිදු වන්නට, බුදු බව අත්වන්නට, හදිසි නීතිය නිසා මේ ඔළු රැකිලා තිබෙනවා. නැත්නම් අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිරිමා බණ්ඩාරනායක කල්ලියේ කෙනෙකුට මහනුවරට ඇතුලු වන්න බැහැ, ගහනවා, ඔළු පැලෙන්නට. හදිසි නීතිය දමා තිබෙන නිසා මේ ඇත්තෝ අපටම මුවා වෙලා ඉන්නවා. හරියට පඳුරට මුවා වුණු හාවා වගේ.

ගරු කථානායකතුමනි, කොත්මලේ මන්ත්‍රීතුමාට මේවා හංගා ගෙන ඉන්න බැහැ, එළියට එනවා ටක් ගාලා. ඕවා අපි නොදන්නා රැස් නොවෙයි. එන්න මාත් සමග නුවර යන්න. එතකොට ගහන්න දෙන්නේ නැහැ. මම කියන්නම් සහෝදරයා ගහන්න එපා මේ මනුෂ්‍යයා හොඳයි කියා.

ගරු කථානායකතුමනි, එතුමාගේ නායිකාව එතුමන්ලා අමාරුවේ දැම්මට අපේ නායකයින් කවදාවත් අපි අමාරුවේ දමන්නේ නැහැ. යුක්ති ධර්මය උඩයි අපි යන්නේ. සාධාරණත්වය උඩයි අපි යන්නේ. ජනතා ආදරය තුළින් අපි ගමන් කරන්නේ. ඉන් එහාට දෙයක් නැහැ. මෙන්න මේ කරුණු අනුව බලන විට ආගම තුළින් මතු කරන ස්වර්ගය, බුදුරජාණන් වහන්සෙත් ක්‍රිස්තුස් වහන්සෙත් මහමත් තුමාත් පෙන්වා දුන් ඊළඟ ආත්මය පිළිබඳ සංකල්පය පැත්තකට දමා, බත් වේලකට ආගමික නායකයින් සමච්චලයට ලක් කළ මේ හ තිකරේට මේ ආත්මෙයේදී දිට්ඨ දම්ම වේදණීය කර්මය ඉටු වී තිබෙනවා. දිට්ඨ දම්ම වේදණීය කර්මය තමුන් නාන්සේගේ ආගමේ හැටියට නොවෙයි මගේ ආගමේ හැටියට—ඇස් ඉදිරිපිට දීම පඩිසම දෙනවා. අද සමසමාජ පක්ෂයට දිට්ඨ ධම්ම වේදණීය කමය ඉටු වී තිබෙනවා.

1977 අයවැය ලේඛනය ගැන කථා කරන විට මම තමුන්නාන්සේට කිව්වා —අමතක වෙන්න බැහැ—මේ ඇත්තිට දිට්ඨ ධම්ම වේදණීය කමය අනුව "ඉද තප්පති පෙච්ච තප්පති පාපකාරී උභයත්ථ තප්පති" බුද්ධ ධර්මයේ න්‍යාය අනුව ඒ ඇත්ති මුළු රටේම අප්‍රසාදයට ලක් වෙනවා පමණක් නොවෙයි, ඒ ඇත්තිගේ කණ්ඩායමම කවදා හරි ඒ ඇත්තිගේ මුහුණට පයින් ගහන දවසක් උදා වෙනවා කියා. අද කොහෙමද ඒ කී දෙය? අද උදේ මොකක්ද වුණේ? දිට්ඨ ධම්ම වේදණීය කර්මය පඩිසම දුන්නේ නැද්ද? මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) නැගිට කිව්වා "මමයි නායකයා" කියා. අනික් පැත්තේ එක්කෙනෙක් කියනවා, එයා නායකයා වුණොත් අපි නැහැ කියා. කාටද මේ කියන්නේ? අපෙත් එහෙම වෙයිද? නැහැ. හීන මවන්න අවශ්‍ය නැහැ. ඔය හීන සැබෑ සිහින හැටියට ගන්න කටයුතු කරන්න. වහාම නායකයෙක් අවශ්‍යයි තමුන්නාන්සේලාට. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නායකයෙක් අවශ්‍ය. කුඹින්ට නායකයෙක් ඉන්නවා. වේයින්ට නායකයෙක් ඉන්නවා. ශ්‍රී ලංකා ජනතාවට නායකයෙක් ඉන්නවා. එහෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නායකයෙක් නැති වීම ගැන මා කණගාටු වෙනවා. ඇයි හේතුව? වේයින්ට නායකයෙක් සිටින නිසා පායන කාලයේ ඇවිදලා වැස්ස කාලය සඳහා කෑම රැස් කර ගන්නවා. කුඹින් එහෙමයි. වැස්ස කාලයට කන්න කෑම ගුලට රැස් කර ගන්නවා. ඒ නිසා උන් වැස්ස නතර වන වසන්ත ඍතුව එනතුරු ස්වම්පෝෂිතව සිටිනවා. එහෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අද වසන්ත ඍතුවක් වැසි ඍතුවක් වෙලා, නායකයෙක් නැති නිසා.

මෙය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අනාථ වසන්ත ඍතුවක්. අපේ ආණ්ඩුව කාලයේ ශ්‍රී ලංකා කාරයින්ට අපි ගහලා පන්නන්නේ නැහැ; බණින්නේ නැහැ; පළිගන්නේ නැහැ. ඒ අයටත් අපි රක්ෂාවල් දෙනවා එක සමානවම. ඉඩකඩම් දෙන විට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා]

**එක සමානවම දෙනවා. පඩිනඩි දෙන විටත් සමානව දෙනවා. පළිගැනීමක් නැහැ. මෙය තමයි, ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ සෑම දේශපාලන පක්ෂයක් මත් සෑම පුද්ගලයෙක්මත් ලැබූ පරම වසන්තය. එය ලැබුවේ ජේ. ආර්. ජය වර්ධන උතුමාණන්ගේ ආණ්ඩුව සමයෙයි කියා කරුණාකර මතක තබා ගන්න.** මේ වසන්ත කාලයේ තමුන්නාන්සේලා තෙම්ච්ච කුකුළො වගේ ඇකිළිලා ඉන්න එපා. ඒක හොඳද නැහැ. ඒ නිසා හොඳ නායකයෙක් පත් කරගෙන එන්න අප සමඟ සාකච්ඡාවට. ලංකාවේ තිබුණු ආණ්ඩු අතරින් මේ ආණ්ඩුවට තමයි, වසන්ත සෘතුව ලබා තිබෙන්නේ කියන එක විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාත් පිළිගන්නවා, මොන තරම් ගැටීම් ආදිය තිබුණත්.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

මොකද, මේ කුකුළො ගැන හැම විටම කථා කරන්නෙ?

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

තමුන්නාන්සේ ඉන්න හින්ද.

ගරු කථානායකතුමනි, මේ රටේ මාක්ස්වාදීන් අහිංසක පන්තියට විෂනය දෙන්න ගිහින් ඒ අය අමාරුවේ දානවා. ඊට මුළාවෙ වැටෙන්නෙ නැතිව කරුණාකර තම තමන්ගේ විෂනය තමතමන්ටම පහළ කර ගන්න කියා මම ආරාධනා කරනවා. මාක්ස්වාදයේ දක්වා තිබෙන සිහින වචන මාලාව ඔස්සේ ගිහින් අමාරුවේ නො වැටෙන ලෙස මම ඒ අයට මතක් කර නවා. මට අයිතියක් තියෙනවා, ඒක මතක් කරන්න.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

කටද? මටද?

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

තමුන්නාන්සේට මම කියන්නෙ වෘත්තීය සමිති අංශයෙන් විතරයි. ඉන් එහාට තමුන්නාන්සේගේ වටිනාකමක් නැහැ. **වෘත්තීය සමිති අංශයෙන් තමුන්නාන්සේට තිබුණා, පොඩි කඩිලි බිඩිලි ටිකක්.** ඒ ටිකෙන් තමයි තමුන්නාන්සේ මතු වුණේ. පන්ති විඥානයෙන ආ පුද්ගලයෙක් නෙවෙයි තමුන්නාන්සේ. තමුන්නාන්සේ ගැන මම ආඩම්බර වෙනවා. තමුන්නාන්සේ ද්විඝර්ථන වාදයේ අනිසි ප්‍රතිඵලයක්. කොත්මලේ මන්ත්‍රීතුමා කියන්නේ කාල්මාක්ස් දක්වන ද්විඝර්ථන **වාදයෙ අනිසි ප්‍රතිඵලයක්. මම ඒක පැහැ** දිලි කරන්න ඕනෑ. පසුගිය මැතිවරණයේදී කොත්මලේ ආසනයට එක්සත් ජාතික පක්ෂයේ දෙන්නෙක් තරග කළා. හැබැ ටම වැඩි ඡන්ද ප්‍රමාණය ලැබුණේ එක්සත් ජාතික පක්ෂයටයි. ඒ නිසා ද්විඝර්ථන වාදයේ අනිසි ප්‍රතිඵලය ලැබූ පුද්ගලයෙක් විශයෙන් තමුන්නාන්සේ ආඩම්බර **වෙන්න ඕනෑ. තමුන්නාන්සේ ගැන ඊට** වඩා දෙයක් මට කියන්න බැහැ.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

දැන් බස්නායක නෙනෙක්නෙ?

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

බස් විතරක් නෙවෙයි, දැන් මට කාර් නායකයෙකුත් වෙලා. මට දැන් කාර් එහෙමත් තියෙනවා.

ලංකාවේ අනුගමනය කරන මේ ආර්ථික සැලැස්ම අනුව මේ රටේ ආර්ථික දේහය යමක් ඉල්ලා සිටින බව මුදල් ඇමතිතුමාට පෙනී ගියා. ඒ ඉල්ලීම මොකක්ද? ශ්‍රමය. ජාතියේ ශ්‍රමය ආර්ථික දේහය ඉල්ලා සිටියා. ඒ නිසා මුදල් ඇමතිතුමා රටේ ශ්‍රමයට මේ අයවැය ලේඛනය මගින් ආරාධනා කර තිබෙනවා. වැටුප් වැඩි කිරීම එහි එක අර්ථයක්. යම්කිසි රාජ්‍යයක් හරිහැටි ගෙන යන්න නම් ඒ රටේ ජනතාවගේ ශ්‍රමය ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රාජ්‍යයේ වැඩ කටයුතු සඳහා යොමු වෙන්න ඕනෑ. කර්මාන්ත වශයෙන් වේවා, ගොවිකර්මාන්ත වශයෙන් වේවා, රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේත් පවතින ශ්‍රමයට රජය ආරාධනා කරන්න ඕනෑ. කොමියුනිස්ට් රටවල නම් ඒ ආරාධනය කරන්නේ අමුතු විධියකටයි. ඔය ද්විසඨක කාරයන්, විඥාන කාරයන් ජාතික ශ්‍රමයට ආරාධනා කරන්නේ බලු විධියටයි. කථානායකතුමනි, ඒ රටවල කෙරෙන හැටියට තමුන්නාන්සේට හෙම්බිරිස්සාව හැදුණත්, තමුන්නාන්සේට අඩප්පරය හැදුණත්, තමුන්නාන්සේට සෙංගමාලය හැදුණත්, වැස්සේ හෝ අව්වේ හෝ පින්නේ හෝ ඔබතුමා වැඩ කරන්න ඕනෑ. ඔබතුමාගේ පෞද්ගලික ප්‍රාණකාරයාට කිසි නිදහසක් නැහැ. තමුන්නාන්සේ ගිහින් වැඩ කරන්න ඕනෑ. අපේ රටේ එහෙම නොවෙයි. ලෙඩ නිවාඩු වෙන් කර තියෙනවා. මඟුල් කන්නත් අනුමත නිවාඩු කියා දවස් 7 ක් වෙන් කර තියෙනවා. මේ විධියට දවස් 42 ක් නිවාඩු තියෙනවා.

රටක දියුණුව ලැබෙන්නේ මම මේ ශ්‍රමය රටේ දියුණුව සඳහා ලබා දෙන්න ඕනෑ කියන හැඟීමෙන් ජනතාව වැඩ කරන විටයි. හිර ගෙවල්වල සිටින හිරකරුවන් ගෙනුත් වැඩ ගන්නවා. ජේල් එකේ ඉන්න නිලධාරි මහත්මයා වේවැලක් අර ගෙන ගිහින් "බැහැපන් එළියට; ගන්, මිටිය; තලපිය ගල්, පැය 2 ක්" යයි කියා හිරකරුවාගේ ශ්‍රමය ලබා ගන්නවා. ඒ ශ්‍රමය ජාතික ශ්‍රමයක් නොවෙයි. රුසියාව වැනි රටවල ලබගන්නා සේවය ජතික ශ්‍රමයක් නොවෙයි. වහල් ශ්‍රමයක්. අපේ රට වැනි ජනසම්මතවාදී දේශපාලන දර්ශන උසුලන රාජ්‍යවල පමණයි, ජාතික ශ්‍රමයක් ජනතාවගේ කැමැත්ත හා ආදරය දිනාගෙන ලබගන්නෙ.

තමුන්නාන්සේට මේක අවබෝධ වෙන්න ඕනෑ. මේ ශ්‍රමයට බාධා කරන්නෙ කවුද? අර විඥානකාරයො; ගුරුන්නාන්සේලා. ගරු මුදල් ඇමතිතුමා දන්නවා. කඩාකප්පල්කාරයො කියා කොටසක් ගැන කථා කරන බව. හැම ආණ්ඩුවක්ම කඩාකප්පල්කාරයො කියන කොටසක් ගැන කථා කර තිබෙනවා. කඩාකප්පල්කාරයො කියන්නෙ කවුද? හරියට තුවාල දැන ගෙන බෙහෙත් දාන්න ඕනෑ. ලොඩේ දැන ගෙන බෙහෙත් දෙන්න ඕනෑ. කකුලේ තුවාලෙට ඔළුවට බෙහෙත් දම්මට හරි යන්නෙ නැහැ. කකුලට බෙහෙත් බඳින්න ඕනෑ. කඩාකප්පල්කාරයො කියන්නේ ජනසම්මතවාදී රටවල සිටින මෙන්න මේ විඥාන වාදියො. ඔවුන් තමයි කාර්යාල තුළ කඩාකප්පල්කාරී වැඩ කරන්නෙ. ඇයි විඥානවාදය පතුරවන්න බැහැ, රටේ ආර්ථිකය කඩාකප්පල්කාරී තත්ත්වයකට වැටුණේ නැත්නම්. රටේ ආර්ථික දියුණු වී ගියොත් කර්මාන්තශාලාවල නිෂ්පාදනය වැඩි වුණොත්, අලෙවිය වැඩි වුණොත්, විඥානවාදය ක්‍රියාත්මක කරන්න බැහැ. අද සිදු වී තිබෙන්නෙ ඒකයි.

මුදල් ඇමතිතුමාගේ අයවැය වාර්තාව අනුව පෙනී යනවා, ශ්‍රමය වැඩි වී තිබෙන බව; නිෂ්පාදනය වැඩි වී තිබෙන බව; අලෙවිය වැඩි වී තිබෙන බව; ජනතාව ලක්ෂණට බෙදී යන බව; ගිඟයක් නැති බව; පෝලිම් නැති බව සීමා කිරීම් නැති බව. එහෙමනම් විඥානවාදීන්ට වෙන්නෙ? අහිංසක වෙනවා; අසරණ වෙනවා. විඥානවාදී හොල්මන් කාරයො එකා දෙන්නා අරහෙ මෙහෙ ඉන්නවා. ඒ හොල්මන්කාරසින්ටත් අපි ආරාධනා කරනවා, කරුණාකර වරදි මාර්ගයේ නොගිහින්, අනිසි මාර්ගවල නොගිහින්, ජාතිය කෙරෙහි ආදරයෙන් කල්පනා කරමින්, ජාතික අභේනියට දාන්නෙ නැතිව, පොදු යහපත තකා ජනතාව සමඟ එකතු වී ක්‍රියා කරන්න කියා. අපි මිනි මරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ, හිරේ දාන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. ස්ට්‍රයික් කරලා රක්ෂා නැති කරගන්න කියන්නෙ නැහැ. අද උදේ ස්ට්‍රයික් ගැන ප්‍රශ්නයක් මතු වුණා. ඒ ගොල්ලන්ට කථා කරන්න මාතෘකාවක් නැති නිසයි, ඒ ගැන කථා කරන්නෙ. අද ලංකාවේ ස්ට්‍රයික් කාරයො නැහැ. මගේ අමාත්‍යාංශයේ එක ස්ට්‍රයික් කාරයෙක්වත් නැහැ. ඒ යටතේ ඇති එකම ආයතනයකවත් නැහැ. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නැහැ. දෙපාර්තමේන්තුවෙ නැහැ; කාර්මික විද්‍යාල අංශයෙ නැහැ; ප්‍රතිපාදන කොමිෂන් සභා අංශයෙ නැහැ; විශ්ව විද්‍යාල අංශයෙ නැහැ; කොහේවත් ස්ට්‍රයික් කාරයෙක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආනන්ද දසනායක මහතා**
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඒක සම්පූර්ණයෙන ඉවර කරල ?

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

ඒකෙ වැඩ කෙරෙනවා. එක විඥනවාදියෙක් නැහැ. විඥානවාදියො හිටියා. මම නැහැ කියන්නෙ නැහැ. මහචාර්යවරු හිටියා; ආචාර්යවරු හිටියා; ශිෂ්‍ය නායකයො හිටියා; මම ඒ ඇත්තොත් එක්ක සාකච්ඡා කර තිබෙනවා. දැන් ඒ කටයුතු කෙරෙනවා. මහචාර්යවරු ආචාර්යවරු ශිෂ්‍ය නායකයො විඥාන වාදය පැත්තක තබා සාකච්ඡා මගින් කටයුතු කිරීමේ මාර්ගයට ඇත් බැය තිබෙනවා. තමුන්නාන්සේලාට පුළුවන්ද, එසේ නොවෙයි කියන්න. ?

**ආනන්ද දසනායක මහතා**
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

බොහෝම හරි.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

බොහෝම හරි කියනවා. බොහෝම ස්තුතියි. ඔන්න ඔකයි, තත්ත්වය.

ගරු කථානායකතුමනි, ඒ නිසා මේ රටේ ආර්ථික දේහය, ආර්ථික ශරීරය ඉල්ලන ඉල්ලීම්වලට ඇහුම්කන් දී හරි හැටි අය වැය ලේඛන සකස් කළ මුදල් ඇමතිවරුන් අතර අපේ මුදල් ඇමති රොනී ද මැල් මහතා පළමුවන ගණයට වැටෙන බව මම සඳහන් කරන්න කැමතියි.

බැලූ බැල්මටම පෙනෙන දෙයක් හැටියට ඇත් විඥාන කාරයන් අල්ලාගෙන තිබෙන්නේ සහනාධාර අඩු වුණාය කියන කථාව පමණයි. ඔන්න විඥානවාදී කට්ටිය කියනවා, "බලාපල්ලා ඔබලාට දුන් හාල් පොත නැහැ; ටෝකන් කාඩ් එක නැහැ; රෙදි යාර දෙක ගන්න දුන් ටෝකන් කාඩ් එක නැහැ; හරි කරදරයක් නොවූ මුදියන්සේ සියාතු උඹලාට දැන් වෙලා තිබෙන්නෙ" කියලා එතකොට සියාතුයි, මුදියන්සෙයි ටෝකන් කාඩ්වලට අහස් ගුණයකින් එහාට ගිහින්. විඥානකාරයො තාම එතැන. අපේ රටේ සිටින විඥානකාරයෝ—ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටින අර්ධ විඥානකාරයොත් අනෙක් කණ්ඩායමේ පූර්ණ විඥානකාරයොත් යන මේ දෙගොල්ලම—තවමත් ඉන්නේ 1970 ටෝකන් කාඩ් යුගය තුළ. සාමාන්‍ය මිනිසා ඊට එහා බොහෝම දුර ගිහින්.

**ආනන්ද දසනායක මහතා**
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

තමුන්නාන්සේ ඉන්නේ අංශබාග විඥානයේද ?

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

එහෙමත් එකක් එතුමාට අහු වෙලා තියෙනවා. එතුමා ගැන අංසබාග කතාවකුත් තිබෙනවා. මම ඒවා ඔක්කොම කියන්න ඕනෑද ? ඒවා පෞද්ගලික දේවල් නිසා, ඒවා කිව්වොත් ගෙදරට බලපාන නිසා, මම ඒවා කියන්නේ නැහැ.

සහනාධාර අවශ්‍යයයි. සහනාධාර එපා යයි අපි කියන්නේ නැහැ. සහනාධාර මිනිසුන්ට අවශ්‍යයයි සහනාධාර සතුන්ටත් අවශ්‍යයි. එය අනවශ්‍ය දෙයක් නොවෙයි. නමුත් සහනාධාර දිය යුතු තැන්වලට දෙන්න පාලනය කරන මිනිස්සු දැක ගන්න ඕනෑ. කෙල්ලක් ගන්න යන තරුණයා, කෙල්ල ගැන කතා කරලා, 20 වැනිදාට බඳිනවාය කිව්වොත්, ඊට දවසකටවත් කලින් දුවනවා දිසාපති කාර්යාලයේ 'චීෆ් ක්ලාක්' මහත්තයා හම්බ වෙන්න, හාල් පොත මාරු කර ගන්න; ටෝකන් කාඩ් එක මාරු කර ගන්න. මේ ජාතිකය තුළ, මේ ධරණී තලයේ ඉපදුණ ශක්ති සම්පන්න කොල්ලෙක්, තම දෙපයින් හිටගත් තරුණයෙක්, තමාට සහකාරියක් ගේන්න යන විට රාජ්‍ය සහනාධාරයක් එක්ක කසාද බඳින්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල්පනා කරනවා නම් එය ඔහුගේ තරුණකමට නින්දාවක්. එය ඔහුගේ දෙපයින් සිටීමට විශාල කම්මුල් පහරක්. මෙතෙක් තිබුණු ආණ්ඩු හතෙන් එකක්වත් මේ ටික කල්පනා කළේ නැහැ. ඒ ආණ්ඩු හතම පෙරළුණේ සහනාධාරයේ අයුතු ප්‍රතිඵලය නිසායි. නමුත් මේ අටවැනි ආණ්ඩුව ඒ ටික කල්පනා කරනවා.

සහනාධාර දිය යුතු තැන්වලට දෙන්න ඕනෑ බව මේ ආණ්ඩුව කල්පනා කරනවා. ලෙඩාට සහනාධාර දිය යුතුයි. සාත්තු කවුරුත් නැති ලෙඩා අහිංසක මට්ටමෙන් මිය යන්න ඉඩ දෙන්න බැහැ. ඒ නිසා, නිදහස් ආරෝග්‍ය ශාලා, ප්‍රතිකර්ම, සෞඛ්‍ය වඩ පිළිවෙළවල් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කර තිබෙනවා. එය නැතැයි කියන්න කාටවත් බැහැ. ඒක තමයි, දෙන්න පුළුවන් ලොකුම සහනාධාරය.

සල්ලි තිබෙන නිසා නමුත්නාන්සේලා නම් මේ ඉස්පිරිතාලවලට ගියේ නැහැ නමුත් ඔය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායම ඉස්පිරිතාලයේ ගේට්ටුවෙන් ඇතුළු වන ලෙඩුන්ගෙන් ශත 25 ක මුද්දරයක් ගත් හැටි අපට මතකයි. ඒ උදවිය සහනාධාර පාලනය කළ හැටි එහෙමයි. සහනාධාර දිය යුතු තැන තෝරා ගන්න බැරි වුණා, ඒ අයට අනේ, ඒකට අපි මොනවා කරන්නද

ගරු කථානායකතුමනි, දරුවන් ජාතියේ මූලධනයයි. ඒ මූලධනය හරියට 'පෙලිෂ්' කර ගත්තේ නැත්නම්, ඔපමට්ටම් කර ගත්තේ නැත්නම්, මුළු ජාතියම කඩා වැටෙනවා. ඒ නිසා ඒ අයටත් සහනාධාර දෙන්න ඕනෑ. අපි ඒක දීලා තියෙනවා. ඉස්කෝල දහ දාස් අටසියයක් විශ්ව විද්‍යාල බර ගණනක්, කාර්මික විද්‍යාල බර ගණනක්, ලී බඩු, ගුරුවරුන් ආදී වශයෙන් විශාල සහනාධාරයක් දරුවන්ට දී තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමා වෙනදාට වඩා පස් ගුණයක් අධ්‍යාපනය සඳහා දී තිබෙනවා පමණක් නොව, ගරු ජනාධිපතිතුමා සානුකම්පිතව මේ ගැන කල්පනා කර බල, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව යටතේ වින්ද දුක් වේදනාවන් විඳි ළැමට උත්තර දෙන්න කටයුතු කර තිබෙනවා.

ළමයින් පොත් ගන්න රු. 350 ක් ඉල්ලා ජනතාව පාරේ යන විට එදා සිටි ගරු අගමැතිවරිය මන්දිරයෙන් එළියට බැස්සේ නැති බව නමුන්නාන්සේට මතක ඇති. එදා මම ඉගැන්නු විද්‍යාලයේ ගුරුවරු 39 දෙනෙක් ස්ට්‍රයික් කළා. මම ස්ට්‍රයික් කළේ නැහැ. තනියෙන් වැඩ කළා. මම කිව්වා (රාජ්‍යයකට විරුද්ධව, රජයක් පෙරළීමේ බලාපොරොත්තුවෙන් අපි 'ස්ට්‍රයික්' කරන්නේ නැහැ කියල. එය අපේ ප්‍රතිපත්තියක්. එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ ප්‍රතිපත්තියක් එය.

ගරු කථානායකතුමනි, ඒ කට්ටිය වින්ද දුක් වේදනාවල් දැක්කා. සහනාධාර දිය යුතු තැනට දුන්නා. අද තිස් හය ලක්ෂයක් පමණ දරුවන් රාජ්‍ය මට්ටමින් පොත් ටික අතේ තබාගෙන ගුරුවරයා හමුවට යනවා. නිකන් දුන්න—රාජ්‍ය මට්ටමින් ලැබුණ—ගුරුවරයා, රාජ්‍ය මට්ටමින් දුන්න පුටුව, රාජ්‍ය මට්ටමින් දුන්න ඉඩමේ රාජ්‍ය මට්ටමින් තැනුන ගොඩනැගිල්ල වෙතට රාජ්‍ය මට්ටමින් දුන්න පොත් ටික අරගෙන ගොස් ජාතියේ දරුවා අද ශිල්ප හදාරනවා. අන්න සහනාධාර දිය යුතු තැනක්. එය දී තිබෙනවා. ගරු කථානායකතුමනි, මම ගරු මුදල් ඇමතිතුමාට මතක් කරන්න ඕනෑ, මෙම කාරණය: නමුන්නාන්සේට හැකියාවක් ඇති වුණොත්, මහවැලි වැඩ සම්භාරය ක්‍රමයෙන් අවසන් වෙන විට ලබන අවුරුද්දේ දීවත් කල්පනා කරන්න, මේ රටේ අහිංසක දුප්පත් දරුවන්ට—එක්තරා වයස සීමාවක ඉන්න පිරිසකටවත්—නිල ඇඳුමකුත් රාජ්‍ය මට්ටමින් ලබා දෙන්න. එයත් වටිනවා. ඒත් සහනාධාර දිය යුතු තැනක්. එහෙම නැතිව කසාද බඳින්න සහනාධාර, බබා හම්බවෙන්න සහනාධාර දෙන්නට ගියොත් ජාතිය විනාශයට යාම නවත්වන්න බැහැ.

හම්බ කරගෙන කන්න පුළුවන් මිනිහාට "හම්බ කරගෙන කන්න එපා; ගෙදර ඉඳගෙන නිකන් කාපල්ලා" කියන්නට තරම් රාජ්‍යයක් මෝඩ වෙන්න නරකයි. මේ රටේ තිබුණ ආණ්ඩු හතම තමන්ගේ ආශිර්වාදය, තමන්ගේ ආඩම්බරය තමන්ගේ කනතුර රැක ගැනීම සඳහා සහනාධාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා]

දෙමින් රාජ්‍ය භාණ්ඩාගාරයේ මුදල් කැත විධියට නින්දිත විධියට පාවිච්චි කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩු පමණක් නොවෙයි, යූ. එන්. පී. ආණ්ඩුත් එහෙම කළා. ප්‍රසිද්ධියේ වුණත් මට එය කියන්න සිදුවෙලා තිබෙනවා. ඒක නිසයි. ඒ ආණ්ඩුවලට රොටි පෙරලෙනවා වගේ පෙරලෙන්න සිද්ද වුණේ. අපි බලමු, මේ ආණ්ඩුවත් එහෙම පෙරලෙයිද කියල. නැගිටල කාටවත් කියන්න පුළුවන්ද, එහෙම සිද්ධවෙයි කියල. අපි ඔට්ටු අල්ලමු. ඒ ආණ්ඩුවලට රොටි පෙරළෙන්න වගේ පෙරලෙන්න සිදුවුණේ ඒ විධියට කටයුතු කළ නිසයි. දේශපාලන නායකයන් වේදිකාවට අවිත් පිටිපස්සෙන් පාර්ලිමේන්තුව හිතේ මවා ගෙන පොරොන්දු දුන්නා. හාල් නිකන් දෙන්නම් කිව්වා; හාල් හඳෙන් ගෙනවිත් දෙන්නම් කිව්වා; මිනිසුන්ට යාන වාහන දෙනවයි කිව්වා. මේ විධියට ස්වර්ගයක් මවල දෙන්න කතා කළා. එම නිසා ඒවා බිඳ වැටුනා. අපි—මේ ආණ්ඩුව—එහෙම කළේ නැහැ.

ජන සම්මතවාදී ආණ්ඩුවල ප්‍රධානම දෙය, එවැනි ක්‍රියා නැතිවීමයි. ජන සම්මතවාදී ආණ්ඩුවක විශේෂ ලක්ෂණය තමුන්නාන්සේ දන්නවාදම්ම දන්නෙ නැහැ. එහි විශේෂ ලක්ෂණය නම් තමුන්නාන්සේගේ අයිතියත්, මගේ අයිතියත්, මගේ දරුවාගේ අයිතියත්, වෙලේ වැඩ කරන සියාතුගේ අයිතියත්, රේදි අපුල්ලන එක් කෙනාගෙග් අයිතියත්, කම්කරුවාගේ අයිතියත්, පොල් කඩන කොලුවාගේ අයිතියත් එක හා සමාන වීමයි. නමුත් අර ආණ්ඩු කල්පනා කළේ, කොමියුනිස්ට් ආණ්ඩු කල්පනා කළේ, ඔවුන්ගේ අයිතියත් මේ අයිතියත් අතර විශාල පරතරයක් තිබෙනවා කියලයි. ඒක තමයි. සමාජවාදයක් ගැන කතා කරන්නෙ. අද පවතින ජනසම්මතවාදය මතයි, සමාජවාදය නිවැරදිව මේ ජාතියේ ප්‍රතිස්ථාපනය වී තිබෙන්නෙ. ඒ නිසා මේ ජනසම්මතවාදී පාලන ක්‍රමය මුළු ලෝකයම වැළඳ ගනිත්වා, මේ විධියේ ආර්ථික ක්‍රමයක් තුළ තම ජනතාව ගමන් කරවීමට තුන්වැනි ලෝකයේ අනික් රටවලත් ශ්‍රී ලංකාව ආදර්ශයක් වේවා, මුදල ඇමතිතුමාට සහනධාර දිය යුතු තැනට සහනාධාර දෙන්නට, අහිංසක දරුවන්ට සහනාධාර දෙන්නට වාසනාව, ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින්, පංතිවිඥානයට අපි මේ අයවැය ලේඛනයෙන් පාංශකූලය දී හමාරයි කියමින් මගේ කතාව අවසන් කරනවා.

**එච්. එම්. ඒ. ලොකුබණ්ඩා මහතා (ගල්ගමුව)**

*(திரு. எச். எம். ஏ. லொக்குபண்டா—கல்கமுவ)*

**(Mr. H. M. A. Lokubanda—Galigamuwa)**

ගරු කථානායකතුමනි, මෙතෙක් වේලා නිදහස් අධ්‍යාපනයේ හඬ අපට අසන්න ලැබුණා. ඇත්ත වශයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ වර්තමාන නායකතුමා ලබන ලද විශාල ජයග්‍රහණයක් තමයි, උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා වැනි, අපි වැනි, සාමාන්‍ය පංතියේ විශාල පිරිසකට පාර්ලිමේන්තුවට එන්නට අවස්ථාව සලසා දීම. තමුන්නාන්සේ දන්නවා ඇති ඒ ආකාරයට බව, අපි විශාල ජයග්‍රහණයක් කළේ. එහෙම නම් අපේ ගතානුගතික සිරිත් විරිත්, සම්ප්‍රදායන් අපේ පාලන තන්ත්‍රයෙන් ටිකෙන් ටික වෙනස් කළ යුතු තැනට අපි පත්වී සිටිනවා. විශේෂයෙන්ම පසුගිය වකවානුවල තිබුණු පාර්ලිමේන්තු සම්ප්‍රදායයන් දිහා බලන විට අපට පෙනෙනවා, ඒ තිබුණු ආණ්ඩු අයවැය ඉදිරිපත් කළ සෑම අවස්ථාවකදීම, එවකට තිබුණු විරුද්ධ පක්ෂය ඊට විරුද්ධව තර්ක—විතර්ක ඉදිරිපත් කර ඇති බව, ඊට විරුද්ධව ඡන්දය පාවිච්චි කර ඇති බව. අපට සර්වජන ඡන්ද බලය ලැබී අවුරුදු 50 සම්පූර්ණ වන මේ අවස්ථාවේදී, අපේ පාර්ලිමේන්තුව ශ්‍රී ජයවර්ධනපුරයට—කෝට්ටෙට—ගෙන යන මේ වකවානුවේදී අප සිතට ගන්න ඕනෑ මෙතෙක් මේ රටේ රදළ පන්තිය, මේ රටේ ලොකු මිනිසුන්—තමන්ගේ නම්—ගම් කියා ගෙන ඒ අනුව ඡන්දය ලබා ගත් රදළයන්—මෙතෙක් ගෙන ගොස් තිබෙන ප්‍රතිපත්තිය අප විසින් වෙනස් කරනු ලැබිය යුතුය කියා.

මේ අලුත් පාර්ලිමේන්තුවේ, අලුත් මන්ත්‍රීවරුන් වන අප ඒ ඒ යෝජනා සාකච්ඡා කළ යුත්තේ අවංකවයි, අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හඳවතට එකඟවයි, ජනතාවගේ ශුභසිද්ධිය අරභයායි. කථානායකතුමනි, තමුන්නාන්සේ දන්නවා, මේ රටේ තිබුණු ඇතැම් පාර්ලිමේන්තුවල සිටි විපක්ෂය සිය ඡන්දය විරුද්ධව පාවිච්චි කළ හැටි, සාමාන්‍ය ජනතාවට සත 25 ට හාල් දුන් අවස්ථාවලදීත්. ඒ වාගේම පසුගිය වකවානුවේදී එක කූපන් පොතකට සතියකට පිටි රාත්තල් 3/4 ක් පමණක් දෙමින් ඒ ආණ්ඩුව රටේ ජනතාවට කෑම බෙදන්න අවස්ථාව උදා කළ විට, එවැනි අයවැය කටත් පක්ෂව ඡන්දය දුන් ආණ්ඩු පක්ෂත් මේ රටේ තිබුණා. ඒ දේශපාලන පක්ෂ නොදියුණු තත්ත්වයක තිබුණු නිසා, නුගත්කමින් පිරී තිබුණු නිසා, සිය රජය ගෙන ආ ඕනෑම පනත් කෙටුම්පතකට හෝ යෝජනාවකට හෝ පක්ෂව ඡන්දය දෙන්න ඒ මන්ත්‍රීවරුන්ට සිදු වුණු බවයි, එයින් පෙනෙන්නේ. මේ අලුත් පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් වන අපි කල්පනාකාරීව අවශ්‍ය වෙනස්කම් කරන්න ඕනෑ ; එමඟින් මේ රටේ සංවර්ධන වේගය වැඩි කිරීමට අප ක්‍රියා කරන්න ඕනෑ.

කථානායකතුමනි, මේ අයවැය ලේඛනයෙන් මේ රටේ සංවර්ධනයට විශාල මුදලක් වෙන් කර තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. පොල් වගාව වැඩි දියුණු කිරීම, තේ වගාව වැඩි දියුණු කිරීම, රබර් වගාව වැඩි දියුණු කිරීම, කම්කරුවන් ලිපිකරුවන් වැනි රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම ආදී වශයෙන් නොයෙකුත් තරාතිරම්වල ජනතාවට සහන සැලසීම තේමාව කරගෙනයි, මේ අයවැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන්නේ.

සුළි සුළං, කැරලි—කෝලාහල ආදී ආපදාවලට මුහුණ පාන්නටත් මේ රජයට සිදු වුණා. ඒ වාගේම, මේ රටේ සංවර්ධනය කෙරෙහි ඉතාමත් විනාශකාරී විධියට බලපාන තෙල් මිල වැඩිවීම සම්බන්ධයෙනුත් අපේ අවධානය යොමු වෙන්න ඕනෑ. ඒ තත්ත්වයන් යටතේ අපේ සංවර්ධන ව්‍යාපාර අඩපණ නොවී සාර්ථක කර ගන්නේ කොහොමද කියා අප කල්පනා කරන්න ඕනෑ.

තමුන්නාන්සේ මගේ මැතිවරණ කොට්ඨාශයේ සංචාරය කර තිබෙනවා. එක දවසකට රුපියල් ලක්ෂයක—හමාරක සංවර්ධන වැඩ අපේ කොට්ඨාශවල සිදු වන අවස්ථා තිබෙන බව, ඒ අනුව තමුන්නාන්සේට පෙනී යන්නට ඇති. දරන්න පුළුවන් උදවියට බදු බර පටවා රජය ලබා ගන්නා මුදල් ඉතා සාධාරණ අන්දමින්, මේ රට සංවර්ධනය කිරීම සඳහා වැය කරන බව අප දන්නවා. මේ සංවර්ධන වේගය දිගටම පවත්වාගෙන යන්නේ කොහොමද, එහෙම නැත්නම් එය තවදුරටත් වැඩි දියුණු කරන්නේ කොහොමද කියා ජනතාව කල්පනා කරන්න ඕනෑ.

එම නිසා දේශපාලන පක්ෂ භේදයෙන් තොරව අප මේ රටේ ජනතාවට ආයාචනා කරන්න ඕනෑ, රජය වෙන් කරන මුදල්වලින් උපරිම ප්‍රයෝජනය ලබා ගන්නය කියා.

අයවැය ලේඛනවලින් ලබා දෙන මුදල්වලින් අපට නියම විධියට වැඩ කරවා ගන්න බැරි වී තිබෙන ප්‍රධානතම බාධකය නම්, මේ රටේ තිබෙන අලසකමය කියා මේ අවස්ථාවේදී නොකියාම බැහැ. රජයේ කන්තෝරුවකට යන්න. ගිහින් බලන්න. එහි වැඩ කරන අයට වඩා වැඩ නොකරන අය නැද්ද කියා. ලියන්නය කියා ලිපිකරු තනතුරුවලට පත් වී සිටින අය අතුරින්, ලියන අයට වැඩියි නොලියන අය. පසුගිය වකවානුවේදී අපට කිව්වා, අරපිරිමැස්මෙන් විදුලිය පාවිච්චි කරන්නය කියා. ඒ වුණත් සමහර කන්තෝරුවල කිසි වැඩකට නැතිව 'බල්බ්ස්' දහය, පහළොව පත්තු වන හැටි, විදුලි පංකා පහ, හය වැඩ කරන හැටි, ඒ මඟින් විදුලිය නාස්ති වන හැටි අප දැක තිබෙනවා.

නියෝජ්‍ය මහා මාර්ග ඇමතිතුමා දන්නවා, මහා මාර්ගවල වැඩ කෙරෙන හැටි. එතුමා මා සමඟ යන අවස්ථාවල ඒ ගැන සඳහන් කර තිබෙනවා. අපේ ගම්වල හොඳට කෑත්ත—උදැල්ල පරිදු අය පවා මහා මාර්ගවල වැඩට දැම්මාට පස්සේ, ඒ එක් කෙනකුගෙන් කෙරිය යුතු වැඩ කොටස කරවා ගැනීම සඳහා දෙන්නෙක් යොදවන්න සිදු වෙනවා. වැකන්ද—වැවේ බැම්ම—එළි කරන්නය කිව්වොත් එක කම්කරුවකු වෙනුවට කම්කරුවන් දෙදෙනෙකු යොදවන්නට සිද්ධ වෙනවා. හේතුව, අලස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වි. ජ. මූ. ලොකුබණ්ඩාර මහතා]

කම. ලොකු තැනින් පටන් ගත්තාම පොඩිම තැන දක්වා අලසකම විශාල වශයෙන් පැතිර ගොස් තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපේ ආසනවල යම්කිසි ගොඩනැගිල්ලක් ඉදි කරන්නට විමධ්‍යගත අයවැයෙන් මුදල් වෙන් කළාය සිතමු. මුදල් වෙන් කළ පමණින් ගොඩනැගිල්ල ඉදි කරන්නට බැහැ. ඒ අදාළ දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති අනුව එක එක නිලධාරියා හමුවෙන්නට ඕනෑ. ගමේ මට්ටමේ සිට—ප්‍රාදේශීය මට්ටමේ සිට—කොළඹ මධ්‍යස්ථාන මට්ටම දක්වා ඒ සෑම කාර්යයකටම නොයෙකුත් නිලධාරීන් හමුවෙන්නට අපට සිද්ධ වෙනව. මහජනතාවගේ සුභ සිද්ධිය සඳහා ඒ ආකාරයට කටයුතු කරන විට අපට යම් යම් සේවකයන්ගේ අලසකම නිසා නැත්නම් දුර්වලකම නිසා නොයෙකුත් දුක් ගැහැටවලට ලක් වෙන්නට සිද්ධ වෙනවා. අලසකම මඟ හරවා නොගෙන—මේ විශාල නාස්තිය මඟ හරවා නොගෙන—අප, අප විසින්ම විනාශය ඇති කරගෙන යනව දැයි මේ අවස්ථාවේදී කල්පනා කර බලන්නට ඕනෑ.

අද මේ රටේ වන නාස්තිය සම්බන්ධයෙන් තමුන්නාන්සේට මම තවත් උදාහරණයක් පෙන්නුම් කරන්නම්. පසුගිය සුළි සුළඟින් පසු මගේ මැතිවරණ කොට්ඨාශය තුළ රු. 1,37,00,000 ක් වැය කර වැව් ගණනාවක් ප්‍රතිසංස්කරණය කළ බව ගරු මුදල් ඇමතිතුමා දන්නවා. මේ වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ දී විශාල නාස්තියක් සිද්ධ වුණාය කියා මේ වන විටත් පරීක්ෂණ පවත්වනවා. නිලධාරීන් සහ කොන්ත්‍රාත්කරුවන් මුදල් ගසා කෑවාය කියා පරීක්ෂණ පවත්වනවා. මුළු රටේම මහජනතාව සතු මුදල්වලින් අයථා විධියට සුළු කොටසක් තර වෙනවා නම් ඒක විශාල අසාධාරණයක්. මේ රටේ සෑම පුරවැසියකුම ජාතිය වෙනුවෙන් තමන්ගේ යුතුකම් කොටස හරිහැටි ඉටු කරන්නට තීරණය කරනවා නම් මේ අයථා වැඩ සහ නාස්තිය වළක්වා ගත හැකි බව මා පෙන්වා දෙන්නට ඕනෑ.

මේ රජය බිහිවීමෙන් පසු රටේ ඇති වී තිබෙන සංවර්ධනය ගැන අමුතුවෙන් කියන්නට වුවමනාවක් නැහැ. නමුත් ඒ සමගම අපට ප්‍රශ්න කීපයකටම මුහුණ දෙන්නට සිද්ධ වූ බව තමුන්නාන්සේ දන්නවා. ඉන්ධන මිල ඉහළ ගියා. කෘෂිකර්මාන්තයට වුවමනා කරන ට්‍රැක්ටර් යන්ත්‍රවල සහ තෙල් බෙහෙත් වර්ගවල මිල ඉහළ ගියා. සමහර උදවියගේ ශ්‍රමයට ඉහළ ගාස්තුවක් ගෙවන්නට සිද්ධ වී තිබෙනව. පසුගිය අවුරුදු හතර තුළ විශාල සංවර්ධනයක් ඇති වුණත් බඩු මිල දෙස බලන විට මිල මට්ටම පහළ තත්ත්වයක තිබෙනවාය කියා අපට කියන්නට බැහැ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජය තිබුණු කාලයේ දී හාල් ප්‍රවාහණය සීමා කිරීම වැනි පියවරවල් නිසා හාල් සේරුවක මිල රු. 8 ක් පමණ වුණා. රුපියල් 8 කට හාල් සේරුවක් ගෙන ඒක හංගාගෙන අරන් ගියා. අද තවම එහෙම තත්ත්වයක් නැහැ. නමුත් මිල ඉහළ යන නිසා සංවර්ධනයක් වුණාය කියා ජනතාව සතුටු කරවන්නට අපට පුළුවන්කමක් නැහැ. හාල් සේරුවක් නිෂ්පාදනය කරන්නට සිද්ධ වී තිබෙනවා. පසුගිය කාලයේදී අපි විශාල වශයෙන් සහනාධාර දුන්නේ මේ රටේ ගොවීන්ට නොවෙයි. චීනයේත් ඇමෙරිකාවේත් ගොවීන්ටයි. හාල් සහ පිටි ගෙන්වන්නට අපි විශාල මුදලක් වැය කළා. නමුත් දැන් අපට අඩම්බරයෙන් කියන්නට පුළුවනි පසුගිය අවුරුදු හතර ඇතුළත ආහාර සඳහා පිටරට ඇදී ගිය මුදලෙන් විශාල ප්‍රමාණයක් මේ රටේම ඉතිරි කර ගත් බව. අපේ සංවර්ධන වැඩ පිළිවෙල තුළින් ඒ මුදල ඉතිරි කර ගත්තා.

ගරු කථානායකතුමනි, කුරක්කන්, අබ, මෙනේරි, කව්පි වැනි අතිරේක භෝග සඳහා නියමිත අවම මිල වැඩි කරන්නට ගරු මුදල් ඇමතිතුමා බලාපොරොත්තු වෙනවා. මෙවැනි ද්‍රව්‍ය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව කාලයේ දී කළ සීමාකිරීම් අපට අද වාගේ මතකයි. තමුන්නාන්සේ දන්නවා ඒ කාලයේ දී මිරිස් රාත්තලක මිල රු. 40 දක්වා ඉහළ ගිය බව. නමුත් රු. 40 ගණනේ ඒ මිරිස් මිල දී ගෙන පාරිභෝජනය කරන්නට සිද්ධ වුණේත් ගොවි ජනතාවටයි. ඒ කියන්නේ, එවැනි ද්‍රව්‍ය නිෂ්පාදකයිනුත් පරිභෝගිකයන්ගේ තත්ත්වයට පත්ව සිටියා. ඒ කාලයේ අපේ ගම්වල අය අමු මිරිස් අඹරා පොල් සම්බෝල කෑ හැටිත් මට මතකයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිටරටින් ඒ ද්‍රව්‍ය ගෙන්වීම නැවැත්වීමට ප්‍රථමයෙන් අපි ගොවි ජනතාවට යම් ඇගවීමක් කරන්නට ඕනෑ. "කරුණාකර අසුවල් කාලය තුළ නිෂ්පාදනය පටන් ගන්න, අසුවල් දවසේ සිට අපි අසුවල් ද්‍රව්‍යය පිටරටින් ගෙන්වීම නවත්වනවා", යයි කියන්නට ඕනෑ. විශේෂයෙන්ම මා ඒ ඉල්ලීම කරන්නේ අප නියෝජනය කරන ප්‍රදේශවල ගොවි ජනතාව වෙනුවෙන්. නමුත් නාන්සේ දන්නවා අතිරේක භෝග වගා කරන්නේ නමන්වය කියා අක්කර දෙකකවත් ස්ථිර ඉඩමක් නැති ගොවීන් බව. සාමාන්‍යයෙන් ඉතාම දුෂ්කර ප්‍රදේශවල ජීවත්වන අවුරුද්දකට එක වාරයක් පමණක් තල වැනි ද්‍රව්‍ය නිෂ්පාදනය කරන ගොවීන් තමයි, අතිරේක භෝගත් වගා කරන්නේ. සුළු වාරිමාර්ගත් නැහැ; මහ වාරි මාර්ගත් නැහැ. තල, කුරහන්, මෙනේරි වාගේ දේවල් සාමාන්‍යයෙන් මාස් කන්නයේ පමණක් වගාකර, සුළු ආදායමක් ලබාගන්නා අහිංසක ජනතා කොට්ඨාශයක් ඉන්නෙ. මේ අය ගැන කථා කරන් කරන්න කිසිම කෙනෙක් නැහැ, ප්‍රදේශයේ මන්ත්‍රීවරයා නියෝජිතයා—හැරුණු විට.

ඇත්ත වශයෙන්ම මා මුලින් සඳහන් කළා වාගේ වෘත්තීය සමිති අයිතිවාසිකම් තිබෙන, මොනවා හරි කරන්න පුළුවන් කම තිබෙන අයට. අද ඉතාමත්ම සාධාරණව පඩි වැඩිවීම් ලැබී තිබෙනවා. ඔවුන්ගේ සාධාරණ අයිතිවාසිකම් ලැබී තිබෙනවා. නමුත් අර අහිංසක ජනතාව යමක් බලාපොරොත්තු වන්නේ මහජන මන්ත්‍රීවරයා මගින් පමණයි. අපට ඒක කියන්න පුළුවන් පසුගිය වාරවල සිදු වූ ආණ්ඩු පෙරළි දීහා බැලුවාම.

මා ගරු මුදල් ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා මේ මිළ වැඩි කිරීම් වලදී සාධාරණ ලෙස උපරිම මිළක් කවිපිවලට නියම කරන්නය කියා. එමෙන්ම විශේෂයෙන්ම එවැනි ආහාර වර්ග පිටරටින් ගෙන්වීම නතර කරවන්න කියාත් ඉල්ලමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

* * * * * *

[ඉතිරි වැඩ කටයුතු සඳහා 1981 නොවැම්බර් 18 වන බදාදා නිල වාර්තාව බලන්න.]

*[நிகழ்ச்சித் தொடரை 1981 நொவம்பர் 18, புதன்கிழமைய அதிகார அறிக்கையிற் பார்க்க.]*

*[For continuation of Proceedings, see* OFFICIAL REPORT *for Wednesday, 18th November 1981]*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සැ. යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා සවාජිය කථාවල ශුද්ධ කළ යුතු තැන් දක්වනු පිණිස මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි වැරදි හරිගස්සා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

1981 දෙසැම්බර් 1 වන අඟහරුවාදා

නොඉක්මවා ලැබෙන සේ එවිය යුතුයි.

---

**குறிப்பு**

அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற் தெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு

1981 டிசம்பர் 1, செவ்வாய்க்கிழமைக்குப் பிந்தாமற்

கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.

---

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the copy *containing the corrections must reach the* Editor of HANSARD,

not later than

Tuesday, 1st December 1981

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය